sinhalaebooks.com




මෙම කෘතියෙහි සම්පූර්ණ අයිතිය විහා දිසානායක සතුවේ.
කරුණාකර කතෘ අයිතිය සුරකින්න.
කියවීම පහසුව උදෙසා PDF ගොනුවක් ලෙස සකසන ලද්දේ - sinhalaebooks.com.

sinhalaebooks.com

උබ ගිය මාසේ ගත්ත සල්ලි වලට මොකද කරේ.."

" සැරින් සැරේ ඇවිත් ඉල්ලන් යද්දි කොහෙ තියන සල්ලියක්ද ..."

" උබ එහ් පාර කට ගහන්නත් එනවද %$#*..උබ දැනගනින් මට උබව මේ දැන් උනත් මේ ගෙදරින් එලියට දන්න පුලුවන්... එහ් හින්ද මන් කියන විදිහට හිටපන්... "

" මේ ගෙදර මෙහෙම දුක් විදිනවට වඩා මහ පාර් සැපයි මටයි මගෙ කෙල්ලටයි... "

" ඔව්... උබලා ට හරියන්නේ මහා පාර තමයි...අතට ආව චාන්ස් එකත් මිස් කරගත්ත පට්ටි $&#... ලමයව අර නෝනලට දුන්නනම් ලමයත් සැපට ඉන්නව..අපිත් සැපේ ඉන්නවා... "

" තාත්තා කෙනෙක් කියන කතාවක් ද දෙයියනේ මේ..."

" මටත් හරි තාත්තෙක් වෙන්න තිබ්බ උබ හරිහමන් ලමයෙක් හැදුවනම්..ඇස් පේන් නැති අන්ධ කෙල්ලෙක් හැදුවම උබ හිතනවද අපිට ඒකි තියන් ඉදලා හරියයි කියලා... "

" දෙයියනේ....ඔය වචන වලට නම් හොදක් වෙන් නෑ...ඇස් පෙනුනත් නැතත් එහ් මගෙ දරුවා..පාරේ හිගා කාලා හරි මන් මගෙ දරුවව හදනවා මිසක් මන් කාටවත් මගෙ කෙල්ලව දෙන්නේ නෑ...."

" දැන් ඕන උනත් දෙන්න බෑනේ ගෑනියේ.දීග දෙන වයසේ කෙල්ලෙක් දරු කමට හද ගන්න මොන නෝනල ද කැමති වෙන්නේ...ඒකි පොඩි කාලේ මහත්තයලා ඉල්ලද්දි දීලා දැන්මනත් යස ගේට අපිටත් ඉන්න තිබ්බා... "

" තමුසෙට ඕන සල්ලි නෙහ්...තමන් ගේ දරුවා විකුනලා හරි තමුසෙට බොන්න තිබ්බොත් ඇති.."

" මන් උබට කිවුවා එක පාරක්..එහ් වගේ එකියක් හැදුවා කියලා අපට ලැබෙන දෙයක් නෑ..උබට ඒකිව ඔය විදිහට ම තියාගන්න ඕන නම් හැම මාසෙම මේ විදිහට මල් විකුනන සල්ලි වලින් මට බාගයක් ඕන..එක මාසෙක හරි මිස් උනොත් එදට උබට ඒකිවත් නැති වෙයි..."

නේහා ගේ කාමරේට ඇහුනා තාත්තා හැමදම වගේ අදත් අම්මට තර්ජනය කරලා යනවා...කෙල්ලට දැනුනේ තමන් ගැන ම උපන් තරහක්...

" මගෙ අම්මා පව්..මන් හින්ද ගොඩක් විදවනව දෙයියනේ.."

කෙල්ල තමන් ගේ රිදුම් දෙන ඔලුව අල්ලගෙන ඉකිගහන් හඩට සාලේ හූල්ලමින් හිටපු කෙල්ලගේ අම්මා තත්පරේට දෙකට කෙල්ල ලගට ආවා...

sinhalaebooks.com

" ඇයි මගෙ දුවේ...මොකද මේ... "

" ඇයි අම්මේ අම්මා මාව තාත්තා කිවුව නෝනල ට විකුනුවේ නැත්තේ... එහෙනම් තාත්තා කිවුවා වගේ අම්මලට අද සතුටින් ඉන්න තිබ්බා... "

" මොනවද පුතේ උබ මේ කියවන්නේ... "

" තාත්තා කියන්නේ ඇත්ත... මාව හැදුවා කියල අම්මලට ලැබෙන දෙයක් නෑ...මන් වගේ අන්ද කෙල්ලෙක්ගෙන් ඇති වැඩේ මොකක් ද මගෙ අම්මේ... අම්මා මන් හින්ද දුක් විදින්න එපා අම්මේ... මල් විකුනල ගන්න සල්ලි තාත්තට දෙන්න එපා... එතකොට තාත්තා මට මොනවහරි කරයි...එතකොට අම්මට ත් නොදහසේ ඉන්න පුලුවන්... "

" කටවහපන් මගෙ කෙල්ලේ...එහ් මිනිහට දරු කැක්කුමක් නැති උනාට මට උබව ඕනි... මට පුලුවන් උබව බලගන්න මන් මැරෙනකම්.. ඒත් මට බය මන් නැති කාලෙක උබ තනිවෙයි පුතේ.. එහ් ගැන හිතද්දි ත් මගෙ පපුව පිච්චෙනවා.... "

" අනේ මගෙ රත්තරන් අම්මේ.... අඩන්න එපා..මන් ආයේ අම්මට මොනවත් කියන් නෑ අම්මේ... අනේ මගෙ ඇස් දෙක පෙනුනනම් මන් මගෙ අම්මව බලාගන්නවා දෙයියනෙහ්...එහෙනම් අම්මට මෙහෙම දුක් විදින්න දෙන් නෑ... "

නේහා අම්මගේ පපුවට තුරුල් වෙලා කිවුවේ අවුරුදු 25ක් උනත් පොඩි එකෙක් වගේ ඉකි ගගහා අඩ අඩ..

නේහා නිම්සාරී.. කෝටි පතියෝ නොවුනත් යමක් කමක් තිබුන පවුලක එකම කෙල්ල...

කෙල්ලට තිබුනේ ලේසියෙන් කාටවත් නොලැබෙන අමුතුම පෙනුමක්.. කෙල්ල පුදුම තරම් අහිංසකයි... දුබුරු ඇස් ඉනෙනුත් පල්ලෙහට තියන කොන්දේ රෝස පාට දෙතොල්.... කෙල්ලට ගෙනාවේ අමුතු ම ලස්සනක්...එහ් හැමදේම කෙල්ලට අඩුවක් නැතුව තිබ්බත් හරියට ම අවුරුදු 10 දි කෙල්ලගේ පෙනීම සම්පූණර්යෙන් නැති වෙලා ගියපු නිසයි මේ හැම ප්‍රශ්නයක් ම මතු උනේ..

නේහා ගේ තාත්තා කවදාවත් එහ් කියන්නේ කෙල්ලගේ ඇස් පේන කාලෙදිවත් කෙල්ලට ආදරේ කරේ නෑ... නේහා ගේ පෙනීම නැති උන ගමන් ඔහු කරේ නේහා විකුනලා දන්න හදපු එක... එහ් දේ තාත්තා කෙනෙක් ට හීනෙකින් වත් කරන්න බැරි දෙයක් උනත් නේහා ගේ තාත්තා ට නම් අරක්කු බෝතලය වෙනුවෙන් ඕනිම දෙයක්..

නේහා අම්මගේ තුරුලේ අඩ අඩ ඉද්දි කෙල්ලට එහෙම් ම නින්ද ගියා...

කෙල්ල ඉන්න තත්වේ දන්න හින්ද ම අම්මා කෙල්ලට කතා නොකර ම බර කල්පනාවකට වැටුනා... එහ් තව ටික දවසකින් මේ ගෙදරින් යන්න වෙනවා කියලා ඇයට ඉවෙන් වගේ

sinhalaebooks.com

දැනුන නිසා.. මොකද මේ වෙද්දි සතයක් වත් නේහා වෙනුවෙන් දෙන්න ඇය අතේ තිබුනේ නෑ.

" පුතේ...නැගිටින්න... අපිට යන්න ගමනක් තියනවා... "

කෙල්ලගේ අම්මා අකමැත්තෙන් උනත් කෙල්ලව ඇහැරවලා කියද්දි කෙල්ල ඇස් දෙක ඇරලා අම්මා කිවුව දේවල් අහන් හිටියා..

" ලෑස්ති වෙයන් මගෙ දූවේ... අපි ටවුමට ගිහින් එන්න ඕනි... "

" ඇයි අම්මේ මේ හදිස්සියේ... "

" යන ගමන් කියන්නම් ..ලෑස්ති වෙමු
.. "

එහෙම කියන ගමන් අම්මා කෙල්ලව රූම් එකට එක්ක ගිහින් ඇදුම් අන්දවන් එලියට ආවේ ඇයත් ලෑස්ති වෙලා...

කෙල්ලගේ අතකිනුත් අල්ලගෙන බොහොම පරිස්සම ට කෙල්ලව එක්ක ගියත් කහා ඉර ලගට ඇවිත් පාර පනින්න හදද්දි ම වේගෙන් ආව කාර් එකක් නේහා යි අම්මයි ඉන්න තැනින් බ්‍රේක් කරේ වැරැද්ද කාර් එකෙ අයිති කාරයගේ උනත් නේහා ට ත් අම්මටත් පාර මැද කියලවත් බලන් නැතුව කුනුහරපෙන් බනිමින්...එහ් එක්ක ම කෙල්ලගේ හිත ට මේ තියෙන ප්‍රශ්නනත් එක්ක දැනුනේ පුදුම තරම් තරහක්....." කොහෙද ඕයි යන්නේ... පේන් නැද්ද වාහන එනවා... "

" අපි කහා ඉරෙන් නෙහ් පැන්නේ මහත්තයා... "

" &%*$ කියන්නේ...තමුසෙලා නම් මැරිලා යයි..ඒත් ඊට පස්සේ තමුසෙලා හැප්පුනාම මට නෙහ් හිරේ ලගින්න වෙන්නේ... "

" මහත්තයා හරි කතාවක් නෙහ් කියන්නේ... මහත්තයා හරියට පාර බලන්..... "

"$&#@%** මන් උබට ආයේ කියන් නෑ... දැන්වත් ඔය පාර මැද්දෙන් අයින් වෙනවද... "

කෙල්ල හිටියේ තරහින් උනත් වචනයක් වත් නොකියා මේ හැමදේම අහගෙන... ඒත් තමන් ගේ අම්මට කවුරුත් තරක වචනෙන් කතා කරනවා අහන් ඉන්න තරම් කෙල්ලගේ ඉවසීම දැඩි උනේ නෑ.... කාර් එක තියෙන්නේ කොතනද, එතකොට කාර් එකේ ඉදන් අම්මට බැන්න කෙනා ඉන්නේ කොතන ද කියලා කෙල්ලට පේන්නේ නැති උනත් කෙල්ල බෙල්ල හරවලා අම්මගේ අත තදින් අල්ල ගත්තේ හොද දෙකක් කියලා දෙනවා කියලා හිතාගෙන...

sinhalaebooks.com

" මහත්තයා... මහත්තයා කවුරු උනත් කමක් නෑ.... ඔක්කොමට ම කලින් කෙනෙක් ට කතා කරන්න ඉගෙන ගන්න... "

ඇඟිල්ලකුත් දිග් කරල කෙල්ල කිවුව වචන වල සැරට ද මන් ද ඊට පස්සේ තත්පර දෙක තුනක් ම ගෙවුනේ නිහඬව...

ඒත් ඊළඟට ඇහුන වචන ටිකට කෙල්ලට වගේ ම කෙල්ලගේ අම්මටත් දැනුනේ පුදුමයක්..

" ඈ යකෝ... බලපන්කෝ අරකිගේ කටේ සැර... ඒත් ඇයි ඒකි මෙච්චර බැනපු මට වචනයක් නොකියා කට වහගෙන හිටපු උබ දිහා බලලා ඕක කිවුවේ...."

" ආයුශ්..මචන් උබට හොදට ම වැඩියි...එහ් කෙල්ලට ඇස් පේන් නෑ... දැන් යමන්.."

" අම්මට යකෝ... ඇස් පේන් නැති උනාට කටේ සැර බලපන්කෝ.... ඔහොම හිටපන් මන් ඕකිට හොඳ වැඩක්...... "

කොල්ලා කාර් එකෙන් බහින්න හැදුවත් කොල්ලට කෙලින් හිටගන්න තරම් වත් හයියක් තිබ්බේ නෑ.. එතකොටයි කෙල්ලගේ අම්මට තේරුනේ කොල්ලා ඉන්නේ හොදට ම බීලා කියලා...

" ප්ලීස් මචන්..දැන් යමන්... අද දවසට දගන්න ප්‍රශ්න ඇති .... උන දේට සොරි ආන්ටි..."

එහෙම කියන ගමන් ආයෙත් කාර් එක ස්ටාට් වෙද්දි අම්මා කෙල්ලගේ අතින් අල්ලගෙන් ඉක්මනට පාර අයිනට උනා...

ඒත් ඊළඟට ඇහුන වචන ටික කෙල්ල ජීවිතේ ට කවදවත් ම අහලා තිබුන් නැති වචන ටිකක්...

" උබ දැනගනින්.... මන් මේක ලේසියෙන් අත අරින් නෑ .. උබ මට කෑ ගහලා කරගත්තේ හොඳ වැඩක් නෙමෙයි..උබට ඇස් දෙක විතරනේ නැත්තේ.. අනිත් ඒවා තියනවනේ...මන් එද්දි ලෑස්තිවෙලා හිටපන්..... "

" ආයුශ්.. කට වහපන්.."

ඊට නොදෙවෙනි ව ඇහුන දෙවෙනි කටහඬත් එක්ක කාර් එක ඈතට ගියේ කෙල්ලගේ අම්මගේ ඇස් වල කඳුලු පිරෙද්දි.... එහ් අද තමන් ලග ඉදලත් තමන්ගේ කෙල්ලට මෙහෙම කතා අහගන්න වෙනවනම් තමන් නැති දවසට මොනවගෙන් මොනා වෙයි ද් කියලා හිතට පුදුම තරම් අසරනකමක් දැනෙද්දි....

sinhalaebooks.com

ඒත් කෙල්ලට නම් හිතුනේ එක ම එක දෙයයි.. අන්ධ කෙල්ලෙක් ට වත් අනුකම්පාවක් නැති මේ විදිහට කතා කරන සමාජේ දකින්න බැරි වෙන්න තමන් පින් කරලා තියනවා කියලා විතර මයි..

කෙල්ලට ඇස් දෙකක් ඕනි වෙන්න තිබුන එකම අවශ්‍යතා ව තමන් හින්ද දුක් විඳින කෙල්ලගේ රත්තරං අම්මට සලකන්න තිබුන ආසාව... පිය සෙනෙහස හීනෙන්වත් විඳලා නොතිබුන කෙල්ල තමන් ව විකුනලා සල්ලි ගන්න හදපු දනටත් සල්ලි වෙනුවෙන් තමන් ව මරන්න උනත් සූදනම් තමන් ගේ නරුම තාත්තාටත් පුදුම විදිහට ආදරේ කරා...

ටවුමට ආවේ කෙල්ලට ගවුම් රෙද්දක් අරන් දෙන්න හිතාගෙන උනත් මේ උන සිදුවීම හින්ද ම කෙල්ලගේ අම්මගේ හිත හොදට ම අවුල් උනා... එහ් හින්ද කෙල්ලවත් එක්කන් ඇය ආපහු ගෙදර එන්න හැරුනේ සුසුමකුත් පිට කරමින්...

ඒත් ගෙදරට අඩිය තිබ්බ පලවෙනි තත්පරේ ම දැක්ක දේ නිසා ඇගේ ඇස් පවා විසල් උනේ දැක්ක දේ එහ් ඇස් වලට විශ්වාස කරන්න් බැරි උන හින්ද මයි...
" මොන අපරාදයක් ද දෙයියනේ මේ.... "

ඇය කිවුවා නෙමෙයි කියවුනා... අත් දෙකත් මුවට අරන් ඇය මොහොතක් බලන් හිටියේ තමන් ගේ ඇස් තමන් ට ම විශ්වාස නැති වෙලා යද්දි...

කොහොම විශ්වාස කරන්නද... අත් දෙකේ කරගැට එනකම් මහන්සි උන, රැයක් දවාලක් නැතුව සාත්තු කරපු, දෙයියනේ කියලා කාලා ඇදලා ඉන්න සල්ලි ටිකක් හොයා ගන්න මුලු රෝසමල් වගාවම තනිකර ගලවලා තියෙද්දි...අඩන්නවත් කොයින් ද හයියක්...

" අනේ ඇයි අම්මා... මොකද උනේ..... "

කෙල්ල අම්මගේ අත තවත් තදට අල්ලගෙන අහද්දි ඇය කරේ මේ තරම් වෙලාවක් හිතේ හිර කරන් හිටපු කදුලු ඉකියකුත් එක්ක පිටකරපු එක විතරයි...

" අනේ අම්මා කියන්නකෝ.... "

" අපේ රෝස ගස් ටික ගලවලා දාලා පුතේ... අනේ කවුද දෙයියනේ මේ අපරාදේ කරේ.. "

එහ් වචන ටික එක්ක කෙල්ලගේ ඇස්වලටත් කදුලු ආවේ එහ් මල් ටික හදන්න උන මහන්සි ය මතක් වෙද්දි...

ඒත් තත්පර ගානයි ගත උනේ... ඉස්සරහට ආවේ කෙල්ලගේ තාත්තා..නිකන් නෙමෙයි... සමච්චල් හිනාවක් එක්ක...

" උබලා නෑ නෑ කියලා ගන්න එකෙනුත් තියාගෙනනේ මට සල්ලි දුන්නේ..දැන් බලාගමුකෝ කරගන්න හැටි..මන් තාම ගැලෙවුවේ මේ ටික විතරයි....උබ ඊලග පාර මට වෙලාවට සල්ලි

sinhalaebooks.com

දූත් නැති උනොත් මත් අතිත් මල් ටිකත් ගලවලා දෙන්නට ගෙදරිනුත් එලියට ඇදලා දානවා... "

දෙයියනේ...තාත්තා කෙනෙක් කරන වැඩක් ද මේ... කෙල්ලගේ හිතට දැනුනේ පුදුම අසරනකමක්...ඒත් කෙල්ලගේ අම්මා නම් හිටියේ වචනයක් වත් කතා නොකර..එග් හිත මේ වෙද්දි ත් කෑලී කෑලී වලට කැඩිලා ඉවරයි...

" මත් හෙට ගෙදර එනවා..නවතින්න...මත් දන්න මහත්තයෙක් එනවා..මල් ටිකක් ඕන කිවුවා...මේ ගලවපු ගස් වල තියන මල් ටික කඩලා වතුර එකක දලා තියපන්..."

එහෙම කියලා කාගෙවත් ම අවසරයක් නැතුව කෙල්ලගේ තාත්තා කෙලින් ම ගියේ ගේ ඇතුලට.. මිදුලේ තනි උනේ නේහ යි අම්මයි විතරයි....

" අම්මේ... දූත් අඩන්න එපා.. අපි ආයෙත් හදමු.. තාත්තා ගියාම... "

කෙල්ල කිවුවේ තමන් ගේ දුක හිත ඇතුලෙම තියාගෙන අම්මගේ හිත හදන අරමුනෙන්.. ඒත් එග් වෙනුවට ඇයගෙන් ලැබුනේ කෙල්ලගේ හිසට සියුම් ස්පශර්යක් විතරයි...

" මට දුක උබ ගැන මගෙ දූවේ..මත් නැති කාලෙක උබව බලාගන්නේ කවුද ..."

කෙල්ලගේ අම්මා ඇස් දෙකේ කඳුලු පුරවත් එහෙම කියලා කෙල්ලවත් එක්කත් ගේ ඇතුලට ආවා... හවස් වෙලා ගලවලා තිබුන රෝස පාත්තියේ මල් එකින් එක්ක කඩ ගත්තේ මේ මල් හදන්න උන මහන්සිය මතක් වෙලා හූල්ලමින්...

එදා දවසේ ඉතුරු කාලේ ගෙවිලා ගියේ හැමදම වගේ අහත් ඉන්නවත් බැරි තරක වචන එක්ක... ඒත් පුදුමේ කියන්නේ පහුවදා උදේ වෙද්දි කෙල්ලගේ තාත්තා පුදුම විදිහට වෙනස් උනා.. කෙල්ල එක්කයි අම්මා එක්කයි දෙන්න ම එක්ක හොඳට කතා කරා .. මෙහෙම කතා කරන්නේ හොඳකට නම් නෙමෙයි කියලා දෙන්න ම දැනත් හිටියත් දෙන්න ම බලන් හිටියේ වෙන්නේ මොකක් ද කියලා...

" මහත්තයා ගේ අම්මයි තාත්තයි දෙන්නත් එනවලු... තව මහත්තයගේ යාලුවෙකුත්... එග් හින්ද මාත් එක්ක හොඳට කතා කරලා හිටපන්..එග් මහත්තුරු යනකම්... "

කෙල්ලගේ තාත්තා කිවුවේ ඔය එනවයි කිවුව මහත්තුරු එන්න ඔන්න මෙන්න තියෙද්දි...

දවස ම රඟපෑවේ මේක ට නේද කියලා එතකොටයි නේහා ටයි අම්මටයි දෙන්නට ම තේරුනේ...ඒත් කරන්න දෙයක් නැති කමට පාඩුවේ හිටියා...

නේහා ගේ තාත්තා ගේ බල කිරීමට ම කෙල්ලගේ අම්මා හිටියේ ඔය එනවයි කිවුව මහත්තුරු ට කන්න උයන ගමන්... කෙල්ලත් හැමදම වගේ අම්මා එක්ක කතාවක් දගෙන හිටියේ...

sinhalaebooks.com

එහ් එක්ක ම කෙල්ලගේ තාත්තා කුස්සියට ආවා...

" අර මහත්තුරු ඇවිත්..ඉක්මනට තේ එකක් හදන් වරෙන්... "

කෙල්ල ගේ අම්මා හා කිවුවෙත් නෑ..බෑ කිවුවෙත් නෑ... නිහඬව ම වතුර එක රත් වෙන්න තියලා තේ හදන්න ගත්තා...

ඊලගට තේ ටිකත් අරන් සාලෙට එද්දි කෙල්ලගේ තාත්තා හිටියේ අර මහත්තුරු එක්ක ලොකු කතාවක... කෙල්ලගේ අම්මා තේ එක මේසෙන් තියලා කුස්සියට එන්න් හැදුවත් පුරුදු කටහඬත් ඇහුන නිසා ආටෙත් හැරිලා බැලුවේ... එතකොට දැක්ක කෙනා දැක්කලා කෙල්ලගේ අම්මා වගේම එහ් කෙනාගේ මූනුත් තරහින් පිරුනේ සාලේ හිටපු අනිත් හැමෝම දෙන්නගෙම ඉරියව් දිහා පුදුමයෙන් බලන් ඉද්දි..." ඔහේ මොකද මෙහේ... "

මුලු ගේම දෝන්කාර දෙන්න ඇහුන එහ් ගැබුරු කටහඬින් කෙල්ලගේ අම්මා ඇරෙන්න අනිත් හැමෝම බලන් හිටියේ බය වෙලා...

" මන් මගෙ ගෙදර නැතුව මහත්තයාගේ ගෙදර ඉන්නද .. "

කෙල්ලගේ අම්මත් ඇහුවේ දෙවනි නොවෙන කටහඬකින්...

ඇවිත් හිටියේ වෙන කවුරුත් නෙමෙයි..එදා නේහා ටයි ඇයටයි බැනපු තරුනයා... තනියම නෙමෙයි..මුලු පවුලත් එක්ක ම.. වෙනසකට තියෙන්නේ අද කොල්ලා සිහියෙන් ඉන්න එක...

" මේ තමුන්ගේ ගෙදර ද... ඔහ්හ් ශිට්...අම්මා යමු..මේ ගෙදර හරියන් නෑ..වෙන කොහෙන් හරි ගමු...මලීශ්... යමන්..උබට මතකනේ මේකිව.. අම්මලට කියපන් ...මන් පුතා උනාට එයාලා අහන්නේ උබ කියන දේනේ... "

කොල්ලා කිවුවේ තමන් ගේ හොඳම යාලුවා උන මලීශ් දිහත් කොල්ලගේ පවුලේ අය දිහත් බලලා...

" ආයුශ්..කූල් ඩවුන් මචන්... "

මලීශ් කිවුවේ කොල්ලගේ කරට අතක් දගන්න උත්සාහ කරමින් උනත් කොල්ලගෙන් ඊට ප්‍රතිචාර විදිහට ලැබුනේ මලීශ් ගේ අත ගස ඇරලා දපු එක විතරයි ..

" අම්මා...අම්මා දන්නවද මේ කවුද කියලා... මේ ගෑනී මට ඊයේ පාර මැදදි... මලීශ් කියපන්කෝ &%%# කට වහන් ඉන්නේ... "

" මහත්තයා මොකද මේ... ඇයි මගෙ ගෑනි අනින් මහත්තයලට මොකක් හරි වැරැද්දක්... "

sinhalaebooks.com

" වැරැද්දක්... ? මේ තමුන් ගේ ගෙදර කියලා දන්නවා නම් මන් පස් පාගන් නෑ...මට තමුන් ගේ රෝස මල් එපා...මේ ගෙදර විතරක් තිබ්බොත් ඇති... මේ දැන්ම මේ ගෙදරින් එළියට බැහැපල්ලා... "

ආයුශ් මුලු ගේම දෙකක් වෙන්න මහා හයියෙන් කෑ ගගද්දි කෙල්ලගේ අම්ම තුශ්නීම් භූත වෙලා බලන් හිටියේ ගෙදරක් ඉල්ලපු කතාවක් නිසා..මොකද තේහා ටයි අම්මා ටයි ඉතුරු වෙලා තිබුන එකම වස්තුව මේ ගේ විතරයි... ගෙදරත් නැති උනොත් යන්න වෙන්නේ මහා පාරට කියලා ඇය දැනන් හිටියා ...

" මොකක් ද මහත්තයා එහ් කතාවේ තේරුම .. මගෙ ගෙදරින් මට යන්න කියන්න... මහත්තයා මේ ගෙදර අයිති කාරය ද... "

" ඔව් $%&% මන් තමයු අයිති කාරයා ..දන් නැත්තන් මේ මිනිහගෙන් අහපන්... ගෙදර ඔප්පුව තියලා මගෙන් ලක්ශ 6කට ත් වඩා අරන් තියනවා... දැන් මේ ගේ අයිති මට... මන් ආවේ රෝස මල් ටික අරන් මේ මනුස්සයට උදව්වක් කරලා යන්න..අනික මට මේ ගේ ගන්න ඕන කමකුත් තිබ්බෙ නෑ. ඒත් දැන්...මට මේ දැන් ම මේ ගෙදර ඕන... "

කෙල්ලගේ අම්මා එහ් වචනත් එක්ක කෙල්ලගේ තාත්තා දිහා බැලුවේ කවදාවත් නැති තරම් තරහකින්...

" මොකක් ද මිනිහෝ මේ කියන්නේ..මේ කියන දේවල් ඇත්තද...මටයි මගෙ කෙල්ලටයි උන් හිටි තැනුත් නැති කරන්නද මිනිහෝ හදන්නේ... "

ඔහු නිහඩයි.... මුලු සාලෙන් ම ඇහුනේ එක ම අදෝනාවක්...කුස්සියට වෙලා හිටපු කෙල්ලත් සාලෙට ආවේ මෙ සද්දෙට..

" මේ ඉන්නේ අනිත් &%*$..දැන් ම ම මේ ගෙදරින් පලයන් පට්ට %$... නැත්නම් එදා මන් කිවුව දේ ඇත්තට ම කරලා පෙන්නන්න වෙයි.. උබේ කෙල්ලට... "

" ඇති මහත්තයා... ආයෙත් මගෙ දුවට එක වචනයක් හරි කියලා තිබුනොත්... "

" ඈයි උබ මට මොනා කරන්න ද %$&# අහ්... උබ මට මොනා කරන්න ද... "

" ඇති පුතා...නවත්තන්න දැන්... මලීශ් පුතා..මොකද මේ වෙන්නේ කියනවද..."

එහ් ඇහුවේ මේ තරම් වෙලාවක් හැම කතාවක් ම බොහොම ඉවසීමෙන් අහන් හිටපු කොල්ලගේ තාත්තා...

sinhalaebooks.com

" අන්කල්... ඊයේ එද්දි ආයුශ් හොදට ම ඩ්‍රින්ක්ස් අරන් හිටියේ...මන් එපා කියද්දි ආයුශ් ඩ්‍රයිව් කරා..එද්දි මේ අම්මවයි මේ අම්මගේ දුවයි හැප්පෙන්න ගියා... පස්සේ ආයුශ් පාර මැද මේ අම්මටයි දුවටයි බනින්න ගත්තා... දැන්... දැන් මේ ඉස්සරහා ඉන්නේ එහ් අම්මියි දුවයි... "

කවදාවත් බොරුවක් නොකියන මලීශ් කිවුවේ තමන් ගේ හොදම යාලුවගේ වැරැද්ද පාවා දෙමින්...

" මලීශ් උබ... "

" ආයුශ් මට උබව හදුගන්න ඕනී මචන්..ඒකයි.. සොරි... "

මලීශ් එහෙම කියලා කොල්ලගෙන් ඇස් ඉවතට ගත්තේ කනගාටුවෙන්... කොල්ලා නම් හිටියේ මාරයා වැහිලා වගේ...

"එහ්කියන්නේ මලීශ් උබ... "

" නවත්තපන්... උබ මගෙ පුතෙක් කියන්නත් ලැජ්ජයි මට... "

එහ් එක්ක ම ආයුශ් ගේ කම්මුලට පහරක් වැදුනේ ඔහුගේ තාත්තා ගෙන්...

" වරෙන් යන්න ගෙදර... "

" මන් කොහෙවත් එන් නෑ තාත්තා... මන් මේ ගෙදර අරන් මිසක්... "

එහ් වචන ටික එක්ක ආයෙත් කොල්ලගේ කම්මුලට පහරක් වැදුනා..කොල්ලා අතින් පහර වැදුන කම්මුල අල්ල ගත්තේ කම්මුලෙන් දැඩි වේදනාවක් දැනුන නිසා...

" යමන්... "

" මන් කිවුවනේ තාත්තා...එක්කෝ මේ ගෙදර නැත්නම් මේකී...දෙකෙන් එකක් මට ඕනි... "

ආයුශ් ආයෙත් මහා හයියෙන් කෑ ගැහුවත් මේ පාර ආයුශ් ට ඕනි කියන්නේ නේහා ව... හදවත වේගෙන් ගැහෙද්දි කෙල්ල බිත්තියට හේත්තු උනේ හිටගෙන ඉන්නවත් හයියක් නැති හින්දා...

කෙල්ලගේ අම්මා නම් හිටියේ යක්ශාවේශ වෙලා... ඒත් ඊලගට ආයුශ් කිවුව දේටනම් ඇගේකටත් එක පාරම නිහඩ වෙලා ගියේ තත්පර ගානෙන්...
" සමහරවිට තමුන් දන් නැතුව ඇති මන් කවුද කියලා .. හොදින් නැත්නම් නරකින් මට මට ගේ හරි මේකී හරි ඕනි...නැත්නම් මේකිගේ ජීවිතේ ගැන තියන අදහස අත ඇරලා දාපන්... "

sinhalaebooks.com

ආයුශ් එහෙම කියන ගමන් ම අඩියට දෙකට ආවේ බිත්තියට හේත්තු වෙලා හිටපු නේහා ලගට...කෙල්ල හිටියේ හොදටම බය වෙලා..දඩිය මූන පුරාම ගලනවා...

ආයුශ් ගැහෙන කෙල්ලගෙ කම්මුලකින් අතක් තිබ්බේ එහ් අත් වලින් කෙල්ලට රිදෙන තරමට ම මිරිකමින්.....

" එනවද මාත් එක්ක..නැත්නම් පස් යටට ගිහින් නිදා ගන්නවද... වතුර යටට ගිහින් හරි කමක් නෑ..වට්ස් යුවර් චොයිස් බේබී.... "

" අත ඇරපන් මගෙ කෙල්ලව... "

කෙල්ලගේ අම්මා කිවුවේ ආයුශ් ගේ අත කෙල්ලගේ කම්මුලෙන් අයින් කරමින්...

" නවත්තපන් ආයුශ්..වරෙන් යන්න ගෙදර... "

ඒත් එක්ක ම කොල්ලගේ තාත්තා කොල්ලගේ කම්මුලට ආටෙත් වැරෙන් පහරක් එල්ල කරා ..

" ඔහොම නෙමෙයි තාත්තා..කොහොම කිවුවත් මත් එන්නේ නෑ... අම්මා කියනවා නේද මට හැමදම මැරේජ් එකක් කරගන්න කියලා .මත් මේ කරගන්න යන වෙලාවෙ වත් තාත්තාට පාඩුවේ ඉන්න කියන්න... "

කොල්ලා කිවුවේ කොල්ලගේ තාත්තා දිහා ආයෙත් එක පාරක් වත් බලත් නැතුව...

" ආයුශ් උබ.... "

කොල්ලගේ තාත්තා ආයෙත් කොල්ලට අතක් උස්සන්න යද්දි ම නොහිතපු විදිහට කෙල්ලගේ තාත්තා මැදට පැන්නා...

" නවත්තන්න මහත්තයා..මහත්තයා කැමති ද මගෙ දුවව ඇත්තට ම කසාද බදින්න... එතකොට මේ ගෙදර.... මේ ගෙදරත් ආපහු අපිට... "

" ඔව්...මේකිව මට දුන්නොත් මත් මේ ගේත් එහෙම් පිටින් ම දෙනවා..මට එක සතයක්වත් එපා... "

ආයුශ් කිවුවේ ස්තීර ස්වරයෙන්... එහ් වචන වල වංචාවක් ගෑවිලා වත් නෑ....

" අනේ මහත්තයා ට පින්... මේ ගේ දෙනව නම් සල්ලි ත් එපා නම් මහත්තයා මගෙ දුවව බදින්නත් කැමති නම් අපිත් කැමති මහත්තයා... "

sinhalaebooks.com

මේ ලෝකේ තාත්තා කෙනෙක් මෙහෙම කියපු පලවෙනි වතාව මේක වෙන්න ඇති... සල්ලි වෙනුවෙන් තමන් ගේ දුවව අපායකට ඇදලා දන්න තරම්.. කෙල්ලට එක පාර ම ඉකි ගගහා ඇඩුනේ කෙල්ලගේ අම්මත් අඩමින් උනත් තරහින් ම කෙල්ලගේ තාත්තා ලගට එද්දි..." තමුසෙට පිස්සු ද මිනිහෝ...අපේ එක ම දුවව මේ තිරිසනා ට කසාද බන්දලා දෙන්න...තමුන් දන්නවද මේ මිනිහා ඊයේ මටයි මගෙ කෙල්ල්ටයි කතා කරපු විදිහට... එහෙම් මිනිහෙක් ලගට මන් මගෙ කෙල්ලව කීයටවත් යවන් නෑ...මහ පාරේ හිගා කනවා...ඒක සැපයි ඊට වඩා... "

කෙල්ල ගේ අම්මා යක්ශාවේශ වෙලා කෙල්ලගේ තාත්තට කිවුවත් එහ් වෙනුවට ඔහුගෙන් ලැබුනේ වියරු හිනාවක් විතරයි....

" උඹට මේ ගෙදර එපානම් උඹත් පලයන් $%#&.. කොහොමත් උඹලා මෙච්චර කල් හිටියේ මගෙ ගෙදරනේ..එහ් ගවුරවේ වත් තියලා කතා කරපන්...මගෙ තීරනේ වෙනසක් නෑ... අනික එහ් උඹගේ විතරක් නෙමෙයි.මගෙත් දුව.... ඒකි ගැන තීරන ගන්න මටත් අයිතියක් තියනවා... "

" ඔහේට දැන් ද මිනිහෝ....."

" කට වහපන් .. මන් කිවුවනේ..උඹටත් ඉන්න බැරිනම් පලයන්... උඹ කලින් ම මන් කියපුවා ඇහුවනම් අපිට මෙහෙම වෙන් නෑ...මන් එක පාරක් උඹ කියපු එක අහලා කෙලව ගත්තා...මේ පාරනම් මන් චාන්ස් එක මිස් කරගන් නෑ..."

ඔහු කිවුවේ මීට අවුරුදු ගානකට කලින් නේහා ව සල්ලිකාර මහත්තයෙක් ට විකුනන්න ගිහින් ඇගේ අම්මා ඒක නවත්තපු අතීතේ සිහිගන්නවමින්...

කෙල්ලගේ අම්මා ඇස් දෙකේ කඳුලු පුරවන් තාමත් බිත්තියට හේත්තු වෙලා ඉන්න නේහා දිහා බැලුවේ හිතේ උතුරුන මව් සෙනෙහසින් පපුව පිච්චිලා යද්දි...

" අනික මේක කෙල්ලගේ වාසනාව..නැත්තම් කවුද කැමති මේ වගේ එකියක් කසාද බඳින්න..මැරෙනකම්ම අපිටම තමා මේකිව බලාගන්න වෙන්නේ..මහත්තයා අපි මේකට කැමති....."

සල්ලි වෙනුවෙන් ඕනම දෙයක් කරන කෙල්ලගේ තාත්තා අවසාන වතාවට කිවුවේ නේහා ගෙත් ඇගේ අම්මගෙත් හැඩුම් වේගවත් වෙද්දි....බලාපොරොත්තු සුන් වෙලා එහ් හිත් හැගීමක් දැනීමක් නැතුවම හඩා වැලපෙද්දි....

ආයුශ් ගේ මූනේ නම් මැවුනේ ජයග්‍රාහී හිනාවක්... නේහාගෙත් අම්මගෙත් කඳුලු කොල්ලට ගෙනාවේ කියලා නිම කරන්න බැරි සතුටක්.. පොඩ්ඩක් වත් එහ් හිත මේ කඳුලු ඉස්සරහා තෙත් උනේ නෑ...

sinhalaebooks.com

ඒත් ආයුෂ් ගේ තාත්තත් මේ තරම් වෙලා නිහඬව බලන් හිටපු ආයුෂ් ගේ අම්මා නංගි වගේ ම ආයුෂ් ගේ යාලුවා මලීශ් පවා නේහා දිහා වගේ ම අම්මා දිහත් බලන් හිටියේ අනුකම්පාවෙන්...

ආයුෂ් ගේ තාත්තා ට දැනුනේ කියන්න බැරි මහා ලොකු අසරනකමක්...ආයුෂ් තමන් ගේ පුතා උනත් කවදවත් කොල්ලා අම්මා තාත්තා කිවුව දෙයක් කවදවත් ඇහුවේ නෑ...අහන්න තියා තාත්තා ගැන පුංචි ගවුරවයක් වත් කොල්ලගේ හිතේ තිබ්බේ නෑ... පොඩි කාලේ ඉදන් ඕනවට වඩා කොල්ලට නිදහස දුන්න එකයි මේ හැමදේට ම මුල කියලා තාත්තාට තේරිලා තිබුනත් මේ වෙද්දි හොදට ම පරක්කු වැඩියි...

කොල්ලගේ තාත්තා කොල්ලා ගැන හොදට ම දන්න නිසයි අකමැත්තෙන් උනත් නිහඬ උනේ...මොකද කොල්ලට විරුද්ධ උනොත් කොල්ලා කලින් කිවුව විදිහට ම කෙල්ලගේ ජීවිතේට අනතුරක් කරන බව ඔහු නොදකාරව ම දැනන් හිටියා... මේ අහිංසක කෙල්ලට එහෙම දෙයක් වෙනවට ඔහු කීයටවත් කැමති උනේ නෑ....

" එහෙනම් ඔක්කොම හරි නෙහ්... දැන් යමු අම්මා... වෙඩින් එක තව දවස් තුනකින් වෙන්න ඕනි...මන් තැනයි වෙලාවයි කියන්නම්..."

ආයුෂ් එහෙම කියලා මිදුලේ නවත්තලා තිබුන කාර් එක ලගට ගියේ අනිත් හැමොම ගේ ඇතුලේ ඉද්දි....

ආයුෂ් යන දිහා මොහොතක් බලන් හිටපු කොල්ලගේ අම්මා තාමත් හඩා වැලපෙමින් ඉන්න නේහා ලගටත් ඇගේ අම්මා ලගටත් ආවේ හිතේ උපන් පසුතැවීමෙන්...

" අපිට සමාවෙන්න ..අපිට අපේ පුතාව හරියට හදගන්න බැරි උනා.. ඒත් මන් මේ කෙල්ලට අසාධාරණයක් වෙන්න දෙන් නෑ.... මන් දුවව බලා ගන්නම්... "

එහ් වචන කෙල්ලගේ අම්මට ගෙනාවේ පුදුම සහනයක්..ඇය අඩ අඩ ම අත් දෙක එකතු කරලා කොල්ලගේ අම්මට වැන්දේ මේ වෙද්දි ඇයට දැනුන එකමපිහිට ඇය නිසා...

" අපි ගිහින් එන්නම්... "

කෙල්ලගේ තාත්තා කිවුවේ කෙල්ලගේ අම්මා දිහා අසරණව බලලා....

කාර් එක නොපෙනී යනකම් ම වැලහිත්තක් වගේ අඩ අඩ බලන් හිටපු කෙල්ලගේ අම්මා අඩ අඩ ම කෙල්ලගේ හිස තමන් ගේ උරහිසෙන් තියා ගත්තේ....

" මන් යනවා .... හෙට එන්නම්... "

sinhalaebooks.com

කෙල්ලගේ තාත්තාගේ හිතක් පපුවක් නැති වචන ඉස්සරහා කෙල්ලගේ අම්මාගේ දුක ආයෙත් තරහක් බවටපත් උනත් ඇය නිහඬ උනේ තේහාට ගහයි කියන බයට... මොකද මීට කලිනුත් රන්ඩු ඉවර උනේ පැත්තක හිටපු අර අහිංසක කෙල්ලට වද දීලා...

මුලු ගේම පාලු සොහොන් පිට්ටනියක් වගේ දැනෙද්දි මුලු ගේ පුරාම ඇහුනේ එක ම අදෝනාවක්...

කාලය ගෙවෙනවා වත් නොදැනුන තේහා ටත් අම්මටයි උන් තැන ම නින්ද ගිහින් තිබුනේ අඩලා අඩලා අවසානේ...

කෙල්ලගේ අම්මට ඇහැරුනේ වහලට වැටුන වතුර සද්දෙට... එහ් එක්ක ම ඇහුන ගෙරවිලි හඩට....

මුලු අහසම කලු කරලා හොදට ම වහිනවා... එහ් දසුන ගෙනාවේ මුලු පලාතට ම මූසල ගතියක්...

කෙල්ලගේ අම්මා කෙල්ලවත් ඇහැරවගෙන කෙල්ලව රූම් එකට එක්ක ගියේ තමන් ගේ හිත තමන් ම රවට්ටගෙන කෙල්ලගේ හිත හැදෙන්න එක එක දේවල් කියන ගමන්...

අම්මත් එක්ක ඉන්න තියන අන්තිම දවස් තුන තේද මේ ගෙවිලා යන්නේ කියලා හිතෙද්දි කෙල්ලට දැනුනේ පුදුම විදිහේ වේදනාවක්...

ඒත් කෙල්ල තමන් ගේ හැඩුම් ආයාසයෙන් ම පාලනය කරගත්තේ කෙල්ල කවදාවත් තමන්ගේ සතුටට වඩා එද ඉදන් ම තමන් නිසා දුක් විදින අම්මගේ සතුට ගැන හිතපු නිසා... මොකද කෙල්ල හොදට ම දැනන් හිටියා තමන් ගේ මේ එක් කදුලින් තමන් ගේ රත්තරං අම්මා දස දහස් වතාවක් විදවන බව....
මේ දවස් තුන ගෙවිලා ගියේ කෙල්ලට වගේම කෙල්ලගේ අම්මටත් ජීවිතේ තවත් එපා කරමින්...ඒත් කෙල්ල එහ් හැම තත්පරේම උත්සාහා කරේ කෙල්ලගේ අම්මගේ හිත හදන්න..තමන් ගේ දුක හංගගෙන අනිත් අයගේ දුක නිවන්න කෙල්ල හරි දක්ශයි...ඒත් කෙල්ලගේ තාත්තා හිටියේ පුදුම තරම් සතුටකින් .. එහ් ආයුශ් කෙල්ලගේ තාත්තට තවත් ලක්ශ දෙකක් දෙන්න පොරොන්දු වෙලා...

ආයුශ් ට කෙල්ලව ඕනි වෙන දේකට නෙමෙයි...එද උන දේට කෙල්ලගෙන් පලි ගන්න... ඒහ් නිසාම සල්ලි ආකාරයක් තියන ආයුශ් ට ලක්ශ දෙක කියන්නේ නිකන් මුහුදෙන් දෝතට ගත්ත වතුර ටිකක් වගේ....

කෙල්ලව මැරි කරනවා කියලා ආයුශ් කිවුව දවස අද... මේ මැරේජ් එක තේහා ගේ ජීවිතේ තවත් අදුරට අරන් යනවා කියලා දන්න නිසාම කෙල්ලගේ අම්මා හිතවතෙකුටවත් මේ ගැන කිවුවේ නෑ... එහ් ඇරත් කෙල්ලගේ අම්මට නෑදෑයෙක් හිතවතෙක් කියලවත් කවුරුත් හිටියේ නෑ...

sinhalaebooks.com

කෙල්ලගේ අම්මා ගොඩක් පෝසත් පවුලක කෙනෙක්... කෙල්ලගේ තාත්තා කරේ එහ් ගෙදර වත්ත බලාගත්ත එක...ඔය අතරෙයි දෙන්නා අතර සම්බන්දයක් ඇති වෙලා ඇය ඔහුත් එක්ක ආවේ..ගෙදරට ද්‍රෝහි උනා කියලා එදයින් පස්සේ නේහා ගේ අම්මව ගේ ගෙදරට ගත්තෙවත් නෑ...හත් දවසේ දනෙත් දීලා නේහා ගේ අම්ම මැරුනා කියලා එහ් ගෙදර මිනිස්සු හිත හදාගත්තේ එහ් කාලෙම... එදා ඉදන් මේ වෙනකම්ම කෙල්ලගේ අම්මට ලැබුනේ දුක විතරයි...ගෙදර අයත් නැති උනා...ආව මිනිහත් කරේ හැමදම ගහපු එක...නේහා තමයි එහ් හැමදේක ම ඇයට තිබුන එක ම සැනසීම... ඉතින් කෙල්ලගේ අම්මට කොයින් ද නැද්දයො කෙල්ලගේ වෙඩින් එක කියන්න......

ආයුශ් ඊයේ හවස ඇවිත් කෙල්ලට අදින්න තියන සාරි එකත් දීලා උදේ මේකප් කරන කෙනත් ගෙදරට ම එයි කියල ගෙදර අයවත් දැනුවත් කරලා යන්න ගියා...සාරි එක පුදුම තරම් ලස්සන උනත් කෙල්ලට එහ් ලස්සන දකගන්න විදිහක් නෑ...හැබැයි කෙල්ලට හිතුනේ ඒක කෙල්ල කරපු පිනක් කියලා...මේ වගේ තිරිසනෙක් ගෙනත් දෙන සාරි එකක් බලන්න තමන් පව් කරලා නෑ කියලා කෙල්ල සතුටු උනා....

හරියට ම උදේ පාන්දර වෙද්දි ආයුශ් කිවුව මේකප් කරන කෙනා කෙල්ලගේ ගෙදර ට ආවා... කොල්ලා ගෙනත් දුන්න සාරි එකත් තමන් ගෙනපු මේකප් බඩු ටිකත් අරන් කෙල්ල එක්ක ම රූම් එකට ගියේ ගෙදර දිහත් තිකන් අමුතු විදිහට බලලා...

"ආයුශ් මේ ගොඩේ කෙල්ලව ද මැරි කරන්න යන්නේ... "

ඇය ගෙදර වටපිටාව දිහා බලලා කට කොනකින් හිනා උනා...

ඒත් දැනත් හිටියේ නෑ කෙල්ලට ඇස් පේන්නේ නෑ කියලා...

" මිස් ඔය සාරි ජැකට් එක ඇද ගන්නවද... අපි මේකප් එක දාලා dress කරමු.... "

ඇය කෙල්ල දිහා බලලා කියද්දි කෙල්ලගේ අම්මා කෙල්ල අතට සාරි ජැකට් එක දෙද්දි කෙල්ල ඒක ඇගිලි වලින් අල්ලල හිතින් මාවාගද්දි යි ඇයට තේරුනේ කෙල්ලට ඇස් පේන් නෑ කියලා... එහ් වෙලාවෙනම් ඇයට දැනුනේ කෙල්ල දැන පුදුම අනුකම්පාවක්...මොකද ආයුශ් කියන්නේ මොන වගේ කෙනෙක් ද කියලා ඇය හොදකාරවම දැනත් හිටියා..කෙල්ලගේ අම්මගේ හොදම යාලුවෙක් තමයි ආයුශ් ගේ අම්මා..එහ් හින්දම පොඩි කාලේ ඉදන් ම ඇය ආයුශ් ගැන දන්නවා. ...කොල්ලා එක එක දවසට එක එක කෙල්ලෝ එක්ක තමන් ගේ සැලෝන් එකට එන බව ඇයගේ සිහියට නැගෙද්දි මේ අසරන කෙල්ල ගැන ඇත්තට ම ඇය දුක් උනා...එතකොටයි ඇයට හිතුනේ ආයුශ් කෙල්ලව මැරි කරන්නේ ආදරෙකටනම් නෙමෙයි කියලා....

" ඉන්න මන් හෙල්ප් කරන්නම්... "

ඇය එහෙම කියලා කෙල්ලගේ කැකට් එක ඇන්දුවා...

sinhalaebooks.com

" මිස් එලියෙන් ඉන්න..මන් මේ මිස් ව අන්දලා කතා කරන්නම්.... "

ඇය කිවුවේ කෙල්ල එක්ක තනිවෙන්න ඕනි නිසා... අනිත් අයගේ දේවල් ගැන හොයන පුරුද්දක් ඇයට නැති උනත් ඇයට කෙල්ල ගැන දැනුන අනුකම්පාව නිසා ම කෙල්ල ට වචනෙකින් හරි උදව් කරන්න ඕනි උනා...

" හරි නෝනා..මන් නෝනට තේ එකක් හදන්නම්... "

කෙල්ලගේ අම්මා එහෙම කියලා කාමරෙන් සමුගද්දි ඇය කෙල්ලව පුටුවකින් වාඩි කරලා මේකප් එක දන්න පටන් ගත්තා...

ටික වෙලාවක් උනත් මේ ටික වෙලාවේ දෙන්නා හොදට ම ෆිට් උනා... කෙල්ල නෝනා කියලා කතා කරන නිසයි ඇය කෙල්ල ට තමන් ගේ නම කිවුවේ...

" මට #සරණී කියන්න...මන් ආයුශ් ගේ හොද ම යාලුවෙක්...අම්මිනම් කැමති නෑ මන් මේ සැලෝන් එක කරනවට...එයා කියන්නෙ ම ඔිස්ට්‍රේලියා ගිහින් ස්ටඩීස් කරන්න කියලා..ඒත් මන් මේ ෆීල්ඩ් එකට ආසයි....ඉතින් කියන්නකෝ...ඔයාට කොහොමද ආයුශ් ව හම්බුනේ...ආයුශ් ගේ අම්මියි අපේ අම්මිගෙ හොදම යාලුවෙක්...ඉතින් අපි පොඩි කාලේ ඉදන් ම ආයුශ්ව දන්නවා. .. "

ඇය තමන් ව අදුන්වලා දුන්නේ එහෙම..එහ් තමන් ගේ අම්මට පස්සේ ඇහුන ආදරීයම කටහඩ... ඒකයි නේහා ගේ ඇස් වලට කදුලු පිරුනේ... කෙල්ල එදා ඉදන් උන හැම සිදුවීමක් ම සරණී ට කියන්න ගත්තේ සරණී ගැන හිතේ දැනුන පැහැදීමෙන් වගේම හිතට දැනුන අසරනකමින්...

කතාව අවසානේ සරණී සුසුමක් හෙලුවේ වැලහින්නක් වගේ අඩා වැලපෙන කෙල්ලගේ අත් දෙකෙන් ම අල්ලගෙන...

" මට ඔයාගේ හිත හැදෙන්න බොරු කියන්න ඕනි නෑ නේහා... ආයුශ් හොද කෙනෙක් නෙමෙයි...එයාට කෙල්ලෝ ගොඩයි...ඊටත් වඩා එයා හොදට ම බොනවා.... නයිට් ක්ලබ් යනවා එතකොට තව "

කෙල්ල කියන්න ගියපු වචන ටික කටින් ගිල ගත්තේ කෙල්ලගේ අහිංසක මූන දිහා බලාගෙන එහ් වචන ටික කියන්න හිත දුන් නැති නිසා...

" ඇයි සරණී නැවැත්තුවේ...කියන්න...මගෙ ජීවිතේම අදින් විනාශ වෙනවා...ඊට වඩා දුකක් මට තව නෑ...මට දැන් ඕනි දෙයක්.... "

කෙල්ල කිවුවේ අත් දෙකෙන් කදුලු පිහදන ගමන්...

" මන් දන්න විදිහට ආයුශ්...අර තැන් වලටත් යනවා... ගිහින්...."

sinhalaebooks.com

" ඇති සරණී... මන් මහ පව්කාර කෙල්ලෙක්..මුලින් ම මට ඇස් දෙක නැතිඋනා...දැන් මුලු ජීවිතේම... මට ජීවත් වෙන්න තියන එකම හේතුව මගෙ අම්මා.... ආයුශ් මොන වගේ උනත් මට වැඩක් නෑ සරණී.... මන් එයාගේ වෙන්නේ කොලකෑලි ටිකකට විතරයි... "

" මට දුකයි කෙල්ලේ...උබ ගැන ගොඩක් දුකයි... ඒත් මට කරන්න කියලත් දෙයක් ඉතුරු වෙලා නෑ...ඒත් මන් එක දෙයක් පොරොන්දු වෙන්නම්..මොන දේ උනත් මන් ඉන්නවා නේහා..ලගින් ම ඉන්නවා..... ආයුශ් ඔහොම උනාට එයාගේ අම්මා තාත්ති එහෙම නෑ... එයාලත් යාව තති කරන් නෑ කෙල්ලේ... ආයුශ් ගේ නංගිත් ඔයාට ගොඩක් ආදරේ වෙයි... "

සරණී කිවුවේ කෙල්ලගේ ඔලුව අත ගාලා තමන් ගෙ ම සහෝදරියක් ට වගේ ආදරෙන්....

නේහා අහිංසක විදිහට හිනා උනා....

" ලෑස්ති වෙමු කෙල්ලේ...ආයුශ් ලේට් උනොත් මිනිස්සු මැද කියලවත් බලන් නැතුව කෑ ගහයි... "

සරණී එහෙම කියලා කෙල්ලගේ මේකප් එක් පටන් ගත්තේ නේහා මොහොතකට හිතේ තිබුන හැම දුකක් ම අමතක කරලා කෙල්ලගේ මූනේ අහිංසක හිනාවක් මැවෙද්දි.....කෙල්ල මේකප් නැතුවත් පුදුම තරම් ලස්සනයි.. අහිංසකයි...කවදාවත් මූනට මේකප් එකක් දාලා නැති කෙල්ල අද පෙනුනේ දෙව් දූවක් වගේ ලස්සනට... කෙල්ලගේ දුඹුරු පාට ඇස් දෙකට ම මැච් වෙන්න ඇදපු අයි ලයිනර් eye brows නිසා කෙල්ලගේ ඇස් දෙක තවත් කැපිලා පෙනුනා...

dark colors use කරලා මේකප් එක දැන්ම නිසා ද මන් ද කෙල්ලගේ අද අමුතු ලස්සනක්..කෙල්ලව dress කරල ඉවර වෙලා සරණී ටික වෙලාවක් කෙල්ල දිහා බලන් හිටියේ නේහා ගේ තිබුන අහිංසක ලස්සනට කෙල්ලටත් ලෝබ හිතුන හින්ද..

ඇත්තට ම කෙල්ලව එක පාර දකින කෙනෙක් ට කෙල්ලට ඇස් පේන් නෑ කියලා කියන්නත් බැරි තරම්... කෙල්ල දිහා ටික වෙලාවක් බලන් හිටියොත් ඇරෙන්න එක පාර දකින ඕන කෙනෙක් කෙල්ල ගැන එහෙම දෙයක් හිතන් නෑ...

" මාර ලස්සනයි කෙල්ලේ... "

සරණී ගේ වචන වලට නේහා අහිංසක විදිහට හිනා උනා විතරයි...

කෙල්ල නේහා ගෙ අම්මගේ සාරි එකත් අන්දලා නේහා ගේ අම්මයි තාත්තා යි නේහා හැමෝම එක්ක ආයුශ් ගේ ලගට එවනවයි කිවුව කාර් එකේ ආවා...

sinhalaebooks.com

වෙඩින් හෝල් එක ලගට එනවත් එක්ක ම එතනින් ඇහුනේ කනක් දෙදරා යන විදිහේ සද්දයක්... ඔව් ඇතුලේ ඩාන්ස් කරනවා...සරණී සද්දෙත් එක්ක ම අනුමාන කරපු දේ හරියට ම හරි....

නේහා වෙනුවෙන් හිටියේ නේහා ගේ අම්මයි තාත්තා යි විතරක් උනාට ආයුශ් වෙනුවෙන් හෝල් එක පිරෙන්න ම සෙනග.... ඔව් එහ් පිරිසෙන් බාගයක් ම ආයුශ් ගේ ටයිප් එකේම කොල්ලෝ... කෙලින් හිටගන්නවත් බැරි විදිහට බොන ටයිප් එකේ බේබද්දෝ...

නේහා එක පැත්තකින් සරණී ගේ අතත් අනිත් පැත්තෙන් අම්මගේ අතත් අල්ලගෙන ඇතුලට එද්දි ම හරියට මහ වැස්සක් වැහැලා පැවුවා වගේ එක පාරට ම හැමෝම නිශ්ශබ්ද උනා...

ඔව්...එකම හේතුව හැමෝම වශී කරන කෙල්ලගේ අමුතු ලස්සන... විනාඩි කීපයක් තිබුන එහ් නිශ්ශබ්දතාවය එක්ක ඊලගට ඇහුනේ කසුකුසුවක්...

හැමෝගෙම ඇස් නේහා දිහාට වශී වෙලා තියෙද්දි සරණී ට එක පාර ම බැලුනේ ආයුශ් දිහා..එහ් කොල්ලගේ ඇක්ශන් එක දැනගන්න කෙල්ලගේ හිතට දැනුන කෘතුහලය නිසා...

පුදුමයි..හිතේ මොන තරම් දේවල් තිබුනත් ඕනි ම කෙනෙක් වශී කරන නේහා දිහා ආයුශ් ගේ තිබුනේ හිස් බැල්මක්... කට කොනකින් හිනාවක්...ආදරය සෙනෙහස නම් ආයුශ් කවදාවත් නොදන්න දෙයක්...ඒත් එහ් බැල්මේ පුංචි ම අනුකම්පාවක් වත්... නෑ....එහ් හිත නම් ගලක්... කිසිම හැගීමක් දැනීමක් නැති....

ආයුශ් කෙල්ල ලගට ඇවිත් කෙල්ලගේ අතින් අල්ල ගත්තේ කෙල්ලගේ ඇගිලි වලට හිතා මතාම රිද්දමින්...

" බොරුවට චාරිත්‍ර කරන්න ඕනි නෑ ..කරත් පේන්නෙත් නැතේ.... "

හැමෝට ම ඇහෙන්න ආයුශ් කිවුව වචන ටිකට එතන හිටපු හිතක් පපුවක් තියන හැමෝගෙ ම හිත් පිච්චිල ගියා.. ඒත් කාටවත් කොල්ලට විරුද්ධ වෙන්න තරම් හයියක් තිබුන් නෑ...

කොල්ලා කෙල්ලව ඇදගෙන ගියේ පොතේ අත්සන් කරන්න... අත්සන් කරන්න කලින් අර කියන වචන ටික ඇරෙන්න මේ කසාදේ කිසිම චාරිත්‍රයක් උනේ නෑ...

අත්සන් කරාට පස්සේ කොල්ලා කරේ නේහා ව පැත්තක දාලා තමන් ගේ බේබදු යාලුවොත් එක්ක බීපු එක... කෙල්ල හිටියෙ පැත්තකට වෙලා... ඒත් ඕන ම නරක කෙනෙක් ලග හොද අතට ගන්න මහන්සි වෙන කෙනෙක් ඉන්නවා නම්...ආයුශ් ලග එහෙම හිටියේ මලීශ්...ආයුශ් ටිකක් හරි අහන්නේ මලිශ් ගේ කීම විතරයි.. කොල්ලා ගේ කටේ බලේට ම ආයුශ් ට බොන්න හම්බුන් නෑ... කොල්ලා බිවුවා..නැත්තේ නෑ...ඒත් කෙලින් හිටගන්න බැරි වෙන්න බිවුවේ නෑ...

sinhalaebooks.com

මේ කසාදෙට දෙවනි දවසක් නෑ... ආයුශ් කලින් ම මේ ගැන දැනුවත් කරලා තිබුනේ...

හවස් වෙන්න වෙන්න කෙල්ල වගේ ම කෙල්ලගේ අම්මත් හිටියේ පපුව පිච්චෙන තරම් වේදනාවෙන්...බයෙන්... එහ් අද ආයුශ් එක්ක එක රූම් එකේ තනිවෙන්න ඕනි නේද කියන එක මතක් වෙලා...

කෙල්ලගේ අම්මා විනාඩියෙන් විනාඩියට නේහා ව ආරක්ෂා කරලා දෙන්න කියලා දෙවියන් ට කිවුවා...

පැයෙන් පැය ගෙවිලා ගියා...ඔව් එහ් මොහොත උදා උනා...උනුවෙන හදවත් තියෙන හැමෝගෙම හදවත් නේහා ගැන අනුකම්පාවෙන් පිරිලා...

කෙල්ල අම්මට වදින ගමන් අම්මගේ කනට කරලා කිවුව වචන ටික කෙල්ලගේ අම්මගේ රිදුම් දෙන වේදනාව තවත් වැඩි කරා...

" බය වෙන්න එපා අම්මා...මන් හොදින්..මට මොකුත් වෙන් නෑ... "

ආයුශ් ගැන හොදකාරවම දැනගෙනත් කොහොමද අම්මා කෙනෙක් හිතහදාගන්නේ...ඇය හිතින් වගේම පිටතිනුත් හඩා වැලපුනා... ඒත් නේහා ගේ ඇස් වලින් අර අහිංසක හිනාව ඇරෙන්න අම්මගේ දුක අංශු මාත්‍රයකින් වත් වැඩිකරන එක ම එක කදුලක් වත් වැටුන් නෑ...

ආයුශ් කෙල්ලව කාර් එකට නග්ගයෙන යන දිහා කෙල්ලගේ අම්මා වගේම ආයුශ් ගේ පවුලේ අයත් සරණි ත් බලන් හිටියේ හිත් වේදනාවෙන්... ඒත් කෙල්ලගේ තාත්තා... තේරෙන් නෑ තාත්තා කෙනෙක් ට මෙහෙම වෙන්න පුලුවන් ද කියලා..අදහන්නත් බෑ එහ් හිතේ එහ් මූනේ හැඟීම්...එක ම එක දෙයයි එහ් මූනෙන් පෙනුනේ...ලොකු බරකින් නිදහස් උන සතුට එහ් හිත උපරිමේට ම විද ගත්තා...

කාර් එක ඇතුලේ දියෙන් ගොඩ දාන් ම මාලුවෙක් වගේ ගැහි ගැහී හිටපු නේහා දිහා කොල්ලා බැලුවේ හිස් බැල්මකින්..වෙඩින් එක දවසේ කියලා නෑ..සාක්කුවෙ තියන සිගරට් එක අදත් එහ් විදිහමයි...

සාක්කුවෙන් සිගරට් එකක් අරන් බොන්න ගත්තේ හිතා මතාව සිගරට් එකේ දුම නේහා ගේ නහය ලගට ලන් කරලා... කෙල්ලට එහ් සැරට ම කැස්සක් එද්දි ආයුශ් ගේ හිතට දැනුනේ කුරිරු සතුටක්....

කෙල්ල තමන් ගේ දෝතින් ම මුව වහා ගත්තේ ඉවසන්න ම බැරි තැන...කදුලු ආවත් එහ් කදුලු ආයාසයෙන් ම පාලනය කරගත්තේ මේ වගේ තිරිසනෙක් ලග අඩා වැලපෙන්න කෙල්ලගේ හිත කොහොමටවත් ම ඉඩ නොදුන්න නිසා...

sinhalaebooks.com

කාර් එක හොටෙල් එක ලඟින් නතර වෙද්දි ආයුෂ් නේහා ගේ අතිනුත් අල්ලගෙන කාර් එකෙන් බැස්සා...ආයුෂ් වෙන් කරගෙන තිබුන කාමරය තිබුනේ උඩු මහලේ...ලිෆ්ට් එකේ යන්න පුලුවන්කම තිබුනත් කොල්ලා හිතා මතාම පඩිපෙල දිගේ ගියේ කෙල්ලව මහන්සි කරවන්න... කෙල්ලගේ අතින් අල්ලගෙන පඩිපෙල දිගේ ගියත් කෙල්ලගේ කකුල පැටලෙන වාරයක් වාරයක් ගානේ කොල්ලා කුරිරු සතුටක් වින්ද..

පඩිපෙල නැගලා ඉවර වෙද්දි කෙල්ල හති දනවා..ආයුෂ් එහ් දිහා බලන් හිටියේ කිසිම හැඟීමක් නැතුව...

" වරෙන්... "

අවසාන පඩිය නගිනවත් එක්ක ම ආයුෂ් කෙල්ලගේ අත තද කරලා අල්ලගෙන කිවුවේ වේගවත් අඩි තබමින්...

ආයුෂ් ගියපු වේගෙට කෙල්ලව කොහෙට හරි තල්ලු කරලා මැරුනට පස්සේ අනිත් අයට වැටුනා කියලා කියයි ද කියලා කෙල්ලගේ හිතට සදුරන බයක් දැනුනා..

ඒත් දොරක් අරින සද්දයක් ඇහුන නිසා කෙල්ලගේ හිතට තත්පර ගානකට සැනසීමක් දැනුනේ මේ කාමරය වෙන්න ඇති කියලා හිතෙද්දි... ඒත් ඊලග තත්පරේ එහ් හිතම පිච්චිලා ගියේ මේ කාමරය ඇතුලෙදි මොන වගේ දේකට මූන දෙන්න වෙයි ද කියලා හිතෙද්දි...

honeymoon එකක් උනාම රූම් එක මොන තරම් නම් ලස්සනට සරසනවද..ඒත් මේ රූම් එකේ කිසිම වෙනසක් තිබුනේ නෑ...සාමාන්‍යය හොටෙල් රූම් එකක්..වෙනසකට තිබුනේ ඇදේ දෙපැත්තේ ලොකු ඉටිපන්දම් දෙකක් ගහලා තිබුනා.. එහ් ඉටිපන්දම් දෙක නිසා ලයිට් නැතුව උනත් මුලු කාමරය ම අලෝකමත් උනා...

" රූම් එක වෙනස් කරේ නෑ... වෙනස් කරා කියලා පේන එකක් ද..."

ආයුෂ් ගේ එහ් වචන කෙල්ලගේ හිත කෑලි කෑලි වලට කඩලා බිදලා දැන්මා... වරින් වර ආයුෂ් තමන් ගේ දුවර්ල ම තැන බලලා පහර එල්ල කරද්දි කෙල්ල හිතින් අන්තයට ම කඩන් වැටෙනවා...

" මහන්සියි... "

තාමත් කෙල්ල දොර ලගට වෙලා ඉද්දි කොල්ලා කෙල්ලගේ අත අතඇරලා ඇදට වැටෙන ගමන් කිවුවා...

" ඔතන හිටගෙන ඉන්නෙ මොකද..එනවා..."

sinhalaebooks.com

ආයුශ් කිවුවේ මුලු කාමරයෙම එහ් කටහඩ දෝන්කාර දෙද්දි... එහ් වචන වලට කෙල්ල ගැස්සුනා... කෙල්ල තමන් ගේ පය ඉස්සරහට තියලා යන්න හදද්දි ම කෙල්ලගේ කකුලට පැගුනේ ආයුශ් මොහොතකට කලින් බීලා ඉවර කරලා බිමට දැන් ම සිගරට් එක...

" ආ..ව්..."

කෙල්ල කකුල අල්ල ගත්තේ දැනුන වේදනාවට..කෙල්ලගේ යටි පතුල පිච්චෙන්න ඇති...ටිකක් නෙමෙයි ගොඩක්...ඒත් විනාඩි කීපයක් පිච්චුන කකුල අල්ලගෙන හිටපු කෙල්ල ආයෙත් අඩිය තිබ්බා... එක අතක් ඉස්සරහට දිග් කරගත්තේ මොනවගෙ හරි හැප්පෙන්න කලින් දැනගන්න පුලුවන් නිසා...ඒත් කාමරේ තිබුන දේවල් වල කෙල්ල හැප්පෙන්න ගත්තා.. ඉටිපන්දම් එළියෙන් මේ හැමදේම බලන් හිටපු ආයුශ් ට දැනුනේ සතුටක්...එහ් හිතින් ප්‍රාර්ථනා කරේ තවත් තැන් වල උබ හැප්පියන්...තව හැප්පියන් කියලා....

ඒත් අවසානේ කෙල්ල ඇදේ එක පැත්තක් අල්ලගෙන ඇදේ එක කොනකින් වාඩි වෙද්දි ආයුශ් ගේ මූනේ තිබුනේ පරාජිත හැගීමක්..

ඒත් ආයුශ් ගේ ඊලග වචන ටික නම් කෙල්ලගේ හිතට ගෙනාවේ පුදුම සැනසීමක්...

" කැමතිනම් වොශ් එකක් දන් ඇවිත් නිද ගන්නවා..නැත්නම් ඔහොමම නිද ගන්නවා..මන් නිදි.... "

කෙල්ල හිතුවෙ අද ආයුශ් කෙල්ලව නොමරා මරයි කියලා... ඒත් මේ වචන එක්ක කෙල්ලට සැනසුම් සුසුමක් පිට වුනේ ඉබේමයි...

" ඇයි උබ හිතුවද මන් උබ එක්ක...අද අරහෙම... ඉදියි කියලා...උබට තිබ්බට මට එහෙම මොලේ අමාරුවක් නෑ.. උබ වගේ මෙලෝ හත්සිලව්වක් පේන් නැති එකියක් එක්ක කොහෙද ආතල් එකක්...මන් ඒක මටවත් මතක නැති තරම් කරලා තියෙයි...උබ වගේ ගොඩේ කැල්ලක් එක්ක නෙමෙයි... පට්ට කෙල්ලො ටිකක් එක්ක... මට ඕනි උබෙන් පලිගන්න..උබේ ජීවිතේ විනාශ වෙනවා බලාගෙන ඉදලා සතුටු වෙන්න...හැබැයි එහෙම කියලා උබ වගේ එකියක් එක්ක නිදගෙන මගෙ ආතල් එක නැති කරගන් නෑ...දැන් නිද ගනින් %&$* "

මේ වචන ටික..බිරිදකට අහන්න තියන හිත උපරිමේට ම රිද්දන වචන ටික වෙන්න ඇති... තමන්ගේ සැමියගේ කටින් වෙන ගෑනු එක්ක නිදගෙන හිටියා කියලා අහන්න පුලුවන් මොන බිරිදට ද... ඒත් විශ්වාස කරන්න..මේ නේහා ආයුශ් ගේ කටින් අහපු ලස්සන ම වචන ටික..

" උබ වගේ ගෑනියක් එක්ක නිදගෙන මගෙ ආතල් එක නැති කරගන් නෑ... "

එහ් කියන්නේ මන් එහ් තරම් පව් කරලා නෑ... මේ තිරිසනා අතින් එහෙම වෙන්න තරම්...

කෙල්ල හිතුවෙ හිතින් දස දහස් වාරයක් සතුටු වෙමින්...එහ් එක්කමයි කෙල්ලගේ ඇස් දෙකත් පිය උනේ... එහ් අද ඉදන් ගෙවන්න වෙන ජීවිතේ මොන වගේ එකක් උනත් තමන්

sinhalaebooks.com

ගොඩක් ම බයෙන් හිටපු දේ ආයුශ් ගේ අතින් වෙන් නෑ කියලා තහවුරු වෙද්දී... එද පාරෙදී මහ ජරා විදිහට කෙල්ලට බැන වැදුනත් කොල්ලා තමන් වගේ කෙනෙක් එක්ක යහන් ගත වෙන්න කැමති නෑ කියලා දැනෙද්දි කෙල්ලට දැනුනෙ වචන කරගන්න බැරි හැඟීම් ගොන්නක්..... එත් එහ් ඇස් පියවිලා තිබුනේ තත්පර ගානක් විතරයි..

කොල්ලා බලන් උන්නේ කෙල්ලගේ මූනේ තියෙන මේ සැනසිලි දයක හිනාව දිහා..කොල්ලා කවදවත් ම නේහා ව මෙහෙම් බලාපොරොත්තු උනේ නෑ...නේහා ගේ මූනේ හිනාව තවත් තත්පරයක් වත් තියෙනවා දකින්න අකමැති ඔහු ඇදේ එක පැත්තක ගහලා තිබුන ඉටිපන්දම තමන් ගේ අතට ගත්තේ නේහා ට ටිකාක් විතර ලන් වෙමින්...

ඊලගට උනුවුන ඉටිපන්දම් ඉටි කෙල්ලගේ ගෙලට වැටෙන්න අල්ලන් හිටියේ කට පුරා හිනාවකුත් එක්ක...

රස්නියට දැනුන වේදනාවත් එක්ක කෙල්ල ගැහගෙන නැගිට්ටේ බෙල්ලත් එක අතකින් අල්ලගෙන... ආයුශ් කාමරය ම දෙවනක් වෙන්න හිනා වෙන්න ගත්තේ කෙල්ලගේ ඉකි බිදුම් හඩ නැසෙන තරමට...

" උබ..උබ හැමදම ඔහොම අඩන්න ඕන...හැමදම..එක පාරක් හරි උබ හිනා වෙලා තිබ්බොත් උබට දවස් ගානකට අඩන්න දෙයක් කරනවා මන්..මතක තියා ගනින්..උබ වැඩිය උඩ පනින්න ආවොත් මන් මගෙ ආතල් එක පැත්තකින් තියලා අර උබ බයෙන් හිටපු දේම කරලා දනවා..ඒකට මට තත්පර 5ක් වත් යන් නෑ... එහ් හින්ද හැමදම අඩාගෙන ම හිටපන්....තේරුනා ද... "

ආයුශ් කෙල්ලගේ නිකට මිරිකලා අහද්දි කෙල්ල ඉකි බිදුම් අතරින් ම ඔලුව හෙල්ලුවා...කෙල්ලගේ ඇහින් වැටෙන හැම කදුලක් පාසාම ආයුශ් ගේ හිතට ගෙනාවේ අසීමිත සතුටක්...මේ වෙද්දි ආයුශ් මේ ලෝකේ දකින්න ආසම කරන දේ කෙල්ලගේ ඇස් වල කදුලු බවට පත් වෙලා ඉවරයි...
උදේ පාන්දර ම කොල්ලා ඇහැරුනේ ඇගින් දැනුන වෙහෙසත් එක්ක..ඊයේ රෑ කොල්ලට තිබුන ලාවට වෙරි ගතිය මේ වෙද්දි හොදට ම නැති වෙලා තිබුනා... කොල්ලා ඇස් දෙක ඇරලා ඇදේ එහා පැත්තේ හිටපු නේහා දිහා බැලුවේ හිස් බැල්මකින්...

වෙඩින් සාරි එක පිටින් ම නින්දට වැටුන කෙල්ලගේ බෙල්ලේ ඊයේ රෑ වැටුන ඉටිපන්දම් ඉටි නිසා තාමත් රත් පැහැ වෙලා තිබුනා...තැනින් තැන එහ් රත් පැහැයට හුරු තුවාල වල තාමත් ඉටි පන්දම් ඉටි එහෙම්ම මයි... කොල්ලට දැනුනේ අසීමිත සතුටක්... කෙල්ලගේ මූන දිහා වත් නොබලපු කොල්ලා රත් පැහැ වෙලා තියන කෙල්ලගේ බෙල්ල දිහා බලන් හිටියේ සතුටට එහ් ඇස් පවා දිස්නේ දෙද්දි...

කොල්ලා කෙල්ල නිදගෙන ඉද්දිම වොශ් රූම් එකට ගියේ බෑග් එකේ තිබුන ඇදුමකුත් අතට අරන්...ඊයෙ රෑ ඇදුම පිටින්ම තාමත් හිටපු කොල්ලට ඕනි උනේ ඉක්මනට වොශ් එකක් දගන්න...වොශ් රූම් එකට ගිහින් පැයක් වගේ කාලයක් අරන් කොල්ලා වොශ් එකක් දගත්තේ තිබුන මහන්සියත් නැත්තට ම නැති වෙලා යද්දි...

sinhalaebooks.com

ඇඳන් හිටපු ඇඳුම් වොශ් රූම් එකේ ඔහේ දාලා කොල්ලා රූම් එකට ආවේ ටවල් එක පිටින්..වොශ් රූම් එකට අරන් ගියපු ටී එක හිර හිත්ද කොල්ලා ආවේ වෙන ටී එකක් ඇඳගන්න හිතාගෙන...

කන්නාඩිය ලගට ඇවිත් වතුර බේරෙමින් තිබුන කොන්ඩේ ඇගිලි තුඩු වලින් ගසලා විනාඩි දෙක තුනක් කන්නාඩියෙන් පෙනුන තමන් ගෙ ම මූන දිහා බලන් හිටියේ හිස් බැල්මකින්... ඉර එලිය මූනට වැටිලා තිබුන නිසා ම කොල්ලගේ සුදු මූන තවත් ලස්සනට පෙනුනා... දුඹුරු පාට ඇස්, ලා රෝස් පාට දෙතොල් කොල්ලට ගෙනාවේ අමුතුම ලුක් එකක්..ආයුශ් ගැන නොදන්න කෙනෙක් ට කොල්ලා මේ වගේ නපුරු ගතිගුණ තියන කෙනෙක් කියලා හිතන්නවත් බැරි තරම්... ඒත් පෙනුමෙන් ගතිගුන මනින්න බෑ කියනවා වගේ ආයුශ් ට තිබ්බේ පිට පෙනුමට හාත්පසින් ම වෙනස් ගතිගුන ටිකක්...

කන්නාඩියෙන් මූන බලන් හිටපු කොල්ලගේ ඇස් ඉබේම යොමු උනේ කන්නාඩියේ පහලට වෙන්න පෙනුන නේහා දිහාට... කෙල්ල හිටියේ තාමත් තද නින්දේ... එහ් එක්කමයි කොල්ලගේ හිතට තරහක් ආවේ...

" උබ තාම නිදිද %&$&...හිටපන් උබට කරන්නම් හොද වැඩක්... "

ආයුශ් තමන් ට ම කියාගෙන වොශ් රූම් එක ඇතුලට ගිහින් එලියට ආවේ උනු වතුර දාපු භාජනෙකුත් එක්ක... කොල්ලා දෙපාරක් නොහිතා අතේ තිබුන උනුවතුර කෙල්ලගේ ඇග පුරාම වැටෙන්න අල්ලන් හිටියේ කිසිම හිතක් පපුවක් නැතුව..ඇගට දැනුන රස්නෙත් එක්ක කෙල්ල කෑ ගහගෙන ම ඇදෙන් නැගිට්ටේ සිරුර පුරාම දැඩි වේදනාවක් දැනෙද්දී... ඊලගට කෙල්ල පිච්චිලා රිදුම් දෙන ඇග අත් වලින් අල්ලන්න ගත්තේ ඉකි ගගහා...කෙල්ලගේ ඉකිය නෑසෙන තරමට ම කොල්ලගේ හිනාව කාමරය පුරාම දෝන්කාර දුන්නා...

ඒත් කෙල්ල වචනයක් වත් නොකියා ඉකි ගගහා අඩපු එක විතරයි කරේ...අඩුම තරමේ ඇයි මෙහෙම කරන්නේ කියලවත්, මෙහෙම කරන්න එපා කියලවත් කෙල්ල ආයාචනා කරේ නෑ... හිතක් පපුවක් නැති කෙනෙක් ලග වැද වැටිලා තේරුමක් නෑ කියලා කෙල්ල දැනන් උන්නා...

" මීට පස්සේ උබ මට කලින් ඇහැරෙන්න ඕනි... තේරුනා ද උබට...ආයේ පාරක් මෙහෙම උනොත් මන් මීට වඩා දෙයක් කරනවා... "

කොල්ලා කිවුවේ උනුවතුර වැටිලා පිච්චිලා තිබුන කෙල්ලගේ අතක් තවත් තදින් මිරිකලා...කෙල්ලගේ අදෝනාව මුලු කාමරය පුරා ම පැතිරෙද්දී.....

කෙල්ල පිලිතුරු විදිහට අදන් කරේ ඔලුව හොල්ලපු එක...

" දැන් ගිහින් වොශ් එකක් දගනින්..අඩලා මෙතන දවසම මූසල කරන් නැතුව...අහ් වොශ් රූම් එකේ මගෙ ඇඳුම් ඇති..ෙහ් ටිකත් නමලා ගන්නවා..ගෙදර ගිහින් වොශ් කරමු... "

sinhalaebooks.com

කොල්ල කලින් තරම්ම නැතත් දැඩි ස්වරයෙන් කියද්දි කෙල්ල මුලු ඇගෙන් ම දැනුන වේදනාවත් එක්කම නැගිටලා වොශ් රූම් එක කොයි පැත්තෙද කියලා දන්නේ නැති උනත් කොල්ලගේ අහන්න බැරි කමට ම ඔහේ ඇවිද්දේ බිත්තියක් අහු වෙනකම්..එතකොට බිත්තිය දිගේ අත ගාලා වොශ් රූම් එකේ දොර හොයා ගන්නවා කියලා කෙල්ල හිතා ගත්තා... ගෙදරදිත් කෙල්ල අම්මා වත්තේ හිටපු ගොඩක් වෙලාවට පාර හිතා ගත්තේ එහ් විදිහට...

ඒත් කරුමෙට ම කෙල්ල ගියේ වැරදි පැත්තට...

" ඔය පැත්තේ නෙමෙයි ඕයි..මේ පැත්තේ වොශ් රූම් එක..."

කොල්ලා කිවුවේ බෑග් එක අදිමින් වෙන ටී එකක් හොයන ගමන්... කෙල්ල ආයෙත් අතින් පැත්ත හැරෙද්දි ආයෙත් කොල්ලගෙන් ලැබුනේ කලින් පිලිතුරමයි....

ඇත්තටම කෙල්ල හරි පැත්තට දෙපාරක් ම යන්න හැදුවත් කොල්ලා හිතා මතාම ඒක නැවැත්තුවේ කෙල්ලගේ මේ අසරනකමින් පවා කොල්ලා කුරිරු සතුටක් ලබපු හින්ද... තව ටිකක් ජෙල්ලව මේ විදිහට ම නටවලා වොශ් රූම් එක පෙන්නනවා කියලයි කොල්ලා හිතා ගත්තේ ..

ඒත් කෙල්ල උපතින් ම අන්ද නොවුනත් අවුරුදු ගානක් ඇස් පේන් නැතුව ඉදලා කෙල්ලට අඩි සද්දෙන් අඩි ගානෙන් පවා යන්න ඕනි තැන ගැන අවබෝධයක් තිබුනා... එහ් හින්ද ම ආයුශ් තමන් එක්ක සෙල්ලම් කරනවා කියන දේ කෙල්ලට තේරෙන්න වැඩි වෙලා ගියේ නෑ... එහ් හින්ද මයි කෙල්ල ආයුශ් කියන දේ ට ඇහුම්කම් නොදී තනියම වොශ් රූම් එක හොයා ගන්නවා කියලා තීරනය කරේ...

කෙල්ලගේ වෙනස තේරුන නිසාද මන්ද කොල්ලා හිටියේ ඇස් පවා තරහට රතු කරගෙන...

" උබ... උබ මන් කියන දේ විතරයි අහන්න ඕනි... උබ ආයේ මගෙ වචනෙන් පිට දෙයක් කරොත් මන් උබව ඉතුරු කරන් නෑ...මන් මොනවා කිවුවත් හරි උනත් වැරදි උනත් උබ පිලිගන්න ඕනි හරි කියලා.... "

එහ් එක්ක ම කෙල්ලගේ කම්මුලට වැදුන පහරත් එක්ක ආයුශ් කිවුවේ කෙල්ලගේ අතින් ඇදලා වොශ් රූම් එකට තල්ලු කරද්දි.....

කෙල්ල නොවැටි බේරුනේ වාසනාවකට වගේ... වැටුනා නම් කෙල්ලගේ ඔලුව ඉතුරු වෙන එකක් නෑ..මොකද වොශ් රූම් එකෙත් හොදට ම වතුර...

කෙල්ල අඩ අඩ ම වොශ් රූම් එකේ තැනින් තැන දලා තිබුන කොල්ලගේ තෙත ඇදුම් එකතු කරන්න ගත්තේ බිම දනගහගෙන...නොවැටි බේරෙන්න කෙල්ලට තිබුන එකම ක්‍රමය ඒක...

sinhalaebooks.com

ඊලගට කෙල්ල සිත්ත් එක හොයා ගත්තේ බොහොම අමාරුවෙන්.... කොන්ඩ කටු ටිකයි සාරි එකයි ගලවන්න කෙල්ලට පැයකට වඩා ගියා.... ඊලගට ඇදුම් ටිකත් පුලුවන් විදිහට නමලා සිත්ත් එක උඩින් ම තිබ්බා... මොකද ශවර් එක ඇරුනම මේ ඇදුම් ඔක්කොම තෙමෙයි කියලා කෙල්ලට බය හිතුනා.... කෙල්ල වොශ් රූම් එකේ බිත්ති පුරාම අත යවලා ශවර් එකත් හොයා ගත්තා.... ඊලගට ඇස් දෙක තද කරලා පියාගෙන ශවර් එක ඇරියේ පිච්චිලා තියන ඇගට වතුර වැටෙද්දි දැනෙන වේදනාව කෙල්ල හොදට ම දන්න නිසා..

ඇගෙන් පුදුම විදිහට වේදනාවක් දැනුනත් කෙල්ල හිත ගලක් කරගෙන එහ් හැමදේම ඉවසුවා... ඊත් ඇස් පියා ගත්ත පලවෙනි මොහොතෙම කෙල්ලගේ සිහියට ආවේ තමන් ගේ රත්තරන් අම්මව.... මේ වෙනකම් තමන් ව මලක් වගේ පරිස්සම් කරපු හැටි කෙල්ලට එකින් එක මතක් වෙන්න ගත්තේ වේදනාවට ඇඩුව දුකටත් වඩා අම්මව මතක් වෙලා වැටුන කදුලු නිසා කෙල්ලට මහ ලොකු අසරනකමක් දැනෙද්දි...

අඩ අඩ ම ශවර් එක යටට වෙලා ටික වෙලාවක් උන්න කෙල්ලට එතකොටයි මතක් උනේ ආයුශ් කිවුව ගමන් වොශ් රූම් එක හොයාගෙන ආවත් එක ඇදුමක් වත් අඩුම ටවල් එකවත් අරන් ආවේ නෑ නේද කියලා... කෙල්ලට දැනුනේ තමන් ගැන ම තරහක්.... ආයුශ් ගෙන් උදව් ගන්න කෙල්ලගේ හිත කොහොමටවත් ම කැමති උනේ නෑ...

කෙල්ල ගලවලා දාපු සාරි එක ආයෙත් අදින්න ගත්තේ එහ් නිසා...ඇස් ප්‍රෙන් නැති උනාට කෙල්ලට තමන් ගේ වැඩ ටික හරි අපූරුවට කරගන්න පුලුවන් උනා..කෙල්ල මේ සාරියක් ඇදපු පලවෙනි වතාවත් නෙමෙයි... එහ් නිසා හිතුවට වඩා ඉක්මනට කෙල්ලට සාරි එක ඇදගන්න පුලුවන් උනා.. ඊත් යටට ඇදපු සායෙන් කොන්ඩෙයි තෙත ඇගයි පිහඹ නිසා සාරි එක ඇතුලට වෙන්න තෙත ගතියක් දැනුනත් ආයුශ්ගෙන් උදව් ගන්න නොලැබුන එක ගැන කෙල්ලට දැනුනේ සතුටක්....

කෙල්ල එලියට එද්දි කොල්ලා හිටියේ ලැස්ස්තිත් වෙල කෙල්ලට බනින්න බලාගෙන... ඊත් කෙල්ල ලැස්ති වෙලා ඉන්නවා දකිද්දි කොල්ලට එක පාරම පුදුම හිතුනා...

" තමුසේ ලැස්තිත් උනාද...ඊයේ ඇදුම ම ද ඕයි මේ..ශිට්...ඊයේ දවසනත් ඇදලා.. ඔව් ඉතින්.. තමුසෙලා වගේ ගොඩේ ගෑනුන්ට කොහෙන්ද පිරිසිදුකමක්...ඇස් පේන් නැති උනාට මේ සාරි එකනම් ඇදගෙන තියෙන්නේ..ඔය වගේද දන් නෑ උබගේ අනිත් දේවලුත්.. දෙකට ගනින්න බෑ වගේ හිටියට... "

කොල්ල කට කොනකින් හිනා වෙලා කියද්දි කෙල්ල එහ් වචන් නෑසුන විදිහට කොල්ලගේ ඇදුම් ටික දිග් කරේ තමන් ගැම චරිත සහතික දෙන්න ආයුශ් ට කිසිම අයිතියක් නැති නිසා... මොකද මේ කසාදේ කොල කැල්ලකටයි බල පුලුවම්කාරකමටයි යට උන එකක්..ඊට එහා බැදීමක් මේ කසාදේ නෑ...

කෙල්ල දුන්න ඇදුම් ටික කොල්ලා බෑග් එකට දාගෙන කෙල්ලගේ අත බලෙන් ම අල්ල ගත්තේ කෙල්ලට රිදෙන තරමට...

sinhalaebooks.com

" දැන් යමන් ගෙදර... උබත් එක්ක මොන honeymoon ද... හැබැයි ගියා ම අම්මට හරි තාත්තාට හරි නංගිට හරි වෙන කිසිම කෙනෙක් ට හරි මෙහෙ උන දේවල් කියලා තිබ්බොත් උබ ජීවත් වෙන අන්තිම දවස අද කියලා මතක තියාගනින්.."

කොල්ලා කෙල්ලගේ කම්මුල මිරිකලා කියද්දී සුපුරුදු විදිහට ම කෙල්ල ඔලුව හෙල්ලුවා..ඒත් කෙල්ලගේ හිතට යාන්තමට සතුටක් දැනුන..එහ් ගෙදර යනවා කිවුව නිසා... මොකද ආයුශ් ගේ අම්මා වත් තාත්තා වත් ආයුශ් වගේ තිරිසනෙක් නෙමෙයි කියලා කෙල්ල දැනන් උන්නා...

ඒත් රුම් එකට ඇවිත් විනාඩි කීපයක් යද්දී ආයුශ් ගේ නංගි වහලා තිබුන දොරට තට්ටු කරේ කොල්ලව තරහා ගස්සමින්...මොකද කොල්ලා හිටියේ ෆෝන් එකත් අතේ තියන් කා එක්කදෝ ලොකු චැට් එකක..කෙල්ල නම් ඇදට වෙලා ඔහේ බලාගත්තු අත බලාගෙන හිටියා විතරයි...

" අයියා...දොර අරිනවකෝ... "

" මොකක් ද හලෝ..මන් වැඩක්.."

" ඔයාව නෙමෙයි..අක්කිව බලන්න ආවේ... "

" එයත් වැඩක්..."

" අනේ මේ අයියා... විනාඩියෙන් යන්නම්... "

කෙල්ල කිවුවේ නේහා එක්ක මේ තමන් ට කතා කරන්න ලැබෙන පලවෙනි අවස්තාව නිසා හරි ආසාවෙන්... පායවී...කෙල්ල දැන් හුග කාලෙක ඉදන් තනියම ම හැදිලා කෙල්ලට නේහා ආවම දැනුනේ නිම් හිම් නැති සතුටක්..මොකද ආයුශ් කෙල්ලගේ අයියා උනා කියලා කෙල්ල ගැන මතක ඇති කාලෙක හොයලා බැලුවෙවත් අඩුම හරියට කතා කරපු දවසක් වත් කෙල්ලට මතක නෑ....

ආයුශ් ගේ නංගිගේ කටහඩ ඇහිලා නේහා ගේ මූනේ හිනාවක් මැවෙනවා ආයුශ් බලාගෙන...

" මන් උබ ගැන පස්සේ බලාගන්නම්..උබ හිනා උනා නෙහ් එහෙනම්... %&$* "

නේහා ගේ හිනාව දැක්ක ගමන් ම කොල්ලා හිතින් හිතාගෙන දොර ඇරියේ පායවී ටත් රවාගෙන...

ඒත් කෙල්ල කොල්ලගේ තරහා තබ සතේකට ගනන් ගන් නැතුව ඇද උඩ හිටපු නේහා ලගට ආවේ අඩියට දෙකට...

" අක්කි...අනේ ඔයා...සෝ කියුට්...මට අල්ලලා මිරිකන්න හිතෙනවා... "

sinhalaebooks.com

කෙල්ල නේහා ගේ අත් දෙකෙන් ම අල්ලගෙන කිවුවේ හුරතල් විදිහට...ඒත් නේහා කිවුව කතාවට නම් කෙල්ලගේ පපුව පිච්චිලා ගියා...

" මට ඔයාව පේන් නැතේ...ඔයත් ගොඩක් ලස්සන ඇති..කටහඩනම් ගොඩක් ලස්සනයි... "

" අක්කි තරම් නෑ... "

කෙල්ල වෙනසක් නොපෙනෙන්න කතා කරත් පායචී ට කෙල්ල ගැන දුක හිතුනා..

" ඔයාගේ නම මොකක් ද නංගි... "

ආයුශ් කෙල්ල එක්ක කතාවට ගියා කියලා කෑ ගහයි කියලා නේහා ට හිතුනත් කෙල්ල පායචී එක්ක හොදට කතා කරේ ආයුශ් ගැහුවොත් ගුටි කනවා කියලා හිතාගෙන... ඒත් යකා කියන තරම් කලු නෑ කියනවා වගේ හිතපු තරම් තරහක් කොල්ලට ගියපු බවක් පෙනුනේ නෑ..කොල්ලා උන්නේ ටේබල් එකේ වාඩි වෙලා නේහා ගෙයි නංගිගෙයි කතාවට ඇහුම්කන් දෙන ගමන්...

" මන් පායචී අක්කි..හැමෝම කියන්නේ #පායා කියලා... "

" ෂා...හරි ලස්සන නමක්.. "

නේහා කිවුවේ එහ් ඇස් පුංචි කරලා හිනා වෙලා... පායා බලන් උන්නේ කෙල්ලගේ දුබුරු පාට ඇස් දෙක දිහා...එහ් ඇස් වල ජීවයක් නෑ කියලා එක පාරම කියන්නත් බැරි තරම්...ඒලගට කෙල්ල මොහොතක් නේහා ගේ අහිංසක මූන දිහා බලන් ඉදන් එක පාර ම තමන් ගේ අයියා දිහා බැලුවේ මොකක්දෝ එක පාර ම මතක් උනා වගේ...

" මේ අයියා..අද මලීශ් අයියයි සරණි අක්කි යි එනවා කිවුවා... "

" එහ් මොකටද... "

ආයුශ් ඇහුවේ නුරුස්නා බැල්මකින් කෙල්ල දිහා බලලා...

" #සරණි... "

නේහා කිවුවා නෙමෙයි.කෙල්ල ට කිය උනා...

" ඔව් අක්කි...එද ඔයාව මේකප් කරපු අක්කි...මලීශ් අයියගේ gf...එයා හරි හොදයි....."

සරණි හොද කෙල්ලෙක් කියන්න නේහා ත් දැනන් උන්නා...කෙල්ලට දැනුනේ පුදුම සතුටක්..ආයෙත් සරණි එක්ක කතා කරන්න ලැබෙනවා කියලා දැනෙද්දි...ඒත් එහ් මූනේ

sinhalaebooks.com

ඉරියව් ආයුෂ් තේරුම් ගත්තා වගේ කොල්ල ඊලගට කිවුව කතාවෙන් කෙල්ලගේ මූන අඳුරු උනා...

" එපා... එන්න ඕනි නෑ කියන්න..අපි මේ මැරි කරලා තාම දවසයි..අපිට නිදහසේ ඉන්න ඕනි.... "

මලීශ් තමන් ගේ හොදම යාලුවා උනත් මලීශ් ගේ ගතිගුන ගැන දන්න නිසා ම කොල්ලා කැමති උනේ නෑ තේහා ට මලීශ් ව මූන ගස්වන්න.. මොකද කොල්ලා බය උනා මලීශ් ඔක්කොම අම්මලා ඉස්සරහා දිග අරියි කියලා..සරණි කියලත් වෙනසක් නෑ... දෙන්නම එකම ටයිප් එකේ...

" ඔයාට පිස්සුද...එයාලා දන් මග එන ගමන්..මන් යනවා...අක්කි පැටියෝ කත් යනවා..... "

පායා එහෙම කියන ගමන් නැගිට්ටත් ආයෙත් හැරිලා බැලුවේ අමතක උන යමක් මතක් උන නිසා...

" අනේ අක්කියා...මට කියන්න බැරි උනානේ...මන් වොශ් රූම් එකට යන දොර ලග බිත්තියේ Wind chimes එකක් එල්ලුවා හරිද... ඒකේ ඉන්නේ කුරුල්ලෝ...ඒක හුලගට හෙල්ලෙද්දි ඇහෙන සද්දෙත් වෙනස්... එතකොට අක්කිගේ අල්මාරිය ලග... එතකොට බැල්කනි එකට යන තැන... එතකොට රූම් එකේ දොර ලග... හතරක් ම එල්ලුවා..එතකොට අක්කිට හොයා ගන්න ලේසීනේ... හතරම වෙනස් විදිහේ ඒවා... "

කෙල්ල කියද්දියි කොල්ලා රූම් එකේ එල්ලලා තිබුන Wind chimes හතර දැක්කේ...එතකොට නම් කොල්ලට ආව තරහට කොල්ලට කොල්ලවම පාලනය කරගන්න බැරි උනා...

" නංගි..තමුසෙට පිස්සුද...සිලින් බිලින් ගාලා මෙතන සද්දේ ඇහෙද්දි මන් මෙතන වැඩක් වත් කරන්නේ කොහොමද.. අනිකඅට තේහා ව බලාගන්න පුලුවන්..මේ මගුල් Wind chimes ඕනි නෑ... "

කොල්ලා එහ් ලගම බැල්කනි එක ලගට වෙන්න තිබුන සමතල්ලු ඉන්න Wind chimes එක ගලවන්න උත්සාහා කරමින් කියද්දි පායා එහ් සැනින් ම එතනට ගියේ හිතට ආව ආවේගයටමයි...

" අයියා..ඉතන්...ඔයා මහ ලොකුවට මෙතන වැඩ කරනවනේ..අනේ මේ අයියා..මගෙ කට අවුස්ස ගන්න එපා..ඔයා ගිහින් බොරුවට ඔෆිස් එකේ වෙයාමර්න් එකේ ඉන්නවා විතරනේ... වැඩ ඔක්කොම කරන්නේ secretary නෙහ්...මන් ඔය ඔක්කොම දන්නවා...අනිත් අය ඔයාට බය උනාට මන් බය නෑ... ඕකේ...Wind chimes ටිකක් රූම් එකේ තිබ්බම මොනා වෙනවද...ගලවලා තිබ්බොත් මන් තාත්තිට කියනවා... "

sinhalaebooks.com

කෙල්ල ආයුශ් ට සැරෙන් එහෙම කියලා ගස්සගෙන රූම් එකෙන් එළියට ගියා..පායා එක්ක තිබුන තරහට කොල්ලා පලි ගත්තේ තේහා ගෙන්.. තත්පර ගානෙන් තේහා ලගට ගියපු කොල්ලා තේහා ගේ කෙස් වැටියෙන් අල්ල ගත්තේ කෙල්ලට රිදෙන තරමට ම මිරිකලා...

" උබ...උබ ආයේ ඒකි එක්ක කතාවට ගිහින් තිබ්බොත්...මත්...මත් උබව තේහා...දැනගතිත්...මත් කිවුවොත් කිවුවා... මේ පාර ඉටිපන්දම් ඉටි දලා බේරෙන්න බැරි වෙයි උබට... "

ආයුශ් දත් මිටි මොලවලා කිවුව කතාවට කෙල්ලගේ ඇස් වලින් තිමක් නැතුවම කදුලු ගලන් යන්න ගත්තා... තරහා මැදින් එහ් කදුලු දකිද්දි එහ් තරහා ලාවට තුනී උනේ කදුලු දැකලා හිතට දැනුන සතුටට...කොල්ලා කෙල්ලගේ කෙස් වැටියෙන් අල්ල ගත්ත අත ගස ඇරලා දත්මේ කෙල්ලව ඇදේ මුතින් අතට වැටෙන විදිහට...ඒත් කොල්ලා දැනත් උන්නේ නෑ මේ හැමදේම රූම් එකේ දොර ලග හිටපු මලීශ් වගේම සරණී ත් හරි අපූරුවට දැක්ක කියලා... කොල්ලා හැස්සුනේ නොසිතුව වෙලාවට රූම් එකට කඩා පැන්න සරණී ත් මලීශු ත් නිසා...

" ආයුශ්...උබට පිස්සු හැදීගෙන එනවද..මේ අහිංසකී ට... මෙහෙම..ආයුශ්..උබ නම් මනුස්සයෙක් නෙමෙයි... "

මලීශ් කොල්ලගේ කොලර් එකෙනුත් අල්ලලා කියද්දි සරණී ගියේ ඇස් වල කදුලු පුරවන් අඩන තේහා ලගට... සරණී කෙල්ලගේ ඔලුව සීරුවට අත ගාන්න ගත්තේ වේගෙන් හුස්ම හෙලමින් ආයුශ් ගැන තිබුන තරහා නිසා ම ආයුශ් දිහා බලාගෙන...

" උබත් ආවද... උබ විතරයි අඩුවට හිටියේ..මලීශ්..උබ මගෙ හොදම යාලුවා හින්ද ඉවසනවා..වෙන එකෙක් කිවුවා නම් ඕක..මත් ඌට..... "

" ඇයි උබ මොනා කරන්නද... "

" ඒක උබට එහ් වෙලාවට බලාගන්න පුලුවන් ...යකෝ මේ මගෙ කසාද ගෑනි...කාටවත් මොකද මගෙ ගෑනි ගැන අමාරුවක්.. "

." ආයුශ් මේ... මචන් ඇත්තට ම උබට අනුකම්පාවක් කියලා එකක් නැද්ද..උබ කොහොමද මේ අහිංසක කෙල්ලට මෙච්චර දුක් දෙන්නේ...පව් කියලා හිතෙන් නැද්ද... "

" උබට මතකනේ එද මෙකී කතා කරපු හැටි..පාර මැදදි... එතකොට මේකිගේ මේ අහිංසක කම කොහෙද තිබ්බේ අහපන්..ඔක්කොම රගපෑම්...අනේ මලීශ් මේ...උබ එන්න එපා මට ගෑනු ගැන කියලා දෙන්න...මත් ඕකුන් ගැන ඉගේ කෙස් ගානට දන්නවා...එහ් හින්ද පාඩුවේ හිටපන්..මේකිගේ ඇස් දෙක විතරයි අඩු...ඒකත් තිබ්බනම් බලන්න තිබ්බා... මේ ආයුශ් ලේසියෙන් දෙයක් අමතක කරන මිනිහෙක් නෙමෙයි...ඒක උබත් දන්නවනේ...එහ් හින්ද මගෙ වැඩ වලට ඇගිලි ගහන් නැතුව හිටපන්...උබේ මේ සුරංගනාවිටත් කියපන්...මත් යනවා විශ් එකක් දගන්න... මෙන්න වැන්ද මලීශ්..උබ මේකත් ගෙදර උන්ගේ කනේ

තිබ්බොත් මේකිව මන් ඉතුරු කරන් නෑ...උබ ඇත්තට ම මේකි පව් කියලා හිතනව නම් කට වහගෙන පාඩුවේ හිටපන්... "

ආයුශ් එහෙම කියාගෙන ටවල් එකත් අරන් වොශ් රූම් එක ඇතුලට ගියේ සරණි ටත් රවාගෙන... මලීශ් ආයුශ් දිහා ටික වෙලාවක් බලන් ඉදලා සරණි ගේ උරහිසේ ඔලුව තියන් ඉන්න තේහා දිහා බැලුවේ තමන් ගේ ම සහෝදරියක් ට වගේ ආදරෙන්..

" නංගි..අඩන්න එපා... පුලුවන්නම් විතරක් අපි ටිකක් කතා කරමුද... "

මලීශ් කිවුවේ තේහා දිහා බලලා කෙල්ලගෙන් අවසර පතමින්... කදුලු මැදින් උනත් කෙල්ල හරි ලස්සනට හිනා වෙලා ඔලුව හොල්ලලා හා කියද්දි මලීශ් ගේ වගේ ම සරණි ගෙත් පපුව පිච්චිලා ගියේ ආයුශ් මේ අහිංසකීට කොහොම වද දෙනවද කියලා හිතෙද්දි...

සරණිත් මලීශුත් කෙල්ලව එක්ක ගියේ බැල්කනි එකට... මුලු ගාඩ්න් එකම හරි අපූරුවට එතනට පෙනුනත් කෙල්ලට කොයින් ද ඒවා දකින්න තරම් වාසනාවක්... එහ් හින්ද ම මලීශ් කෙල්ලව හුලන් වදින විදිහට එතන තිබුන පුටුවකින් වාඩි කරවලා එහ් දෙන්නත් එහ් ලගින් ම වාඩි උනේ ලොකු කතාවකට මුල පුරමින්..

" නංගි..නංගිට මාව මතකයි නෙහ්...එද පාරෙදි ආයුශ් ගේ කාර් එකේ ආයුශ් එක්ක හිටියේ මන්...එතකොට එද ඔයාලගේ ගෙදර ආව දවසෙත්..මන් ආයුශ් ගේ බෙස්ට් ෆ්‍රෙන්ඩ්... "

" මට මතකයි අයියේ... "

" ම්ම්ම්ම්... මට සරණි ත් විස්තර කිවුවා නංගි .. ඇත්තට ම මට ගොඩක් දුකයි...ආයුශ් මගෙ යාලුවා වෙලත් මට ඌව හදගන්න බැරි උනා...ඒත් මන් කවදවත් හිතුවේ නෑ ඌ ඔයා වගේ අහිංසක කෙල්ලෙක් ට මෙහෙම කරයි කියලා... "

මලීශ් කිවුවේ සුසුමකුත් පිට කරමින්..තමන්ටත් වැරැද්ද පටව ගනිමින්... තේහා නිහඩයි..කෙල්ල කරේ ඇස් අගින් එලියට වැටෙන්න හදපු කදුලු ආයාසයෙන් ම වලක්වා ගත්ත එක විතරයි...

" මට බෑ නංගි තේ උන දේවල් වෙනස් කරන්න... ඒත් අපි ට පුලුවන් නෙහ් ඉස්සරහට වෙන දේවල් වලක්වා ගන්න... මමයි සරණි යි ඕන වෙලාවක ඔයා එක්ක ඉන්නවා නංගි ..ඕන ම වෙලාවක අපිට කතා කරන්න...ආයුශ් මගෙ යාලුවා තමයි...ඒත් මන් ඔයාගේ පැත්තේ... තේරුනා ද..මන් පිට කෙනෙක් කියලා හිතන්න එපා..ඔයාගෙ ම අයියා කියලා හිතන්න... "

මලීශ් පුදුම තරම් කරුනාවෙන් ආදරෙන් කියද්දි කෙල්ල ට තවත් කදුලු පාලනය කරගන්න බැරි උනා..කෙල්ල ඔහේ කදුලු වලට ගලන් යන්න ඉඩ දීලා බලන් හිටියා..ඒත් මලීශ් ගේ මේ වචන ටික කෙල්ලට ලොකු හයියක් උනා.. තමන් තනි වෙලා නෑ කියන හැඟීම කෙල්ලට දැනෙන්න ගත්තා..

sinhalaebooks.com

" ඔයාට අපි gift එකක් ගෙනාවා නංගි..රතු පාට.. ම්ම්ම් රතු පාට කිවුවට ඔයා දන්නේ නෑනේ..."

මලීශ් කිවුව කතාවට කෙල්ලට දුකත් මොහොතක ට අමතක වෙලා හිනා ගියේ කෙල්ලටත් නොදැනිම...

මොකද කෙල්ලගේ පෙනීම නැති උනේ කෙල්ලට වයස අවුරුදු දහයෙදි... කෙල්ල එහ් තරම් ම අවසනාවන්ත නෑ..මොකුත් ම නොදැක ඉන්න තරම්...

" ඇයි නංගි හිනා වෙන්නේ... "

මලීශ් ඇහුවේ ඇස් දෙකත් ලොකු කරන් පුදුමයෙන්..
" නෑ අයියා...මන් පාට දැකලා තියනවා..මට ඇස් පේන් නැතුව ගියේ මන් පොඩි කාලේදිනේ..
"

ඒක ඇහුවම මලීශ් ගේ හිතට දැනුන සතුට නිමක් නැති උනා.. මොකද ඔහු වෘත්යෙන් වෛද්‍යවරයෙක්... කොල්ලා හිතන් උන්නේ කෙල්ලගේ පෙනීම උපතින් ම නෑ කියලා... ඒත් කෙල්ලගේ මේ වචන කොල්ලට ගෙනාවෙ පුදුම සතුටක්...

" ඇත්තට ම... නංගි....එහ් කියන්නේ...ඔයා..ඔයා....එහ් තරම්ම අවාසනාවන්ත නෑ.... මට කියන්න...කොහොමද...කොහොමද එහ් දේවල් උනේ...මන් කිවුවේ කොහොමද පේන් නැති උනේ..ඔයාට මතක විදිහට කියන්න....නංගි අපි ටෙස්ට් ටිකක් කරලා බලමු... මන් හිතන්නේ...අපිට පුලුවන් වෙයි...ඔයාගේ..100%ක් ශුවර් කරන්න බෑ.....ඒත් අපි ට්‍රයි කරමු...මට කියන්නකෝ...ඔයාගේ ඇස් පේන් නැති උනාම ඩොක්ටර් කෙනෙක් ලගට ගියෙ නැද්ද..එහ් ඩොක්ටර් මොනවද කිවුවෙ..."

සතුට වැඩිකමට ම මලීශ් එක පිට එක කෙල්ලගෙන් ප්‍රශ්න කෝටියක් අහන් ගියත් කෙල්ල උත්තර දෙන්න කට අරින්න හදද්දි ම උනේ කවුරුත් බලාපොරොත්තු නොවුන දෙයක්...
මලීශ්..උබ ඩොක්ටර් නෙමෙයි..කවුරු උනත් මට අදල නෑ..ප්ලීස් මචන් දැන් මෙතනින් යනවද... "

ආයුශ් යක්ශාවේශ වෙලා කියද්දි කෙල්ල ගැහෙන්න ගත්තේ ඊලගට මොනා වෙයි ද කියලා පුදුම තරම් බයක් හිතට දැනෙද්දි...

" මචන් තේහා... "

" මට ඔක්කොම ඇහුනා... උබ මේකිගේ අයියා වෙන්න කලින් මගෙ යාලුවා උනේ..ඒත් උබ... උබ මොනවද හිතුවේ...මේකිට ඔක්කොම කේලම් ටික කියන්න දීලා මන් වොශ් රූම් එකට ගියා කියල ද..උබට මාව මොකෙක් වගේද පේන්නේ..මන් ඔක්කොම අහගෙන හිටියේ... මන් දැනගත්තා උබලා දෙන්න ආවේ හොදකට නෙමෙයි කියලා...මන් මෙතනින් ඇදලා දන්න

sinhalaebooks.com

කලින්..ප්ලීස් මචන්....මෙතනින් පලයන්...උබ මගෙ යාලුවා උනාට හැමදම මට කරේ ද්‍රෝහිකම්..."

" ආයුශ්...මචන්..මේ අහපන්.."

" පලයන් &*%$$ එක පාරක් කිවුවම... "

ආයුශ් දෙවනක් වෙන්නම හයියෙන් කෑ ගහලා කියද්දි මලීශ් වගේම සරණි ත් රූම් එකෙන් පිට උනේ බයෙන් ගැහෙන නේහා දිහා අසරණ විදිහට බලලා... ඒත් මලීශ් සරණි ට යන්න කියලා ආයෙත් රූම් එකට ආවේ එහ් වචන ටික කියලා නොගියොත් හිතට හරි නැති නිසා...

" උබට දවසක විදවන්න වෙයි ආයුශ්..මේ අහිංසකීට දෙන දුක් වලට උබට විදවන්න ම වෙයි...පුලුවන්නම් දැන්වත් හැදියන්..."

ආයුශ් කරේ හිතේ තිබුන ආවේගයටත් එක්ක වියරු හිනාවක් පෑව එක විතරයි... එහ් වචන කොල්ලා කනකටවත් ගත්තේ නෑ...මලීශ් තවත් මොහොතක්වත් එතන රුදෙන් නැතුව පහලට ආවේ තවත් එතන ඉන්න එක තේරුමක් නැති නිසා... ඒත් මලීශ් මේ කිසි දෙයක් ආයුශ් ගේ ගෙදර අය එක්ක නොකියන්න වග බලා ගත්තේ ඒකෙන් වද විදින්න වෙන්නේ අසරන නේහා ට කියලා දැනන් උන්න නිසා...

මලීශ් ගෙදර අයටත් වෙනසක් නොපෙනෙන්න හදිස්සි ජේශන් කෙනෙක් ඇවිත් යන්න වෙනවා කියලා සරණි එක්ක පිටත් උනේ එහ් නිසා...

මලීශ් ගේ කාර් එක ගේට් එකෙන් එලියට යනකම්ම වේගෙන් හුස්ම ගනිමින් බලන් හිටපු ආයුශ් ඊලග තත්පරේ රූම් එකේ දොර ලගට ගිහින් දොර හයියෙන් වහලා දැන්මේ තාමත් බැල්කනියට වෙලා ගැහෙමින් ඉන්න නේහා ව තවත් බය කරමින්... ඊලගට කෙල්ලගේ අතින් අල්ලගෙන රූම් එකට ඇදන් ආවේ එතන මොනා හරි කියන්න ගියොත් බැරි වෙලාවත් ගාඩ්න් එකේ කවුරු හරි හිටියොත් බැල්කනි එකේ වෙන හැමදේම අපූරුවට පේන නිසා...

" උබ නම් මාව කන්න ආව යක්ශනියක්... උපන් ද ඉදන් මට හිටපු සහෝදරයත් උබ මට නැති කරලා දැන්මා එහෙනම්... "

ආයුශ් නේහා ගේ කෙස් වැටියෙන් අල්ලගෙන කිවුවේ එහ් මූන දිහා රතු උන ඇස් වලින් බලන ගමන්... කෙල්ලගේ පපුව පිටතට ඇහෙන තරමට ම වේගවත් වෙලා... කෙල්ලගේ ඇස් වලින් කදුලුවත් නාවේ තිබුන බය වැඩිකමට...

" %$&# හිතන් ඉන්නේ ඌවත් රවට්ටගෙන ඇස් දෙක සනීප කරගන්න ද..ඒවා කොහෙද මාත් එක්ක..උබ වැඩිය දගලන්න ආවොත් උබගේ අතක් පයකුත් කඩලා දනවා..දැනගනින්... එතකොටවත් දෙයියනේ කියලා එක තැනකට වෙලා ඉදියි නෙහ්... "

sinhalaebooks.com

මනුස්සයෙක් ට මේ තරම් දරුනු වෙන්න පුලුවන් ද..ඇරත් ඇස් පේන් නැති අසරණ කෙල්ලෙක් ට... හිතක් පපුවක් තියන මනුස්සයෙක් ට නම් කවදාවත් එහෙම කරන්න බෑ... ඒත් ආයුශ්... අනුකම්පාව කියන දේ ආයුශ් අඳුරන්නෙවත් නැති දෙයක්..එහ් ඇස් වලින් කඳුලක් වැටුන කාලයක් මතක නෑ...කොටින්ම කිවුවොත් එහ් හිත ගලක්...කවදාවත් ම කාටවත් ම උනු කරන්න බැරි...

ඒත් නේහා...කවදාවත් ම ආයුශ් ලග වැද වැටුනේ නෑ...දරාගන්නම බැරි තැන ඇඩුවා මිසක් තිරිසනෙක් ලග දනින් වැටෙන්න දරම් කෙල්ලගේ හිත දුවර්ල උනේ නෑ....

" $%&# උබට තේරුනා නේද මන් කිවුව දේ...පාඩුවේ උබේ වැඩක් බලාගෙන මන් කියන විදිහට හිටපන්... "

නේහා ගෙන් පිලිතුරක් නැති තැන ආයුශ් කිවුවෙ කෙල්ලගේ කෙස් වැටිය අත ඇරලා කෙල්ලගේ උරහිස් දෙකෙන් හොල්ලලා... කෙල්ල අදත් කරේ තේරුනා කියන්න හිස සලපු එක විතරමයි ..

කොල්ලා කෙල්ලව අත ඇරලා බැල්කනි එකට ආවේ නේහා අඩ අඩ ම ඇද හොයාගෙන ඇදෙන් වාඩි වෙද්දි... පැයක් විනාඩි 45ක් වගේ කෙල්ල ඉකි බිදින්න ඇති..කොල්ලත් එහ් තරම් වෙලාවක් ම බැල්කනි එකට වෙලා මොනවදෝ කල්පනා කරා... ඊලගට ආයෙත් රූම් එකට එද්දි කෙල්ල බෙල්ලත් ඇල කරන් හොදට නිදි...කම්මුල් දොගේ වැටිලා තිබුන කඳුලු ගල් වෙලා... මුලු මූන ම රතු වෙලා...ඕන කෙනෙක් ට එහ් මූන දැක්ක ගමන් දුක හිතෙනවා...ඒත් කොල්ලා හිස් බැල්මක් විතරක් හෙලලා ටේබල් එක ලගට ඇවිත් ෆෝන් එක අතට ගත්තා... ඊට පස්සේ කාගෙදෝ නම්බර් එකක් ඩයල් කරා...

" අද රෑට මන් එනවා....ලෑස්ති කරලා තියපන්..කීයක් උනත් කමක් නෑ... මට හොටෙල් එකයි වෙලාවයි කියපන්...හැබැයි ගිය පාර වගේ උනොත් උබ ඉවරයි කියලා හිතා ගනින්... යකෝ සල්ලිත් දෙන එකේ සෙක්සි කෑල්ලක් නැත්නම් ඇති වැඩේ මොකක්ද &%*$... "

ආයුශ් ගේ වචන වල සැරට ද මන්ද නින්ද ගිහින් හිටපු කෙල්ලව ඇහැරුනා...ආයුශ් කිවුව හැම වචනයක් ම කෙල්ලට අගේට ඇහුනා..කොල්ලා මේ යන්න හදන්නේ ගනිකාවියක් ගේ පහස ලබන්න කියන දේ කෙල්ල ට තේරුම් යන්න වැඩි වෙලා ගියේ නෑ...බැදීම කොහොම උනත් කොල කෑල්ලකට හරි ආයුශ් කෙල්ලගේ husband..ඒත් මැරි කරාට පස්සේවත් ආයුශ් මෙහෙම වෙන් නැති වෙයි කියලා කෙල්ලගේ යටි හිතේ පුංචි බලාපොරොත්තුවක් තිබුනා...ඒකත් මේ වෙලාවේ කැඩිලා බිදිලම ගියා ..තමන් ගේ මිනිහා පිට යනවා කියද්දි ගැනියෙක් ට දැනෙන්නේ දුකක්....දරාගන්න බැරි දුකක්...ඒත් නේහාට දැනුනේ ආයුශ් ගැන පුදුම පිලිකුලක්... කෙල්ල ආයෙත් ඇස් දෙක පියා ගත්තේ මේ දේවල් තමන් ට ඇහුන වගක් ආයුශ් දැනගන්න ඕනි නැති නිසා...

ජීවිතේ අපි ප්‍රාථර්නා කරන දේවල් ම ලැබෙන් නෑ...එහ් ජීවිතේ හැටි..ඒත් නේහා ගේ ජීවිතේ...කෙල්ලට ඉපදුන දවසේ ඉදන් ම ලැබුනේ දුක ම විතරයි....එහ් හැමදේම දරා

sinhalaebooks.com

ගත්තා වගේ කෙල්ල තමන් ගේ හිත ගලක් කරගෙන මේ හැමදේමත් දරා ගත්තේ කරන්න දෙයක් නැතිකමට...

හවස 6 වගේ වෙද්දි ආයුශ් ලෑස්ති වෙන්න ගත්තා... නේහා ඇදට වෙලා මගේ කල්පනා කර කර උන්නා...

" මන් එද්දි රෑ වෙයි...සමහරවිට උදේ වෙන්නත් පුලුවන්..මන් එනකම් ඉන් නැතුව කාලා නිදා ගන්නවා... "

ආයුශ් කිවුවේ හිස් බැල්මකින් කෙල්ල දිහා බලලා...

" වෙන ගෑනු එක්ක නිදගෙන ඉදලා එනකම් මට ඇහැරන් ඉන්න පිස්සුවක් නෑ..."

කෙල්ල හිතුවා විතරයි..වචනයක් වත් කියන්න ගියේ නෑ...

" හැබැයි උබ මේකේ උන් එක්ක වැඩිය කතාවට ගිහින් තිබ්බොත් මන් ආවම එහ් ගැන බලාගන්නම්...පුලුවන් නම් රූම් එකට වෙලාම හිටපන්..එක වේලක් කෑවේ නෑ කියලා මොකද උබ මැරෙන්නද....අර ගොඩේ ගෙදර ඉද්දි වේල් කියක් නොකා ඉන්න ඇතිද..එගඅ උබට අද කෑවේ නැති උනා කියලා මැරෙන් නෑනේ... "

එහ් වචන ටිකට නම් කෙල්ලගේ පපුව පිච්චිලා ගියා..මොන තරම් නැති බැරිකම් තිබුනත් කෙල්ලගේ රත්තරං අම්මා එක වේලක් වත් කෙල්ලව බඩගින්නේ තියලා නෑ...ඇස් වල කදුලු පිරුනේ ඉබේම...මේ වෙලාවේ අම්මා මොනවා කරනවද කොහොම ඇතිද කියලා කෙල්ලගේ හිත කෑ ගහලා අහන්න ගත්තා...ආයුශ් ගැන තරහකුත් හිතට නොදැනුනා නෙමෙයි...ඒත් කෙල්ල මොනවා කියලා කරන්නද...නිහඩව ඉන්නවා හැර... අසරනකම නම් අන්තයට ම වැටිලා....මේ ලෝකේ මේ තරමට ම නපුරු ද..අසරණකමින් පන්න පන්න පලි ගන්න තරමට ම... කෙල්ලට හිතුනේ එච්චරමයි...
කොල්ලා ගියාට පස්සේ නේහා හිටියේ රූම් එක ඇතුලට ම වෙලා... හුලකට හෙල්ලෙන wind chimes වල හඩ කෙල්ල අහන් උන්නේ මොහොතකට හිතේ තිබුන දුක අමතක කරලා..පායා කිවුවා වගේම wind chimes හතරෙන් ඇහුනේ වෙනස් හඩවල්...දැන් කෙල්ලට එහ් හඩත් එක්ක බැල්කනි එක තියෙන්නේ කොහෙද වොශ් රූම් තියෙන්නේ කොහෙද වගේම රූම් එකේ දොරත් අල්මාරියත් තියන තැන හරි අපූරුවට හොයාගන්න පුලුවන් උනා...

දැන් කෙල්ලට මේ රූම් ටික ටිකෙන් ටික හුරුයි... දවසක් වත් නොයා කෙල්ල රූම් එක අදුර ගත්තේ ආයුශ් හිටපු නැති හින්දමයි..කොල්ලා හිටියා නම් නේහා ඇද උඩට වෙලා හූල්ලන එක විතරයි කරන්නේ... කොල්ලා ගියේ වෙන ගෑනු ලග නිදගන්න උනත් කොල්ලා නොහිටපු මේ ටික වෙලාවට කෙල්ලට දැනුනේ පුදුම නිදහසක්...

කෙල්ල රූම් එකට වෙලා මගේ කල්පනා කර කර ඉද්දියි පායා රූම් එකට ආවේ...

sinhalaebooks.com

" අක්කි..කන්න එන් නැද්ද...දැන් ගොඩක් රෑ වෙලා... අයියා කොහෙද ගියේ... "

" අ..යි..යා...ඔෆිස් එකේ වැඩකට එලියට ගියා නංගි... මට..මට බඩගිනි නෑ... "

කොහොම කටක් ඇරලා කියන්නද..කොල්ලා ගියේ වෙන ගෑනියෙක් ලග නිදා ගන්න කියලා..කෙල්ලට දැනුනේ පුදුම අසරනකමක්....

" අනේ එන්න අක්කි යමු..අයියා නෑ කියලා කන්නෙත් නැතුව ඉන්නද හදන්නේ..එයා හෙට උදේට එයි අනේ.... "

මේ කිසි දෙයක් නොදන්න පායා කෙල්ලගේ අතිනුත් අල්ලගෙන කෙල්ලව පහලට එක්ක ආවා... කෑම මේසේ අම්මා වගේම තාත්තා ත් බලන් උන්නේ නේහා දිහා...දෙයියනේ කියලා ආයුශ්ගේ ගතිගුන වලින් එකක්වත් එහ් අම්මා තාත්තාට තිබුනේ නෑ..පායා ට තරම්ම කෙල්ලටත් ආදරේ කරා... කොටින් ම කිවුවොත් පායා ට වගේම නේහා ට කෑවුවෙත් අම්මාගේ අතින්..එහ් තරමට ආදරයක් එහ් හිතේ පිරිලා තිබුනා...

කෙල්ලගේ හිතට දැනුනේ නිදහස් සතුටක්...ප්‍රශ්න කෝටියක් මැද්දේ උනත් කෙල්ල මේ ආදරේ හිත පුරා විද ගත්තා...කෙල්ලට තමන් ගේ අම්මාව මතක් නොවුනාමත් නෙමෙයි..ඒත් අම්මව බලන්න යන්න තරම් ශක්තියක් නැති හින්දම කෙල්ල හිත ගලක් කරන් උන්නේ අවස්ථාවක් ලැබුන ගමන් ම අම්මව බලන්න යනවා කියල හිතාගෙන...හැබැයි කාගෙන්වත් උදව් නැතුව එහ් වැඩේ කෙල්ලට තනියම කරන්න බැරි බව කෙල්ල දැනන් උන්නා...එහ් හින්දමයි කෙල්ල තීරනේ කරේ ආයුශ් ගේ අම්මගෙන් ඒකට උදව් ගන්නවා කියලා..ඒත් මේ ඒකට වෙලාව නොවුන නිසා ම කෙල්ල රූම් එකට ආවේ හිත හදගෙන...පායා කෙල්ලව රූම් එකට එක්ක ගිහින් කෙල්ලත් තමන් ගේ රූම් එකට ගියා...

නේහා කොට්ටෙට ඔලුව තියාගෙන ඇස් දෙක පියා ගත්තේ නින්දක් අහලකවත් තිබුන් නැති නිසා...ඒත් කෙල්ලට නින්ද යන්න ඇති...ඒකයි දොරට ගහන සද්දෙට කෙල්ල ගැස්සිලා ගියේ .. ඔව්...පාන්දරත් වෙලා...කෙල්ල ඇස් දෙක අමාරුවෙන් ඇරලා සද්දේ ඇහුන දිහාට යන්න ගත්තේ මේ වෙලාවේ කවුරු වෙන්න ඇති ද කියලා හිත හිතමයි....

දොර ලග හිටියේ වෙන කවුරුත් නෙමෙයි..කෙලින් හිට ගන්නවත් බැරි තරම ට බීලා හිටපු ආයුශ්...ඒත් කොල්ලා වචනයක් වත් කතා නොකර හිටපු හින්දම කෙල්ල ට මේ කවුද කියලා අදුර ගන්න අමාරු උනා...

" ක..වු..ද...ඔ..න..න... "

කෙල්ල කතා කරේ වචනත් මුවින් පිට නොවෙන තරමට ම බය වෙලා...

" ම..න්..."

sinhalaebooks.com

එහ් ආයුශ්ගේ කටහඬ කියලා අඳුර ගන්න කෙල්ලට තත්පරයක් වත් ගියේ නෑ...කෙල්ල නිහඬවම ටික වෙලාවක් ඉඳලා ආයෙත් රූම් එක ඇතුලට එන්න හැරුනේ ආයුශ් ගේ මේ නිහඬතාව කෙල්ලට ලොකු බයක් ගෙනපු නිසා..කොල්ලා ගහලා බැනලා ඉන්න විදිහ කෙල්ලට දැන් හොදට ම පුරුදුයි...කෙල්ල හිතුවෙම ආයුශ් දොර අරින්න ලේට් උන එකට බනියි කියලා නැත්නත් ගහයි කියලා...ඒත් කොල්ලගේ නිහඬතාව කෙල්ලට ගෙනාවේ පුදුම තරම් බයක්...

" නේහා...ඔහොම ඉන්න... "

බිලා උනත් එහ් කටහඬ වෙනදට වඩා ආදරනීය වෙලා....කෙල්ලගේ බය තවත් වැඩි උනේ එහ් නිසා...

ආයුශ් කෙල්ලගේ අතකින් අල්ලලා තමන් ලගට ඇදලා ගත්තේ කෙල්ල පිටතට ඇහෙන තරමට ම ගැහෙන්න ගද්දි... ආයුශ් අතින් ඇදපු වේගෙට කෙල්ල නතර උනේ ආයුශ් ගේ පපුව මැද...මත්පැන් වල ගඳ කෙල්ලට හුස්ම ගන්න පවා අපහසු තත්වයක් උදා කරත් ඒහ් ගැනවත් කෙල්ලට ගානක් නොවුනේ කෙල්ල හිටියේ මුලු ඇගම සීතල වෙන තරමට ම බය වෙලා නිසා...

කොල්ලා බීමතින් උනත් කෙල්ලගේ කඩා හැලෙන කොන්ඩේ තමන් ගේ අතින් පිටුපස්සට දලා කෙල්ලගේ නිකටෙන් අල්ලලා තමන් ගේ මූන දිහා ට හරවගත්තේ කෙල්ලගේ ජීවයක් නැති දුඹුරු පාට ඇස් දෙක දිහා ම බලාගෙන.... ඊලගට කෙල්ලට දැනෙන්නෙවත් නැති තරම ට සියුම් ව කෙල්ලගේ කම්මුලක් පිරිමැද්දෙ එහ් හැම ස්පශර්යකින් ම කෙල්ල ඊලගට මොකක් වෙයිදෝ කියලා පුදුම බයකින් පපුව පිච්චෙද්දි... ඒත් ආයුශ් ඊලගට කිවුවේ කෙල්ල හීබෙකින්වත් නොහිතපු වචන ටිකක්...

" ඔයා...මන් හින්ද දුක් විදිනව නේහා...ගොඩක් දුක් විදිනවා.... "

කොල්ලගේ වචන ඇහුනේ කැඩි කැඩි...බිදුනු ස්වරයකින්... ඒත් කෙල්ල උන්නේ ඒක තේරුම් ගන්න පුලුවන් තත්වෙක නෙමෙයි..කෙල්ල උන්නේ හොදට ම බය වෙලා...ඒත් මේ වචන කෙල්ලගේ හිතේ ගැඹුරෙම ලියැවුනේ මේ තරම් ආදරනීය ව කෙල්ල අහපු පලවෙනි වචන ටික මේ වචන නිසා ම වෙන්න ඇති.. ඒත් එහ් හැඟීම තිබුනේ තවත් තත්පර ගානක් විතරයි....

" ඒත් උබත් ගැනියෙක්... අහිංසක විදිහට ඉස්සරහට ඇවිත් උබත් හදන්නේ මාව විනාශ කරලා දන්න...අයින් වෙයන් &$&$... "

ආයුශ් දැඩි ආවේගයෙන් එහෙම කියලා කෙල්ලව තල්ලු කරලා දැන්මේ කෙල්ල විසි වෙලා ගිහින් ටයිල් පොලව මත ඉන්දවෙද්දි.... කොල්ලා එහෙම්ම ම වැටුනේ ඇදට... කෙල්ල උන්නේ පපුවටත් අත තියාගෙන මේ උන කිසි දෙයක් හිතා ගන්න බැරුව.... ටික වෙලාවක් එහෙම ඉදලා කෙල්ල ඇද ලගින් ම බිම නිදා ගත්තේ මේ වෙද්දි ආයුශ් මුලු ඇදම ආවරණය

sinhalaebooks.com

වෙන විදිහට නිදාගෙන හිටපු නිසා....අඩුම තරමේ කෙල්ලගේ ඇගට ශීට් එකක් වත් තිබුනේ නෑ...

සීතලට කෙල්ල වෙවුලුවත් කෙල්ල ට නින්ද නොගියේ එහ් නිසා නම් නෙමෙයි..මොහොතකට කලින් ආයුශ් ගෙ එහ් හැසිරීම හිතට වද දුන්න නිසා...

හිතක් පපුවක් නැති ගල් හිතකට පුලුවන් ද මොහොතකට හරි එහ් විදිහට හැසිරෙන්න...එහ් තරම් ආදරනීයව... කෙල්ලගේ හිතට ගෙනාවේ මහා ලොකු ප්‍රෙහේලිකාවක්...හරියට ම උදේ 6.30 වෙද්දි කොල්ලගේ ෆෝන් එක රින්ග් වෙන්න ගත්ත නිසයි තද නින්දේ හිටපු කොල්ලා ඇහැරුනේ...වේ වෙද්දි කොල්ලට සම්පූණර්යෙන් ම වගේ නෝමල් තත්වෙට ඇවිත් තිබුනේ... ඒත් හිටියේ හොදට ම නිදිමතේ.....එහ් නින්ද ම කොල්ලා සාක්කුවේ තිබුන ෆෝන් එක අතට අරන් කට් කරලා ආයෙත් නිද ගන්න හැදුවත් එතකොටයි කොල්ලා දැක්කේ ඇදේ ඉන්නේ තමන් විතරයි කියලා...කොල්ලගේ නිදිමතත් නැති වෙලා ගියේ තත්පර ගානෙන්..කොල්ලා එහෙම්ම ම ඇදෙන් වාඩි උනේ රූම් එක හැම තැනට ම ඇස් යවලා...ඒත් එහ් කොහෙවත් නේහා නැති උනා ම කොල්ලගේ හිත කලබල උනා...

කොල්ලා එහෙම්ම ම ඇදෙන් බහින්න හැදුවේ කෙල්ල පායා එක්ක පහලට ගිහින් ද කියලා හිතට තරහක් දැනෙද්දි.... ඒත් ඇදෙන් බහින්න කකුල බිමින් තියද්දි ම ටයිල් පොලව මත ශීට් එකක් වත් නැතුව නිදන් ඉන්න කෙල්ල දකිද්දි කොල්ලා එක පාරම ගැස්සුනා..එහ් නිසා මයි බිමින් තියන්න ගත්ත කොල්ලගේ කකුල වෙවුලන්න ගත්තේ...කෙල්ල උන්නේ සීතලට ගුලි වෙලා හොදට ම නිදාගෙන...ටයිල් පොලව හින්දම කෙල්ලට සීතල වැඩියෙන් දැනෙන්න ඇති..

" නේ...හා... "

කොල්ලා පලවෙනි වචන ටික කිවුවේ වචන පටලමින්..ඒත් කෙල්ල ඇහැරින පාටක් අහලකවත් තිබුන් නෑ...

" නේහා... "

කොල්ලගේ ඊලග වචන ටික කලින් ට වඩා දැඩි උනේ මේ වෙද්දි කොල්ලා සාමාන්‍ය තත්වෙට එමින් තිබුන නිසා...ඒත් කෙල්ලගේ නින්ද කොච්චර ද කියනවනම් කෙල්ලට එහ් වචන ටිකවත් ඇහුන් නෑ...

" නේහා...නැගිටපන්...%$&# "

කෙල්ලගේ කන ලගින් ම ඇහුන ආයුශ් ගේ යක්ශාවේශ කටහඩත් එක්ක කෙල්ල නැගිට්ටේ ගැස්සිලා යද්දි...කෙල්ල කොච්චර කලබල උනා ද කියනවම් කෙල්ලට කෙල්ල නිද ගත්තේ බිම කියන දේත් එක පාර ම අමතක වෙලා ගියා...

sinhalaebooks.com

" ආ..යු...ශ්..."

" මොකද උබ බිම... "

ආයුශ් ඇහුවේ සුපුරුදු හිතක් පපුවක් නැති වචන වලින්..කෙල්ලගේ ඇගට ම දමලා ගහලා... කෙල්ල ඊයේ උන දේ කියන්න හදද්දි ම කොල්ලා ආයෙත් කෑ ගහන්න ගත්තේ කෙල්ලට වචනයක් වත් කතා කරන්න ඉඩක් නොදී...

" මන් උබට කියලා තියනවා නේද..මට කලින් නැගිටපන් කියලා..මන් උබට කී පාරක් දැන් කතා කරාද... උබ දැන් අර දොරත් ඇරලා දාලා ඔතනට වෙලා බිම නිදාගෙන ඉන්නේ මන් උබට බිම නිදාගන්න කිවුවා කියලා ගෙදර ඉන්න උන්ට පෙන්නන්න ද $%&$*.. උබ වගේ කපටි ගෑනියක් මන් දැකල ම නෑ..."

දෙයියනේ...මේ තරම් චෝදනාවක්... කෙල්ලට එක වචනයක් වත් කතා කරගන්න හයියක් තිබුනේ නෑ එහ් වචන එක්ක...කෙල්ල හීනෙන් වත් හිතපු නැති දේවල් කියලා ආයුශ් තමන් ට චෝදනා කරද්දි කෙල්ල හැමදම වගේ අදත් නිහඩ උනේ කෙල්ලට වචනයක් වත් කතා කරන්න ආයුශ් ඉඩක් දෙන්නේ නෑ කියලා දැනන් උන්නු නිසාමයි... හැබැයි කෙල්ලගේ ඇස් රතු වෙන තරමට ම එහ් ඇස් වලින් නිමක් නැතුව ම කදුලු ගලා හැලුනා...

" නැගිටපන් &%*$.. තවත් ඔහොම ඉන්නේ කවුරු හරි එනකම්ද... "

කෙල්ල එහ් තත්පරේ ම නැගිට්ටේ ආයුශ් කෙල්ල නැගිටිනවත් එක්ක ම කෙල්ලගේ කම්මුලට පහරක් ගහද්දි...

" ආයේ එක දවසක් හරි උබ මන් ඇහැරිද්දි නිදාගෙන හිටියොත් එද ට මන් උබව ඉතුරු කරන් නෑ.... "

කොල්ලා කෙල්ලගේ කම්මුල් දෙක තමන් ගේ වම් අතින් මිරිකන ගමන් කෙල්ලට තර්ජනය කරා..කෙල්ල උන්නේ එහ් හැම වචනෙට ම හා කියන්න ඔලුව හොල්ලමින්....

පාන්දර උන කිසි දෙයක් කොල්ලගේ මතකේ තිබුනේ නෑ... කෙල්ලගේ හදවතේ ගැබුරුම තැන එහ් මතකය ලියවිලා තිබුනත් කෙල්ල මතක් වෙන වාරයක් පාසා ම එහ් සිදුවීම හිතින් අයින් කරලා දැන්මේ ආයුශ් කියන්නේ කවදාවත් එහ් වගේ හැසිරීමක් තියන ආදරනීය කෙනෙක් නෙමෙයි කියලා හොදකාරවම දන්න නිසා..පාන්දර උන හැම දෙයක් ම හීනයක් කියලා කෙල්ල අමතක කරලා දැන්මා...

කොල්ලා කෙල්ල එහ් විදිහට ම ඉද්දි ටවල් එකත් අරන් වොශ් රූම් එකට ගියේ නේහා තමන් ගේ නින්දත් නැත්තටම නැති කරා කියලා හිතින් බනිමින්...වොශ් රූම් එකට ගිහින් කන්නාඩිය ලගට ගියපු කොල්ලට දකින්න ලැබුනේ නුපුරුදු දෙයක් නම් නෙමෙයි... කොල්ලගේ නිරුවත් සිරුර පුරා ම තිබුනේ ලිප්ස්ටික් වගේ ම නිය පාරවල්...අවුරුදු කීපයක ඉදන් ම කොල්ලා ගණිකාවන් ඇසුරු කිරීම කරත් කොල්ලා එක ම දවසේ ගණිකාවන්

sinhalaebooks.com

දෙදෙනෙකු ඇසුරු කරලා තිබුනේ නෑ...ඒත් ඊයේ රෑ මැදියම වෙන්න එක ගණිකාවක් එක්කත් පාන්දර වෙන්න තව කෙනෙක් එක්කත් ඉදලයි කොල්ලා ගෙදර ආවේ...එහ් ආවෙත් නැගිට ගන්න බැරි තරමට ම බීමත් ව...

හොද සිහියෙන් ඉද්දි ත් එහ් වගේ ඇසුරක් තියනවා කියන්නේ එහෙම කෙනෙක් ගැන තවත් මොනවටද නිදහසට කරුනු...කොල්ලාගේ හොදයි කියලා කියන්න එක ම ගතිගුනයක් වත් නෑ... ඒත් අද ජීවිතේ පලවෙනි වතාවට කොල්ලගේ මේ සිරුර දකිද්දි කොල්ලට තමන් ගැන ම පිලිකුලක් දැනුනා...එහ් ඇයි කියන්න කොල්ලවත් දැනන් උන්නේ නෑ... හැබැයි එහෙම කියලා මේ දේවල් අතහරින්න අදහසක් කොල්ලගේ තුන් හිතකවත් තිබුනෙත් නෑ.. ක්ෂනිකව හිතට ආව එහ් පිලිකුල් සහගත හැගීම හිතා මතා ම යටපත් කරගත්ත එක විතරයි කොල්ලා කරේ....

කොල්ලා ආයෙත් රූම් එකට ආවේ ටවල් එක පිටින්.. කොල්ලා එනකොට නේහා හිටියේ ඇද උඩට වෙලා බර කල්පනාවක... වොශ් රූම් එකේ දොර ඇරෙද්දි ම කල්පනා කර කර හිටපු කෙල්ල ගැස්සෙනවා කොල්ලා හොදට ම බලාගෙන...ඒත් කොල්ලා හැගීම් විරහිතව කෙල්ල දිහා එක බැල්මක් විතරක් හෙලලා අල්මාරිය ලගට ඇදුමක් ගන්න උනත් ආයෙමත් හැරිලා කන්නාඩිය ලගට ගියේ බොඩි spray එක ගන්න...නොදැනුවත් ව උනත් කෙල්ල බලන් උන්නේ කන්නාඩිය දිහා... කොල්ලගේ සුදු හමට බෙල්ලේ වගේම පපුවෙත් තිබුන රතු පැල්ලම් හොදට ම පෙනුනා...එක පාර ම කොල්ලා බෙල්ලේ තිබුන රතු පැල්ලම අතින් වහගෙන කෙල්ල දිහාට හැරුනේ කලබලෙන්... කෙල්ලට ඇස් පේන් නෑ කියන දේ කොල්ලට එහ් මොහොතේ අමතක වෙලා ගියේ කොල්ලටත් නොදැනිම... ඒත් කෙල්ල පෙර ඉරියව්වෙන් ම ඉද්දි කොල්ලා සුසුමක් හෙලුවේ කෙල්ලට ඇස් පේන් නෑ නේද කියලා හිත කියද්දිමයි...

" ගිහින් වොශ් එකක් දාගෙන එනවා...පහලට යන්න ඕනි... "

ආයුශ් ඇදුම් ඇදලා ඉවර වෙලා අතේ තිබුන ටවල් එක නේහා ගේ ඇගට විසික් කරලා කියද්දි කෙල්ල ඒකටත් ඔලුව හොල්ලපු එක විතරමයි කරේ... ඒත් අදනම් මතක් කරල ම ඇදුම් අරන් ගියේ ඊයේ උන දේ මතක් උන හින්ද...

කෙල්ල වොශ් එකක් දාගෙන වොශ් රූම් එකේදිම අරන් ගියපු ගවුමත් ඇදගත්තේ ආයුශ් ගේ ඉස්සරහා ඇදුම් අදින්න කෙල්ල ගේ හිත කොහෙත්ම කැමති නැති නිසා...අඩලා හිටපු නිසා ද මන් ද කෙල්ලගේ සුදු මූන රෝස පාට වෙලා තිබුනා... කෙල්ල වොශ් රූම් එකෙන් එලියට ආවේ තෙත කොන්ඩෙට ටවල් එක ඔතාගෙන...

මේ වෙද්දි වෙලාව 8 ටත් ලන් වෙලා තිබුනා...කෙල්ල රූම් එකට එද්දි ම කොල්ලා කෙල්ල දිහාට කඩන් පැන්නේ කිසිම හිතක් පපුවක් නැතුව..

" මෙච්චර වෙලා මොනවද කරන්නේ...මට බඩගිනියි...ඔව් ඉතින්..මන් ගත්තේ උයලා දෙන්නවත් පුලුවන් ගැනියෙක් නෙමෙයි නෙහ්....උබට උයලා දෙන්න බැරිනම් අඩුම තරමේ වෙලාවට කන්න හරි වරෙන්..."

sinhalaebooks.com

ආයුශ් කතා කරේ හරියට මේ කසාදේ ආයුශ් ට බලෙන් කරලා දුන්නා වගේ... කෙල්ලගේ හිත රිදුනේ නැතුව ම නෙමෙයි...ඒත් කෙල්ල කඳුලු ඉස්සර කර නොගත්තේ අඩලා පලක් නෑ කියලා දන්න නිසා....කඳුලු වලට උනු වෙන්න තරම් හිතක් ආයුශ් ට නෑ...

කෙල්ල ඔතාගෙන හිටපු ටවල් එකත් හිසින් ගලවලා දලා කොල්ලා එක්ක පහලට ආවා...කොල්ලා කෙල්ලගේ අතින් අල්ලා ගත්තත් එහ් ස්පශර්යෙන් පවා කෙල්ලට රිද්දලා කොල්ලා අසීමිත සතුටක් වින්ද... දෙන්නා පහලට යද්දි පායා උඩ රූම් එකට එන්න පුටුවෙන් නැගිට්ටා විතරයි... නේහා ව දැක්ක ගමන් කෙල්ලගේ මූන සතුටින් පිරුනා...

" ගුඩ් මෝනර්නි අක්කි බබෝ... අනේ උදෙන් ම නැවද.....අනේ ඔයා රතු වෙලා අක්කි... "

කෙල්ල කිවුවේ ආයුශ් අල්ලන් හිටපු කෙල්ලගේ අත බලෙන්ම අල්ලගෙන කෙල්ලව තමන් ලග ම පුටුවෙන් වාඩි කරලා...ආයුශ් ඊට එහා පැත්තට වෙන්න තිබුන පුටුවෙන් වාඩි උනා... ආයුශ් ගේ අම්මා බලන් හිටියේ කොල්ලා දිහත් නේහා දිහත් ..එහ් මූනවල් වල තිබුන හැගීම් කියවන්න ඇය උත්සාහ කරා...නේහා වගේම ආයුශ් දෙන්න ම හිත පුරා හිනා වෙලා හිටපු නිසා ම ආයුශ් වෙනස් වෙලා කියලා හිතේ තිබුන පුංචිම සැකයත් නැති කරගත්තේ ඇයගේ හිතට මහා ලොකු සතුටක් දැනෙද්දි.. ආයුශ් ගේ බෙල්ලේ තිබුන රතු පැල්ලමත් ඒකට ලොකුම හේතුවක් උනා... එහ් හැමදේම නේහා ගෙයි ආයුශ් ගේ බැදීමේ ප්‍රතිඵල කියලයි ආයුශ් ගේ අම්මා හිතුවේ...
breakfast ගන්න අතරතුර පොඩි පොඩි කතා කීපයක් ඇරෙන්න ලොකුවට විශේෂ යමක් උනේ නෑ... ඒත් අද කෑම මේසේ ලොකු අඩුවක් තිබුනා..එහ් ආයුශ් ගේ තාත්තා අද breakfast ගන්න ඇවිත් තිබුනෙ නෑ...

නේහා කාලා ඉවර වෙද්දි ආයුශ් ගේ නංගි කෙල්ලගේ අත බෝල් එකට දලා හේදුවේ පුදුම තරම් ආදරේකින්..ඒත් ඊලගට ආයුශ් ගේ අම්මා කෙල්ලගෙන් ඇහුවේ කවුරුත් ම එහ් වෙලාවේ අහයි කියලා නොහිතපු දෙයක්...

" දූ...දූ ගේ ඇස් පෙනුන් නැති උනේ එක පාරම ද...දූ ගේ අම්මා මට විස්තරේ කිවුවා..."

ඇය ඇහුවේ කිසිසේත්ම කෙල්ලගේ හිත රිද්දන්න බලාපොරොත්තුවකින් නෙමෙයි... හිත පුරා මව් සෙනෙහස දෝරේ ගලද්දි..පුදුම තරම් ආදරේකින්...

" ඔව්...ඔ..ව්...අම්මා...එතකොට මත් ගොඩක් චූටී..මට ලොකුවට එහ් ගැන මතකයක් නෑ අම්මා... "

කෙල්ල මේ ආයුශ් ගේ අම්මා ට අම්මා කියලා කතා කරපු පලවෙනි වතාව..ඇයට දැනුනේ නිම් හිම් නැති සතුටක්....

" අපි ඩොක්ටර් කෙනෙක් ව හම්බෙන්න යමු දූ...සමහරවිට අපිට පුලුවන් වෙයි දූ ගේ පෙනීම ආයෙත් ගන්න..."

sinhalaebooks.com

එහ් වචන ටික ඇහෙනවත් එක්ක ම ආයුශ් ගේ ඇස් රතු උනේ හිතට පුදුම තරම් තරහක් දැනෙද්දී...කොල්ලා කාටත් නොපෙනෙන්න නේහා ගේ අත තදින් මිරිකුවා... ආයුශ් එහෙම කරේ අම්මා කිවුව දේට අකමැති කියන්න කියලා ඉගියක් කියලා කෙල්ල හොදකරව ම දැනන් උන්නා...එහ් නිසා මයි කෙල්ල ආයෙත් මේ ලෝකේ දකින්න තිබුන ආසාව යටපත් කරගෙන එහ් දුක මැදින් ම මුනව හිනාවක් ගත්තේ...කවදවත් බොරුවක් නොකියපු කෙල්ල ට ආයුශ් නිසා බොරු ගොතන්න පවා සිද්ද උනා...

" නෑ අම්මා...එහ් දවස් වල ඩොක්ටර් කියලා තිබුනා මගෙ ඇස් දෙක සනීප කරන්න බෑ කියලා... මේ ලගකදිත් පෙන්නුවම ඒක ම කිවුවා... . "

කෙල්ල කිවුවේ පපුව පිච්චිලා යන තරම ට වේදනාවකින්..පොඩි කාලේ කෙල්ලගේ අම්මා කෙල්ලව ඩොක්ටර් කෙනෙක් ට පෙන්නුවත් වැඩි දවසක් ඩොක්ටර් ව මීට් වෙන්න හම්බුනේ නෑ...කෙල්ලගේ තාත්තාගේ හිරිහැරත් එක්ක ඩොක්ටර් කෙනෙක් ට පෙන්නන්න තරම් දිගට ම ප්‍රතිකාර ලබන්න තරම් වත්කමක් කෙල්ලගේ අම්මට තිබුනේ නෑ...එහ් නිසා ම එහ් කාලෙම එහ් දේවල් නැවතිලා ගියා...මේ ලගකදි නම් පෙන්නන්න තියා එහ් ගැන හිතලවත් තිබුනේ නෑ..මොකද රෝස මල් වගාවෙන් ලැබෙන හැම සතයම වගේ කෙල්ලගේ තාත්තා කෙල්ලගේ අම්මට තර්ජනය කරලා අරගත්තු නිසා...තමන් ගේ අම්මා තරමට ම සෙනෙහසක් දක්වන ආයුශ් ගේ අම්මට බොරු කියන්න උන එක ගැන කෙල්ල හිතින් දහස් වාරයක් පසු තැවුනා..කෙල්ලට කරන්න තිබුන එක ම දේ එහ් දේ විතරයි...

නේහා ගේ කතාව එක්ක ආයුශ් ගේ අම්මා සුසුමක් හෙලුවේ බලාපොරොත්තු සුන් උන නිසා... ඒත් ආයුශ් එහ් ලැබුන අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගන්න නම් අමතක කරේ නෑ... මොකද කොල්ලට ඕනි උනේ ගෙදර අයට තමන් ගැන ඇති වෙලා තියන විශ්වාසේ තවත් වැඩි කරලා නේහා ට හිතේ හැටියට වද දෙන්න...

" නේහා ට ඇස් හතරක් ඕනි නැතේ අම්මා...නේහා ගේ ඇස් දෙක මන්... මන් නේහා ව ඇස් දෙක වගේ බලාගන්නවා.."

ආයුශ් කිවුවේ අද පාන්දර අසිහියෙන් හිටපු වෙලාවේ නේහා ට කතා කරපු වචන තරම්ම ආදරනීයව... කෙල්ලගේ කරට ත් අතක් දලා කෙල්ල ව අනවසරෙන් ම තුරුල් කරගෙන, එක අතකින් කෙල්ලගේ ඔලුවත් අත ගාන ගමන්...

නේහා උන්නේ දියෙන් ගොඩ දාපු මාලුවෙක් තරම ට ම ගැහෙමින්...

කෙල්ල හිතන් උන්නේ ආයුශ් කියන්නේ කිසි ම හිතක් පපුවක් නැති,අනුකම්පාවක් අහලකවත් නැති, ආදරය කියන නාමයක් වත් විදලා නැති තිරිසනෙක් කියලා...ඒත් ආයුශ් ට බොරුවට හරි මේ තරම් ආදරනීය ව රගපාන්න පුලුවන් නේද කියලා හිතෙද්දී කෙල්ලගේ හිතට දැනුනේ පුදුමයක්...එහ් එක්ක මයි කෙල්ල ගේ හිතේ ගැබුරුම තැන සටහන් වෙලා තිබුන අද පාන්දර උන සිදුවීමත් මේ වගේ ම රගපෑමක් ද කියලා කෙල්ලගේ හිතට සැකයක් දැනුනේ ..එතකොට නම් කෙල්ල ට ආයුශ් ගැන දැනුනේ කවදවත් නැති තරම ට ම පිලිකුලක්......

sinhalaebooks.com

කෙල්ල අයුශ් ගේ තුරුලෙන් මිදෙන්න හැදුවත් කොල්ලා කෙල්ලව තදින් අල්ලන් හිටපු නිසා ම කෙල්ලට හෙලවෙන්නවත් පුලුවම් කමක් තිබුනේ නෑ...

මතක ඇති කාලෙක තමන් ගේ අයියා මේ තරමට ම ආදරනීයව කතා කරනවා දැකලා නැති පායා පවා තමන් ගේ හිතේ අයියා ගැන තිබුන වැරදි වැටහීම නැත්තට ම නැති කරලා දැන්මා... ආයුශ් ගේ අම්මා ආයුශ් ගේ මේ ගතිගුන එක්ක සතුටු කඳුලු හෙලුවේ තමන් ගෙ පුතා මේ තරමට ම හොඳ උනේ කොහොම ද කියලා තමන්ගේ හිතින් ම ප්‍රශ්න කරමින්...

නේහා ඇරෙන්න එතන හිටපු හැමෝගෙම මූනුවල තිබුනේ කියලා නිම කරන්න බැරි තරමට සතුටක්..ඒත් එහ් සතුට තිබුනේ තවත් විනාඩි දෙක තුනක් විතරයි...

ආයුශ් ගේ නම ගේ දෙවනක් වෙන්න කියමින් කොහෙදෝ ඉඳන් ආව තාත්තා නිසා ආයුශ් වගේ ම අනිත් හැමෝමත් ගල් ගැහුනේ කිසි දෙයක් හිතා ගන්න බැරුව...මොකද කොල්ලගේ තාත්තා හිටියේ ඇස් දෙක ම රතු කරන්..පුදුම තරම් තරහකින් පුපුරමින්...
" ආයුශ්...උබ මොකක්ද මේ කරලා තියෙන්නේ... "

කොල්ලගේ තාත්තා අතේ තිබුන ෆයිල් වගයක් කොල්ලගේ මූනට දමලා ගහලා ඇහුවේ පුදුම තරම් තරහකින්...ෆයිල් ටික කොල්ලගේ ඇගේ වැදිලා ටේබල් එකට වැටුන සද්දෙට ගැහි ගැහී හිටපු කෙල්ල තවත් ගැහෙන්න ගත්තා... ආයුශ් වගේ ම කොල්ලගේ අම්මත් නංගිත් තාත්තා දිහා බලන් හිටියේ තාමත් කිසි දෙයක් හිතා ගන්න බැරුව....

" ඇයි තාත්තා...මන් මොකක් ද කරේ... "

කොල්ලා ඇහුවේ කොච්චර උනත් තාත්තාගේ තරහා ඉස්සරහා තමන් ගේ චන්ඩිකම් තමන්ටත් නොදැනිම නැති වෙලා යද්දී... මොකද කොල්ලා කවදවත් ම දැකලා තිබුනේ නෑ කොල්ලගේ තාත්තා මේ තරමට ම තරහින් ඉන්නවා...

ආයුශ් ගේ එහ් වචන ටිකත් එක්ක ම තරහින් හිටපු කොල්ලගේ තාත්තා කොල්ලගේ කම්මුලට පහරක් ගැහුවේ එහ් තරහා තවත් වැඩි උන හින්දමයි... කොල්ලගේ තාත්තා හිටියේ තමන්ව වත් පාලනය කරගන්න බැරි තත්වෙක....

" මොකද කරේ....උබ දන්නෙ ම නෑ මොකක්ද කරේ කියලා... "

ආයුශ් ගේ තාත්තා ආයෙමත් හයියෙන් කෑ ගහන්න ගත්තේ කොල්ලගේ අනිත් කම්මුලටත් පහරක් ගහලා....

" මොකක්ද උනේ කියන්නකෝ...මේ ළමයට මෙහෙම ගහන් නැතුව.... "

sinhalaebooks.com

ආයුශ් ගුටි කනවා බලන් ඉන්න ම බැරි තැන ආයුශ් ගේ අම්මා මැද්දට පැන්නේ හිතේ උතුරන දරු සෙනෙහස හින්දමයි....කොල්ලා මේ විදිහට ගුටි කනවා බලන් ඉන්න තරම් හයියක් එහ් හිතට තිබ්බේ නෑ.....

" මොකක්ද උනේ...ඔයා දන්නව ද ඔයාගේ පුතන්ඩියා කරලා තියන දේ...මූ හැදුවට වඩා හොදයි...මන්.... "

ආයුශ් ගේ තාත්තා කියන්න ගියපු වචන ටික ගිලගෙන ආයෙමත් කොල්ලගේ කම්මුලට පහරක් ගැහුවා....

" මූ...මූ කම්පැනි එකේ හැම security එකක ම password අර කෙල්ලට දීලා... secretary කියලා මූ උඩින් ම තියන් හිටපු එකීට... ඒකී....මන් මෙච්චර කල් හම්බ කරපු සල්ලි වලින් බාගෙකටත් වඩා අරන් දැන් ආගිය අතක් නෑ...මන් වෙලාවට කම්පැනි එකෙන් බාගයක් විතරක් මේ බූරුවට පැවරුවේ...ඔක්කොම පැවරුවා නම් අරකි සතයක් වත් ඉතුරු කරන එකක් නෑ.... "

කොල්ලගේ තාත්තා කිවුවේ තරහින් පුපුරමින්...එහ් තරහට ඇස් පවා රතු වෙද්දි...

" මොකක්...ඒකී....මන් ඒකිව ඉතුරු කරන් නෑ....ඒකිට කොහෙන්ද එච්චර හයියක්..."

තාත්තා ගේ වචන එක්ක ආයුශ් කිවුවේ කේන්තියෙන්...තරහට ම කොල්ලගේ වචන පවා වෙවුලද්දි....

" ඒකිට නෙමෙයි...උබට කොහෙන්ද හයියක් ඒකිට password දෙන්න...කතා කරපන් ආයුශ්...උබ මොකට ද ඒකීට password දුන්නේ....කතා කරපන්....."

" තාත්තා මන්... "

" ඔව්....කියපන්...මොකද උබ ගොත ගහන්නේ...කියපන්...උබ මොකටද කොහෙවත් යන එකියක් ට password දුන්නේ... "

" ම...ට..දෙ...න්...න්...උ...නා...තා..ත්...තා..."

කොල්ලා කිවුවේ බිම බලාගෙන..පුදුම තරම් අසරනකමකින්... මොන දරන් දරදඩු උනත් කොල්ලත් හිටියේ දරාගන්න බැරි තරමේ දුකකින්..මොකද කොල්ලා හොදකාරවම දන්නවා මේ කම්පැනි එක මේ තත්වෙට ගන්න තාත්තා උන මහන්සිය...කොල්ලා උන්නේ මේ උන කිසි දෙයක් හිතා ගන්න බැරුව....

" මොකටද උබට දෙන්න උනේ...කියපන්..."

sinhalaebooks.com

මේ තරම් කාලෙකට තාත්තට හංගපු හැම දෙයක් ම අද කියන්න වෙනවා නේද කියලා දැනෙද්දී කොල්ලට දැනුනේ කවදාවත් නොදැනුන විදිහේ බයක්..ඒත් ඇත්ත කියනවා ඇරෙන්න වෙන කරන්න දෙයක් නැති බව කොල්ලා හොඳට ම දැනන් උන්නා...එහ් නිසාමයි වෙන දෙයක් වෙන්න කියලා කොල්ලා හිත හදාගෙන ඇත්ත කියන්න ගත්තා...

" තාත්තා..මට පවරපු වැඩ ඔක්කොම කරේ එහ් කෙල්ල... මට ඒවා කරන්න ඕන කමක් තිබ්බේ නෑ.... මන්...මන්...ගොඩක් දවසට ඔෆිස් ගියෙත් නෑ...මන් ඉතින් ඔක්කොම එහ් කෙල්ලට පවරලා තිබුනේ...ඒකයි password දුන්නේ...ඒත් මන් හිතුවේ නෑ එහ් කෙල්ල මෙහෙම දෙයක් කරයි කියලා.... "

කොල්ලගේ එහ් වචන ටිකත් එක්ක කොල්ලා බලාපොරොත්තු උනේ තාත්තා තමන් ව ඉතුරු කරන් නැති වෙයි කියලා...ඒත් උනේ කොල්ලා කිසි සේත්ම බලාපොරොත්තු නොවුන දෙයක්... ඔහු දෝතින් ම තමන් ගේ ඔලුව බදාගෙන ලග තිබුන පුටුවෙන් වාඩි උනේ ඇස් වල කඳුලු පුරවන්... කවදාවත් එහ් ඇස් වල මේ තරම් අසරනකමක් දැකලා නැති කොල්ලා උන්නේ ගල් ගැහිලා එහ් දිහා බලාගෙන...

" දරුවෝ කියලා හැදුවේ,හැම සතයක් ම හම්බ කරේ මෙහෙම දරුවෝ වෙනුවෙන් ද... උබ...උබ හැමදම කරේ අපිව පත පිටින් මරපු එක ආයුශ්....උබට තියන ආදරේ හින්ද හැමදම උබ කරපු හැම දෙයක් ම ඉවසුවා .. ඒත් උබ...මේ තරමට ම අසරන කරයි කියලා හීනෙකින් වත් හිතුවේ නෑ... මුලින් ම උබ බීලා නාස්ති උනා..ඊට පස්සේ අර අහිංසක කෙල්ලගේ ජීවිතේ විනාස කරා...දැන් ජීවිත කාලෙම උබලා වෙනුවෙන් ම හම්බ කරපු කම්පැනි එකත් උබ මට නැති කරලා දැන්මා...උබට මොනවද ආයුශ් තව ඕනි...උබ මේ තාත්තාවත් මරපන්...එතකොට උබට සැනසීමක් දැනෙයි.... "

කවදාවත් හැගීම් බර වෙලා නැති තාත්තා අද හඩා පැලපෙමින් කිවුව කතාවට ආයුශ් උන්නේ හද පතුලෙන් ම පිච්චෙමින්... තමන් කරේ කවදාවත් සමාවක් දෙන්න බැරි වැරැද්දක් කියලා කොල්ලා දැනන් උන්නා ....

" මට සමාවෙන්න තාත්තා... මන්...මන් ඒකිව...කොහොම හරි හොයාගෙන...තාත්තා ලගට ම...."

" කට වහපන් ආයුශ්...දැන් ඒකිව උබට කොහෙත්වත් හොයා ගන්නවෙන් නෑ...ඒකි ගිහින් ඉවරයි....උබට මේ තාත්තා ගැන පොඩි හරි ආදරයක් තියනවනම් මේ ඉතුරු වෙලා තියන ටිකවත් රැකගන්න බලපන්.... නැත්නම් මට මුලු ජීවිත කාලෙම විදවන්න වෙයි...උබ වගේ පුතෙක් ට තාත්තා උන එකට...මන් මෙ හැමදේම කරේ උබයි නංගියි වෙනුවෙන් ආයුශ්...මන් මේවා යද්දි අරන් යන් නෑ..මේවා මගෙ ඇස් ඉස්සරහම විනාශ වෙද්දි මට තවත් ජීවත් වෙන්නවත් ඕනි නෑ.... "

" මන් මොනවද තාත්තා කරන්න ඕනි...තාත්තා කියන ඕනි ම දෙයක් මන්...මන්...කරන්නම්..."

sinhalaebooks.com

ආයුශ් කිවුවේ ස්තීර කටහඩින්...හිත ගලක් කරගෙන හිටුයත් එහ් ඇස් වලින් පවා කඳුලු ගලන් යද්දි ......

" මීටින් එකක් තියනවා ඉන්දියා වල..හැම කම්පැනි එකකින් ම එතනට එනවා.....පුතේ උබ මේ තාත්තා ට පොඩ්ඩක් හරි ආදරේ කරා නම් එහ් මීටින් එකට ගිහින් අලුත් production එකක් ගැන ප්‍රසන්ටේෂන් එකක් කරලා කොහොම හරි මේ පාර production loan එක අපේ කම්පැනි එකට ගන්න....production එක success උනොත් එහ් ලැබෙන සල්ලි වලින් ආයෙත් කම්පැනි එක ගොඩ දගන්න පුලුවන්.....හැබැයි...හොදට හිතලා කවුරුත් නොකරන විදිහේ production එකක්..... උබ මේකත් විනාශ කරලා දැන්මොත් නම්.... මත් උබට බල කරත් නෑ ආයුශ්... උබ මත් ගැන නෙමෙයි නංගි ගැන හරි හිතලා මේ දේ කරපන් පුතේ ...මත් හැමදම මේ දේවල් කරේ උබලා දෙන්නා වෙනුවෙන්... "

" මත් යත්නම් තාත්තා...මත්...මත්...එහ් දේ කරනවාමයි ..... "

ආයුශ් කිවුවේ පුදුම තරම් විශ්වාසෙකින්...එහ් වචන වලට කොල්ලගේ තාත්තාගේ දුක නැත්තට ම නැති වෙලා යද්දි..

" තව මාසයක් තියනවා මීටින් එකට...හොදට හිතන්න පුතා...පුතා ගිහින් එනකම් අපි...අපි නේහා දුව ව බලා ගන්නම්..."

කොල්ලාගේ තාත්තා කිවුවේ නේහා ගේ ඔලුවත් හරි සීරුවට අත ගාමින්...ඒත් කොල්ලා කිසිත් නොකියම කෙල්ලගේ අතින් අල්ලගෙන රූම් එකට ආවේ ලොකු කල්පනාවකට වැටිලා.... රූම් එකට ඇවිත් දොර වහගත්ත කොල්ල එහෙම්ම ම බිත්තියට ඔලුව ගහා ගත්තේ තමන් කරපු හැම දෙයක් ම ඇස් ඉස්සරහා මැවිලා පේද්දි... තමන් මේ තරම් කාලෙකට අම්මට වගේ ම තාත්තාට ත් මොන තරම් දුක් දීලා තියනවද කියලා අද කොල්ලට අගේට තේරෙන්න ගත්තා...හිතට දැනුනේ පුදුම වේදනාවක්...

secretary ව උනත් කොල්ලා මොන තරම් විශ්වාස කරා ද ...එහ් කෙල්ල මෙහෙම විනාශයක් කරයි කියලා කොල්ලා කීයටවත් හිතුවේ නෑ.....

කොල්ලා දෙතුන් වතාවක් ම බිත්තියට ඔලුව ගහා ගත්තේ එහ් ලග ම හිටපු කෙල්ලවත් හොදට ම බය කරලා...බිත්තියට ඔලුව වැදෙන සද්දෙගෙත් එක්ක ම කොල්ලගේ සියුම් ඉකි බිදුම් හඩත් ඇහුන හින්ද ම ආයුශ් අඩනවා කියලා තේරුම් ගන්න කෙල්ලට වැඩි වෙලා ගියෙ නෑ ...

ආයුශ් තමන් ට මොන තරම් දරුණු විදිහට සැලකුවත් කෙනෙක් අඩද්දි අසරන වෙලා ඉද්දි නොබලා ඉන්න තරම් දරුනු හිතක් කෙල්ලට තිබුනේ නෑ...එහ් හින්ද මයි කෙල්ල සද්දේ ඇහුන දිහාට හෙමින් හෙමින් ගියේ...කෙල්ල ගිහින් අත තිබ්බේ නොදැනුවත් ම උනත් ආයුශ් ගේ පිටට...

sinhalaebooks.com

කෙල්ලගේ ස්පර්ශයත් කෙල්ල ම බිත්තියට ඔලුව ගහමින් තමන් කරපු දේට තමන් ට ම දඬුවම් දෙමින් හිටපු කොල්ලා කෙල්ල දිහාට හැරුනේ තත්පර ගානෙත්....
කොල්ලා කෙල්ල දිහාට හැරෙනවත් එක්ක ම කොල්ලගේ ඇඩිල්ලත් නැති වෙලා යද්දි කෙල්ල ගේ හිත පුදුම විදිහට බය උනා....කෙල්ල හිතුවෙම තමන් ගේ කම්මුලට ඊලග මොහොතේ පහරක් වදී කියලමයි...කෙල්ල ආයුෂ් ට කතා කරන්න ගිහින් කරගත්තේ වැරැද්දක් කියලා එහ් දැනුන බය අස්සෙම කෙල්ලගේ හිත කියන්න ගත්තා....එහ් හින්ද මයි කෙල්ල ගැහෙන්න ගත්තේ...

ඒත් ආයුෂ් තත්පර ගානක් කෙල්ලගේ මූන දිහා බලන් ඉදලා ඊලගට කලින්ටත් වඩා හයියෙන් අඩන්න ගත්තා....එහ් ක්ෂයෙන් ම අනිත් පැත්ත හැරිලා ආයෙත් කලින්ටත් වඩා හයියෙන් ඔලුව බිත්තියේ ගහ ගත්තේ තමන් ගැන ම දැනුන තරහා නිසා..

ආයුෂ් ගේ මේ සැරින් සැරේ වෙනස්වෙන හැසිරීම කෙල්ලගේ හිතේ තිබ්බ බය නැත්තට ම නැති කරලා දැන්මා... කෙල්ලට ඕනි උනේ කොහොම හරි ආයුෂ් දැන් ඉන්න තත්වෙට සහනයක් දෙන්න... එහ් වගේ ම ආයුෂ් මේ තමන්ගෙන් ම පලි ගන්න හදන එක කෙල්ලගේ හිතට ගෙනාවේ පුදුම බරක්.. ආයුෂ් තමන් ට මොන විදිහට සැලකුවත් කෙල්ලගේ හිත කැමති උනේ නෑ ආයුෂ් මේ විදිහට දුක් විදිනවා බලන්න...ආයුෂ් නෙමෙයි..මේ ලෝකේ කවුරු උනත්...කෙල්ලගේ හිත එහ් විදිහයි....

" ආ..යු...ශ්...මොකද මේ...නවත්තන්න..."

කෙල්ල කිවුවේ ආයුෂ් ගේ පිටින් ආයෙත් අත තියන ගමන්...ඒත් කෙල්ල එහෙම කතා කරන්න කරන්න කොල්ලා කරෙ තමන් ට තවත් රිද්ද ගන්න එක.... එහ් වගේ ම කොල්ලගේ ඉකි බිදුම් ඉකියක් බවට පත් උන එක... කෙල්ලට ඒක හොදට ම තේරුනා...එහ් හින්දමයි කෙල්ල අකමැත්තෙන් උනත් ආයුෂ් ට එහ් විදිහට ම ඉන්න දීලා ඇවිත් ඇදෙන් වාඩි උනේ....

කොල්ලා තවත් ටික වෙලාවක් එහ් විදිහට ම ඉදලා බිත්තියෙන් ඔලුව ගත්තේ නලලෙන් දැනුන වේදනාවත් එක්ක.... කොල්ලගේ නලල මේ වෙද්දි ලේ එන තරමට ම තුවාල වෙලා තිබුනා... ඒත් කොල්ලට නම් එහ් ගැන වගක් වත් තිබුනේ නෑ.කොල්ලා හිටියේ ගතේ වේදනාවට වඩා දස දහස් ගුනයක් හිතින් තැවෙමින්...

ඇදේ වාඩි වෙලා හිටපු කෙල්ලට ආයුෂ් ගේ අඩි සද්දේ හොදට ම ඇහුනා....කොල්ලා ටිකෙන් ටික තමන් ලගට එනවා කියලා දැනෙද්දි මොනවා උනත් කෙල්ලගේ හිත ආයෙමත් ගැස්සෙන්න ගත්තා...මොකද ආයුෂ් කියන්නේ කවදාවත් ම කාටවත් ම තේරුම් ගන්න පුලුවන් කෙනෙක් නෙමෙයි...

ඒත් කොල්ලා ඇවිත් එක පාරම ටයිල් පොලව මත වාඩි වෙලා ඇදේ වාඩි වෙලා හිටපු තේහා ගේ උකුලෙන් තමන් ගේ ඔලුව තියා ගත්තේ කිසිම අවසරයකින් තොරව... මහා හයියෙන් අඩාගෙන.... කෙල්ල උන්නේ වෙන කිසිම දෙයක් හිතා ගන්න බැරුව ගල් ගැහිලා...

sinhalaebooks.com

කොල්ලා ටික වෙලාවක් එහ් විදිහට ම අඩ අඩ ඉදලා ඊලග තත්පරේ තේහා ගේ අත අරන් තමන් ගේ ඔලුව උඩින් තිබ්බේ කොල්ලගේ ඔලුව අත ගාන්න කියලා ඉගි කරමින් වගේ...

කවදාවත් පිරිමියෙක් ගේ හුස්මක්වත් වැටිලා නැති තේහා ට මේ හැම හැගීමක් ම නුහුරු උනා...එහ් වගේ ම නුහුරු මොකක්දෝ සතුටකුත් හිතට දැනෙන්න ගත්තා...එහ් හැගීම් වල තේරුම මොකක් ද කියලවත් කෙල්ල දැනන් උන්නේ නෑ.... කෙල්ලගේ උඩු හිත කොහොම උනත් යටි හිතනම් මේ වෙන දේවල් වලට කැමැත්තෙන් උන්නා...

ගෑනු කොහොමත් බොලදයි... කප්පරක් දුක් වින්ද ගෑනියෙක් ට එක ම එක හැගීමක් ඇති එහ් හැමදේම අමතක කරලා දාන්න... ඒත් තේහා වෙනස්.... ගොඩක් වෙනස්.....කෙල්ලට කවදාවත් ම ඕනි උනේ නෑ තමන් ගේ මුලු ජීවිතේම විනාශ කරලා දාන් ම පිරිමියා වෙනුවෙන් උන හැමදේම අමතක කරලා දාන්න....ඒත් කෙල්ලට ඕනි උනා දුකින් ඉන්න ආයුශ් ගේ හිතට සහනයක් වෙන්න...එහ් කෙල්ලගේ හිත හතුරෙක් ට වත් වෛර නොකරපු නිසා....

කෙල්ල ආයුශ් ඔලුව උඩින් තිබ්බ තමන් ගේ අතින් කොල්ලගේ ඔලුව සීරුවට අත ගාන්න ගත්තා... කොල්ලගේ කදුලු වලින් තමන් ගේ ඇදුම් මේ වෙද්දි ත් තෙත් වෙලා ඉවරයි....ආයුශ් ගේ චන්ඩිකම් මැරකම් එක්ක කෙල්ල කවදාවත් ආයුශ් මේ තරමට වැටිලා ඉන්නවා දකින්න නම් කැමති උනේ නෑ.... එහ් හින්ද ම කෙල්ලා ආයුශ් ගැන ගොඩක් දුක් උනා..

" අඩන්න එපා...ඔයා හිතලා කරේ නැතේ...තාත්තා කිවුව දේ කොහොම හරි කරලා පෙන්නන්න... එතකොට තාත්තා ගොඩක් සතුටු වෙයි... "

කෙල්ල කිවුවේ කෙල්ලගේ අහිංසක කටහඩින්...බොහොම පැහැදිලි හඩින්..එහ් වචන ඇහෙද්දි ත් කොල්ලගේ හිත මොකක් දෝ ලොකු වේදනාවකින් පිරෙන්න ගත්තා...හැබැයි තමන් තේහා ට කරපු වද හිංසා ගැන නම් පුංචි ම පුංචි පසුතැවීමක් වත් එහ් හිතට දැනෙන්න තරම් එහ් වේදනාව ප්‍රභල උනේ නෑ... කොල්ලා නිහඩයි... වචනයක් වත් එහ් මුවින් පිට උනේ නෑ....එහ් වෙනුවට කොල්ලා කරේ කෙල්ලගේ උකුලට තවත් තුරුල් උන එක...

" ඔයාගේ නලල තුවාල වෙලා ද...මන් බෙහෙත් දාන්න ද... "

පුලුවන් ද හිතකට මේ තරමට ම කරුණාවක් දක්වන්න... ඒත් තේහා ට පුලුවන් උනා... මොකද කෙල්ල හැමදාමත් හැමෝගෙම යහපත ම පතපු නිසා...

කෙල්ලගේ එක ප්‍රශ්නෙකටවත් ආයුශ් ගෙන් පිලිතුරක් නම් ලැබුනේ නෑ... එහ් වෙනුවට කොල්ලා තව තවත් කෙල්ලගේ උනුහුම හොයපු එක විතරමයි කරේ...

" ආයුශ්...මන් කියන දේ ඇහෙනවද...."

"ෂ්..ෂ්.... මට ඕවා අහන්න ඕන් නෑ... "

sinhalaebooks.com

වෙනද වගේ තරහින් නොවුනත් කොල්ලා කිවුවේ කෙල්ලට තරවටු කරලා...එතනින් එහාට වචනයක් වත් කියන්න කෙල්ල බය උනා...එහ් හින්ද ඊට පස්සේ ගෙවුන හැම තත්පරේම ගෙවුනේ නිහඬ බව බිඳින ආයුශ් ගේ ඉකි බිඳුම් හඬක් සුසුම් හඬත් එක්ක...

අඩ හෝරාවක්...නෑ හෝරාවක් විතර ගෙවිලා යන්න ඇති...කොල්ලා උන්නේ නින්දත් අඩ නින්දත් අතර...ඒත් කෙල්ල ට නම් නින්දක් අහලකවත් තිබුනේ නෑ...කෙල්ල හිටියේ මේ වෙන දේවල් හින්ද ම හිත හොඳට ම අවුල් කරගෙන....

ඒත් ආයුශ් නින්දෙන් ම කිවුවේ කෙල්ල හීනෙකින් වත් හිතුවේ නැති දෙයක්...

" නේ...හා...උබට ඔය ඇස් දෙක ඕනි මද... "

" ආ..යු...ශ්..."

" මන් අහපු දේට උත්තර දීපන්... "

" නෑ... "

" උබට ඕනි උනත් ..මන් උබට ඔය දැස් දෙක දෙන් නෑ නේහා...කවදාවත් ම ඒක වෙන්න දෙන්නේ නෑ...එහ් හින්ද උබේ හිතේ එහ් ගැන අදහසක් තියනවා නම් අත ඇරලා දාපන්...තේරුනා ද... නැත්තම් උබත් එහ් වගේ වෙයි...එහෙම උනොත් මන් මැරිලා යයි... "

" කොයි වගේ ද ආයුශ්... ඔයා මොනවද මේ කියන්නේ....මට මොනවත් තේරෙන් නෑ... "

" උබට මොනවත් තේරෙන්න ඕනත් නෑ නේහා...උබ...උබ හැමදම ඔය විදිහට ම හිටපන්...."

ආයුශ් එහ් වචන ටික කියනවත් එක්ක ම කෙල්ලගේ උකුලෙන් නැගිට්ටේ කෙල්ල ට හිතන්නවත් වෙලාවක් නොදී.... ඊලගට ඇඳේ එහා පැත්තට ගිහින් නිදා ගත්තේ මිට සුලු මොහොතකට කලින් උන හැමදේම අමතක කරලා දාලා...

කෙල්ලට ආයුශ් ගේ මේ හැසිරීම පුදුමක් ගෙනාවත් අද කෙල්ල එකම එක දෙයක් තේරුම් ගත්තා... එහ් ආයුශ්...කාටවත් ම නොකියන දෙයක් හිතේ තියන් දුක් විදිනවා කියලා... ආයුශ් ගේ අද මේ වචන මේ හැසිරීම එහ් හැමදේකට ම සාක්ශි සැපයුවා...ඒත් කෙල්ල ට හිතා ගන්නවත් බැරි උනා එහ් දේ මොකක් වෙන්න ඇති ද කියලා...තවත් පැය බාගයක් විතර ඇඳට වෙලා කල්පනා කර කර හිටපු කෙල්ල ඊලගට නිදා ගන්න හැදුවේ කොච්චර කල්පනා කරත් ආයුශ් ගේ මේ හැසිරීම් තේරුම් ගන්න බෑ කියලා හිතට හොඳට ම වැටහුන නිසා...මේ වෙද්දි ආයුශ් නම් හිටියේ තද නින්දේ... කෙල්ලටත් ටික වෙලාවක් යද්දි හොඳට ම නින්ද ගියා....

sinhalaebooks.com

පහුවදා උදේ වෙද්දි කෙල්ල ඇහැරුනේ ආයුශ් ඇහැරලා ඇති ද කියලා හිතට දැනුන බයත් එක්ක...ඒත් ආයුශ් ඇදේ එහාට මෙහාට දඟලද්දි කොල්ලා තාම නිදි කියන දේ කෙල්ලට තහවුරු උනා... කෙල්ල දෙවියන්ට ස්තුති කරේ අදත් ඇහැරුන් නැති උනා නම් කෙල්ලට ආයුශ් මොනා කරයි ද කියලා හිතා ගන්නවත් බැරි උන නිසා.. ඒත් ඊයේ ආයුශ් හිටපු හැටි මතක් වෙද්දි ආයුශ් වෙනස් වෙලා ද කියලා කෙල්ලගේ හිතේ කොනක වෙන්න පුංචි ම පුංචි බලාපොරොත්තුවක් තිබුනත් කෙල්ල මහා ලොකු බලාපොරොත්තුවක් හිතේ තියා ගත්තේ නැත්තේ ඊයේ අන්තිමට උන සිදුවීම මතක් උන නිසා.. ඒත් ආයුශ් හැමදාම ඊයේ වගේ ඉන්නවනම් කියලා කෙල්ලගේ හිතට කොහෙදෝ ඉඳන් ආව ලෝබ කමක් එක්ක ම හිතෙන්න ගත්තා....

කෙල්ල ආයුශ් ට ඇහැරෙන් නැති වෙන්න හෙමීට ඇඳෙන් නැගිටලා ගියේ වොශ් රූම් එකට... ඉක්මනට වොශ් එකකුත් දාගෙන රූම් එකට ආව කකුල් දෙක ලඟට ම දිග ගවුමක් ඇඳගෙන... කෙල්ලගේ අම්මා ගවුම ගැන කිව්ව විදිහට නම් මේ කහා පාට ගවුමක්....කෙල්ල ගවුම ඇන්දෙත් එදා අම්මා කිව්ව දේවල් හිතින් මවාගෙන... තෙත කොන්ඩේ කඩා දාලා මූනට වැටුන ඉර එලියත් එක්ක කෙල්ලව තවත් ලස්සනට පෙනුනා... කෙල්ල රූම් එකේ දොර ලඟට ගිහින් පහලට යන්න හැදුවේ වැටෙයි ද කියලා හිතට බයක් දැනුනත් පහලට යන්න ම ඕනි නිසා... මොකද කෙල්ලට ඕනි උනා ආයුශ්ගේ අම්මා එක්ක ආයුශ් නැති තැන ටිකක් කතා කරන්න...

කෙල්ල පඩිපෙල බැහැලා පහලට යද්දි ආයුශ් ගේ අම්මා හිටියේ හැමෝට ම තේ හදන ගමන්...කෙල්ලව දැක්ක ගමන් එහ් ඇස් විසල් උනේ කෙල්ල තනියම පහලට එයි කියලා ඇය කීයටවත් හිතුවේ නැති නිසා...

" අනේ දූ...මොකද මේ..මට කතා කරානම් මන් දූව එක්ක එනවනේ...වැටුනානම් එහෙම තනියම එන්න ඇවිත්..."

ඇය කිව්වේ කෙල්ලගේ දෝතින් ම අල්ල ගන්න ගමන්...

" නෑ අම්මා...මට දැන් පුරුදුයි...අනේ අම්මා...අම්මාට කරදරයක් නැත්නම් මට අම්මා එක්ක පොඩ්ඩක් කතා කරන්න පුලුවන් ද.. "

" අම්මලට තමන් ගේ දරුවෝ එක්ක කතා කරන එක කරදරයක් ද පුතේ... මට දූ ත් මගෙ ම දරුවෙක්...කියන්න පුතේ...මොකක් හරි ප්‍රශ්නයක් ද...ඔඉයේ උන සිද්දිය නිසා ආයුශ් පුතා දූට..? "

ඇය කියන්න ගියපු වචන ටික කියලා ඉවර කරන්න කලින් ම නේහා කතාව පටන් ගත්තේ ආයුශ් ඇහැරෙයි කියලා බයටමයි...

" අනේ නෑ අම්මා...ආයුශ් මට මොනවත් කිව්වේ නෑ.... අම්මා...මන්...ආවේ.... "

" ඔව් පුතේ කියන්න... "

sinhalaebooks.com

" අනේ අම්මා මට අම්මාව බලන්න ඕනි...අම්මා ගෙදර තනියම මොනා කරනවද දන් නෑ අම්මා.... මර හැමවෙලාවෙම අම්මව මතක් වෙනවා... "

කෙල්ල කිවුවේ කෙල්ලගේ රත්තරන් අම්මගේ මූන,එහ් වචන හිතේ මැවෙද්දි..ඒත් ආයුශ් ගේ අම්මාගෙන් ලැබුනේ කෙල්ල කිසිසේත් ම බලාපොරොත්තු නොවුන පිලිතුරක්.....

" අනේ පුතේ...ඒක ද මේ...ඇයි දූට ආයුශ් පුතාට ඒක කියන්න බය ද...මන් කියන්නම් දූ...දූව එක්ක යන්න කියලා හොදද....දැන් මේ තේ එක බොන්නකෝ..."

ඇය කෙල්ල අතට තේ කෝප්පෙත් දීලා කිවුවේ පුදුම තරම් ආදරේකින්...ඇය හිතන් ඉන්නේ ආයුශ් දැන් නේහා ට ගොඩක් ආදරෙයි කියලා...ඒත් කෙල්ල ට උනේ කබලෙන් ලිපට වැටුනා වගෙ වැඩක්...අම්මව හම්බ වෙන්න ආයුශ් ට හොරෙන් උදව් ඉල්ලන්න ආවත් දැන් ආයුශ් මේ හැමදේම දැනගත්ත ම මොන වගේ තත්වයක් උදා වෙයි ද කියලා කෙල්ලගේ හිතට දැනුනේ පුදුම තරම් බයක්...එහ් හින්ද ම ද මන් ද කෙල්ල උනුවෙන් තිබුන තේ එකත් උගුරට දෙකට බීලා දැන්මා... අම්මටත් යන්නම් කියලා කෙල්ල උඩට එන්න හැරෙද්දියි කොල්ලගේ අම්මා ආයෙත් පාරක් කෙල්ලට කතා කරේ...

" දූ තනියම යන්න බැහැ නෙහ්..ඉන්න මන් එක්ක යන්නම්..."

" අනේ එපා අම්මා...මට දැන් පුරුදුයි..මන් ගෙදරත් තනියම යනවා ඕන තරම්... "

කෙල්ල කිවුවේ අමාරුවෙන් මුනට හිනාවක් අරන්... කොල්ලගේ අම්මා කෙල්ල ලගට ඇවිත් ඔලුව අත ගාලා කෙල්ල කිවුව දේට හා කිවුවා...

" දූ.... ආයුශ් පුතාට තේ එක බොන්න පහලට එන්න කියන්න..."

ආයුශ්ගේ අම්මගේ මුවින් පිටවුන ඊලග වචන ටිකට නම් කෙල්ල ගැස්සිලා ගියා..ආයුශ් දැන් පහලට ආවොත් අත් වෙන ඉරනම මොකක් ද කියලා දන්න නිසා ම කෙල්ල ඉක්මන් උනේ තත්පර ගානෙන්...

" මන් ගිහින් දෙන්නම් අම්මා එයාට.."

" අනේ පුතේ ඔයාට බැනේ ඔහොම..."

" නෑ අම්මා...මට පුලුවන්..කෝ දෙන්නකෝ..."

නේහා එහෙම කියන ගමන් අත දිග් කරේ තේ එක දෙන්න කියන්න...කොල්ලගේ අම්මා කෙල්ල අතට තේ එක දුන්නත් කෙල්ල වැටෙයි කියන බය නිසා ම කෙල්ලව රූම් එකේ දොර ලගට එක්ක ආවා... කෙල්ල රූම් එක ඇතුලට ගියාමයි ආයුශ් ගේ අම්මා හැරිලා ගියේ...කෙල්ල රූම් එකට එනකොටත් කොල්ලා හිටියේ වොශ් එකකුත් දගෙන ටේබල් එක

sinhalaebooks.com

ලග... ලැප් එකේ මොකක්දෝ වැඩක් කියලා කෙල්ලට හිතුනේ ඇහුන සද්දෙත් එක්ක..... තේහා රූම් එකට එද්දි කොල්ලා කෙල්ල දිහා එක බැල්මක් විතරක් හෙලලා අයෙත් කරපු වැඩේ ම කරන්න ගත්තා...

" ඔයා ඇහැරුනා ද..තේ එක... "

කෙල්ල කිවුවේ කී බෝඩ් එකේ සද්දේ ඇහෙන දිහාට එන ගමන්...ඒත් කොල්ලගේ පිලිතුරක් නම් ලැබුනේ නෑ...කෙල්ලගේ හිත ගැස්සුන් නැතුවම නෙමෙයි..ඒත් කෙල්ල උන්නේ ඊයේ රෑ උන කිසි දෙයක් මතකයේ නැති ගානට...තමන් රූම් එකේ නැති උනාම ආයුශ් ට තරහා ගිහින් ඇති ද කියලත් කෙල්ලගේ හිත කියන්න ගත්තා...

"ආ...යු...ශ්...."

" කට වහපන්...උබ කොහෙද ගියේ උදේ පාන්දර අහ්... "

" ආ..යු...ශ්...ම...න්..."

" කට වහපන්...මන් ඔක්කොම අහගෙන හිටියේ... උබ... උබ අම්මා එක්ක ගෙදර යන්න නේද හැදුවේ.... තේහා උබ මාව තම්බන්න හැදුවා මදි... මන් ඔක්කොම බලාගෙන හිටියේ... "

" ආයුශ්...ඔ..යා...මො...න...ව...ද...දෑ...ක්...කේ... "

" හැම දෙයක් ම..අම්මා එක්ක කියපුවයි කරපුවයි ඔක්කොම... උබ වගේ කපටි ගෑනියෙක් මන් දැකල ම නෑ... "

කෙල්ලගේ හිතට දැනුනේ පුදුම තරම් තනිකමක්..අසරනකමක්... හැමදම වගේ අදත් ආයුශ් ගේ කිසිම වෙනසක් නෑ...පරන ආයුශ් මයි... කෙල්ල කරේ කරපු හැම චෝදනාවක් ම පිලි අරන් නිහඩව හිටපු එක..අම්මව බලන්න යන්න හිතේ තිබ්බ ආසාවත් එහ් එක්ක ම අත ඇරලා දැන්මේ ඒක කවදාවත් නොවෙන දෙයක් කියලා දැනුන නිසා... ඒත් ඊලගට ආයුශ් කිවුව වචන ටිකනත් කෙල්ලට අදහ ගන්නත් බැරි උනා...

" ලෑස්ති වෙනවා...මන් විනාඩි 5යි දෙන්නේ.. ඇදුමක් දගෙන එනවා... "

" කො...හේ...ය..න්...න..ද...ආ...යු...ශ්..."

" අම්මව බලන්න..."

" ඇත්තම ද ආයුශ් ..."

" මගෙ යකා අවුස්ස ගන් නැතුව ගිහින් ලෑස්ති වෙයන්... "

sinhalaebooks.com

කොල්ලා කිවුවේ මුලු කාමරේම දෙදරලා යන තරම් තරහකින්...ඒත් කෙල්ලට අදනම් එහ් තරහත් හිතට ගෙනාවේ පුදුම සතුටක්..ආයුශ් ගෙදර ගිහින් අම්මටත් බනියි ද කියලා හිතට බයක් දැනුනත් ඊට වඩා කෙල්ලට අම්මා ලගට යන්න තිබුන ආශාව වැඩි උනා... කෙල්ල ඉක්මනට අල්මාරිය ලගට ගිහින් ඇදුමක් හොයන්න ගත්තේ මේ තරම් දවසක් හිතේ හිර කරන් හිටපු අම්මව දකින්න තිබුන ආසාව ඉශ්ට උන එක ගැන පුදුම තරම් සතුටකින්...කෙල්ල හොයලා හොයලා අතට ගත්තේ සාරියක්...මොකද කෙල්ලගේ අම්මා ආසම කෙල්ල සාරියෙන් දකින්න කියලා කෙල්ල දැනන් උන්නා....කෙල්ලට ඕනි උනේ තමන් ඉන්නේ සතුටින් කියලා අම්මට අගවන්න...මොකද කෙල්ල කවදාවත් ම කැමති උනේ නෑ අම්මා හිතින් විදවනවට...කොච්චර දුකින් හිටියත් කෙල්ල හැමදාම කරේ අනින් අයව සතුටින් තිබ්බ එක... ගෙදරට ගියපු ගමන් ම ආයුශ් මේ හැම හීනයක් ම විනාශ කරලා දයිද කියලා කෙල්ලට බය හිතුනත් අම්මා ලගට යන්න තිබ්බ ආසාව හින්දම එහ් හැම බයක් ම හිතේ ම තියාගෙන කෙල්ල ලෑස්ති උනා...

ආයුශ් රූම් එකේ ඉන්න හින්ද ම කෙල්ල සාරියත් අරන් වොශ් රූම් එකට ගිහින් වොශ් රූම් එකේදියි සාරිය ඇන්දේ... රූම් එකට ඇවිත් කොන්ඩේ පීරපු එක විතරයි කෙල්ල කරේ... ආයුශ් රූම් එකට වෙලා කෙල්ල කරන මේ හැමදේම නිහඩව බලන් හිටියා...

" දැන්වත් හරිද මගුල... "

නේහා ට ලෑස්ති වෙන්න දීපු විනාඩි 5 ඉවර වෙද්දි ම ආයුශ් කිවුවේ වෙනදා තරම් ම දැඩි ස්වරයෙන්....

" හ..රි...ආ..යු...ශ්... "

" එනවා... "

කෙල්ල කතා කරලා ඉවර වෙද්දි ම ආයුශ් කෙල්ලගේ අතින් අදින ගමන් කිවුවේ කෙල්ලගේ අත ආයුශ් අල්ලපු ඇල්ලිල්ලට ම රතු වෙලා රිදුම් දෙද්දි...ඒත් අදනම් කෙල්ලට ආයුශ් ගේ මේ නපුරු කම් ගැන දුක් වෙන්නවත් අඩු තරමේ එහ් ගැන හිතන්නවත් හිත දුන්නෙම නෑ... කෙල්ල හිටියේ අම්මගේ සිහියෙන්...

ආයුශ් පහලට එද්දිම නේහා ගේ කරට අත දාගත්තේ පහල අම්මා හිටපු නිසා..

" පුතා...කොහෙද මේ දුවත් එක්ක යන්නේ.. "

ආයුශ් ගේ අම්මා ඇහුවේ පුදුමයෙන්...මොකද ඇය දැනන් හිටියේ නෑ ඇයයි නේහා යි කතා කරපු හැම දෙයක් ම ආයුශ් අහන් හිටියා කියලා... ඇය හිතන් හිටියේ පස්සේ වෙලාවක ආයුශ් ට නේහා ගේ අම්මා ගැන කියනවා කියලා...

sinhalaebooks.com

" නේහා ව අම්මව බලන්න එක්ක යන්න කියලා අම්මා...මේ කෙල්ලට අම්මවත් අමතකයි මත් ලගට ආවම...මත් ගිහිත් බලලා එමු කියනකම්ම මේ කෙල්ල ට අම්මා ව මතකවත් නෑ... "

ආයුශ් කිවුවේ නේහා ගේ කතක් දැනෙන නොදැනෙන තරමට මිරිකලා...

කොල්ලා නම් අවස්තාවෙන් උපරිම විදිහට ප්‍රයෝජන ගන්නවා... ආයුශ් නේහා ගැන ගොඩක් හිතනවා කියලා අම්මට පෙන්නන හරිම තාත්වික විදිහට රගපෑවා... කෙල්ලටත් ආයුශ් ගේ මේ රගපෑම ගෙනාවේ හිතා ගන්න බැරි තරම් පුදුමයක්...

" අනේ නෑ පුතා..දූ මට උදෙත් කිවුවා අම්මව බලන්න ආසයි කියලා...දූට බය හිතෙන්න ඇති පුතා එක්ක එක පාර ම කියන්න....මත් පුතාට කියන්න කියලා හිටියෙත්... "

" අනේ මෙයාගේ බය අම්මා..රෑට බලන්න ඕනි මෙයාගේ වැඩ... "

ආයුශ් ගේ එහ් කතාවට නම් කෙල්ල ගැස්සුනා... ආයුශ් ඔය කියන කිසි දෙයක් තමත් කරලා නැති උනත් ආයුශ් අම්මා ඉස්සරහා එහෙම කතා කියලා තමත් ගැන මොනවද අම්මට අගවන්න හදන්නේ කියලා හිතෙද්දි නම් කෙල්ල ට දැනුනේ ආයුශ් ගැන තරහක්...

ඒත් ආයුශ් ගේ එහ් වචන අම්මගේ හිතට නම් ගෙනාවේ පුදුම සතුටක්... ඒත් ඇය කතාව වෙන අතකට හැරෙවුවේ එහ් දේවල් ලේලි එක්ක මිසක් පුතෙක් එක්ක කතා කරන්න ඕනි දේවල් නෙමෙයි හින්ද....

" එහෙනම් පරිස්සමිත් ගිහිත් එන්න පුතා... දූව බලාගන්න...දූ පරිස්සමින් හොදද...ඉක්මනට ගිහිත් එන්න... "

ඇය ආයුශ් ගෙත් නේහා ගෙ ත් නලලා සිබලා කිවුවේ ආදරේ දෝරේ ගලද්දි ...නේහා හා කියන්න ඔලුව හොල්ලද්දි කොල්ලා අම්මව හග් කරේ ආයුශ් ගේ අම්මගේ ඇස් වලට කදුලු එද්දි...මොකද අවුරුදු ගානකිත් කොල්ලා මේ විදිහට ඇයව හග් කරලා තිබුනේ නෑ...

ගෙදරිත් එලියට එද්දි ම ආයුශ් නේහා ගේ කරේ තිබුන තමත් ගේ අත ඉවත් කරේ අනේ දත් හිටපු රිත්ග් එකෙන් හිතා මතාම නේහා ගේ උරහිස සීරෙන විදිහට.... ඊලග ට කෙල්ලගේ අතත් තදින් අල්ලගෙන කෙල්ලව කාර් එක ලග එක්ක ගියා... ඒත් අද තමත් කරන කිසි දේකට කෙල්ලගේ මූනේ එක ඉරියව්වක් වත් වෙනස් නොවී තියනවා දකිද්දි කොල්ල ට දැනුනේ තරහක්...එහ් තරහා හින්දමද කොහෙද කොල්ලා කාර් එක ඩ්‍රයිව් කරේ පුදුම ස්පීඩ් එකකින්..

පැයක ගමන විනාඩි 20ත් එන්න පුලුවත් උනේ කොල්ලගේ මේ ස්පීඩ් එක හින්දමයි...කාර් එක කෙලිත් ම ඇවිත් නැවැත්තුවේ කෙල්ලගේ ගෙදර මිදුලේ...

sinhalaebooks.com

කෙල්ලගේ අම්මා හිටියේ ඉස්සරහට වෙලා ඔහේ කල්පනා කර කර...ඇය හිතුවෙම තේහා ගොඩක් දුක් විදිනවා ඇති කියලා....මේ දවස් ගානට හරියට කෑමක් වත් ඇයට තිබුන් නැත්තේ හැම තත්පරේම තේහා ව මතක් උන නිසා...මිදුලේ නවත්තපු කාර් එක දැකලා ඇයට ඇස් පවා අදහ ගන්න බැරි උනා...ආයුශ් කාර් එකේ දොර අරිද්දි කාර් එකෙන් බැහැලා එන තේහා ව දකිද්දි එහ් ඇස් වල සතුටු කදුලු නිමක් නැතුවම ගලන් යන්න ගත්තා...

කෙල්ල ගේ ඇතුලට එන්නත් කලින් ම කෙල්ලගේ අම්මා ඇවිත් කෙල්ලව බදා ගත්තා..

" මගෙ කෙල්ල...අනේ පුතේ මට සමාවෙන්න... "

කෙල්ලව බදා ගත්ත ගමන් ඇය අඩන්න ගත්තා..එහ් මේ කසාදේ නවත්තන්න බැරි උන එක ගැන දවස් ගානක් හිතින් විදවපු වේදනාවන් වචන කරමින්...

කසාදෙන් පස්සේ කෙල්ලගේ තාත්තා මේ ගේ පැත්ත පලාතකවත් ඇවිත් තිබුනේ නෑ...කෙල්ලගේ අම්මා තේහා එක්ක ගත කරපු මේ ගෙදර එහ් මතක එක්ක මේ දවස් ටිකට හිටියේ හිතින් පිච්චි පිච්චි...

" අනේ ඇයි මගෙ අම්මේ... "

කෙල්ල ඇහුවේ හැමදමත් වගේ මුව පුරා හිනා වෙමින්....

" මේ අපරාදෙන් ගලවගන්න මට බැරි උනාට...සමාවෙන්න මගෙ පුතේ... "

" අනේ අම්මා..මන් ඉන්නේ ගොඩක් සතුටින්..."

කෙල්ල කිවුවේ අම්මගේ කරට අත දලා...කෙල්ලගේ අම්මට එක පාර ම බැලවුනේ ආයුශ් දිහා...කොල්ලත් බලන් හිටියේ අම්මයි තේහා යි දිහයි...නොසිතුව විදිහට තේහා ගේ අම්මා තමන් දිහා බලද්දි කොල්ලාගැස්සුන් නැතුවම නෙමෙයි...ඒත් කොල්ලා එහ් බවක් පිටතට පෙන්නුවේ නෑ....කෙල්ලගේ අම්මා ගේ බැල්මේ තිබුනේ ගිනි පුපුරන තරම් තරහක්..

තමන් ගේ අසරණ දුවගේ ජීවිතේ විනාශ කරලා දාන්ම කෙනා ගැන කොහොම ආදරෙන් බලන්න ද... තරහක් විතරයි එහ් හිතට දැනුනේ... කෙල්ලගේ අම්මා මොහොතක් ආයුශ් දිහා තරහින් බලන් ඉදලා තේහා අතින් අල්ල ගත්තා...

" යමු පුතේ ඇතුලට...ඇතුලට ගිහින් කතා කරමු... "

ඇය කිවුවේ තේහා ගේ ඔලුව අත ගාලා කෙල්ලව ගේ ඇතුලට එක්ක යන ගමන්.. ඒත් ආයුශ් ට ගේ ඇතුලට එන්න කියලවත් ඇය කිවුවේ නෑ...ඇය ඇතුලට ගිහින් කතා කරමු කියලා කිවුවේ තමන් මෙතන ඉන්න නිසා කියලා කොල්ලට නොතේරුනා නෙමෙයි...එහ් හිත්දම ද මන් ද කොල්ලගේ කට කොනකට ඉබේම හිනාවක් ආවේ...

sinhalaebooks.com

කොල්ලා මොහොතක් ගේ ඇතුලට යන නේහා යි කෙල්ලගේ අම්මයි යන දිහා හිස් බැල්මකින් බලන් ඉදලා ඊලගට කාර් එක උඩ වාඩි උනේ කිසිම හැගීමක් දැනීමක් නැතුව... කෙල්ල අම්මා එක්ක ගේ ඇතුලට ගිහින් අම්මා එක්ක මොන තරම් කතා කරත් ආයුශ් ගැන හොද ඇරෙන්න එකම එක වැරැද්දක්වත් කිවුවේ නෑ...කෙල්ල කිවුවෙම කෙල්ල ඉන්නේ හිතා ගන්නවත් බැරි සතුටකින් කියලා...ආයුශ් හීනෙකින්වත් නොකරන දේවල් කෙල්ල හරි ලස්සනට අම්මා ඉස්සරහා කියන්න ගත්තේ ආයුශ් ගැන අම්මගේ හිතේ තිබුන තරහත් ටිකෙන් ටික අඩු වෙලා යද්දි...කෙල්ල කොච්චර හොදට එහ් දේවල් කිවුවද කිවුවොත් ආයුශ් ගේ අම්මට තමන් ආයුශ් ට ගේ ඇතුලටවත් කතා නොකරපු එක ගැන හිතේ පසුතැවීමක් පවා ඇති උනා කෙල්ලගේ වචන වලට...

" අනේ පුතේ..මන් හිතුවේ නෑ එහ් ලමයා එච්චර හොදට මගෙ පුතාව බලාගයි කියලා... මන් හිතුවෙම මගෙ කෙල්ලට දස වද දෙනවා ඇති කියලා... මට වතුර උගුරක්වත් බොන්න හිතුන් නෑ මගෙ පුතේ...කොහොම විශ්වාස කරන්නද එද පාර මැදදි අර විදිහට බැනපු වසවතර්යිා මේ වගේ දෙවියෙක් කියද්දි...දැන්නම් මට දෙයියනේ කියලා සැනසීමෙන් ඉන්න පුලුවන් මගෙ පුතේ... "

කෙල්ලගේ අම්මා නේහා ගේ අත් දෙකම තමන්ගේ අතට අරන් කිවුවේ ඇස් දෙකේ කදුලු පුරවගෙන.. කෙල්ලට දැනුනේ කියා ගන්න බැරි තරම් සතුටක්... තමන් මොන තරම් දුක් වින්දත් කෙල්ලට ඕනි උනේ අම්මව සතුටින් තියන්න...හිතුවටත් වඩා එහ් දේවල් හරි හොදට විසදෙද්දි කෙල්ල හිටියේ අම්මගේ මූන හිතේ මවාගෙන... කෙල්ල පුංචිම කාලේ දැක්ක අම්මගේ මූන කෙල්ලගේ හිතේ ගැඹුරුම තැන කවදවත් අමතක නොවෙන විදිහට ම ඇදිලා තිබුනා... ඒත් එහ් සතුට රැදිලා තිබුනේ තවත් තත්පර ගානක් විතරයි...අම්මා ඊලගට කිවුව කතාවට කෙල්ලගේ හිතේ තිබුන සතුට නැත්තට ම නැති වෙලා ගියා..

" අනේ පුතේ...මන් අර ලමයට ගේ ඇතුලට එන්න කියලා එන්නම්.... "

එහ් ඇහුන වචන ටිකට කෙල්ලව කතා කරගන්නත් බැරි තරම ට ගැස්සිලා ගියා... ආයුශ් ගේ ඇතුලට එන එකක් නෑ කියලා කෙල්ල හිත හදගෙන හිටියත් දැන් අම්මා කතා කරාම ආයුශ් මේ හැමදේම කඩා බිදලා දලා අම්මගේ හිත ආයෙත් දූලෙන් පුරවයි කියලා දැනෙද්දි කෙල්ල හිතින් පුදුම විදිහට කඩන් වැටුනා..අම්මා ඉස්සරහා අඩන්න බැරි කමට කෙල්ල කදුලු හිර කරන් හිටියත් අන්තිම තත්පරේ වෙනකම්ම කෙල්ල උත්සාහා කරේ අම්මා ආයුශ් ලගට යන එක නවත්තන්න....

" අම්මා.. එ...යා...එයා...එලියෙම හිටපු දෙන්...එයා....එ...යා...කිවුවා එයා ආසයි කියලා මෙහෙට....එ..ලි..ය..ට...වෙ...ලා...ඉ..න්..න.. "

" හරි පුතේ...ඒත් ගේ ඇතුලටවත් කතා නොකර් හිටියම එහ් දරුවා මොනවා හිතයි ද... ඉස්සර කොහොම උනත් දැන් එහ් දරුවා මගෙ පුතාව මටත් වඩා හොදට බලාගන්නවනේ...."

sinhalaebooks.com

" අනේ අම්මා...එහ් උනාට එයා... "

" මන් කතා කරලා එන්නම් පුතේ... "

" එහෙනම් මාත් එනවා... "

කෙල්ල කිවුවේ වචන පවා පැටලෙද්දි...හිතට පුදුම විදිහට බයක් දැනෙද්දි...

කෙල්ලගේ එහ් වචන ටිකත් එක්ක අම්මා කෙල්ලගේ අතින් අල්ලගෙන එලියට ආවේ ආයෙත් පාරක් කෙල්ලගේ ඔලුව ආදරෙන් අත ගාලා...

එලියට යද්දි කොල්ලා හිටියේ කාර් එක උඩට වෙලා ඈතින් පෙනුන රෝස පාත්තිය දිහා බලාගෙන ලොකු කල්පනාවක..කොල්ලගේ කල්පනාව කොච්චර ද කියනවනම් නේහයි අම්මයි කොල්ලා ලගට ගිහින් කතා කරනකම්ම කොල්ලා දන්නේ නෑ.....

" පුතේ...යමු ඇතුලට.... "

කෙල්ලගේ අම්මා ගේ කටහඩ එක්ක කොල්ලා ගැස්සිලා මේ ලෝකෙට ආවත් කොල්ලව ඊට වඩා ගැස්සුනේ කෙල්ල්ගේ අම්මා තමන් ට පුතේ කියලා කතා කරපු නිසා...

කොල්ලා උන්නේ ඇයගේ මේ එක පාර වෙනස්වීම හිතා ගන්න බැරුව...නේහා ගේ බය වෙලා තියන මූන දකිද්දි කොල්ලව තවත් හොල්මන් උනා....

" මට නේහා හැමදේම කිවුවා පුතේ...පුතාට ගොඩක් පින් මගෙ කෙල්ලව මේ තරම් ආදරෙන් බලා ගන්නවට...දැන් මට නිදහසේ ඇස් දෙක පියා ගන්න පුලුවන්...මන් එදා තරහා ගිහින් කිවුව හැමදේට ම සමාවෙන්න පුතේ...මන් හිතුවේ නෑ පුතා මේ තරම් හොද කෙනෙක් කියලා.... "

කොල්ලා නේහා දිහත් අම්මා දිහත් මාරුවෙන් මාරුවට බලපු එක විතරයි කරේ...නේහා ගේ මූන බයෙන් ගැහෙනවා එහ් හැම තත්පරේ ම කොල්ලා හරි අපූරුවට දැක්කා...වෙන්න ඇත්තේ මොකක් ද කියලා තේරුම් ගන්න කොල්ලා ට වැඩි වෙලාවක් නම් ගියේ නෑ.. කොල්ලා නිහඩව ම ගේ ඇතුලට ආවේ අම්මවත් නේහා වත් පහු කරගෙන...එහ් දෙන්නට ම කලින්...ඒලගට ඉස්සරහා තිබුන පුටුවෙන් වාඩි උනේ නේහා ගේ අතින් අල්ලන් එන අම්මා දිහත් නේහා දිහත් හිස් බැල්මකින් බලාගෙන....

කොයි වෙලේ මොනවයින් මොනවා වෙයි ද කියලා කෙල්ලනම් උන්නේ බයෙන් ගැහි ගැහී...

"මන් බොන්න මොනා හරි හදන් එන්නම් පුතේ..."

කෙල්ලගේ අම්මා වාඩි වෙලා ඉන්න කොල්ලා දිහා බලලා කියද්දි මේ පාරනම් කොල්ලා ඔලුව හොල්ලලා හා කිවුවා.....එහ් අවසරෙන් කෙල්ලගේ අම්මා ගේ ඇතුලට යන්න හදද්දි

sinhalaebooks.com

නේහා ත් අම්මා පස්සෙන් ම යනවා දකිද්දිනම් කොල්ලට නේහා ව නවත්ත ගන්න හිතුනේ එහ් වෙලාවෙ ආව ක්ෂනික හැඟීමකින්... නේහා ගේ අම්මට මොනවත් කියන්න කොල්ලගේ හිත තවත් ඉඩ නොදුන්නත් කෙල්ලව බය කරන්න හිතේ කුරිරු ආශාවක් මේ වෙද්දි කොල්ලගේ හිතේ ඇතිවෙමින් තිබුනා...

" නේහා... ඔයා ඉන්නකෝ..අම්මා හදත් එයි... "

කොල්ලා කිවුවේ කොල්ලගේ අම්මා ඉස්සරහා නේහා ට කතා කරනවා තරම්ම ආදරීයව...

එහ් වචනත් එක්ක නේහා ගේ අම්මගේ මූනේ හිනාවක් මැවුනේ නේහා වචනින් කිවුව ආයුශ් ගේ ආදරේ ඇය ඇස් දෙකෙන් ම දැක්ක නිසා...

" ඔයා ඉන්න පුතේ.... "

කෙල්ලගේ අම්මා කෙල්ලගේ ඔලුව අත ගාලා කොල්ලා ලගින් ම පුටුවකින් වාඩි කරලා කිවුවේ පුදුම තරම් ආදරේකින්...ඒත් කෙල්ල දියෙන් ගොඩ දාපු මාලුවෙක් වගේ තාමත් ගැහෙනවා....

අම්මා යනකම්ම කොල්ලා උන්නේ නිහඬව... අම්මා යනවත් එක්ක ම කොල්ලා කෙල්ල දිහාට ඇරුනේ පුටුව හරවන සද්දෙත් පවා කෙල්ලගේ ගැස්සීම දැකල හිත යටින් සතුටු වෙමින්...

කොල්ලා කෙල්ල දිහාට හැරිල පලවෙනි වචනේ කියන්න කට හදද්දි ම එහ් වචන පිට වෙන්නත් කලින් ම කෙල්ල කතා කරන්න ගත්තේ කොල්ලා නොහිතපු විදිහට...

" අනේ ආයුශ් ..ඔයා මට කැමති දෙයක් කරන්න....ඒත්...ඒත් අම්මටනම් කියන්න එපා මන් එයාට කිවුවේ බොරු කියල..අනේ මගෙ අම්මා විදවයි ආයුශ්...මට ඉන්නේ එයා විතරයි....අනේ එයා දුක් විදිනවා මට බලන් ඉන්න බෑ...... "

කෙල්ල කිවුවේ ඇස් අගින් කඳුලු බිංඟු කීපයක් ම ගලන් යද්දි... ආයුශ් ලග මේ විදිහට කෙල්ලට වැඳ වැටෙන්න තරම් කෙල්ල දුවර්ල උනේ අම්මා ගේ සතුට වෙනුවෙන්... එහ් ගැන කෙල්ලට පුංචි ම පුංචි පසු තැවීමක් වත් තිබුනේ නෑ...

" තමුසේ දන්නවනේ නේහා..මට හිතක් පපුවක් නෑ කියන්න....මන් කරන්නේ මට ඕන දේ... මන් කරන්නේ මට හිතෙන දේ.... "

දමලා ගැහුවා වගේ ආයුශ් එහ් වචන ටික කිවුවේ කිසිම හිතක් පපුවක් නැතුව... කෙල්ල ඉකි බිදින්න ගත්තේ හිතට දැනුන මහා ලොකු තනිකම දරාගන්න ම බැරි උන නිසා ...මොකද කෙල්ලට මේ ලෝකේ තියන එකම සතුට අම්මගේ සතුට.... එහ් සතුට නැති වෙලා යනවා කියන්නේ කෙල්ලට තවත් ජීවත් වෙන්න හේතුවක් නෑ කියන එක...

sinhalaebooks.com

ආයුශ් තවත් මොනවදෝ කියන්න කෙල්ල දිහාට ඇඟිල්ල දිග් කරන්න හදද්දි ම කෙල්ලගේ අම්මා එන සද්දේ ඇහුන හින්ද ම කොල්ලා කතාව වෙනස් කරේ තත්පර ගානෙන්...

" ඕක අඬන්න දෙයක් ද නේහා...හරි..අම්මට මුනුබුරෙක් බලන්න ආස ඇති ...ඒත් අපි තාම මැරි කරලා දවස් කීයද ලමයෝ....එහ් දවස් ගානට කොහොමද....අඬන්න එපා..අපි ඉක්මනට අම්මගේ අතට මුමුබුරෙක් ගෙනත් දෙමුකෝ හොදද... "

කොල්ලා කෙල්ලගේ කම්මුල් වලව්තිබුන කඳුලු තමන් ගේ අත් දෙකෙන් පිහ දලා කිවුවේ හඬ ටිකක් වැඩි කරලා එහ් වචන අම්මට හොදට ම ඇහෙන විදිහට... සාලෙට ආව අම්මා කෙල්ල දිහත් කොල්ලා දිහත් බලන් හිටියේ පුදුම ආදරේකින්...

ඒත් ආයුශ් ගේ මේ හැසිරීම් තේරුම් ගන්න බැරුව කෙල්ල නම් හිටියේ පුදුම විදිහට අසරන වෙලා.. ඒත් අම්මා ගේ හිත ආයුශ් රිද්දපු නැති එකට කෙල්ල දහස් වාරයක් හිතින් ආයුශ් ට ස්තුති කරා...

නේහා ගේ අම්මා අවුරුදු ගානකට පස්සේ අද පුදුම විදිහට සතුටින්... නේහා ටයි ආයුශ් ටයි කන්නත් දීලා කරන්න පුලුවන් උපරිම විදිහට සලකලා තමයි දෙන්න ව පිටත් කරේ...

එන අතරතුර නේහා අතරෙවත් ආයුශ් අතරෙවත් කිසිම කතා බහක් උනේ නෑ....

කාර් එක ආයුශ් ගේ ගෙදර ගේට් එකෙන් දද්දි ම කොල්ලගේ අම්මත් දෙන්නා එනකම් මග බලාගෙන... අම්මටත් කතා කරලා කොල්ලා ආවේ කෙල්ලවත් එක්කන් රූම් එකට...

ඊලගට කෙල්ලගේ අතින් ඇදලා තමන් ලගට අරන් කිවුව කතාවට කෙල්ලගේ පපුව වේගෙන් ගැහෙන්න ගත්තේ කවදවත් නැති තරමට...
" උබ හිතන්න එපා මන් හැමෝම ඉස්සරහා රගපාන්නේ හොදකට කියලනම්... උබ දන් නෑ නේහා මන් කවුද කියන්න...ඔන්න බලපන්...උබට මන් කරන දේ උබට හිතා ගන්නවත් බැරි වෙයි..."

ආයුශ් එහෙම කියලා කෙල්ලව තල්ලු කරේ කෙල්ලව තල්ලු කරේ කෙල්ල මූනින් අතට ඇදට වැටෙන විදිහට..ඊලගට ලැප් එකත් අරන් ටේබල් එක ලගට ගියේ ආයෙත් නේහා දිහා එක පාරක් වත් බලන් නැතුව...

කෙල්ලගේ පපුව එහ් වචන ටික එක්ක පුදුම වේගෙන් ගැහෙන්න ගත්තත් කෙල්ල උන්නේ වැටුන විදිහට ම ඇස් දෙක තද කරලා පියාගෙන...ආයුශ් තමන් ට කරනවයි කියලා කියන්නේ මොනාද කියලා හිතෙද්දි පවා කෙල්ලට දැනුනේ පුදුම බයක්... කෙල්ල බය උනා මේ වැටිලා ඉන්න විදිහෙන් හෙල්ලන්න පවා... කොල්ලා ඒකටත් වද දෙයි කියලා හිතුන හින්දම කෙල්ල එහ් විදිහට ම ඉදලා ලග තිබුන කොට්ටේ පපුවට තුරුල් කරගත්තේ ඇස් අගින් වැටෙන්න තලියන කඳුලු කැට ඉකි බිදුමක් නැසෙන විදිහට පිට කරමින්....

sinhalaebooks.com

ආයුශ් ට තමන් එක්ක මේ තරමට ම තියන තරහා මොකක් ද කියලා කෙල්ලට හිතා ගන්නවත් බැරි උනා..පාරෙදි එක ම එක පාරක් කෑ ගැහුවා කියලා මනුස්සයෙක් ට මේ තරම් පලි ගන්න පුලුවන් ද... ඊටත් වඩා කොල්ලගේ සැරින් සැරේ වෙනස් වීම්... හැමදම එක ම විදිහට නපුරුකම් කරා නම් ඒක සැපක් කියලා කෙල්ලට හිතුනේ ආයුශ් ගේ එහ් හැසිරීම් දරාගන්න ම බැරිම තැන. බීපු වෙලාවට එක විදිහක්. අම්මා තාත්තා ලග තව විදිහක්... තමන් විතරක් ලග ඉද්දි තව විදිහක් .. .මේ වද හිංසා වලටත් වඩා කෙල්ලගේ හිතට වද දුන්නේ මේ අමුතු හැසිරීම....හැබැයි ආයුශ් හැමෝට ම හොද මූන පෙන්නලා තමන් ට කවුරුත් නැති වෙන්න තමන් ව මෙහෙම තනි කරගත්තේ හොදකට නම් නෙමෙයි කියලා කෙල්ලගේ හිත හැම තත්පරෙ ම කියන්න ගත්තා..ආයුශ් ම කියනවනම් තමන් ගේ මේ රගපෑම හොදකට කරන දෙයක් නෙමෙයි කියලා එතනින් එහාට තව කතා කරන්න දෙයක් තියෙයි ද...කෙල්ල හිතුවේ තවත් කොට්ටේ තමන් ගේ පපුවට තුරුල් කරගනිමින්......

ආයුශ් උන්නේ ලැප් ඒකේ තමන් කර කර හිටපු වැඩේ දිගින් දිගට ම වැරදෙන නිසා තමන් එක්ක ම තරහින්... කොල්ලා ලග තිබුන ටේබල් ලැම්ප් එකට අතින් ගැහුවේ එහ් තරහටමයි...ඒත් පහරේ සැර වැඩි කමටද මන් ද කොල්ලගේ අත තුවාල උනේ වීදුරු බිදෙන සද්දෙකුත් එක්ක... මේ වෙද්දි නින්දත් නොනින්දත් අතර හිටපු කෙල්ල ගැස්සිලා ඇහැරුනේ එහ් සද්දෙත් ආයුශ් ගේ කෑ ගැසිල්ලත් එක්ක....

" ආ..ච්... "

කොල්ලා තමන් ගේ ලේ පෙරෙන දකුනු අත අනිත් අතින් අල්ලගෙන කිවුවේ වීදුරු වලට කැපුන වේදනාවත් එක්ක...

" ආයුශ්..ඇයි...මොකද උනේ... "

කෙල්ල බය උන පාරට කෙල්ල කිවුවා නෙමෙයි..කෙල්ලගේ කටින් එහ් වචන පිට උනා...

" අත කැපුනා.. "

කොල්ලා සිහින් කෙදිරිලි හඩකුත් එක්ක කිවුවේ ඉදන් හිටපු තැනින් නැගිට්ින ගමන්... නේහා ඇදෙන් නැගිටලා කොල්ලා ලගට ආවේ තත්පර ගානෙන්...

" ගොඩක් කැපුනද. "

" ඔව්... රිදෙනවා... "

කොල්ලා තාමත් අත අල්ලගෙන මයි...ඒත් උන් තැනම.... කොල්ලගේ අතින් වැටෙන ලේ බිංදු ලයිල් පොලව පුරාම වැටුනා..කෙල්ල ඉක්මනට කොල්ලගේ අත අරන් තමන් ඇදන් හිටපු සාරියේ පොටෙන් තිබ්බේ දෙපාරක් හිතත් නැතුව...

sinhalaebooks.com

කොල්ලා උන්නේ වචනයක් වත් නොකියා ගල් ගැහිලා කෙල්ල මේ කරන දේවල් දිහා බලාගෙන...

ඊට පස්සේ කොල්ලට රිදෙන් නැති වෙන්න අත සාරි පොටේ එතුවේ ලේ එන ටික ටිකක් හරි නවත්ත ගන්න...

ඒත් කොල්ලගේ අත ගොඩක් කැපිලා කියලා කෙල්ලට තේරුනේ සාරි පොටම ලේ වලින් තෙත් වෙලා තිබුන නිසා...

" මොකක් ද කරන්න ගියේ...පොඩි ලමයෙක් ද..පරිස්සම් වෙන්න බැරිද..දැන් බලන්න උන දේ... "

වෙනදට ආයුශ් ලග වචනයක් කියා ගන්නත් බැරුව ගැහෙන කෙල්ල අද ආයුශ් ටත් සැර දලා කියද්දි කොල්ලට එක පාරම කෙල්ල දිහා බැලුනේ තුවාලේ වේදනාවත් අමතක වෙලා යද්දි...

" මොකක් ද කිවුවේ... "

කොල්ලා ආයෙත් ඇහුවේ තමන් ට ඇහුන වචන විශ්වාස කරන්න බැරි හින්ද...

" බෙහෙත් කොහෙද තියෙන්නේ.. "

ආයුශ් ඇහුව දේ ඇහුන් නැ වගේ කෙල්ල ඇහුවේ සාරි පොටෙන් කොල්ලගේ අත හෙමීට ඉවත් කරලා...

" බෙහෙත් ඉවරයි... "

කොල්ලා කිවුවේ අතින් මොන තරම් වේදනාවක් දැනුනත් බෙහෙත් දගන්න තරම් හිතක් තිබුන් නැති හින්ද...

ඒත් කෙල්ලට ඕනි උනේ ආයුශ්ගේ අතට කොහොමහරි බෙහෙත් ටිකක් දන්න....

" එහෙනම් හොස්පිටල් යමු....මන් අම්මට කියලා එන්නම්... "

" ඕන් නැ..දැන් හොදයි මට..."

" ඔයාගේ අත හොදට ම කැපිලා #ආයූ..."

කෙල්ල අතින් කියවුනේ ඉබේම...ඕන ම කෙනෙක් තමන් එක්ක විනාඩි ගානක් සමීපව කතා කරොත් එහ් විදිහට කතා කරවෙන එක කෙල්ලට තියන නවත්ත ගන්න බැරි පුරුද්දක්.... ඒත් ආයුශ් ට නම් එහ් වචන ගෙනාවේ කොල්ලවත් නොහිතපු තරම් ලොකු වේදනාවක්...

sinhalaebooks.com

" මො..ක..ක්...ද....කි...වු...වේ... #ආයු කියල ද..."

කොල්ලා අහද්දියි කෙල්ලට තමන් අතින් කියවුන වචනේ බරපතළ කම තේරුනේ...

" අනේ සොරි ආයුශ්....මට....මට එහෙම කියවුනා..මන්...මන් හිතලා නෙමෙයි... "

කෙල්ල කිවුවේ වචන පටලමින්...ඒත් කොල්ල නම් හිටියේ වෙනම ම ලෝකෙක...... ඒත් ආයුශ් ගේ ඊලග වචන ටික නම් කෙල්ලට ගෙනාවේ පුදුමයක්...

" නේහා...උබ...උබ...මගෙන් ඈත් වෙලා හිටපන්.... උබ...උබ...මන් මැරුනත් හොයන්නෙපා..එච්චරයි... උබ හදන්නේ මාව ආයෙත් පිස්සෙක් කරන්න... "

ආයුශ් එහ් වචන ටික කියාගෙන ම රූම් එකෙන් එළියට ගියා...කෙල්ල ට නම් උන කිසි දෙයක් හිතා ගන්න බැරි උනා... ආයෙත් ආයුශ් කොයි වෙලේ හරි රූම් එකට එයි නෙහ් කියලා කෙල්ල බලන් උන්නත් ආයෙත් ආයුශ් රූම් එකපැත්ත පලාතක ආවේ නෑ... රූම් එක තියා කොල්ලා ගෙදරවත් උන්නේ නෑ...

කොල්ලා තුවල උන අත එහ් විදිහට ම තියාගෙන කාර් එකට නැංගේ අතින් කොච්චර වේදනාවක් දැනුනත් හිතේ වේදනාවට එහ් හැමදේම යට කරලා....

කොල්ලා කාර් එක අරන් ගියේ ඉස්සර තමන් යන්න පුදුම විදිහට ආසා කරපු ඒත් දැන් පුදුම විදිහට වෛර කරන අවුරුදු ගානකින් නොගියපු තැනකට....
කොල්ලා ගියේ වෙන කොහෙටවත් නෙමෙයි..මෙන්ටල් හොස්පිටල් එකට.... අවුරුදු ගානක් ගිහිල්ලත් එදා වගේම අදත් හැමදේම එහ් විදිහට ම තිබුනා....එක ම එක දෙයක් ඇරෙන්න... මේ හොස්පිටල් එකේ කොල්ලා ආසම කරපු රූම් එකේ තමන් දකින්න ආසම කරපු කෙනා වෙනුවට ඉන්නේ වෙන කෙනෙක්.... කොල්ලා වහලා තිබුන රූම් එකේ ජනෙල් කවුලුවෙන් රූම් එක දිහා බැලුවේ කෝටියක් මතක හිත අස්සේ රිදුම් දෙද්දි....

" ආයුශ් සර්.... සර් මෙහෙ... "

හිත අස්සේ රිදුම් දෙන මතක අස්සෙන් කොල්ලට ඇහුනේ පුරුදු කටහඩක්.. කොල්ලා එහ් දිහාට හැරුනේ හිතේ තිබ්බ වේදනාව එහ් විදිහට ම තියෙද්දි......

කොල්ලා ඉස්සරහා හිටියේ පේශන්ස්ලා බලාගන්න ඉන්න කෙනෙක්... එහ් විතරක් නෙමෙයි...කාලෙකට කලින් කොල්ලා ගොඩක් ම සමීපව හිටපු කෙනෙක්...

" මු...ති...ද...ස...."

කොල්ලා කිවුවේ අඳුරු වෙලා තිබ්බ කොල්ලගේ මූනට අමාරුවෙන් හිනාවක් අරන්....

sinhalaebooks.com

" සර්..කොච්චර කාලෙකට පස්සෙ ද...එදා සර් මැඩම් එක්ක ගියා ට පස්සේ ගියා ගියාමයි...ආයේ දැක්කෙම නෑ.....සර් එදා ආයේ එනවා කියලා ගියාම ආවේ නැති උනාම මන් හිතුවා කරදරයක් වත් ද කියලා...කෝ මැඩම්...මැඩම් ආවේ නැද්ද සර්...මැඩම් වත් මතක් කරා කියන්න...."

කොල්ලා උත්තේ ඇස් වලින් එලියට පනින්න හදන කඳුලු වැටෙන්න නොදී තද කරලා තියාගෙන...ඒත් වචනයක් වත් කතා කරගන්න කොල්ලට හයියක් තිබුනේ නෑ.....

" දෙයියනේ සර්...මේ අත...මේ අත මොනවා වෙලා ද.... "

කොල්ලගෙන් වචනයක් වත් නැති තැනයි මුනිදස දැක්කේ කැපිලා තියන කොල්ලගේ අත... ඒත් කොල්ලානම් උන්නේ වචනයක් වත් කතා කරගන්න පුලුවන් තත්වෙක නෙමෙයි...

මුනිදස කොල්ලව එක්ක ගිහින් කොල්ලගේ අතට බෙහෙත් දැන්මුවත් කොල්ලට එහ් කිසි දෙයක් ගානක් නැති වෙන තරමට ම කොල්ලගේ හිත පරන මතක අස්සේ අතරමන් වෙලා තිබුනේ....

අන්තිමට කොල්ලා හොස්පිටල් එකෙන් එලියට ආවේ ඇවිදින මල කඳක් වගේ..මුනිදස ට යන්නම් කියන්නවත් කොල්ලට සිහියක් තිබුනේ නෑ... ඒත් මුනිදස කොල්ලව කාර් එකට නැංගුවේ කොල්ල ඉන්නේ ප්‍රශ්නෙක කියලා කොල්ලගේ මේ හැසිරීමෙන් ම දැනුන නිසා...

" ඇයි සර් ....මොකක් ද ප්‍රශ්නේ...මැඩම් එක්ක රන්ඩු උනා ද... "

කොල්ලා කාර් එක ස්ටාට් කරද්දි ම මුනිදස අහපු අන්තිම ප්‍රශ්නෙට මේ තරම් වෙලා ඇස් අග හිර කරන් හිටපු කඳුලු කොල්ලට තවත් නවත්ත ගන්න බැරි උනා...කොල්ලා ඇස් දෙකේ කඳුලු පුරවගෙන ම මුනිදස දිහා බලලා ඊලග මොහොතේ කාර් එක ස්ටාට් කරන් යන්න ගියේ පුදුම ස්පීඩ් එකකින්...

මෙන්ටල් හොස්පිටල් එකෙන් පිටත් උන කොල්ලගේ කාර් එක කෙලින් ම ගියේ මීට අවුරුදු ගානකට කලින් කොල්ලගේ මුලු ජීවිතේම වෙනමම පැත්තකට හරවපු තැනට... එහ් වෙන කොහෙටවත් නෙමෙයි... වැව අයිනේ පාක් එක ලග තිබුන පාර ට....

කොල්ලගේ මතකේ අවුරුදු ගානක් ආපස්සට ගියේ මේ පරිසරය කොල්ලගේ ආත්මය තරමට ම ලන් වෙලා තිබුන හින්ද... එදා වගේ අදත් පාර දෙපැත්තේ අසරණ අය දෙතුන් දෙනෙක් ම හිටියා.. යන්න තැනක් නැතුව පාරේ හිගා කාලා දවස ගෙවා ගන්න හැටි දකිද්දි එදා පපුව පිච්චිලා යන තරම් වේදනාවක් දැනුන කොල්ලගේ හිත අද නිකන් ම නිකන් හිස් බැල්මකට විතරක් සීමා වෙලා.... ඒත් එහ් එක්කම එහ් රූප අතර කොල්ලා කාලෙකට කලින් දැක්ක රූපේ මතක් වෙලා කොල්ලට තමන් ගැන ම තරහක් ඇති උනේ තත්පර ගානෙක්...

sinhalaebooks.com

කොල්ලා දෝතින් ම ඔලුව බදාගෙන බිම වාඩි උනේ ඇස් වලින් නිමක් නැතුවම කඳුලු ගලන් යද්දි...

" උබ... උබ මගෙ ජීවිතේ විනාශ කරලා දැන්මා.... $%&# උබ මට ආයෙත් අහු උනොත් මන් උබව ඉතුරු කරන් නෑ...උබ.උබ... මාව පිස්සෙක් කරා... "

කොල්ලා මහා හයියෙන් කෑ ගහලා අඩන්න ගත්තේ කොල්ලගේ කටහඩ පරිසරය පුරා ම දෝන්කාර දෙන්න ගද්දි.....

කාලෙකට පස්සේ අද කොල්ල ඇති වෙන්න ම ඇඩුවා...... පාර අයිනට වෙලා පිස්සෙක් වගේ අඩ අඩලා කොල්ලා කාර් එකට නැංගේ කාර් එක ඇතුලේ තිබුන බියර් බෝතලේ එක හුස්මට බීලා දාලා....

මොන තරම් බිවුවත් හිතේ තියන මේ ගින්දර නැති කරල දාන්න බෑ කියලා අත්දැකීමෙන් ම දැනන් උන්නත් කොල්ලට ඕන් උනේ ඇති වෙන්න ම බොන්න....කොල්ලා බාර් එකට යන්න කාර් එක හරව ගත්තේ එහ් හින්දමයි....
නේහා දවස ම හිටියේ ආයුශ් දැන් එයි දැන් එයි කියලා මග බලාගෙන...ගෙවෙන එක තත්පරෙත් කෙල්ලට දැනුනේ කල්පයක් තරම් වගේ... රූම් එකේ පුංචි සද්දයක් ඇහුනත් කෙල්ලගේ හිත කිවුවෙම ආයුශ් වෙන්න ඇති කියලා.. එහ් තරමට ම කෙල්ල මග බලන් හිටියා... මොකද ආයුශ් ගෙදරින් එලියට ගියේ හොද තත්වෙන් නෙමෙයි නිසා කෙල්ලගේ හිතට දැනුනේ ලොකු බයක්...කෙල්ලට මතක් උනේම ආයුශ් ගේ අතේ ලේ වලින් සාරි පොට තෙත් කරපු හැටි..

පුංචි තුවාලයක් උනත් ඇදන් ඉන්න ඇදුමෙන් පිහදන එක කෙල්ලට නවත්ත ගන්න බැරි පුරුද්දක්...කෙල්ල පුරුදු වෙලා හිටියා තුවාලේ තරම තෙත් වෙන ලේ වලින් මනින්න... ඒත් ආයුශ්...ආයුශ් ගේ තුවාලේ මොන තරම් ද කියලවත් කෙල්ලට හිතා ගන්නවත් බැරි උනා... එහ් තරමට ම කොල්ලගේ කැපුන අතින් ලේ ගිහින් තිබුනා...

ආයුශ් මොන තරම් කෙල්ලට වද දුන්නත් ආයුශ් ගේ වේදනාව ලග කෙල්ලට ආයුශ් කරපු හැම දෙයක් ම අමතක වෙලා යනවා... එහ් ඇයි කියලා කෙල්ල හිතන්න නොගියත් ආයුශ් ට කරදරයක් වෙනවට කෙල්ල ගොඩක් බයයි... කෙල්ලගේ හිත ඕන ම කෙනෙක් දුකින් ඉන්නවා නම් එහ් හිත ලග උනු වෙනවා...ඒත් මේ වෙද්දි යම් තරමකට කෙල්ලගෙ හිත ආයුශ් ගේ මේ සැරින් සැරේ වෙනස් වෙන හැගීම් ඉස්සරහ නොසන්සුන් වෙලා තිබුනේ.... එහ් නොසන්සුන් හිත ආයුශ් ට සීරීමක් වත් වෙනවට කැමති උනේ නෑ....

කෙල්ල ට හරියට කෑමක් වත් ගන්න හිත දුන් නෑ...කොච්චර බඩගිනි දැනුනත් කෙල්ල නොකා හිටියේ ආයුශ් එනකම්....

ඒත් කොල්ලා නම් එන පාටක් තිබුනෙ ම නෑ... ආයුශ් ගේ අම්මා නංගි වගේම ආයුශ් ගේ තාත්තත් ඩිනර් එකට එලියට යන්න... කොල්ලා එනකම් ආයුශ් ගේ අම්මා මග බලන් ඉදලා

sinhalaebooks.com

නැති ම තැනයි කෙල්ලට විතරක් යන්න කතා කරේ....ඒත් නේහා ට ඕනි උනේ ආයුෂ් එනකම් ඉන්න...

ආයුෂ් කොහෙද ගියෙ කියලා අම්මලා අහන ප්‍රශ්න වලට බොරු කියලා කෙල්ල හෙම්බත් නොවුන ම නෙමෙයි... ඒත් ඊට වඩා වේදනයි කෙල්ලට තාම ආයුෂ් නැති එක...

කෙල්ල ආයුෂ් ගේ අම්මට ආයුෂ් එනකම් ඉන්නම් කියද්දි තාමත් ආයුෂ් එක්ක තරහින් ඉන්න තාත්තාට නම් ටිකක් කේන්ති ගියා...

" එහෙනම් මෙයාටත් ඉන්න කියන්න..."

ආයුෂ් ගේ තාත්තා කෙල්ලගේ බෑ කියවිල්ල අහගෙන ඉඳලා ඉඳලා බැරි ම තැන කිවුවේ කේන්තියෙන්.. ඒත් ආයුෂ් ගේ අම්මා නම් කීයටවත් කැමති උනේ නෑ කෙල්ලව ගෙදර තනියෙන් දලා යන්න..නංගි උනත් එහෙමයි...

" එහෙනම් අම්මා..ඔයාලා ගිහින් එන්න..මත් අක්කි එක්ක ඉන්නම්... "

කෙල්ල කිවුවේ නේහා ගේ කරට අතක් දලා...

" අනේ එපා පැටියෝ..ඔයා යන්න..අයියා දැන් මග එනවා ඇති... ඉක්මනට එනවා කියලත් ගියේ... "

කෙල්ල කිවුවේ කෙල්ල නිසා නංගි නතර උනොත් නංගි පව් නිසා... මොකද කෙල්ල කැමති උනේ නෑ කවුරුත් තමන් නිසා මොනවත් ම කැප කරනවට...

" එහෙනම් අපි වෙන දවසක යමු...පුතත් නැතුව දුව ගෙදර තනියම දලා යන්න බෑනේ...ඔයා මිස්ටර් සිරිමාන්න ට කියන්න අද එන්න වෙන් නෑ කියලා.... "

ආයුෂ් ගේ අම්මා කිවුවෙ තාත්තා දිහත් නේහා දිහත් මාරුවෙන් මාරුවට බලලා..ඒත් ඒකෙන් කෙල්ල තවත් අසරණ උන එක විතරයි උනේ...

" අනේ අම්මා..ඔයාලා යන්න...ආයුෂ් දැන් එනවත් ඇති...අපිට ආයේ දවසකත් එකට යන්න පුලුවන්නේ....අද නොගියොත් එහ අන්කල් තාත්තා එක්ක තරහා වෙයි....අනික බිස්නසුත් වැටිල තියන වෙලාවේ කවුරුත් තරහා කරගෙන බෑනේ අම්මා.... "

කෙල්ල කිවුවෙ ඩිනර් අවුට් එකට යන්නේ බිස්නස් වැඩකට කියලා නොදැන උනත් එහෙම හිතලා... කෙල්ලගේ එහ් කතාවට නම් ආයුෂ් ගේ තාත්තාට කෙල්ල ගැන දැනුනේ පුදුම ආදරයක්...

sinhalaebooks.com

" ඔයා වගේ අර බූරුවත් හිතුවනම් පුතේ...එහෙනම්.. එහෙනම් මට අද කවුරු ලගවත් දන නමන්න වෙන් නෑ...මන් කොහොම හිටපු මිනිහෙක් ද... මගෙ දූට තනියම ඉන්න පුලුවන් ද... "

ආයුශ් ගේ තාත්තා කෙල්ලගේ ඔලුව අත ගාලා ආදරෙන් අහද්දි කෙල්ල දෙපැත්තට ඔලුව හොල්ලලා අහිංසක විදිහට හිනා උනා...

අකමැත්තෙන් උනත් කෙල්ලට පරිස්සමින් ඉන්න කියලා ගෙදර අය පිටත් උනේ කරන්න ම දෙයක් නැති තැන..මොකද මේ ඩිනර් එක බිස්නස් වලට වගේ ම ආයුශ් ගේ නංගිගේ ජීවිතේටත් සම්බන්දයි... මිස්ටර් සිරිමාන්න කියන්නේ කාටවත් ලගින්වත් හැරෙන්න් බැරි කම්පැනි එකක අයිති කාරයෙක්... මිස්ටර් සිරිමාන්න ගේ පුතාට ආයුශ් ගේ නංගි ගැන හිත ගිහින් තිබුන නිසා බිස්නස් වගේ ම මේ ඩිනර් එකේ යටි අරමුනක් ඒකත්..ඉතින් නංගිත් නොගිහින් ම බෑ... නැත්තම් කෙල්ලව ගෙදර තට්ට තනියෙන් දාලා යන්න තරම් එහ් කාගෙවත් හිත් ආයුශ් ගේ වගේ දරුනු නෑ...

කට්ටිය ඔක්කොමලා ගියා ම කෙල්ල ඇදට ආවේ ආයුශ් ගැන ම හිත හිත... ගෙදර කවුරුත් නැති හින්ද ද මන් ද හිතට මහා ලොකු තනිකමක් දැනෙද්දි....

කොල්ලා උන්නේ කෙලින් හිටගන්නවත් බැරි තරමට ම බීලා...සිහියක් වත් කොල්ලට තිබුනේ නෑ...කොල්ලා බාර් එකට දිගින් දිගට ම ගිහින් තියන හින්ද ම එතන වැඩ කරන අය කොල්ලව දන්න නිසා කොල්ලගේ කාර් එකේ ම කොල්ලව පරිස්සමට ගෙනත් බැස්සුවා...

කොල්ලා ට කෙලින් හිටගන්නවත් බැරි උනත් කොල්ලා එහ් එද්දි ත් ආවේ බෝතලයක් අතේ තියාගෙන... වෙරි මතින් උනත් හොදට ම බීගෙන.....

කොල්ලා ගේ ඇතුලට ආවේ ඇරලා තිබුන දොරටත් තට්ටුවක් දගෙන...

කොල්ලගේ සද්දේ රූම් එකේ හිටපු කෙල්ලට හොදට ම ඇහුනා..... කෙල්ලඑහ් සද්දෙට ඇහුම්කම් දීගෙනම ඇදෙන් නැගිට්ටා... කොල්ලා උන්නේ වැටි වැටි මොනවදෝ කියව කියව රූම් එකට එන ගමන්...

කෙල්ල රූම් එකේ දොර ඇරලා කොල්ලගේ නම කිවුවේ හිතට දැනුන කොහෙදෝ ඉදන් ආව බයකුත් එක්ක...

" ආ...යු...ශ්... "කෙල්ල කතා කරත් ආයුශ් ගෙන් ප්‍රතිචාරයක් නම් තිබුනේ නෑ... එහ් වෙනුවට කෙල්ලට දැනුනා කොල්ලගේ අඩි සද්දේ එන්න එන්න ම ලන් වෙනවා කියලා...

" ආ...යු...ශ්... "

කෙල්ල ආයෙත් පාරක් කිවුවේ කොල්ලා අදත් බීලද කියලා හිතට දැනුන සැකෙන් එක්ක....මොකද කොල්ලා ඇවිදින අඩි සද්දෙට වඩා ඇහුනේ කොල්ලා වැටෙන සද්දේ..

sinhalaebooks.com

ආයුශ් කෙල්ල කතා කරපු කිසි ම දෙයක් ඇහුන් නෑ වගේ දොර ලග් හිටපු කෙල්ලවත් තල්ලු කරගෙන ම රූම් එක ඇතුලට ආවා ....

" උබ මොකද $&&# ඇහැරන් ඉන්නේ... "

කොල්ලා ඇද ලගට යන්න ගිහින් ආයෙත් කෙල්ල ලගට ඇවිත් ඇහුවේ කෙල්ල ආයුශ්ට උත්තරයක් දෙන්න වචන එකතු කරද්දි...

" උබ හිතන්නේ උබ ඔහොම ඇහැරන් හිටිය ම මන් උබ පව් කියලා හිතයි කියලද .. කතා කරපන්... උබට මන් මොකෙක් වගේද පේන්නේ $&&% "

" නෑ ආයුශ් මන්... "

" නෑ නෙමෙයි ඔව්... කතා කරපන්...උබත් හදන්නේ මාව අන්දන්න නේද..උබ හිතන්නේ මන් ආයෙත් රැවටෙයි කියලද &%*$... "

" නෑ ආයුශ්...මන්...ඔයා... ඔයා අත කපාගෙන හිටපු හින්දයි මන්... "

" කට වහපන් නේහා..මන් දන්නවා ඔක්කොම උන් ගැන...ඔක්කොම එකතු වෙලා..මාව...මාව පන පිටින් මරලා දැන්මා... උබ හදන්නේ ආයෙත් මාව මරන්න...මගෙන් ඈත් වෙලා හිටපන් %&$&..."

කොල්ලා අඩ අඩ එහෙම කියලා ඇදට වැටුනේ බීමතින් උනත් දෝතින් ම ඔලුව අල්ලගෙන...

එතනින් එහාට කෙල්ල වචනයක් වත් නොකිවුවේ ආයුශ් හිත යටින් විදවන හේතුව කොහොමහරි හොයා ගන්නවා කියල හිත හදගෙන... තවත් විනාඩි ගනකින් කොල්ලා නිදි කියලා කෙල්ලට තරවුරු වෙනවත් එක්ක ම කෙල්ලත් ඇදට ඇවිත් නිද ගත්තා..

උදේ වෙද්දි කොල්ලට වෙරි හිදිලා තිබුනා..අම්මලට ඊයේ රෑ උන කිසි දෙයක් නොකියන්න කෙල්ල වග බලාගත්තා...

කොල්ලට කලින් ඇහැරලා වොශ් එකකුත් දගෙන කෙල්ල ඉක්මනට පහල්ට ගියේ උදේ පාන්දර ආයුශ් ගෙන් බැනුම් අහන්න තිබුන බය හින්ද... පහලට ගිහින් ඊයේ ඩිනර් එක ගැනත් අහිත් තොරතුරුත් කෙල්ල අහන්න ගත්තේ මේ වෙද්දි කෙල්ල කෙල්ලගේ අම්මා තරමට ම ආයුශ් ගේ අම්මට ලන් වෙලා තිබුන නිසා...

එතකොටයි කෙල්ල දැනගත්තේ ආයුශ් ගේ නංගි යාලුවෙලුත් එක්ක 3 month වලට රට යනවා කියලා...එහ් වෙලාවෙනම් කෙල්ලට දැනුනේ පුදුම දුකක්..

sinhalaebooks.com

ඊයේ නංගිගේ මැරේජ් එකේ තොරතුරුත් කතා කරලා කෙල්ල තේ එකක් බීලා රූම් එකට ආවේ ආයුශ් ට තේ එකත් අරගෙන... කෙල්ල රූම් එකට එද්දි ත් කොල්ලා හොදට ම නිදි... කෙල්ල ටේබල් එක උඩින් තේ එක තියලා wind chimes වල හඩ එක්ක බැල්කනියට ගියේ කොල්ලව ඇහැරවලා බැනුම් අහන්න බැරි කමට.. කෙල්ලගේ ඇගට සීතල හුලං වැදෙද්දි මූනට ඉරඑලිය වැටෙද්දි මේ පරිසරය දකින්න ඇත්නම් කියල කෙල්ලගේ හිතට ආසාවක් දැනුනේ එහ් හීනේ කවදවත් ම ඉශ්ට වෙන් නෑ කියලා මහා ලොකු වේදනාවකුත් එක්ක...

කෙල්ල සුසුමකුත් පිට කරලා බැල්කනි එකේ තිබුන පුටුවෙන් වාඩි උනේ තමන් මේ ගෙවන ජීවිතේ ගැන ම කල්පනා කර් කර... දැන් කෙල්ල ගෙදර හැම තැනක් ම වගේ ම රූම් එකත් වොශ් රූම් එකටත් බැල්කනියත් හොදට හුරුයි... මේ ටිකදවස ඇතුලට කෙල්ල ට දැන් ඕනි තැනක තනියම යන්න පුලුවන්...

මොන තරම් වෙලා බැල්කනි එකට වෙලා කල්පනා කරාද කියලා කෙල්ලට මතකයක් තිබුනේ නෑ... මොකද කෙල්ල හිටියේ කල්පනා ලෝකේ ගොඩක් දුර ගිහින්...

කොල්ලා ඇහැරලා වොශ් එකකුත් දාගෙන හැමදම වගේ ලැප් එක අතට ගන්න ටේබල් එක ලගට යද්දි යි ටේබල් එක උඩ තිබුන නිමුන තේ එක දැක්කේ.... දැන් කොල්ලට කෙල්ල රූම් එකේ නැති වෙන එක සාමාන්‍ය දෙයක් වෙලා...මොකද කොල්ලා දන්නවා කෙල්ල හැමදම උදේට පහලට ගිහින් අම්මා එක්ක කතා කර කර ඉන්න බව... කොච්චර දරුනු හිතක් තිබ්බත් කොල්ලට මොකක්දෝ හේතුවකට ඒක නවත්තන්න නම් හිත දුන්නේ නෑ... ඒත් නිමුන තේ එක දකිද්දි නම් කොල්ලගේ හිතට ආවේ ක්ෂණික තරහක්...

" තේහා...කෝ උබ...ඉන්න තැනකින් එලියට වරෙන්...."

ආයුශ් ගේ හඩට කල්පනා කර කර හිටපු කෙල්ල ගැස්සිලා රූම් එක ඇතුලට ආවා... තිබුන කලබලේට ම කෙල්ල දෙතුන් තැනක ම හැප්පුනා....

" මන් නිදගෙන හිටියනම් උබ මට කතා කරන් නැතුව තේ එක මෙහෙම තියලා හරියනවද තේහා...මොලයක් කියලා එකක් නැද්ද උබට.. "

" සොරි ආයුශ් මන්.. "

" හරි ..නවත්ත ගතින්... දැන් මේක අරන් පලයන් ගෙනාව තැනකට.මීට පස්සේ මට උදේට තේ එපා... කවුද දන්නේ ඕවට මොනා දාලා ගේනවද කියලා.. "

කොල්ලා කතා කරේ කිසිම හිතක් පපුවක් නැති ගානට...

" ආ..යු..ශ්.. "

sinhalaebooks.com

" උබට ඇස් පේන් නැති උනාට අත පය හොදට වැඩනේ..අනික උබත් ගෑනියෙක් නෙහ්.. "

" ආයුශ් මන්...."

" කට වහපන්...මන් කියන විදිහට විතරයි උබ ඉන්න ඕනි...මීට පස්සේ මට් තේ ඕන නම් පහලට ගිහින් බොන්නම්...උබ ගේන්න ඕන් නෑ...තේරුනා නෙහ්? "

ආයුශ් මේ තරමට ම තමන් ව පහත් කරලා කතා කරන්න තරම් තමන් කරපු වැරැද්ද මොකක් ද කියලා කෙල්ල තමන් ගේ හිතින් ඇහුවේ ඇස් වල කදුලු නවත්ත ගන්න බැරුව ගලන් යද්දි...ඒත් ආයුශ් කරේ නේහා දිහා තවත් එක බැල්මක් වත් නොබල ම ලැප් එක අතට අරන් වැඩ කරන්න ගත්ත එක...

දවසින් දවස ගෙවිලා ගියේ ආයුශ් තාත්තාගේ හීන හැබෑ කරන්න රට යන දවස ටිකෙන් ටික ලන් කරමින්.... ආයුශ් ඒ ගෙවුන හැම දවසක් ම ගෙවුවේ එහ් වැඩ වෙනුවෙන්... නේහා ට උනත් වද දෙන එක ආයුශ් ට ටිකෙන් ටික මග හැරිලා ගියේ මේ වැඩ නිසා..

ආයුශ් ගේ නංගි ත් ආයුශ් එක්ක ම යන්න හිතාගෙන හැමදේම ලෑස්ති කර ගත්තා... යන්න හරියට ම දවස් තුනක් තියෙද්දි අයුශ් ට පුලුවන් උනා වැඩ සේර ම ඉවරයක් කරගන්න...

මේ ගෙවුන කාලේ අතුලත ආයුශ් ගේ යාලුවා මලීශ් වත් සරණී වත් ආවේ නෑ...ආයුශ් එක්ක තරහා උනාට පස්සේ අඩුම තරමේ නේහා ට වත් කතා කරේ නෑ.... ඒත් ආයුශ් ට මලීශ් තමන් ගේ සහෝදරයෙක් ගානයි..කොල්ලා රට යන්න කලින් මලිශ් එක්ක කතා කරන්න ඕනි කියලා හිතුවේ හැම තරහක් ම හිතින් අමතක කරලා දලා...එහ් හින්ද ම යි කොල්ලා මලීශ් , සරණී වෙනුවෙන් ම රට යන්න කලින් පුංචි පාටි එකක් ඕගනයිස් කරේ.....
ගෙදර් හැම සැරසිල්ලක් ම උනේ කොල්ලගේ අතින්... කෑම පිටින් ඕඩර් කරත් කේක් එක හැදුවේ ආයුශ් ගේ අම්මගේ අතින්... නේහා ට පාටි එකක ට අදින්න තරම් ලස්සන අදුමක් තිබුනේ නෑ...කෙල්ල එද අම්මව බලන්න ඇදන් ගියපු සාරි එක ම අතට ගත්තේ එහ් හින්ද...ඒත් ආයුශ් ගේ නංගි පායා එක ම වගේ රෙඩ් ෆ්‍රොක් දෙකක් ඕඩර් කරේ නේහා ටත් එක්ක... කෙල්ල නේහා ගේ ෆ්‍රොක් එකක් අරන් රූම් එකට ආවේ කෙල්ලව ස්ප්‍රයිස් කරන්න හිතාගෙන...

කෙල්ල හෙමින් ම ඇවිත් නේහා ගේ කරට අත දැන්මේ කෙල්ල එහ් ස්පශර්යෙන් ම කවුද කියලා අදුන ගද්දි...

" න..ං..ගි..."

" සු..දු...අ...ක්...කි....මන් කතා කරන්නත් කලින් ම කිවුවා..... "

" එහෙම තමයි...මට දැනෙනවා..."

sinhalaebooks.com

කෙල්ල කිවුවේ හිනා වෙවීම...

" අක්කි...පාටි එකට අඳින්නේ මොකක් ද..."

" එද අම්මලගේ ගෙදර ඇඳන් ගියපු සාරි එක පැටියෝ..."

" අනේ අක්කි...ෆ්‍රොක් එකක් අඳිමුකෝ....අපි දෙන්න ම එක වගේ ම..අනේ හාද...ප්ලීස්ස්...."

" මැට්ටි...ඒත් කොහෙන්ද..මේ හදිසියේ එක වගේ ම ඒවා... "

" මන් ඕඩර් කරා අක්කි..එන්නකෝ..මන් ඇද උඩින් තිබ්බා..රෙඩ් ෆ්‍රොක් එකක්...ඒක ඔයාට ගොඩක් ලස්සන වෙයි..."

" අනේ නංගා..ඔයා..."

" ඔන්න අඳින්න බෑ කියන්න නම් බෑ...හරි ද..."

" නෑ නෑ මැට්ටි....අපි දෙන්න ම අඳිමු.....එක වගේ ම... " .

කෙල්ල පායා ගේ අත උඩින් තමන් ගේ අත තියලා කිවුවේ අහිංසක විදිහට හිනා වෙලා...

කෙල්ල ඕඩර් කරල තිබුනේ යටි පතුල ලගට ම දිග පුදුම තරම් ලස්සන ෆ්‍රොක් එකක්... කෙල්ලට එහ් බවක් පෙනුනේ නැති උනත් ෆ්‍රොක් එක ඇන්දට පස්සේ අනේ මගෙ ඇස් දෙකත් පෙනුනා නම් කියලා හිතට පුංචි ආසාවකුත් නොදැනුන ම නෙමෙයි..

තේහා ෆ්‍රොක් එක ඇන්දට පස්සේ ආයුශ් ගේ නංගි කෙල්ලගේ කොන්ඩේ කඩලා දලා චාම් මේකප් එකකුත් දැන්මේ ෆ්‍රොක් එකට මැච් වෙන විදිහට.... කෙල්ලගේ straight කොන්ඩේ straight එක එහ් විදිහට ම තියෙන්න දීලා යටින් curling tone එකෙන් curl කරේ ඒකෙන් කෙල්ලගේ මූනට අමුතුම ලුක් එකක් එන හින්ද .. පායා කෙල්ල ව අන්දලා ඉවර වෙද්දි කෙල්ලගෙත් දිස් උනේ පුදුම ලස්සනක්...

" වාව්...අක්කී...මාර ම ලස්සනයි....."

අන්දලා ඉවර වෙලා පායා mirror එකෙන් පේන කෙල්ල ගේ මූන දිහා බලලා කිවුවේ පුංචි ම වත් ඊෂ්‍යාර්වක් නැතුව...

කෙල්ලෙක් ට තවත් කෙල්ලෙක් ගේ ලස්සනක් දකිද්දි ඊෂ්‍යාර්වක් දැනෙනවා... ඒක සාමාන්‍ය දෙයක්....ඒත් පායා ට පුංචි ම ඊෂ්‍යාර්වක් වත් නොදැනුනේ කෙල්ල තේහා ට පුදුම විදිහට ආදරේ කරපු හින්ද ම වෙන්න ඇති...

sinhalaebooks.com

නේහා කරේ අහිංසක විදිහට හිනා උන එක...

" අයියා දැක්ක ම එයාට පිස්සු හැදෙයි අක්කි.. ඉන්නකෝ බලන්න... එයා තාම අම්මි එක්ක සාලේ ද කියලා... "

පායා කෙල්ල මොකුත් කියන්න කලින් ම රූම් එකේ දොර ලඟට ගිහින් පහල බැලුවා..එතකොටමයි ආයුශ් උඩට එන්න හැදුවේ...රූම් එකේ දොරෙන් පහල බලපු පායා ව කොල්ලා හොඳට ම දැක්කා...කොල්ලට පායා ගේ බැල්මේ අමුත්තක් දැනුනේ උපන් ද ඉඳන් ම කොල්ලට තමන් ගේ නංගිගේ හැසිරීම් ගැන හොඳ අවබෝධයක් තිබුන නිසා...ඒකමයි කොල්ලා ටිකක් අඩිය ඉක්මන් කරේ.. පායා ඉක්මනට නේහා ලඟට දුවන් ආවෙ තත්පර ගානෙන්...

" අක්කි..ඔන්න අරයා එනවා...මන් යනවා...."

කෙල්ල කලබලෙන් ම එහෙම කියලා පල්ලෙහට දිවුවේ නේහා ගේ කම්මුලකට කිස් එකකුත් දීලා....නේහා නම් පන බයේ ගැහුන එක විතරයි උනේ...

පායා පහලට එද්දි ආයුශ් ව පඩිපෙල මගදි හම්බුනා.. කෙල්ල නිකන් අමුතු හිනාවකින් කොල්ලා දිහා බැලුවා...කොල්ලට නම් එහ් බැල්ම ඇල්លුවෙ ම නෑ...

" මොකද ඕයි... "

" මොකද..."

" ඔහොම හිනා වෙන්නේ.."

" ඇයි මට හිනා වෙන්න ඔයාගෙන් අවසර ගන්න ඕනි ද අයියා..."

කෙල්ල එහෙම කියලා ආයෙත් පඩි පෙල බහින්න ගත්තේ හිනා වෙවීම...

" විකාර..."

ආයුශ් තමන් ට ම කියාගෙන රූම් එකට ගියේ රූම් එක ඇතුලේ මොනවද උනේ කියලා නේහා ගෙන් ම දැනගන්න......ඒකමයි කොල්ලා නේහා ගේ නම කියාගෙන ම ඇතුලට ගියේ...

කොල්ලා ඇතුලට යද්දි ම කෙල්ල උන්නේ දොරට පිටුපාලා ඇඳෙන් වාඩි වෙල..ආයුශ් දැන් ආව ම මොනා කියයි ද කියලා බයේ ගැහි ගැහි... මේ ඇඳුම ගලවන්න කිවුවොත් පායා ට මොකද කියන්නේ කියලමයි කෙල්ල හිතුවේ...

" නේ...හා... "

sinhalaebooks.com

කොල්ලා සුපුරුදු විදිහට ම තරහින් කියද්දි කෙල්ල ආයුශ් ගේ හඩ දිහාට හැරුනේ දිගෙන් ගොඩ දපු මාලුවෙක් වගේ ගැහි ගැහි...ඒත් කෙල්ල ව මේ විදිහට දකිද්දි කොල්ලා විනාඩි කීපයක් කෙල්ල දිහා ම බලන් හිටියේ කොල්ලටත් නොදැනිම... මොකද අද වෙඩින් එක දවසටත් වඩා ලස්සනට කෙල්ලව පෙනුනා...

හැබැයි එහ් විනාඩි කිපයක් විතරයි....

" නේහා... මොකක් ද ඔය..."

" අනේ ආයුශ්...නංගි ගෙනත් දුන්නේ...අනේ ගලවන්න කියන්න නම් එපා..නංගි මොනවා හිතයි ද..."

" හරි..දැන් ඔය ඇඩියාව නවත්ත ගන්නවා..අරුන් ආවම ඕනවට වඩා කතා ඔන් නෑ...තේරුනානේ...අහන දේට විතරක් උත්තර දුන්න ම ඇති..."

කෙල්ලට සුසුමක් පිට උනේ ඉබේම...හිතුව තරම් දෙයක් නොවුනට කෙල්ලගේ හිතට දැනුනේ සැනසීමක්...

ආයුශ් කෙල්ලව මග ඇරලා අල්මාරිය ලගට ආවේ ඇදුමක් සිලෙට් කරගන්න...ඇදුමකුත් සිලෙට් කරගෙන කොල්ල කෙල්ල දිහා බැලුවේ රවාගෙන...

" නේහා..පොඩ්ඩක් එලියට යනවද..මට ඇදුම් අදින්න ඕනි...වොශ් රූම් එකට හරි කමක් නෑ යනවා...."

" අනේ මට ඔයාව පේන් නැනේ..ආයුශ්...."

" මන් දන්නවා ඕයි...ඒත් තමුසේ ඔහොම ඉද්දි....හරි කමක් නෑ..ඉන්නවා..මගුල..."

කොල්ලා එහෙම කියලා අල්මාරියේ තිබුන වයිට් ට්‍රවුසර් එකයි බ්ලැක් ශටර් එකයි ඇදලා රෙඩ් කෝට් එක දැන්මේ කෙල්ල එක්ක මැච් වෙන්න අදින්න ඕනි කියලා හිතාගෙන නම් නෙමෙයි...කොල්ල කොහොමත් එහ් කෝට් එකට ආසයි.... බ්ලැක් ඇන්ඩ් රෙඩ් ටයි එකත් දගෙන කොල්ලා අල්මාරියේ තමන් ගේ පැත්තේ තිබුන ලොකර් එක ඇරියේ වොච් එක දලා තිබුනෙ ඒකේ නිසා...ඒත් වැරදීමකින් කොල්ලගේ අත වැදිල ඇදුම් ඇතුලේ තිබුන කරාබු දෙකක් කොල්ලගේ කකුල් දෙක ඉස්සරහට වැටුනේ හිතේ තිබ්බ සතුටත් නැති කරලා දලා...

කොල්ලා ගල් ගැහිලා වගේ කරාබු දෙක දිහා ම බලන් හිටියේ මුලු හිතම මතක කෝටියක් අස්සේ පිච්චිලා යද්දි...ඒලගට බිමට නැමිලා කරාබු දෙක අතට අරන් විසි කරලා දන්න හැදුවත් ආයෙත් නේහා දිහා බැලුවේ ඉබේමයි...

" නේ...හා.."

sinhalaebooks.com

" ආ..යු...ශ්..."

" මේ කරාබු දෙකත් දගන්නවා..ඕකට මැච් වෙනවා...මේක රෙඩි..."

ආයුශ් එහෙම කියන ගමන් ම කෙල්ලගේ අතින් කරාබු දෙක තිබ්බා...කෙල්ල තමන් දගෙන හිටපු අම්මා අරන් දුන්න කරාබු දෙක ගැලෙව්වේ ලෝබ කමින්...

" ආයුශ් ඔයාට කොහෙද මේ දෙක..."

කෙල්ල හිතා මතා ඇහුවා නෙමෙයි...කෙල්ලට කිය වුනා...

කෙල්ලගේ එහ් ප්‍රශ්නෙට නම් කොල්ලා ගැස්සුනා...ඒත් එහ් බව නොපෙන්නන්න කොල්ලා බොරු තරහක් ගත්තා...

" උබට මොකට ද නේහා ඒක දැන් අහ්..."

කොල්ලා එහෙම කියන ගමන් ම කෙල්ලගේ අතේ තිබුන කරාබු දෙක තමන් අතට අරන් හරි පරිස්සමට කෙල්ලගේ කනට දැන්ම...එහ් ස්පශර්යෙන් කෙල්ල ට දැනුනේ එකම එක දෙයයි... එහ් අර තරම්ම තමන් ට වද දෙන එහ් අත් ම ද මේ තියෙන්නේ කියලා...

කොල්ලා නේහා මූන දිහත් කරාබු දෙක දිහත් තත්පර ගානක් බලන් ඉදලා ඉවත බලාගත්තේ හිස් බැල්මකින්...

" යමු... මලීශ් ලා ඇවිත් ඇති..."

වෙනදා වගේ තරහින් නොවුනත් කොල්ලා කිවුවේ හැඟීමක් දැනීමක් නැතුව කෙල්ලගේ අතින් අල්ල ගන්න ගමන්... කෙල්ල කරේ ඔලුව හොල්ලලා හා කියපු එක විතරමයි...

කිවුවා වගේ ම දෙන්නා පහලට යද්දි ත් මලීශ් සරණී එක්ක ඇවිත් තිබුනා.. මලීශ් වගේ ම සරණී ත් නේහා ගේ අහිංසක ලස්සන දැකලා මොහොතක් කෙල්ලගේ රූපේ ලගම නැවතුනේ ඔවුන්ටත් නොදැනි ම...

ඒත් සරණී කෙල්ල එක්ක වැඩි කතාවක් නොකෙරුවේ මලීශ් එන්න කලින් ම කෙල්ලට ඇඩ්වයිස් දීලා තිබුන නිසා...සරණී ත් එහ් හැමදේම හිතේ තියා ගත්තේ ආයුශ් ඒවට පලි ගත්තේ නේහා ගෙන් කියලා හොදකාරවම දැනන් හිටපු නිසා... ඒත් ආයුශ් එහෙට මෙහෙට වෙනකම් ඉදලා සරණී කෙල්ලත් එක්ක හරි හරියට කතා කරන්න ගත්තේ කෙල්ල දැන් ඉන්න තත්වේ දැනගන්න ඕනි හින්දමයි... ආයුශ් මලීශ් එක්ක ගාඩර්න් එකට ගියා ම සරණී කෙල්ලවත් එක්කන් ආයුශ් ට නොපෙනෙන්න රූම් එකට ගියේ එහ් නිසා...
" කොහොමද කෙල්ලේ...එදා ආයුශ් අපි ගියාට පස්සේ ගැහුවද .."

sinhalaebooks.com

සරණි ඇහුවේ කෙල්ලව ඇදෙන් වාඩි කරලා කෙල්ලගේ අතක් තමන් ගේ ඔඩොක්කුවෙන් තියාගෙන...තේහා ගේ අහිංසක මූන දිහා බලාගෙන...

කෙල්ල ඔලුව හොල්ලලා නෑ කිවුවේ ලාවට හිනා වෙලා... සරණි කෙල්ලගේ ඔලුව අත ගෑවේ කෙල්ල ගැන පුදුම අනුකම්පාවක් හිතට දැනුන නිසා... ඒත් තේහා ගේ හිතට නම් ආවේ සරණි කීයටවත් නොහිතපු දෙයක්... ආයුශ් හිතින් විදවන හේතුව සරණි ගෙන් අහන්න කෙල්ලට මතක් උනේ එක පාර ම...

" සරණි... "

" ඔව් කෙල්ලේ...ඇයි..."

" මට දැනගන්න දෙයක් තියනවා.... මට...ඇත්ත ම කියනවද......"

" අහන්න මැනික..."

" ආයුශ්....එයා....එයා හරි අමුතුයි...මන් හිතපු තරම් එයා නරක කෙනෙක් නෙමෙයි වගේ...."

" තේහා..පිස්සු හැදීගෙන එනවද."

සරණි ඇහුවේ කෙල්ලගේ මේ වචන අදහ ගන්න බැරුව...ඒත් තේහා ගේ මූනේ හිනාව එහ් විදිහමයි..කෙල්ල උන්නේ අයුශ් ව හිතින් මවාගෙන..

" නෑ...ආයුශ්...ආයුශ් මොකක් හරි දේකට හිතින් විදවනව සරණි...එයාට...මට කලින්... වෙන කෙනෙක් ඉදලා තියනවද...."

කෙල්ලගේ එහ් කතාවට සරණිට කට කොනකින් හිනාවක් වගේ කෙල්ල ආයුශ් ගැන හොදට ම දන්න නිසා...

" එක්කෙනෙක් නෙමෙයි...එයාට...ඉදලා ඇති ගනන් කරගන්න බැරි තරම්...එයා හොද කෙනෙක් නෙමෙයි තේහා...එයාව තේරුම් ගන්න පොඩි කාලේ ඉදන් එකට හිටපු මට ම බැරි උනානම්..ඔයා කොහොමද කෙල්ලේ...අඩුම තරමේ සහෝදරයා වගේ ලගින් ඉන්න මලීශ් ට වත් බැරි උනා ආයුශ් ව හරියට තේරුම් ගන්න..... "

ඒත් තේහා ගේ හිත නම් මේ කිසි දෙයක් පිලිගත්තේ කැමති උනේ නෑ...කෙල්ලට හිතුනෙම ආයුශ් මේ ඉන්න කෙනා නෙමෙයි කියලා...

" හරි...එහෙනම් මට කියන්න...ඉස්සර...ඉස්සරත් එයා එහෙම ද..."

" ඉස්සර කිවුවේ... "

sinhalaebooks.com

" ඔයාලා චූටි ම කාලේ....."

" චූටි කාලේ නම් ආයුශ් හරි අහිංසකයි කෙල්ලේ... මලීශ් ගෙනුයි මගෙනුයි ආයුශ් හැමදම ගුටි කනවා....ඒත් අම්මා ඇහුවටවත් කියන් නෑ ඇයි කියලා...එහ් අපි දෙන්නට බනියි කියලා...එහ් තරමට අහිංසකයි..."

සරණි කිවුවේ පුංචිම කාලේ මතකයන් ට ආයෙත් යමින්...හිත පුදුම විදිහට ඉස්සර මතක එක්ක සතුටින් පිරෙද්දි....

" එතකොට....ආයුශ් මෙහෙම උනේ කොයි කාලෙද .. "

" මට හරියට මතක නෑ කෙල්ලේ...කොහොම හරි studies වැඩ හින්ද අපි තුන් දෙනා කැඩුනා...මන් සැලෝන් පැත්තට ගියා, මලීශ් මෙඩිකල් කොලේජ් ගියා, ආයුශ් රට ගියා.... අපි තුන් දෙනා ම බිසි උනාට පස්සේ ආයේ මීට් උනේ ම නෑ කෙල්ලේ....ආයුශ් රට ගිහින් ආයෙත් ආවා...අවුරුදකින් වගේ.. එහ් ආවේ ආයේ යන්න...ඒත් එයා ආයේ ගියේ නෑ...එහ් ඇයි කියන්න මන් හරියට ම දන්නේ නෑ...හැබැයි...ආයුශ් ඇවිත් මාස 5ක් විතර ගියා ම මන් ආවා ආයුශ් ව බලන්න...හැබැයි..එතකොට හිටියේ මන් දන්න ආයුශ් නම් නෙමෙයි...මාත් එක්ක වචන දෙක තුනකට වඩා කතා කරේ නෑ...එයා හරියට බිසී... මන් ඇවිත් වත් ගෙදර හිටියේ නෑ...."

" එද මටත් අවුල්... මට ආයේ එන්නවත් හිතුන් නෑ... ඒත් දවසක් ආන්ටිගේ බල කිරීමට ආවා....එතකොට ආයුශ් හොදට ම බොනවා....මන් දැකලා නෑ ආයුශ් මන් ඇරෙන්න වෙන කෙල්ලෙක් එක්ක කතා කරනවා වත්...ඒත් ඊට දවස් කීපයකට පස්සේ සැලෝන් එකට ම ආවා කෙල්ලෙක් එක්ක... එද නම් මට ගොඩක් දුක හිතුනා කෙල්ලේ... ආයුශ් ව වෙන කෙල්ලෙක් එක්ක දකිද්දි..යාලුවා තමයි .ඒත් ඉරිසියා හිතුනා... ඒත් ඊට පහුවද තව කෙල්ලෙක්....ඊට සති දෙකකට විතර පස්සේ තව කෙල්ලෙක්..එතකොට නම් මට දැනුනේ පුදුමයක්...පස්සෙයි මට ආරංචි උනේ ආයුශ් ගනිකාමඩම් වලටත් යනවා කියල. මන් ආයුශ් ගැන මවන් හිටපු ප්‍රතිරූපේ වැරදියි කියලා එතකොටයි මට තේරුනේ...මන් එයාට ඕවා කියන්න ගියා ම මටත් බැන්න... ඊට පස්සේ... අපේ යාලුකමත් ගොඩක් ඈත් උනා නේහා... මලීශ් නම් තාමත් ආයුශ් ව හදගන්න ට්‍රයි කරනවා.... ඒත් මන් දන්න තරමින් අර පුංචිම කාලේ ඇරුනම ආයුශ් හොද විදිහට ඉන්නවා මන් දැක්කේ රට යන්න කලින්...ඒත් මේ තරම ට ම වෙනස් වෙලා ඉද්දි ආයුශ් ඉස්සර අහිංසක කමට ඉදලා කරලා තියෙන්නේ රග පෑමක් කියල...ඒක එයාගේ කටින් මන් කිවුවා..දැන් එළිපිට කරන ඒවා ඉස්සර කරේ අපිට හොරෙන් කියලා...
#ආයුශ්_හොද_කෙනෙක්_නෙමෙයි_මැනික_එයාගෙන්_පරිස්සම්_වෙලා_ඉන්න.... "

අන්තිමට සරණි කතාව ඉවර කරේ සුසුමකුත් පිට කරලා...ඒත් සරණි අන්තිමට කිවුව වචන ටික නම් නේහා ගේ හිතට පුදුම විදිහට වැදුනා... කෙල්ලගේ හිතේ එහ් වචන දෝන්කාර දෙන්න ගත්තේ පුදුම විදිහට හිතත් රිද්දලා...

sinhalaebooks.com

ඒත් සරණී මේ කිවුව දේවල් ගැන ආයෙත් නිදහසේ හිතන්න කෙල්ල හිතා ගත්තා....

" නේහා...මත් දන්නවා... ඔයාගේ හිත රිදුනා මැනික... ඒත්...මට බොරු කියලා දැන දැනත් ඔය අහිංසක හිතට බොරු බලාපොරොත්තු දෙන්න බෑ...එහ් හැමදේම අමතක කරලා දන්න.මත් ඉන්නව ඕන දේකට..හොඳද ...."

කෙල්ල ඔලුව දෙපැත්තට හොල්ලලා හා කිවුවේ අහිංසක විදිහට හිතා වෙලා උනත් මොකක් දෝ හේතුවකට කෙල්ලට තාමත් මේ කිවුව දේවල් වල මොකක් දෝ අඩුවක් තියනවා කියලා දැනුනා...

" අපි අද ආවේ වෙන දේකට කෙල්ලේ..."

සරණී කිවුවේ කෙල්ලගේ කල්පනාව අතරමැද නවත්තලා....

" එහ් කිවුවේ .."

" ආයුශ් ගියා ම එහෙ මාසයක් ඉන්නවනේ....අපි එතකොට ඇස් දෙක සනීප කරගමු... හරිද..."

" ස..ර..ණී..."

" ඔව් කෙල්ලේ...උබ ඔහොම ඉන්න ඕනි කෙල්ලෙක් නෙමෙයි... "

" ඒත් ආයුශ්..."

" එයාට කියන්න ඕන් නෑ නේහා... එහෙම උනොත් එයා කවදාවත් මේක වෙන්න දෙන එකක් නෑ...ඔයා දන්නවනේ එයාගේ හැටි.... "

" ඒත්...."

" ඒත් නෙමෙයි...එච්චරයි...කතාව ඉවරයි....අපේ යාලුකමට ආදරෙයි නම් මේ දේවල් ආයුශ් එක්ක කියන්න එපා නේහා...."

ඇස් දෙක සනීප කරගමු කියද්දි දැනුන සතුට ආයුශ්ට හොරෙන් මේ දේවල් වෙනවා කියද්දි නැති වෙලා ගියේ මග ලොකු වේදනාවකුත් එක්ක...කොච්චර වද දුන්නත් ආයුශ් එපා කියන දේවල් කරන්න කෙල්ල ගොඩක් බය උනා...ඒත් සරණී ව නැති කරගන්න තිබුන බයත් ඇස් දෙකෙන් මේ ලෝකේ දකින්න තිබුන ආසවත් කෙල්ලව ආයුශ් ට කියන්න තියන ඉඩ අහුරලා දැම්මා....

" දැන් ආයුශ් එන්න කලින් පහලට යමු මැනික...මෙහෙම ඉන්නවා දැක්කොත් තව ප්‍රශ්නයක්... " .

sinhalaebooks.com

සරණි එහෙම කියන ගමන් කෙල්ලව පහලට එක්ක ගියත් එහ් වෙද්දි ත් ආයුශ් හිටියේ ගේ ඇතුලේ...සරණි ත් නේහා ත් රූම් එක ඇතුලේ ඉදන් එද්දි කොල්ලගේ මූන අදුරු උනත් කොල්ලා වචනයක් වත් කිවුවේ නෑ..

සරණි හිටියේ පුදුම බයෙන් ..මලීශ් පවා කෙල්ලට රැවුවේ ඔක්කොම අවුල් කරාද වගේ බැල්මකින්... ආයුශ් ගේ මේ නිහඩ බව නේහා පිටින් යයි දෝ කියලා හිතෙද්දි සරණි ගේ හිත පුදුම විදිහට අසරණ උනා... ඒත් කෙල්ල නිහඩව උන්නේ කරන්න දෙයක් නැති කමට...
මලීශ් සරණි ගෙදරින් ගියේ ඩිනර් එකත් අරන්... හැමෝම නිද ගන්න ආවේ මේ වෙද්දි ත් හොදට ම රෑ වෙලා තිබුන හින්ද... නේහා ත් රූම් එකට ඇවිත් ඇදුමකුත් අරන් වොශ් රූම් එකට ගියේ ආයුශ් ඉන්න තැන ඇදුම් අදින්න බැරි නිසා...කෙල්ල වොශ් එකකුත් දාගෙන රූම් එකට එද්දි ත් ආයුශ් හිටියේ බර කල්පනාවක... එහ් හින්ද ම කොල්ලට කෙල්ල එන සද්දෙවත් ඇහුනේ නෑ...

කෙල්ල ඇදේ තමන් ගේ පැත්තේ වාඩි වෙද්දියි කොල්ලා කෙල්ල දිහා හැරිලා බැලුවේ...

කෙල්ල මේ වෙද්දි ත් හිටියේ හොදට ම නිදි මතේ...කෙල්ලගේ මූන දැක්ක ගමන් ඒක කියන්න පුලුවන්...ඒත් කෙල්ල උන්නේ ආයුශ් නිද ගන්නකම්....

" නිදගන්න... මන් තව ටිකකින් නිද ගන්නම්...."

කවදවත් නැතුව අද ආයුශ් ගේ කටහඩ සන්සුන්...ඊටත් වඩා කෙල්ලට හොදට කතා කරා...

" ඇයි...ඔයා...නිදගන් නැත්තේ.."

කෙල්ල ඇහුවා නෙමෙයි...කෙල්ලගේ කටින් කියවුනා... ඒත් ආයුශ් ගේ නිහඩ බවින් කෙල්ල ඇහුවේ අහන්න ඕන් නැති දෙයක් කියලා කෙල්ලගේ හිත තමන්ට ම දොස් කියන්න ගත්තා....එහ් අහපු දේන් ආයුශ් ට තරහා ගිහින් ද කියලත් කෙල්ලගේ හිත බය උනා...මොකද කෙල්ලට මේ නිහඩ බව මිසක් ආයුශ් ගේ මූනේ ඉරියව් පේන් නැති නිසා... ඒත් ආයුශ් එක පාරම ඇහුවේ කෙල්ල හීනෙකින්වත් නොහිතපු දෙයක්....

" නේහා...දැන් වයස කීයද... "

" 25 යි..."

කෙල්ල මේ පාරනම් වැඩියෙන් මොනවත් නොකියන්න වග බලා ගත්තා...

ආයුශ් කෙල්ලව මැරි කරපු එක මේ කසාද සහතිකේ මේ හැමදේම බලෙන් අකමැත්තෙන් උන දේවල් නිසා ම ආයුශ් කෙල්ලගේ වයස නොදැන ඉන්න එක පුදුමයක් නෙමෙයි...ඒත්

sinhalaebooks.com

පුදුමේ කොල්ල මේක දැන් ඇහුවේ ඇයි කියන එක... එහ් ප්‍රශ්නේ කෙල්ලටත් අගේට දැනුනත් කෙල්ල උන්නේ නිහඬව....

" හ්ම්... මට නංගි.... "

කොල්ලා කිවුවේ සුසුමකුත් පිට කරමින්...

" ඔයාට කීයද... "

කෙල්ල අතින් මුව වහා ගත්තේ කොච්චර තමන් ව පාලනේ කරගෙන හිටියත් මුවින් එහ් වචන ටික පිටවුන නිසා...

" 28යි.... දැන් නිද ගන්න... "

කොල්ල එහෙම කියලා ඇඳෙන් නැගිට්ටේ කෙල්ල මොකුත් නොකියම නිහඬව බලන් ඉද්දි...කොල්ලා රූම් එකේ දොරත් වහලා බෙඩ් එක ලග තිබුන ලැම්ප් එකත් ඕෆ් කරල බැල්කනි එකට ගියේ ආයෙත් බියර් එකකුත් අරන්....

ආයුශ් යන අඩි සද්දේ අහන් ඉදලා කෙල්ලත් නිදි නැතුව ඔහේ ඇදේ පෙරලි පෙරලි හිටියත් කෙල්ලට ටික වෙලාවකින් නින්ද ගියා...

ආයුශ් පාන්දර දෙක තුන වෙනකම් බැල්කනි එකට වෙලා කල්පනා කර කර ඉදලා රූම් එකට ආවේ නින්දක් අහලකවත් නැති උනත් නිද ගන්න... කොල්ලා රූම් එකට එද්දි කෙල්ල උන්නේ තද නින්දේ... කොට්ටෙත් තුරුල් කරන් නේහා හිටියේ හාපැටියෙක් වගේ ගුලි වෙලා... ආයුශ් ගේ පපුවට ඊතලයක් පසාරු කරන් ගියා වගේ අමුතුම හැගීමකින් මුලු පපුවම දැවවෙන්න ගත්තා... කොල්ලට දැනුනේ තමන් ගැන ම තරහක්... වේදනාවත් එක්ක තමන් ගැනම දැනුන තරහත් එක්ක කොල්ලා නේහාගෙන් ඇස් ඉවතට ගත්තේ තමන් ගේ පපුවට තමන්ගේ අතින් ම ගහගෙන.....ඊලගට ඇදට ඇවිත් ඇස් දෙක පියා ගත්තේ දෝතින් ම ඔලුව බදාගෙන....

එලිවෙන්න පැයක් දෙකක් තියෙද්දියි කොල්ලට නින්ද ගියේ....

කෙල්ල උදේ නැගිට්ද්දි ත් ආයුශ් ට හොදට ම නිදි...කෙල්ල ආයුශ් ඇහැරෙන් නැති විදිහට වොශ් එකකුත් දාගෙන පහලට ගියේ ආයුශ් ට ඇහැරින වෙලාවක ඇහැරෙන්න ඉඩ දීලා...

ආයුශ්ට රට යන්න තව තියෙන්නේ හරියට ම දවස් දෙකක් විතරයි.... එහ් ගැන හිතද්දි ත් කෙල්ලගේ හිතට දැනුනේ කියාගන්න බැරි තරම් අමුතු හැගීමක්...එහ් හැගීම තනිකමක් ද පාලුවක් ද දුකක් ද කියලා කෙල්ලට තේරුන් නෑ...

sinhalaebooks.com

ආයුශ් නැගිට්ද්දි දවල් 12 ත් පහු වෙලා... කොල්ලා නැගිට්ට වෙලේ ඉඳන් නේහා ට හරියකට මූන දුන්නේ නෑ... ලැප් එකත් අරන් ලැප් එකේම හිටියත් කොල්ලට කරන්න තරම් වැඩක් ලැප් එකේ තිබුනේ නෑ...

එදා දවස ම ගෙවිලා ගියේ එහෙ විදිහට....

පහුවදා දවස උදා උනේ නේහා ගේ හිතට ඊයේ දවසටත් වඩා වේදනාවක් එකතු කරලා...එහෙ ආයුශ් හෙට රට යන නිසා... ආයුශ් ට ෆ්ලයිට් එක තිබුනේ හෙට රෑ 8 ට... ඒත් ආයුශ් මේ දැන් යනවා වගේ වේදනාවක් කෙල්ලට තිබුනේ...ආයුශ් ගේ නංගි පායා ත් ආයුශ් එක්ක ම යන එක කෙල්ලගේ වේදනාව දෙගුන කරා...

ඊටත් වඩා ඊයේ දවස ම ආයුශ් ගේ මේ නිහඬ බව කෙල්ලට ගෙනාවේ ලොකු බරක්... ආයුශ් බැන්නනම් කෙල්ලගේ හිතට මීට වඩා නිදහසක් දැනෙන්න තිබුනා... සරණි කිවුව දේ ගැන ආයුශ් ට නොකියන්න උන එකත් කෙල්ලගේ හිතේ තිබුන වේදනාවේ කොටසකට අයිතියි උනා... අද දවසත් ආයුශ් ඊයේ වගේම නිහඬව ගෙවන්න එපා කියලා කෙල්ල ගතවුන හැම තත්පරේ ම හිතුවත් වෙනසක් උනේ නෑ...ආයුශ් උන්නේ නිහඬව...නේහා එක්ක එක වචනයක් වත් කතා කරේ නෑ...

ආයුශ් ගෙන් බැනුම් අහන එක හරි සැපයි කියලා කෙල්ල ආයුශ් ගෙන් හිතා මතාම බැනුම් අහන්න වැඩ දෙක තුනක් ම කරත් කොල්ල උන්නේ එහෙ කිසි දෙයක් නොපෙනුන ගානට... අන්තිමට කෙල්ල මේසේ උඩ තිබුන වෝටර් ග්ලාස් එක බිමට අත ඇරියේ ආයුශ් බනින්න හරි කතා කරයි කියලා ලොකු බලාපොරොත්තුවකින්... ඒත් උනේ කොල්ලා පායා ට කියලා රූම් එකේ වීදුරු කටු අස් කරගත්ත එක...

රෑ 10 වෙලත් කෙල්ලට නින්දක් තිබුනේ නෑ...ආයුශ් එක්ක කතා කරන්න ඕනි උනත් මොනා ගැන ද කතා කරන්නේ, මොනවද කියන්නේ කියලමයි කෙල්ලගේ හිත හිතුවේ...

ආයුශ් ඇඳේ අනිත් පැත්තට වෙලා බලන් උන්නේ රූම් එකේ ජනේලෙන් පෙනුන අහස දිහා...ඊලගට තාමත් නිදි නැතුව කල්පනා කරන නේහා දිහාට හැරුනා...

කොල්ල නේහා දිහා බලලා කෙල්ලගේ නම කියද්දි ම කෙල්ලගේ මූනට හිනාවක් ආවේ මේ වචන ටික අහන්න කෙල්ල පුදුම විදිහට පෙරුම් පුරපු නිසා...

කෙල්ල ආයුශ් දිහාට හැරුනේ ලස්සන ම ලස්සන හිනාවක් එක්ක...ආයුශ් ගේ බැනුමක් උනත් හරි ආසාවෙන් බාර ගන්න හිතාගෙන...

ඒත් ආයුශ් රට යන්න කලින් නේහා එක්ක ගත කරන අන්තිම රාත්‍රිය කෙල්ලගේ ජීවිතේ අමතක නොවෙන ම රාත්‍රියක් වෙන බව කෙල්ල දැනන් උන්නේ නෑ... එතකොට මේ රාත්‍රියේ ඇහෙන හැම වචනයක් ම හදවත මේ තරමට ම පසාරු කරයි කියලා කෙල්ල කීයටවත් හිතුවේ නෑ... ආ..යු...ශ්... "

sinhalaebooks.com

කොල්ලා කෙල්ලගේ නම කියලා ආයෙත් මොකුත් නොකියපු නිසා ම තේහා කොල්ලාගේ නම කිවුවේ අහිංසක විදිහට හිනා වෙලා...ලයිට් ඕෆ් කරලා තිබුනත් හද එළිය හින්ද ම තේහා ගේ හිනාව එහ් මූනේ හැඟීම් ආයුශ් හරි අපූරුවට දැක්කා... කොල්ලාගේ හිතට තනිකර ම දැනුනේ දරා ගන්න බැරි ගින්දරක්....

" තේහා...මට...කියන්න දෙයක් තියනවා..."

කොල්ලා කතා කරේ උගුරෙන් වගේ..පිටවෙන වචනෙත් පිටකරගන්න කොල්ලා පුදුම වෙහෙසක් දුන්නා...

" මන් හෙට යනවා තේහා..."

කොල්ලා කිවුවේ තේහා ගේ මූන දිහා ම බලාගෙන...එහ් මූනේ හැඟීම් එකින් එක පපුවේ ගැඹුරුම තැන සටහන් කරගෙන...

"මන් දන්නවා ආයුශ්..."

කෙල්ල හිතේ දුක හංගගෙන ලාවට හිනා වෙලා කිවුවා...

" මන් ගියාම.....තනියම ඔයා..... "

ආයුශ් අද හරියට හැඟීම් බර වෙලා...ඒටත් වඩා කොල්ලා කතා කරන්නේ මැරිලා ඉපදිලා වගේ... මේ තරම් දවසක් තේහා ට තමන් මොන තරම් වද දුන්නත් කොල්ලා මේ කතා කරන්නේ තේහා ව මේ තරම් දවසක් ඇස් දෙක වගේ බලාගත්ත ගානට...

ඒත් ආයුශ් ගේ මේ හැඟීම් බර වචන ලඟ කෙල්ලට සීමාවක් නැතුව ම තමන් ගේ හැඟීම් පාලනය කරගන්න බැරි උනා....ආයුශ් ගේ මේ වචන කෙල්ලට ආයුශ් එක්ක කතා කරන්න තියන බය නැත්තට ම නැති කරලා දද්දි කෙල්ල කතා කරේ හිතට දැනුන හැම වචනයක් ම පිට කරලා...

" අම්මා ඉන්නවනේ ආයුශ්...ඔයා පරිස්සමට ගිහින් එන්න.... "

" තේ..හා.... "

කොල්ලා පිටතට ඇසෙන නැසෙන තරමට කෙල්ලගේ නම කියලා සම්පූර්ණර්යෙන් ම කෙල්ල දිහාට හැරුනේ කෙල්ලගේ මූන දිහා ම බලාගෙන...

" ආ..යු...ශ්... "

ඒත් කොල්ලා ඊලඟට කෙල්ලගෙන් ඇහුවේ කෙල්ල හීනෙකින් වත් නොහිතපු දෙයක්...

sinhalaebooks.com

" එදා සරණී මොනවද කිවුවේ..."

" මො...කු...ත්...නෑ...ආ...යු...ශ්..."

කෙල්ල කිවුවේ වෙවුලමින්... ඒත් ආයුශ් තරහා ගන්නවා වෙනුවට අද ආයුශ් ගේ හැම වචනයක් ම පුදුම තරම් සන්සුන් උනා...

" රූම් එකේ දොරත් වහගෙන... මොකුත් ම කිවුවේ නැද්ද..."

" නෑ...ආ...යු...ශ්...ස...ර...ණී...."

කෙල්ල ඊලග වචන ටික කියන්න කලින් ම කොල්ලා එන් සැනින් ම කෙල්ලගේ කටට තමන් ගේ ඇගිල්ලක් තියලා මොකුත් කියන්න එපා කියලා ඉගි කරේ කොල්ලගේ හුස්ම පවා වේගවත් වෙද්දි...මේ තරම් වෙලා සන්සුන් ව හිටපු කොල්ල තේහා ගේ අන්තිම වචන ටික එක්ක පරන ආයුශ් ම වෙන්න තත්පර ගානක් වත් ගියේ නෑ...ඒත් වෙනසකට තිබ්බේ කොල්ලාගේ හිතේ අද තරහා විතරක් නෙමෙයි ..දුකත් එහ් තරමට ම තිබුන එක...

කොල්ලා දෙපාරක් නොහිතම කෙල්ලව ඇදේ පෙරලලා කෙල්ලගේ ඇග උඩට ආවේ දුක එක්ක ආව තරහා නිසා ම වේගෙන් හුස්ම ගනිමින්... කෙල්ල උන්නේ දියෙන් ගොඩ දාපු මාලුවෙක් වගේ ගැහි ගැහි...

" ආ...යු..ශ්..."

" කට වහපන් තේහා... උබ...උබ හිතන්නේ...මන්... මන්...මෝඩයෙක් කියල ද.... "

" අනේ ආයුශ් මගෙ ඇග උඩින්....අයින්..."

" ෂ්...ෂ්...කට වහපන්....උබලා හැමෝට ම මාව සෙල්ලම් බඩුවක්....උබ දන් නෑ තේහා...මන්...විදවපු තරම්... උබ...උබ හිතනවා ඇති මන් තිරිසනෙක් කියලා...ඔව්...මන් තිරිසනෙක්.....මන්....තිරිසනෙක්....... "

ආයුශ් තරහින් වගේ ම ඇස් අගින්වැටෙන කදුලු තද කරන් කිවුවේ තේහා ව තවත් තද කරලා අල්ලගෙන..කෙල්ලගේ හුස්මත් දැනෙන තරමට ම ළන් කරගෙන....

" හැබැයි.... මගෙ ගෑනිට ඇස් දෙකක් ඕන් නෑ... උබට තේරුනා ද ... "

ආයුශ් කෙල්ලගේ කම්මුලකින් අත තියලා කිවුවේ බිදුනු කටහඩින්... කෙල්ල උන්නේ ගොලු වෙලා...වචනයක් වත් කතා කරගන්න බැරුව...

" කියපන්...උබට තේරුනා ද...."

sinhalaebooks.com

ආයුශ් හැඩුම් ස්වරයකින් කියද්දි නේහා ඔලුව හෙල්ලුවේ ඔව් කියන්න... කෙල්ලගේ එහ් ප්‍රතිචාරේ එක්ක කොල්ලගේ මූනට ආවේ හිනාවක්...එහ් හිනාව එක්ක ම තද කරත් හිටපු කඳුලුත් නිමක් නැතුව ගලත් යත්න ගත්තා...ඊලග තත්පරේ ජීවිතේ පලවෙනි වතාවට කොල්ලා අඬාගෙන ම කෙල්ලගේ පපුවට මූන තද කරගත්තේ වෙන කිසි දෙයක් හිතා ගන්න බැරුව කෙල්ල පුදුම විදිහට ගැහෙද්දි...

" කියපත් නේහා...උබට මොනාද ඕනි...අද මගෙත් ඕන දෙයක් ඉල්ලපත්...ඕනිම දෙයක්...."

ආයුශ් කෙල්ලගේ පපුවට තවත් මූන තද කරලා කිවුවේ ඉකි බිඳුම් අතරින්...කෙල්ල උන්නේ දරා ගන්න බැරි වේදනාවකින් එහ් හඩට ඇහුම්කම් දිදී...

" ම..ට...මො..කු..ත්...එ...පා...ආ...යු...ශ්..."

කෙල්ල කිවුවේ වෙවුලන කටහඬින්...මේ වෙද්දි කෙල්ලගේ ඇස් වලටත් කඳුලු උනලා තිබුනේ...එහ් වෙනදා යක්ශාවේශ වෙලා ඉන්න ආයුශ් ගේ මේ හැඩුම් දරාගන්න බැරුව...

" මට පොරොන්දු වෙයත් නේහා...මත් ගියාම අරුත් එක්ක එකතු වෙලා මේ ඇස් දෙක සනීප කරගත් නෑ කියලා...මට පොරොන්දු වෙයත්....උත් ඔක්කොම හදන්නේ ආයෙත් මාව පිස්සෙක් කරන්න...."

ආයුශ් නේහා ගේ අත තමත් ගේ ඔලුවෙත් තියලා කිවුවේ කෙල්ල වචනයක්වත් කතා කරගන්න බැරුව ගැහෙද්දි...

කලුවර විතරක් පේන මේ ඇස් දෙකෙත් මුලු ලෝකෙම දකින්න කෙල්ල හීන මවපු හැටි...එහ් හීන හරි අහිංසකයි.... ඒත්..ආයුශ් ගේ මේ හැඟීම්...මේ කඳුලු...එහ් හීන හැම එකක් ම යට කරලා දන්න මේ කඳුලු වලට පුලුවත් උනා...

" මත් පොරොන්දු වෙනවා ආයුශ්... "

කෙල්ල කිවුවේ හිත ගලක් කරගෙන... නේහා ගේ එහ් වචන එක්ක කොල්ලා සුසුමකුත් එක්ක කෙල්ලගේ පපුවෙත් මූන ඉවතට ගත්තේ කෙල්ලගේ ඇග උඩිනුත් අයිත් වෙන ගමන්...මේ තරම් වෙලා ආයුශ් ගේ ඇගට හිර වෙලා හිටපු කෙල්ල දිග හුස්මක් ගත්තේ පුදුම අපහසුවකින්...

කොල්ල කෙල්ල දිහා මොහොතක් බලත් ඉදලා ආයෙත් කෙල්ලගේ ඔලුවෙත් තමත් ගේ අත තිබ්බේ කෙල්ලගේ අජීවී ඇස් දෙක දිහා ම බලාගෙන...

" මට දත් හැඟීම් නෑ නේහා...උත් මාව පිස්සෙක් කරා...ඒත් උබ...උබේ අහිංසකකම් ආයෙත් මාව පරන ආයුශ් කරනවා...ඒත් වැරදිලාවත් එහෙම වෙන්න දෙන්න එපා..එහෙම උනොත්.... මාව මේ පාර මැරිලම යයි .. උබ මේ ලෝකේ දකින්න ඕන් නෑ නේහා...මත් උබට වද දෙයි...උබට බනියි..කෑ ගහයි...උබට ජීවිතේම එපා කරවයි..හැබැයි වෙන එකෙක්ටවත් උබට

sinhalaebooks.com

අතක් වත් තියන්න දෙන් නෑ.... මගෙ ජීවිතේ දීලා හරි උබට රැක ගන්නවා... තේරුනාද උබට ..මේ තිරිසනාට විතරයි උබට වද දෙන්න පුලුවන්...අනිත් එකෙක්ටවත් උබට සීරීමක්වත් කරන්න දෙන් නෑ.... "

ආයුශ් කෙල්ලගේ ඔලුව සීරුවට අත ගාලා කියද්දි කෙල්ල කරේ ගැහි ගැහීම ඔල්ලුව හොල්ලපු එක...

" හැබැයි...උබ...මට මේ උන පොරොන්දු ව කැඩුවොත්...මේ ආයුශ්...ජීවත් වෙන එකක් නෑ...එක තත්පරයක් වත්...එහ් වගේ ම එහ් උබෙත් අන්තිම දවස...තේරුනාද උබට..."

කෙල්ලගේ ඔලුව සීරුවට අත ගාමින් හිටපු අතම අරන් කෙල්ලගේ කම්මුල් දෙක රතු වෙන තරමට ම මිරිකලා ආයුශ් තජර්නය කරේ කෙල්ල ඇස් දෙකේ කදුලු පුරවගෙන ම ඔව් කියන්න ආයෙත් පාරක් ඔලුව හොල්ලද්දි...

කොල්ලා එහ් ප්‍රතිචාරය එක්ක කෙල්ලගේ මුවින් අත ඉවතට ගත්තේ හිත යම් තරමකට සන්සුන් කරගෙන...

" මන් ගිහින් එනකම්...පරිස්සමට හිටපන්.... එහ් වගේම උබට පුංචි සීරීමක් වත් වෙන්න බෑ...තේරුනා ද... මතක තියාගනින් තේහා...මේ ආයුශ්...මේ තිරිසනා...උබට වද දෙන මේ තිරිසනා...ජීවත් වෙන්නෙත් උබ හින්ද කියලා...උබ නැති උනොත් මේ ආයුශ් ජීවත් වෙන එකක් නෑ...මන් කිවුවේ උබට ඇස් දෙක එපා කියලා.... හැබැයි උබව ඕනි...මට වද දෙන්නයි මට සැනසෙන්නයි මට උබව ඕනි...උබට තේරුනාද..."

වෙන කිසි දෙයක් දශමයක් වත් නොතේරුනත් හාපැටියෙක් වගේ ගැහි ගැහි හිටපු කෙල්ල ආයිශ් ගේ විටක ආදරේ විටෙක තරහා විටෙක කදුලු...මේ හැම හැගීමක් අතරෙම අහිංසක විදිහට ඔලුව හොල්ලලා තේරුනා කියපු එක විතරමයි කරේ...

" එහෙනම් දැන් නිදා ගන්න.."

ආයුශ් ආයෙම පාරක් කෙල්ලගේ ඔලුවට අත තියලා කියද්දි කෙල්ල කරේ ඒකටත් ඔලුව හොල්ලපු එක...

තාමත් කෙල්ලගේ පපුවේ කොල්ලගේ උනුහුම... එහ් පපුව පිටතට ඇහෙන තරමට ම ගැහෙනවා.....මේ හැගීම් ජීවිතේ පලවෙනි වතාවට මේ විදිහට අවසන් වෙද්දි එහ් හැම හැගීමක් ම කෙල්ලගේ හිතේ ගැබුරෙම සටහන් උනේ අද ආයුශ් ගේ මේ වචන මේ පොරොන්දුව කවදාවත් ම අමතක නොවෙන විදිහට හිතේ ගැබුරුම තැන සටහන් කරගෙන....

ආයුශ් ට තමන් ගැන ම තරහක් පිලිකුලක් දැනුනත් කොල්ලා එහ් හැම හැගීමක් ම යටපත් කරගෙන ඇස් දෙක පියා ගත්තේ තේහා දුන්න පොරොන්දුව නිසා ම කොල්ලගේ හිතට යම් තරමක සහනයක් දැනෙද්දි...පහුවදා දවස ගෙවිලා ගියේ ඒයේ රෑ උන සිදුවීම ත් එක්ක ම

sinhalaebooks.com

නේහා ගේ හිත පුදුම විදිහට පාරලා...කෙල්ලට ගෙවුන හැම තත්පරේක ම ආයුශ් ඊයේ රෑ කිවුව දේවල් මතක් වෙන්න ගත්තා...ඊටත් වඩා කෙල්ලගේ හිත පැරුවේ අදින් ගෙවෙන මාසයක් පුරාවට ආයෙත් ආයුශ් ව දකින්නවත් වෙන් නෑ නේද කියලා හිතෙද්දි...

කෙල්ල හවස් වෙනකම්ම ඇදේ කෙලවරක වාඩි වෙලා කල්පනා කරපු එක විතරමයි කරේ...ආයුශ් කෙල්ලගේ හැසිරීම් දිහා බලන් හිටියත් කොල්ලා එක වචනයක් වත් කෙල්ල එක්ක කතා කරන්න ගියේ නෑ....

පායා අරන් යන බෑග් එකත් ලෑස්ති කරලා රූම් එකට ආවේ කෙල්ල එක්ක ටිකක් කතා කරන්න... ආයුශ් රූම් එකෙන් එලියට ආවේ දෙන්නට නිදහසේ කතා කරන්න ඉඩ දීලා...මොකද කොල්ලා දැනන් හිටියා කෙල්ලට පායා අද යන එක ලොකු දුකක් කියලා...මේ වෙලාවෙත් කෙල්ලට තපුරු කම් කරන්න තරම් නම් කොල්ලගේ හිත දරුනු උනේ නෑ...

ආයුශ් රූම් එකෙන් එලියට ගියාට පස්සේ පායා ඇවිත් කෙල්ලගේ ලගින් ම ඇදේ වාඩි උනා... ඊලගට කෙල්ලගේ අත අරන් තමන් ගේ ඔඩොක්කුවෙන් තියා ගත්තා...

" න..ං..ගි..."

පායා ගේ එක ස්පශර්යෙන් ම කෙල්ලව අඳුන ගත්ත නේහා කිවුවේ මැලවිලා තිබුන මූනට අහිංසක හිනාවක් අරන්...

" දුකයි ද..."

" ඔයා යනවට ද පැටියෝ...හ්ම්..ඔව්...ගොඩක්...."

" මටත් වඩා අයියා යන එකට දුකයි නේද අක්කිට..."

පායා ගේ එහ් ප්‍රශ්නෙට කෙල්ල අහිංසක විදිහට හිනා උන එක විතරමයි කරේ... පායා කෙල්ලගේ ඔලුව අත ගාලා කෙල්ලගේ ඉන වටේ ට අතක් යැවුවා තව ටිකක් ලන් කර ගත්තා...

" අයියා ඉක්මනට මගෙ අක්කිව බලන්න එයි..එතකම් අම්මියි තාත්තියි එක්ක පරිස්සමට ඉන්න මගෙ අක්කි.... "

" ඔයත් පරිස්සමට ගිහින් එන්න පැටියෝ.."

නේහා කෙල්ල ගේ අත් දෙකෙන් ම අල්ලගෙන කිවුවේ ඇස් වලින් වැටෙන්න හදන කදුලු ආයාසයෙන් ම පාලනය කරගෙන... පායා නම් මේ වෙද්දි ත් අඩලා හිටියේ...කෙල්ල කරේ අඩන් නැතුව ඉන්න උත්සාහ කරන නේහා ව තුරුල් කරන් අඩපු එක... නේහා ත් ඇති වෙන්න ම ඇඩුවේ පායා ට නේහා නොසෑහෙන්න ආදරේ කරපු හින්ද... ආයුශ් ආයෙම රූම් එකට එන අඩි සද්දෙටයි දෙන්න ම ඇස් වල කදුලු පිහද ගත්තේ...ඒත් ආයුශ් නම් එහ් බව

sinhalaebooks.com

හොදට ම දැක්කා..ඒකමයි කොල්ලා රූම් එකේ දොර ලගට ඇවිත් ආයෙම පහලට යන්න හැරුනේ... ඒත් පායා කොල්ලව නතර කරා...

" අයියා...ඔහොම ඉන්න...තව පැය තුනයි තියෙන්නේ අපිට මෙහෙන් යන්න...තව ටිකකින් එයාපෙර්ටර් එකටත් යන්න ඕනි..ඔයා අක්කි එක්ක ඉන්න අන්තිම විනාඩි ගාන.... මන් යන්නම් අයියා..ඔයාලා කතා කරන්න....මන් යනවා සුදු අක්කි... "

පායා කෙල්ලගේ කම්මුලක් කිස් කරලා නේහා මොකුත් කියන්න කලින් ම රූම් එකෙන් ගියේ අඩාගෙන ම...ආයුශ් තමන් ගේ නංගි පහලට යනකම්ම රූම් එකේ දොර ලගට වෙලා බලන් ඉදලා ඊලගට රූම් එකේ දොර වහලා කෙලින් ම හැරුනේ නේහා දිහාට...

කෙල්ල උන්නේ අත් දෙකෙන් ම කදුලු පිහදන ගමන්...කොල්ලා අඩියෙන් අඩිය කෙල්ල ලගට එනවා කෙල්ලට දැනුන හින්ද ම කෙල්ලගේ කදුලු ආයෙත් අලුත් වෙන්න ගත්තා.... කොල්ලා කෙල්ල ලගින් ම ඇදේ එහා පැත්තෙන් වාඩි උනේ සුසුමකුත් පිට කරමින්....

ඒත් දෙන්නා අතර ම විනාඩි දෙක තුනක් යනකම් තිබුනේ ලොකු නිහඩතාවක්...එහ් නිහඩතාව එක්ක කෙල්ලට දැනුන තනිකම දෙගුන තෙගුන උනා.... කොල්ලා නම් එහ් විනාඩි ගාන කෙල්ලගේ මූන දිහා බලන් උන්නු එක කරේ...නේහා ට එහ් කිසි දෙයක් නොපෙනෙන හින්ද ම කෙල්ල හිතුවේ කොල්ලා කල්පනා කරනවා කියලා...

ටික වෙලාවක් එහෙම ඉදලා කොල්ලා ඉදන් හිටපු තැනින් තව ටිකක් නේහා ට ලන් උනා..කෙල්ලගේ හිත ගැස්සුන් නැතුව ම නෙමෙයි...ඒත් කෙල්ල උන්නේ ආයුශ් ගෙන් වචනයක් බලාපොරොත්තුවෙන්...එහ් වචනේ මොන වගේ එකක් උනත් කොච්චර හිත රිද්දන එකක් උනත් කෙල්ල බලන් උන්නේ සතුටින් බාර ගන්න...

" නේ..හා... "

කොල්ලා පුදුම විදිහට හැගීම් බරව කෙල්ලගේ නම කියද්දි කෙල්ලගේ කම්මුල් දිගේ කදුලු ගලන් යන්න ගත්තේ මේ ආදරීය වචන ආයුශ් ගේ කටින් ඇහෙද්දි දරාගන්න බැරි නිසා...

කොල්ලා කෙල්ලගේ කම්මුල් දිගේ වැටෙන කදුලු තමන් ගේ අත් දෙකෙන් ම පිහදැන්මේ කෙල්ලට දැනෙන නොදැනෙන තරමට සියුම් ව ස්පශර් කරලා...

" අඩන්න එපා ...මන් ඉක්මනට එනවා...ආයෙත් උබට ගහන්න...වද දෙන්න...උබව පන පිටින් මරන්න..."

ආයුශ් එහ් වචන ටික කිවුවේ ඉකි බිදුම් අතරින්..කෙල්ලගේ කම්මුල් සියුම් ව අත ගාලා....එහ් කටහඩ පුදුම විදිහට දුවර්ලයි...කෙල්ලට ඉකි ගැහුනේ දුක දරා ගන්න ම බැරි තැන....එහ් තත්පරේම කොල්ලා කරේ කෙල්ලව ඇදලා අරන් තමන් ගේ පපුවට තුරුල් කරගත්ත එක......

sinhalaebooks.com

කෙල්ලගේ පපුව ගැස්සුනත් කෙල්ලට ආයුශ් ගේ පපුවෙන් මිදෙන්න උවමනාවක් තිබුනේ නෑ.... කෙල්ලට එහ් පපුව මැදදි දැනුනේ කවදවත් නොවින්ද සැනසීමක්... ඒත් විනාඩි 5ක් යන්නත් කලින් කොල්ලා කෙල්ලව තමන් ගේ පපුවෙන් ඈත් කරා...

" නේහා... උබට මන් ඊයේ කිවුව ඒවා හොදට මතකයි නේද...මට උන පොරොන්දු කඩන් නෑ නේද..."

ආයුශ් ඇහුවේ තරහින් උනත් එහ් තරහා මවාගත්ත එකක් කියලා කෙල්ලට දැනුනේ එහ් වචන අතරින් කොල්ලගේ ඉකිබිදුම් ඇහුන නිසා...

කෙල්ල ඔව් කියන්න ඔලුව හෙල්ලුවා...

" එහ් පොරොන්දුව උබ කැඩුවොත්....මේ ආයුශ් ආයේ නැගිට්ටවන්න බැරි තරමට විනාශ වෙලා යයි නේහා...."

ආයුශ් සුසුමක් හෙලලා කියද්දි කෙල්ලට තවත් කතා නොකර ඉන්න බැරි උනා...
කෙල්ල අමාරුවෙන් වචන අහුල ගත්තේ පුදුම වෙහෙසක් දීලා...

" මන් පොරොන්දු කඩ කරන් නෑ ආයුශ්..."

නේහා අහිංසක විදිහට කිවුවත් කොල්ලා කරේ කෙල්ලගේ කට මිරිකලා අල්ලා ගත්ත එක...

" කැඩුවොත්...එහ් උබ ජීවත් වෙන අන්තිම දවස... උබ විතරක් නෙමෙයි...මාත්... වරෙන්..."

ආයුශ් පුදුම තරම් ආවේගයෙන් කියලා කෙල්ලගේ අතින් ඇදගෙන ම නැගිට්ටේ ලෑස්ති කරලා තිබුන බෑග් එකත් අතට අරන්...

" ආ..යු...ශ්..."

එක පාර ම වෙනස් වෙන ආයුශ් ගේ මේ හැගීම් වලට කෙල්ල දැන් හුරු වෙලා උන්නත් කෙල්ල කතා කරේ පුදුම දුකකින්...

" මට අහන්න ඕන් නෑ නේහා...මන් එනකම් මන් කිවුව හැම දේම ඔලුවේ තියාගෙන පරිස්සමට හිටපන්...එච්චරයි වෙන්න ඕන.... මන් ඉක්මනට එනවා..."

ආයුශ් කෙල්ල කියන්න ගියපු දේ වලක්වලා කිවුවේ සුපුරුදු දැඩි ස්වරයෙන්...ඊලගට කෙල්ලගෙත් අතින් අල්ලගෙන පහලට ගියා...පහලට යද්දි ත් නංගිත් අම්මත් තාත්තා ත් එයාපෙර්ට්ර් එකට යන්න ලෑස්ති වෙලයි උන්නේ... දෙන්නා එනවා දකිද්දි ම ආයුශ් ගේ අම්මගෙ මූනට ආවේ දරාගන්න බැරි දුකක්...

sinhalaebooks.com

" දුවව අපි බලාගන්නවා පුතා...ගොඩක් හොදට...මේ මගෙ දුවනේ...පුතා පරිස්සමට ගිහින් එන්න...."

අම්මා කිවුවේ කොල්ලගේ ඔලුව අත ගාලා..කොල්ලා අම්මගෙත් තාත්තාගෙත් ආශිවර්‍රාදේ අරන් නවත්තලා තිබුන වෑන් එකට නැංගේ කෙල්ලවත් එහ් ලගින් ම වාඩි කරවලා... එයාපෙර්ට්ටර් එකට යන අතරතුර මලීශ් කොල්ලට කෝල් එකක් දුන්නේ සරණි වගේ ම මලීශ් දෙන්නත් කොල්ලව බලන්න එයාපෙර්ට්ටර් එකට එන ගමන් කියලා කියමින්...

එයාපෙර්ට්ටර් එකට යද්දි මලීශ් වගේ ම සරණි ත් ඇවිත් හිටියා...කොල්ලා දෙන්නව ම හග් කරලා මලීශ් ව අම්මගෙනුත් තාත්තාගෙනුත් ටිකක් ඈතට එක්ක ගියේ සරණි ටත් එන්න කියලා අතින් ඉගි කරලා...

" ආයුශ්...ඇයි මචන්..."

මලීශ් ඇහුවේ කොල්ලා කරන්න යන දේ හිතා ගන්න බැරුව ...

" මලීශ්...උබ මට මගෙ සහෝදරයෙක් ගානයි... සරණි එතකොට උබ...උබත් එහෙමයි...අපි පොඩි කාලේ ඉදන් හැදුනේ එකට...එහ් යාලු කම අඩිගටත් හිතේ කොතක හරි තියෙයිනම් මන් ගියාට පස්සේ මන් අකමැති දේවල් නොකර හිටපන්...උබ දන්නවා මචන් මන් මොකක් ගැනද කියන්නේ කියලා...ප්ලීස් මචන්... මට මාව නැති කරවන්න හදන්න එපා... "

ආයුශ් කිවුව වචන ටිකට මලීශ් වගේ ම සරණි ත් මොහොතකට මූනෙන් මූන බලාගත්තා... ඊලගට කොල්ලා ආයුශ් ගේ උරහිසෙන් අත තිබ්බේ හිනාවකුත් එක්ක...

" පරිස්සමින් ගිහින් වරෙන් මචන්..."

කොල්ලා කිවුව කිසි දේකට පිලිතුරු නොදී මලීශ් එහෙම කියද්දි නම් කොල්ලගේ ඉවසීමේ සීමාව බිංදුවට ම වැටුනා....

" හැබැයි මලීශ්...උබ ඔය වැඩේ කරලා තිබ්බොත්...මන් ඒකිව මරනවා..අම්මපා මරනවා මලීශ්... මන් උබලා දෙන්නා ඉතුරු කරන්නෙත් නෑ.... "

ආයුශ් ඇස් දෙකත් රතු කරන් තරහින් පුපුරමින් කියද්දි සරණි මලීශ් ගේ පිටට මුවා වුනේ කොල්ලගේ මූන බලන්නත් බැරි තරමට බය හිතුන හින්ද... ඒත් මලීශ් නම් හිටියේ පුදුම සංසුන්ව...

" ආයුශ්..රිලැක්ස් මචන්... උබ ඔය හිතන කිසි දෙයක් වෙන් නෑ...ප්‍රොමිස්....උබ පරිස්සමින් ගිහින් වරෙන්... "

මලීශ් එහෙම කියද්දි කොල්ලගේ හිතට දැනුනේ පුදුම සැනසීමක්..කොල්ලා සුසුමක් පිට කරලා මලීශ් ගේ මූන දිහා බැලුවේ ලාවට හිනාවකුත් එක්ක...

sinhalaebooks.com

" තැන්ස් මචන්..."

ආයුශ් එහෙම කියලා ආයෙත් අම්මලා ලගට ආවේ මලීශ් වගේ ම සරණි උන් තැන ම ඉදන් ලොකු කල්පනාවකට වැටෙද්දි...

ආයුශ් අම්මට තාත්තට වගේම නේහා ටත් සමු දීලා පායා එක්ක ඇතුලට යද්දි කෙල්ල ඇස් දෙකේ කදුලු පුරවගෙන ම ආයුශ් ගේ අම්මගේ උරහිසට ඔලුව තියාගත්තා ....

මලීශ් වගේ ම සරණි ත් ආයුශ් යන දිහා බලන් උන්නේ ගල් ගැහිලා ..ආයුශ් නොපෙනෙන්න ම ගියාට පස්සේ සරණි මලීශ් දිහාට හැරුනේ මලීශ් ආයුශ් ට කිවුව දේවල් ඇත්තට ම කිවුව දේවල් ද කියලා සැක හිතුන නිසා....

" අපේ ප්ලෑන් එක වෙනස් කරා ද මලීශ්....ඔයා ආයුශ් ට කිවුව ඒවා ඇත්තද..එතකොට අපි අර කෙල්ලව සතිප කරගත් නැද්ද..දෙයියනෙහ් මලීශ්...ඔයා හොදට ම දන්නවා ආයුශ් ගේ හැටි...ඒක රග පෑමක් ...ආයුශ් හදන්නේ එයා එනකම් නේහා ව සතිප කරගත් නැති වෙන්න අපේ හිත් රවට්ටන්න... එතකොට...එතකොට අපි ආයුශ් පව් කියලා හිතලා අර කෙල්ල ව සතිප කරගත් නැතේ....දෙයියනේ...ඔයාට ඒක තේරෙත් නැද්ද මලීශ්...ආයුශ්...ආයුශ් රග පෑමක් කරන්නේ .... එයා කපටියි....."

සරණි කිවුවේ මලීශ් දිහා ම බලාගෙන...එක හුස්මක් වත් නොගෙන වේගෙන් ම කියවමින්.......

ඒත් මලීශ් ගෙන් ලැබුනේ සරණි කීයටවත් බලාපොරොත්තු නොවුන පිලිතුරක්...." අපේ කැමැත්ත විතරක් තිබිලා මදි...ඒකට නේහා ත් කැමති වෙන්න ඕනි සරණි.... "

" මොකක්...මොකක් ද එහ් කතාවේ තේරුම...එහ් කෙල්ල කැමති..."

" එහ් මීට දවස් දෙක තුනකට කලින් නෙහ් සරණි...දැන් තත්වේ වෙනස්...."

මලීශ් කිවුවේ නේහා දිහා බලලා සුසුමකුත් හෙලලා...සරණි මොහොතක් නේහා දිහත් මලීශ් දිහත් බලන් ඉදලා ආයේම මලීශ් දිහාට හැරුනේ මූනේ හිනාවක්වත් නැතුව...

" ඔයා කියන්නේ ආයුශ් අපේ වගේ ම අර කෙල්ලගෙත් ඔලුව අවුල් කරන්න ඇති කියල ද.."

මලීශ් ඔලුව හෙල්ලුවේ ඔව් කියන්න..ඊට පස්සේ ගෙවුනේ විනාඩි දෙක තුනක නිහඩියාවක්...

දෙන්න ම බලන් උන්නේ ආයුශ්ගේ අම්මගේ උරහිසේ ඔලුව තියන් අඩන නේහා දිහා ..

" ඔයා හිතන්නේ නේහා...නේහා ආයුශ් ට ආදරේ කරනවා කියල ද..."

sinhalaebooks.com

අන්තිමට සරණි හඬ අවදි කරේ බිඳුනු ස්වරයෙන්..

" මන් එහෙම කියන් නෑ...හැබැයි නේහා ගේ හිතේ ඔයා මන් ඉන්න තැනට වඩා ආයුශ් ඉස්සරහින් ඉන්නවා... "

" ම...ලී...ශ්.. "

" ඔව් සරණි...ඒක තමයි ඇත්ත.....පුලුවන්නම් බලන්න කෙල්ලගේ හිත වෙනස් කරන්න...මේ නේහා ගේ ඇස් දෙක සනීප කරගන්න ලැබෙන අන්තිම චාන්ස් එක වෙන්නත් බැරි නෑ....නේහා ට ටිකක් තේරුම් කරන්න බලන්න...අපිට තේරුම් කර කර ඉන්නත් ලොකු කාලයක් නෑ සරණි..ඉක්මනට treatment පටන් ගන්න ඕනි... "

" හරි මලීශ්...මන්...මන් හෙට උදේ වෙද්දි නේහා ව කොහොම හරි කැමති කර ගන්නම්...මන් අද ආන්ටිලා එක්ක යනවා...ගිහින් නේහා එක්ක ම ඉදලා තේරුම් කරනවා...මන් ආයුශ් ගේ කපටිකම් වලට අර අහිංසක කෙල්ලට අහු වෙන්න දෙන් නෑ.... "

සරණි කිවුවේ ආයුශ් ගැන උපන් තරහින් මුහු මූනම රතු කරන්... මලීශ් නම් උන්නේ හැමදම වගේ අදත් සන්සුන් ව...

" ඔයා නේහා ව කැමති කරගන්න බලන්න..හැබැයි...ආයුශ් ට මොකුත් කියන්න එපා... ඌ ඉන්නේ අපි කවුරුත් නොදන්න ලොකු ප්‍රශ්නෙක... "

" අනේ මලීශ් මේ....අපි නොදන්න එයාගේ ප්‍රශ්න මොනාද...අතික පුංචි කාලේ ඉදන් එකට හිටපු අපිට එයාගේ ප්‍රශ්න හංගනවා නම් එහ් යාලුකමේ ඇති වැඩේ මොකක් ද.... "

" අමතක කරන්න එපා සරණි..ආයුශ් ඉස්සර කවුද කියලා... අපි තුන් දෙනා එද කැඩුන් නැත්නම් අද ආයුශ් ට මෙහෙම වෙන් නෑ...ඌ අපෙන් ඈත් උනේ ඊට පස්සේ.... "

" ඉතින් මලීශ්.එහෙම නොකර පුලුවන්ද...ඔයා මෙඩිකල් කොලේජ් යන් නැද්ද...ඉගෙන ගන් නැද්ද..මාත් හැමදම මෙහෙම ඉන්නද...ආයුශ්...එයත් එහෙම ඉන්නද... "

" ඉතං... මන් එහෙම කිවුවද..ඔව්.ඉස්සර වගේ ඉන්න බෑ...ඒක ඇත්ත...මන් කිවුවේ ඒකෙන් අපි නොහිතපු විදිහට ඌ අපෙන් ඈත් උනා කියලා... "

" හරි.....දැන් මට මොකක් ද කරන්න කියන්නේ..."

" නේහා ව කැමති කරගන්න... ආයුශ් ට බනින්න එපා...එච්චරයි... "

මලීශ් ගේ එහ් වචන එක්ක කෙල්ල මලීශ් උන්නු තැනින් නේහා ලගට ගියේ මලීශ් ට ගස්සලා...ඒත් කොල්ලා උන්නේ ඉස්සර මතක අස්සේ හිරවෙලා...

sinhalaebooks.com

සරණි නේහා ලගට ඇවිත් කෙල්ලගේ අතින් අල්ල ගත්තේ නේහා ගේ හිතට යාන්තමට සතුටක් දැනෙද්දි...ඒත් සරණි කෙල්ලගේ ඔලුව අත ගාතවත් එක්කම ආයෙම කෙල්ලට ඇඩුනේ ආයුශ් ව මතක් වෙලා....

" අඩන්න එපා කෙල්ලේ...අපි ගෙදර ගිහින් කතා කරපු...මාත් එන්නද ආන්ටි අද.."

කෙල්ල නේහා දිහා බලලා ආදරෙන් කියල ආයුශ්ගේ අම්මා දිහා බැලුවේ අවසර පතමින්...

" අනේ එන්න දූ..ඕක අහන්න දෙයක් ද..නේහා දූ එක්කම ඉන්න පුලුවන් නෙහ්.."

ආයුශ් ගේ අම්මා එහෙම කියද්දි කෙල්ල හා කියන්න ඔලුව හෙල්ලුවා...මලිශ් හැමෝට ම සමු දීලා එයාගේ වාහනේට නැංගා... සරණි ආයුශ් ගේ අම්මයි තාත්තා යි නේහා යි එක්ක ආයුශ් ග්වෙ ගෙදරට ආවා...

කෙල්ල කදුලු කම්මුල් දිගේ වේලිලා තියන ඔහේ බලා ගත්තු අත බලන් ඉන්න නේහා ව රූම් එකට එක්කන් ආවේ කෙල්ල දිහා පුදුම දුකින් බලලා...

" නේහා... වොශ් එකක් දගන්නකෝ කෙල්ලේ....ඔහොම ඉද්දි මටත් දුකයි..."

කෙල්ල සරණි කිවුව දේ ගානකටවත් නොගෙන සරණි ගේ උරහිසට ඔලුව තියා ගත්තේ කෙල්ලගේ මුවින් සිහින් ඉකියක් ඉටවෙද්දි... ඒත් සරණි කෙල්ලව සනසනවා වෙනුවට කරේ කෙල්ලව තවත් පාරපු එක....

" ඔයා ඔහොම ඇඩුවට ආයුශ් දැන් හොදට හිතාවෙවී ඇති...එහෙ ගිහිනුත් එක එක ගෑනු එක්ක නිද ගන්න යයි ද දන් නෑ.... අනික නේහා..ඔයාට ඔච්චර වද දුන්න එකෙක් හින්ද අඩන්න ඔයාට පිස්සුද..ඇත්තට ම පිස්සු හැදීගෙන එනවද... "

සරණි ගේ එහ් වචන එක්ක නේහා සරණි ගේ උරහිසෙන් තමන් ගේ ඔලුව ගත්තේ විදුලි වෙගෙන්... කෙල්ලගේ මූන රතු උනේ සරණි කිවුව දේවල් දරා ගන්න ම බැරි තැන..

"ආයුශ් ට ඔහොම කතා කරන්න එපා...එයා මගෙ husband...මන් කැමති නෑ කවුරු ත් එයාට එහෙම කතා කරනවට..."

නේහා ගේ අහිංසක කටහඩ වෙනුවට අද තිබුනේ කවුරුත් කවදවත් ම අහලා නැති කටහඩක්...සරණි ගල් ගැහිලා බලන් උන්නේ කිසි දෙයක් හිතා ගන්න බැරුව.... ඒත් එහ් තත්පර දෙක තුනක් විතරයි....ආයෙත් කෙල්ල අඩන්න පටන් ගත්තේ දෝතින් ම මූන වහගෙන....

" නේ...හා..."

sinhalaebooks.com

" එයා වෙන අය එක්ක නිදා ගත්තට එයා මගෙ husband නෙහ්...මන් බලාගෙන ඉන්නවා එයා ආයෙත් ඇවිත් මට වද දෙනකම්...මට ගහනකම්...මට බනිනකම්..."

" නේ..හා..."

කෙල්ල උන්නේ පිස්සුවෙන් වගේ කියව කියව..සරණි එහ් තත්පරේම ඇවිත් කෙල්ලව තුරුල් කරගත්තේ කෙල්ල අඩ අඩ ම සරණි ට තුරුල් වෙද්දි..

නේහා මේ වගේ තත්වෙක ඉද්දි ආයුශ් එපා කියපු දෙයක් කියටවත් කරන් නෑ කියලා සරණි හොඳකාරවම දැනත් උන්නත් කෙල්ල උත්සාහය අත ඇරියේ නැත්තේ ආයුශ් ගේ කපටිකම් වලට මේ අහිංසක කෙල්ල දුක් විදින්න ඕනි නෑ කියල හිතලා...

අද රෑ කොහොම හරි කෙල්ලව ඇස් දෙක සනීප කරගන්න කැමති කරගන්නවා කියලා කෙල්ල් හිතුවේ තාමත් තමන්ව බදාගෙන අඩන නේහා ගේ ඔලුව අත ගාන ගමන්.. කෙල්ල සාමාන්‍ය තත්වෙට එනකම්ම සරණි කරේ කෙල්ලගේ ඔලුව අත ගාපු එක...කෙල්ල අඩලා අඩලා හෙම්බත් වෙලා ඔලුව ඉස්සුවේ හිසෙත් දැනුන වේදනාවත් එක්ක.... සරණි කෙල්ලගේ රතු වෙලා තිබුන ඇස් දිහා බලන් උන්නේ පපුව පිච්චිලා යන තරම් වේදනාවකින්...

" සරණි...අපි නිදා ගමු... "

කෙල්ල සරණි ට ඇසෙන නෑසෙන තරමට කිවුවේ කෙල්ලට කතා කරගන්නවත් බැරි තරමට කෙල්ල දුවර්ල වෙලා උන්නු නිසා...

ඒත් සරණි කෙල්ලගේ අත් දෙක තද කරලා අල්ල ගත්තේ සරණි හිතේ හිර කරන් ඉන්න දේ මේ මොහොතෙම නේහා ට කියනවා කියලා තදින්ම හිතාගෙන....

" නේහා...මට කතා කරන්න ඕනි කෙල්ලේ..."

" කියන්න සරණි...."

" අපි...අපි එදා කතා කරගත්ත වැඩේට..මොකද වෙන්නේ.... "

" මොන වැඩේද... "

නේහා ඇහුවේ ගානක් නොගෙන ම....එහ් ගැන මතක තියෙන්න තරම් සිහියකින් නෙමෙයි කෙල්ල හිටියේ...

" ඇ..ස්...දෙ...ක...ස..නී...ප...ක..ර...ග..ත්...න...වැ...ඩේ... "

sinhalaebooks.com

නේහා ගේ ප්‍රතිචාරේ මොන වගේ වෙයි ද කියලා නොදන්න නිසා ම කෙල්ලගේ කටහඬ වෙවුලුවා... ඒත් කෙල්ල සාමාන්‍ය විදිහට ඉන්න උපරිම උත්සාහා කරා...

" ආයුශ් ට මන් පොරොන්දු උනා සරණි...මන් කවදාවත් ඇස් දෙක සනීප කරගන් නෑ කියලා.... "

කෙල්ල කිවුවේ එදා එහ් මොහොතේ උන හැම සිදුවීමක් ම මතක් කරලා... පපුවට එක අතකුත් තියාගෙන...කෙල්ලට දැනුනේ මේ දැනුත් ආයුශ් ගේ උනුහුම කෙල්ලගේ පපුවට දැනෙනවා වගේ... දුක අතරින්ම මහා ලෝබ හිතෙන සතුටක් දැනුනේ ඒකමයි... ඒත් සරණි ගේ වචන කෙල්ලගේ එහ් හැඟීම් තත්පර ගානකට පමනක් සීමා කරා...

" ආයෙත් මේ වගේ චාන්ස් එකක් එන්නේ නැති වෙන්න පුලුවන් නේහා...ආයේ කවදාවත් ම නැති වෙන්න පුලුවන්..ඔයාට ඕනි ජීවිත කාලෙම ඔහොම ඉන්නද.."

" කමක් නෑ...මට මෙහෙම හොදයි... "

" ආයුශ් කරන්නේ රඟපෑමක් නම්..."

" කමක් නෑ.... "

සරණි ආයුශ් ගැන කියන හැම වචනයක් ම කෙල්ලගේ හිතට ගෙනාවේ තරහක්...සරණි ට ආයෙත් බනින්න බැරි කමට ම කෙල්ල සරණි අහන දේවල් වලට තනි වචනෙන් උත්තර දෙන්න පටන් ගත්තා....

සරණි කරේ කෙල්ල ව කැමති කරගන්න පොටක් පාදගන්න උත්සාහ කරපු එක...කොයි පැත්තෙන් හරි කෙල්ලව කැමති කරගන්නයි සරණි ට ඕනි උනේ...

" අර අහිංසක අම්මා ගැනවත් හිතන්න නේහා... "

" අම්මා හිත හදාගෙන ඉන්නේ...අනික අම්මා සතුටින් ඉන්නේ..එයා හිතනවා ආයුශ් මාව හොදට බලාගන්නවා කියල..අනික කොහොමත් මන් මෙහෙට ආවේ නැති උනානම් ඇස් දෙක සනීප කරගන්න වෙන් නෑනේ...අම්මත් එහ් අදහස අතෑරගෙන ගොඩක් කල්...එයාට ඔයා හරි මලීශ් හරි කිවුවොත් විතරයි එයා දන්නේ මගෙ ඇස් සනීප කරගන්න පුලුවන් කියලා....නැත්නම් අම්මා හිතන්නේ මගෙ ඇස් කවදාවත් සනීප කරගන්න බෑ කියලා... එයාට කවුරුත් ඇත්ත නොකියා හිටියොත් මගෙ අම්මා ඉස්සරහටත් සතුටින් ඉදියි....."

නේහා ගේ මේ කතා වලට සරණි ට තරහා නොගියම නෙමෙයි..ඒත් කෙල්ල පුදුම විදිහට ඉවසුවා... මේ හැම ඉවසීමක් ම නේහා වෙනුවෙන්, නේහා ගේ ඇස් දෙක වෙනුවෙන් කියලා කෙල්ලගේ බ්‍රේක් නැති කටට එන හැම වචනයක් ම කෙල්ල ආයාසයෙන් ම ගිල ගත්තා... ආයුශ් ගේ නරක දිගට ම කියන්න ගියොත් කෙල්ල කවදාවත් මේකට කැමති නොවෙන බව කෙල්ල අන්තිමට තේරුම් ගත්තා.....

sinhalaebooks.com

" හරි... ඔයාගේ අකමැත්තෙන් අපි අම්මට කියන් නෑ නේහා... හැබැයි... මට ඔයාගෙන් දෙයක් අහන්න ඕනි... "

" මොකක් ද... "

" ආසා නැද්ද ආයුශ් ව බලන්න...ඔයා ඔය ගුටි කන්න ආසයි කියන කොල්ලව බලන්න ආසා නැද්ද... අම්මව නම් ඔයාට මතක ඇති නේහා...ඔයාට අවුරුදු 10ක් වෙනකම් හොදට ඇස් පෙනුනනේ...ඒත් ආයුශ්...එයාවත් එක පාරක් හරි දකින්න ආසා නැද්ද ම්ම්ම්ම්..... "

සරණී පුදුම විදිහට උපක්‍රමශීලී උනා... කෙල්ලගේ මේ වචන එක්ක නේහා ගේ තරහින් තිබුන මූන වෙනස් වෙද්දි සරණී ට දැනුනේ ජයග්‍රාහී සතුටක්.... කෙල්ල හරි ම පොයින්ට් එකට ආවා කියලා කෙල්ලට දැනුනේ එතකොට...

" කියන්න නේහා...ආසා නැද්ද..."

" ආ..ස...යි....ඒ..ත්...ඒ..ත්...ම...න්...ආ..යු...ශ්..ට...පො...රො..න්...දු...උ...නා... "

කෙල්ල කතා කරේ වෙවුලන කටහඩින්...

" ඉතින් අපි එයාට නොකියා ඉමු.."

" එ..හ්...කි...වු..වේ.... "

" ඔයාට ඇස් පේනවා කියලා....එයාට අපි නොකියා ඉමු... එතකොට පොරොන්දුව කඩ වෙන්නෙත් නෑ.... "

" එහ් කොහොමද..මගෙ ඇස් දෙක සනීප උනාම එයා දැනගන්නවනේ... "

" ඔයා ඇස් සනීප වෙලත් එයා ඉස්සරහා ඇස් පේන් නෑ වගේ රගපෑවොත්....එයා දැනගන් නෑ නේද......"

" අනේ සරණී...මට...මට...ආයුශ්ව රවට්ටන්න බෑ....."

" රවට්ටන්න නෙමෙයි කෙල්ලේ..ආයුශ් ගෙ ම හොදට..ආසා නැද්ද ඔයා අතින් ම ආයුශ් ට උයලා දෙන්න...තව එයාගේ වැඩ කරලා දෙන්න.... "

" ආසයි...ඒත් මන් මේවා කරද්දි එයා දැනගන්නවනේ..."

" ඉතින් කෙල්ලේ අපි වෙනසක් පේන් නැති වෙන්න එහෙම කරමු..."

sinhalaebooks.com

" ඒත් අම්මා....අම්මා කියයිනෙහ්.."

" අපි ආන්ටිට කියමු...ආයුශ් ට කියන්න එපා කියලා... "

" ඒත් සරණි ...මන්...මන්...කවදා වෙනකම් ආයුශ් ව මෙහෙම රවට්ටන්න ද...මට බෑ ..."

" වැඩි දවසක් නෑ කෙල්ලේ..ආයුශ් ම ඇස් දෙක සනීප කරගමු කියනකම් විතරක්....ඊට පස්සේ මලීශ් ලගට නෙහ් කොහොමත් එන්නේ...එතකොට...එතකොට මලීශ් ආයුශ්ට නොතේරෙන්න හැමදේම කරයි...එතකොට පොරොන්දු කඩ වෙන්නෙත් නෑ..ආයුශ් ගේ හිත රිදෙන්නෙත් නෑ...තේරුනා ද..."

සරණි පුදුම තරම් ආදරේකින් හැම වචනෙම බොහොම පැහැදිලිව කෙල්ලට කියද්දි කෙල්ල තේරුනා කියන්න ඔලුව හෙල්ලුවත් කෙල්ල උන්නේ දෙගිඩියාවෙන්...ආයුශ් ව දකින්න තියන ආසාව නිසා හරි කෙල්ලට ආයුශ් ඉස්සරහා මේ තරම් රගපෑමක් කරන්න තාමත් හිත ඉඩ දෙන්නේ නෑ....

" හිතන්න දෙයක් නෑ කෙල්ලේ...ඒක තමයි හොදම විසදුම... "

සරණි ආයෙම පාරක් කෙල්ලගේ අත් දෙකෙන් ම අල්ලගෙන කියද්දි නේහා ලාවට හිනා උනා....

" එහෙනම් අපි හෙට ම හොස්පිටල් යමු හොදද...ආයුශ් එන්න කලින් හැමදේම කරලා ඉවර වෙන්නත් ඕනිනේ...."

කෙල්ල හා කියන්න ඔලුව හෙල්ලුවා...සරණි ගේ මූනට ආවේ කවදාවත් නැති තරම් සතුටක්..කෙල්ල සතුටට ම නේහා ව බදා ගත්තා...

නේහා මොන හේතුව හින්ද හරි මේකට කැමති උනානේ කියලා දැනෙද්දි කෙල්ලගේ හිතට දැනුන සතුට කියන්න වචන නෑ...

කෙල්ල එහ් වෙලාවෙම මලීශ් ටත් කෝල් කරලා විස්තරේ කිව්වා...

ආයුශ් ගේ අම්මා කිචන් එකේ ලයිට් එක දානවා ඇහුන හින්දා කෙල්ලට ඕනි උනේ මේ දැන්, මේ මොහොතෙම ආයිශ් ගේ අම්මටත් මේ හැමදේම කියන්න...

කෙල්ල දෙපාරක් නොහිතම නේහා ව ත් එක්කගෙන පහලට ගියා... ආයුශ් ගේ අම්මා කිචන් එකට ඇවිත් තිබුනේ වතුර එකක් අරන් යන්න... ඇය වතුර එකත් පැත්තකින් තියලා සරණි කියන්න යන කතාව අහන්න වාඩි උනා... ආයුශ් ගේ අම්මා ප්‍රමාද උන හින්ද ම ආයුශ් ගේ තාත්තාත් එතනට ආවායින් දෙන්නම ඉස්සරහා මේ ගැන කතා කරන්න ලැබුන එක ගැන සරණි ට දැනුනේ සතුටක්...

sinhalaebooks.com

කෙල්ල ආයුශ් ගේ අම්මලගේ හිතේ කොල්ලා ගැන දැන් තියන ඉමේජ් එක වෙනස් නොකර ම කතාව කියන්න වග බලා ගත්තා...

කෙල්ල කිවුවේ ආයුශ් එන්න කලින් නේහා ව සනීප කරගමු කියලත් එහ් බව ආයුශ් ට නොකියා ඉමු කියලත්..එහ් ඇයි කියලා ආයුශ් ගේ අම්මා ඇහුවම කෙල්ල කිවුවේ ආයුශ් නේහා ලග මේ විදිහට ඉද්දි ආදරේ වැඩි වෙනවා කියලා..එහ් වගේ ම මේ විදිහට ටික කාලයක් ඉද්දි ආයුශ් ට ම නේහා ව සනීප කරගන්න ඕනි උන දවසට කොල්ලව ස්ප්‍රයිස් කරමු කියලත් කිවුවා...එහ් අතර ම නේහා ආයුශ් මේක දැන් ම දැන ගන්නවට අකමැතියි කියලත් කෙල්ල කිවුවේ ආයුශ් ගේ අම්මා මේ අදහසට විරුද්ධ වෙන්න තියනහැම අදහසක් ම අහුරලා......

ආයුශ් ගේ අම්මා වගේ ම තාත්තා ටත් ඒට වඩා සතුටක් තිබුනේ නෑ...කෙල්ලගේ ඇස් දෙක සනීප වෙනවා කියලා හිතද්ඩිගිත් එහ් ඇස් වල කදුලු... නේහා ත් හදවතින් ම සතුට විද ගත්තත් හිතේ නොනකට වෙන්න චූටි දුකක් තිබ්බේ ආයුශ් ව රවට්ටන්න වෙන එක ගැන..අන්තිමට කෙල්ල හිත හදගත්තේ මේ හැමදේම කරන්නේ ආයුශ් ව බලන්න තියන ආසාව වගේ ම බිරිදකගෙන් ඉටු වෙන්න ඕනි වගකීම් යුතුකම් ඉටු කරන්න තියන ආසාව නිසා කරන දෙයක් කියලා...එහ් වගේම කෙල්ලගේ හිතේ ලොකු විශ්වාසයක් තිබුනා ආයුශ් දවසක කෙල්ලව සනීප කරගමු කියලා කියයි කියලා... එහ් හින්ද ම කෙල්ල හිතට දැනුන වරදකාරි හැගීම් එකින් එක සාධාරණීය කරන්න ගත්තා... අන්තිමට ම කෙල්ලගේ හිතේ ඉතුරු උනේ පුදුම සතුටක් විතරමයි....

පහුවද හොස්පිටල් එකට යන්න ඕනි හින්ද ම සරණි කෙල්ලව රූම් එකට එක්ක ගියා...ආයුශ් ගේ අම්මයි තාත්තයි දෙන්නත් නිද ගන්න ගියා... කෙල්ල ඇස් දෙක පියා ගත්තේ හිතේ අලුත් ම හැගීම් එකින් එක ඉපදෙද්දි......

කාලෙකට කලින් හිතේ කොනක යටපත් කරලා තිබුන එහ් ආසාව හැබෑ වෙනවා කියලා දැනෙද්දි ත් එහ් හිතට දැනුනේ පුදුම සතුටක්...

ආයුශ් ගැන තමන්ගේ හිතේ තියන හැගීම මොකක් ද කියලා කෙල්ල නොදැන හිටියත් ආයුශ් ගේ හිත රිද්දන්න එහ් හිතේ පුංචිම ආසාවක් වත් තිබුනේ නෑ....සරණි කිවුව විදිහට ආයුශ් ගේ හිත රිදෙන කිසි දෙයක් නොවෙන්න කියලා කෙල්ල දෙවියන්ගෙන් ඉල්ලුව්වෙ පුදුම පිරිසිදු හැගීමකින්...
මලීශ් නේහා ගේ ඇස් දෙක සනීප කරගන්න වැඩේට කොච්චර උනන්දු ද කියනවනම් කොල්ලා උදේ 6 වෙද්දි ආයුශ් ගේ ගෙදර... ගෙදර කට්ටිය ඇහැරුනෙත් කොල්ලා ගේට් එක ලගට ඇවිත් හෝන් කරද්දි.... කොල්ලා සරණි ට නේහා ව ලෑස්ති කරලා සරණි ටත් පහලට එන්න කිවුවේ පහල වාඩි වෙලා ඉද්දි ම සරණි ට කෝල් එකක් අරන්... කෙල්ල නේහා වත් ලෑස්ති කරලා පහලට යද්දි මලීශ් නේහා ගෙයි ආයුශ් ගෙයි වෙඩින් ෆොටෝ එකක් බල බල උන්නේ....

" මොකද මලීශ්...මේ උදේ පාන්දර ම..."

sinhalaebooks.com

සරණි ඇහුවේ මලීශ් ට රවාගෙන..මොකද කෙල්ල කැමති ම නෑ උදෙන් ම ඇහැරෙන්න......

" නේහා...අම්මා ලග ඇති නේද පරම රිපෝට්...ඔයා කිවුවනේ දෙතුන් සැරයක් බෙහෙත් ගන්න ගියා කියලා...අපි එහ් ටිකත් අරගෙන ම හොස්පිටල් එකට යමු...මන් එහෙ ඔක්කොම ලෑස්ති කරලා තියෙන්නේ.... "

මලීශ් කිවුවේ සරණි ගේ කතාව ගානකටවත් නොගෙන...නේහා ගේ මූනේ මැවුනේ අහිංසක හිනාවක්...කෙල්ල හා කියන්න ඔලුව හෙල්ලුවා...

සරණි කෙල්ලගේ එක අතකිනුත් මලීශ් කෙල්ලගේ අනිත් අතිනුත් අල්ලගෙන කෙල්ලව කාර් එකට නැංගුවා...මේ වෙද්දි සරණි මලීශ් නේහා අතර ගොඩනැගිලා තිබුනේ පුදුම සහෝදර බැදීමක්...එහ් බැදීම කාලෙකට ඉස්සර ආයුශ් සරණි මලීශ් ගේ බැදීමටත් වඩා ප්‍රභල උනා...එහ් හින්ද ම මන් ද කෙල්ලට ලොකු ආරක්ෂාවක් දැනුනා... කෙල්ල උන්නේ එහ් සතුට නිදහසේ විදගනිමින්...

කාර් එකේ යනකම්ම කිසිම කතා බහක් උනේ නෑ...නේහා සරණි වගේ ම මලීශ් උන්නේ තම තමන්ගේ ලෝක වල තනි වෙලා... කෙල්ල කොච්චර කල්පනාවට වැටිලා හිටියද කිවුවොත් ගේ ලගින් කාර් එක නවත්තනකම්ම කෙල්ලට දැනුනේ නෑ....

" නේහා බහින්න...අපි ආවා කෙල්ලේ... "

සරණි කෙල්ලගේ අතින් අල්ලලා හිනා වෙවී කියද්දි කෙල්ලත් අහිංසක විදිහට හිනා වෙලා කාර් එකෙන් බැස්සා...ගේ ඇතුලේ හිටපු නේහා ගේ අම්මා දුවගෙන එලියට ආවේ කාර් එකේ සද්දෙත් එක්ක...නේහා ව දකිද්දි එහ් ඇස් වල සතුටු කදුලු දෝරේ ගලනවා.ඇය දුවගෙන ඇවිත් කෙල්ලව බදගත්තේ එහ් සතුට අතරින් මයි...

" අනේ මන් එන්න හිටියේ මගෙ කෙල්ලව බලන්න.... "

විනාඩි 5ක් 10ක් ම නේහා ව සිප වැලදගෙන ඇය කිවුවේ නේහා ගේ ඔලුව ආදරෙන් අත ගාලා....

" ඔන්න අපිම නේහා ව එක්ක ආවා අම්මා....."

මලීශ් කිවුවේ කට පුරා හිනා වෙලා..

" යමු පුතේ ගේ ඇතුලට... "

නේහා ගේ අම්මා නේහා ගේ අතින් අල්ලගෙන කිවුවේ මලීශ් වගේ ම සරණි දිහා බලලා... ගේ ඇතුලට ආව ම ඇය දෙන්නට ම වාඩි වෙන්න කියලා ගේ ඇතුලට යන්න හැදුවේ තේ එකක් හදන් එන්න... ඒත් මලීශ් ඇයව නැවැත්තුවා...

sinhalaebooks.com

" එපා අම්මේ...දැන් වෙලාවක් නෑ...අපි ඉක්මනට යන්න ආවේ...."

" ඇ..යි..මොකක් හරි ප්‍රශ්නයක් ද පුතේ...."

නේහා ගේ අම්මා ඇහුවේ කලබල වෙලා...

" නේහා...ඔයාම අම්මට කියන්නකෝ..."

මලීශ් නේහා දිහා බලලා කියද්දි කෙල්ල කරේ අහිංසක විදිහට හිනා උන එක...

" මොකක්ද දරුවෝ උනේ..."

නේහා ගෙන් උත්තරයක් නැති තැන නේහා ගේ අම්මා තවත් කලබල උනා....

" නෑ අම්මා... මලීශ් අයියයි සරණි යි....මගෙ ඇස් දෙක සනීප කරන්න හදන්නේ... අපි ආවේ ඉස්සර මගෙ බෙහෙත් ගත්ත ඒවගේ රිපෝට් අරන් යන්න... "

නේහා හිනා වෙලා කියද්දි නේහා ගේ අම්මා මොහොතක් කල් ගැහිලා බලන් හිටියේ එහ් වචන විශ්වාස කරන්න බැරි තැන...ඊලග තත්පරේ ඇය හිනා උනෙ එහ් ඇස් වල වියලිලා තිබුන කදුලු ආයෙත් අලුත් වෙද්දි...

" අනේ ඇත්තමද පුතේ.."

" ඔව්...ඔ...ව්...අම්මා... "

" මට මේක හීනයක් වගේ...ඔය දෙන්නට ගොඩක් පින් පුතේ... මගෙ කෙල්ලව සනීප කරලා දෙනවට....ආයෙත් මගෙ කෙල්ලට ඇස් පෙනුනොත් මට..මට නිදහසේ ඇස් දෙක පියා ගන්න පුලුවන්...මටත් වඩා ආයුශ් පුතා ට සතුටු හිතෙයි... ආයුශ් පුතා මගෙ කෙල්ලට ගොඩක් ආදරෙයි... "

අම්මගේ එහ් වචන වලින් නම් කෙල්ලගේ මූන අදුරු උනා..එහ් ආයුශ් ඒක දනගත්තොත් සතුටු වෙන් නෑ කියලා කෙල්ල හොදකාරවම දන්න නිසා...

" අපි බැලුවේ අම්මා ආයුශ් ට නොකියා ඉන්න...ආයුශ් ව ස්ප්‍රයිස් කරන්න...කාලයක් ගියාම එයාට කියන්න කියලා බැලුවේ...එතකම් නේහා ආඋශ් ලග මේ විදිහට ම ඉදියි...."

මලීශ් ඉක්මන් කරලා කිවුවේ තවත් ප්‍රශ්නයක් නොවෙන්න... ඒත් ඊලගට නේහා ගේ අම්මා කිවුව දේටනම් තුන් දෙනාම ගල් ගැහිලා බලන් උන්නේ කිසි දෙයක් හිතා ගන්න බැරුව....

sinhalaebooks.com

" ආයුශ් පුතා දැනටත් මගෙ කෙල්ලට ගොඩක් ආදරෙයි පුතා... හැබැයි මේක දැනගත්ත දවසට ගොඩක් සතුටු වෙයි..පුතා රට යන්න කලින් මෙහෙ ඇවිත් මට සල්ලි ත් දීලා ගියේ..ආයේ මහන්සි වෙන්න එපා කියලා..හැම මාසෙම වියදමට සල්ලි දෙන්නම් කිවුවා..මන් එපා කියද්දි මට බැන්නත් එක්ක..එයාගේ අම්මා නේහා ගේ අම්මා කියලා පුතාට වෙනසක් නෑ කියලා...එහ් කොල්ලා නම් රත්තරන් කොල්ලෙක්...මගෙ දුවගේ වාසනාව..."

" ආ..යු..ශ්...මෙ.හෙ...ආ..ව..ද...ම..ට...කි...වු..වේ..නෑ...නේ....ඒත් කවද්ද..එයා ගෙදරමනේ හිටියේ...."

" පෙරේද උදේ පුතේ...ඉක්මනට ඇවිත් ගියා...ඔයාට කියන්න එපා කිවුවා පුතේ... එහෙම උනොත් කෙල්ල අඩයි කියලා කිවුවා.... "

කෙල්ලගේ මුලු පපුවම එහ් වචන එක්ක පිච්චිලා ගියා...කෙල්ල ඇස් වලින් වැටෙන කඳුලු එක්ක ම මුව වහා ගත්තේ අඩ අඩ...

ආයුශ් ගෙදර හිටියේ නෑ කියලා කෙල්ලට මතකයක් නැති උනත් ආයුශ් දවසම කතා නොකර හිටපු දවස් දෙක තුනේ එක දවසක ඕක වෙන්න ඇති කියලා කෙල්ලට හිතුනා... කෙල්ලට ආයුශ් ගැන එහ් වෙලාවේ දැනුන හැඟීම කියාගන්න බැරි තරම්...

" නේහා... එයා වෙනුවෙන් නෙහ් අපි හැමදේම කරන්නේ...දැන් යන්නකෝ..අම්මා එක්ක ගිහින් රිපෝට් ටික අරන් එන්න..."

සරණී කිවුවේ කෙල්ලගේ හිත වෙනස් වෙන්න කලින් කෙල්ලගේ හිත වෙන දිහාකට යොමු කරලා... කෙල්ල හා කියන්න ඔලුව හොල්ලලා අම්මා එක්ක ම ඇතුලට ගියේ ඇවිදින මලකදක් වගේ...

මලීශ් කෙල්ල යන දිහා බලන් ඉදලා සුසුමක් පිට කරේ ඉබේමයි...

නේහා අම්මා එක්ක ගියා ම එලියේ උන්නේ සරණී ත් මලීශුත් විතරයි.. මලීශ් හිටියේ මොකක් දෝ වේදනාවකින් උනත් සරණී නම් උන්නේ තරහින්...

" මේ ආයුශ් හැමදේම අවුල් කරනවනේ... තව පොඩ්ඩෙන් අරන් කෙල්ලගේ හිත ආයේ වෙනස් වෙනවා.. "

" තමන් මැරි කරපු කෙල්ලගේ අම්මට වියදමට ම සල්ලි ටිකක් දෙන එක අවුලක් වෙන්නේ කොහොම ද සරණී..."

මලීශ් කතා කරේ පුදුම විදිහට හිත සන්සුන් කරගෙන...

" සල්ලි දුන්නට කමක් නෑ...ඒත්...ඒත් මේ ඔක්කොම ආයුශ් ගේ කපටිකම්..."

sinhalaebooks.com

" මොකක්ද සරණි ඒකේ තියන කපටිකම..."

" ආයුශ් දැනගත්ත ඇති අපි රිපෝට් ගන්න මෙහෙ එයි කියලා..එතකොට....එතකොට නේහා ගේ අම්මා මේ විස්තරේ කිවුවම කෙල්ලගේ හිත වෙනස් වෙයි කියලා හිතන්න ඇති..මහ කපටියෙක්..."

" සරණි ඉතිං...නිකන් බොරුවට කතා හදන්න එපා..."

මේ පාරනම් මලීශ් කතා කරේ හිතට ආව ආවේගය තරමක් පාලනය කරගෙන...ඒත් කොල්ලා උන්නේ සරණි ගේ මේ වචන එක්ක තරහා පාලනය කරගන්න පුලුවන් තත්වෙක නෙමෙයි...කොයි වෙලේ තමන් ගේ හිත ඇතුලේ තියන දේවල් කියවෙයි ද කියල කොල්ලා උන්නේ පුදුම විදිහට ඉවසීමෙන්....

" මොකක් ද හදපු කතාව...මන් කිවුවේ ඇත්ත...ආයුශ් මහා කපටියෙක්..."

සරණි කිවුවේ ගානක් නොගෙන...හැඟීමක් දැනීමක් නැතුව ඔහේ වචන පිට කරලා...

" සරණි...දැන් හොදට ම ඇති..ඔයා ඔය කියන කිසි දෙයක් මෙතන වෙල නෑ...ආයුශ් මේ දේවල් කරේ ප්ලෑන් කරලා නෙමෙයි...ආයුශ් ගේ නේහා උන පොරොන්දු ව විශ්වාස කරලා...එක අතකින් අපි මේ කරන්නේ පවක්..අර අහිංසක කෙල්ල පොරොන්දු කඩ කරා කිවුව ආයුශ් ට ඒක දරාගන්න බැරි වෙයි...කරන්න දෙයක් නැති හින්ද මෙහෙම කරනවා මිසක් මට ආයුශ් ට ද්‍රෝහිකම් කරන්න හිත දෙන් නෑ.... "

" ඔයා දන් නෑනේ මලීශ් ආයුශ් ගේ හැටි...දන්නවනම් ඔයා ඔහොම කියන් නෑ..."

" මොනවද මන් දන් නැත්තේ අහ්...ඔයා වගේම මාත් ඌ එක්ක පොඩි කාලේ ඉදන් හැදුනේ එකට...ඔයා දන්න හැමදේම මාත් දන්නවා....මොකක් ද ඔයාට ඔච්චරට ම ආයුශ් එක්ක තියන තරහා.... "

" මට එයා එක්ක තරහක් නෑ..."

" තරහක් තියනවා සරණි..මන් කියන්න ද එහ් මොකක් ද කියලා... අපිට තේරෙන කාලේ ඉදන් මන් දැකලා තියනවා ඔයාගේ ඇස් ආයුශ් ලග දිලිසෙනවා...මන් ඔයාට හිතින් ආදරේ කරද්දි ඔයා ආදරෙ කරේ ආයුශ් ට...එහෙම නේද සරණි...."

" මලීශ්...ඔයා මේ මොනවද...."

"ෂ්...ෂ්.... මමයි කතා කරන්නේ....ආයුශ් එහ් හැඟීම් තේරුම් ගත් නැතුව හිටියම ඔයා දුකින් ඉද්දි මන් හිත හැදුවට කවදවත් මට දුකින් ඉන්න හේතුව කියලා නෑ නේද...ඒත් මන් එද ඉදන් දැනන් හිටියා හේතුව මේක කියන්න... අපි තුන් දෙනා වෙන් උනාට පස්සේ ඔයා

sinhalaebooks.com

ආයෙත් ආන්ටිගේ කීමට ආයුශ් ගේ ගෙදර ආවේ හිතේ තියන හැමදේම ආයුශ් ට කියනවා කියලා හිතාගෙනතේ...එහෙම නේද..."

කොල්ලා සරණි ගේ ඇස් දිහා ම බලන් අහද්දි කෙල්ල එහ් ඇස් මග ඇරියේ වරදක් කරලා අහු උනා වගේ ඇක්ශන් එකකින්... කෙල්ල හිටියේ ගොඩක් කලබල වෙලා...

" ඊට පස්සේ ආයුශ් ඉස්සර වගේ නෙමෙයි...ඔයා ඇවිදිනුත් ඌ වචන දෙක තුනයි කතා කරේ...එද ගොඩක් දුක හිතුනා...එහෙම නේද..."

කෙල්ලගෙන් පිලිතුරක් නම් ලැබුනේ නෑ...කෙල්ල උන්නේ බිම බලාගෙන...ඒත් මලීශ් කතාව දිගට ම කියන් ගියා...

" ඊට පස්සේ ඊලග පාර එද්දි මූ හොදට ම බීලා නාස්ති වෙලා...දෙතුන් පාරක් කෙල්ලෝ එක්ක සැලෝන් එකටත් ආවා...අන්න එතකොට තමයි ඔයා හිත හදගත්තේ...ආයුශ් ව අමතක කරන්න...ඊට පස්සෙයි මන් ආදරෙයි කිව්ව ම මගෙ ආදරේ පිලිගත්තේ...එහෙම නේද සරණි...ඔව්..එහෙම තමයි..ඔය ඇස් කලබලයි..මාව.මග අරිනවා...මන් කිව්ව හැමදේම ඇත්ත... එහ් හැම වචනයක් ම ඇත්ත මැනික... උබට තියෙන්නේ ආයුශ් උබේ හිතේ තියන හැඟීම් තේරුම් නොගත්තට ඌ එක්ක තරහක්..."

" අනේ මලීශ් මන්...ඔයාට මේ දේවල්...."

" කියාගන්න බැරුව හිටියේ...එහෙම නේද...මට උබේ පුංචි වෙනසත් අදුන ගන්න පුලුවන් මැනික... ඒත් උබ ආයුශ් ට ආදරේ කරාට වඩා ආදරේ කරෙ ඉගෙනීමට...ඒකනේ උබ ආයුශ් ව අරහෙම තනි කරලා දැන්මේ... එද එහෙම නොවුනනම් අද ආයුශ් උබ ලග ඉන්න තිබ්බා...උබේ ආදරේ මොන වගේ ද කියනවනම් ආයුශ් දැන් නාස්ති වෙලා කියලා දැනෙද්දි එහ් ආදරේ අමතක කරලා දන්නත් උබට පුලුවන් උනා... නෑ මැනික...ආදරෙයි නම් ගොඩක් ආදරෙයි නම් එහෙම කරන්න බෑ කවදවත්... උබට තිබ්බා ආයුශ් ව හදගන්න..උනේ මොකක්ද කියලා හොයලා බලන්න..ඒත් උබ කරේ මට ලන් උන එක.... හරි...දැන් එහ් හැමදේම ඉවරයි...උබ ආයුශ් ට දැන් ආදරේ නෑ කියන්න මන් දන්නවා මැනික....හැබැයි ඌ එක්ක තාම තරහින්...එහ් ආදරේ අමතක කරා වගේ ඔය තරහත් හිතින් අයින් කරලා දපන් මැනික... උබට වඩා ආයුශ් ට ආදරේ කරන ඌ විනාශ වෙලා ඉද්දිත් ඌ ට ආදරේ කරන රත්තරන් කෙල්ලෙක් දැන් ඌට හම්බෙලා...අපි සතුටු වෙන්න ඕනි මැනික... එහ් කෙල්ලගේ හිත කඩලා බිදලා දන්න එපා... ඒකි අපේ නැති උන ආයුශ් ව ආයෙත් හොයාගයි.... ඒකට ඒකිට උදව් කරපන් මැනික...ඒකිගේ හිත කඩන්න එපා.. අපි තුන් දෙනා වෙන් උන කාලේ ආයුශ් ට උන දේ එහ් රත්තරං කෙල්ලට හොයාගන්න දීලා අපි පැත්තකට වෙමු..."

මලීශ් ඇස් වල කදුලු පුරවන් මේ තරම් කාලයක් හිතේ හිරකරන් හිටපු හැමදේම සරණි ඉස්සරහා කියලා දැන්මේ අඩ අඩ මයි... සරණි ඉදගෙන හිටපු තැනින් නැගිටලා ඇවිත් කොල්ලගේ පපුවට තුරුල් උනේ ඉකි ගගහා...

sinhalaebooks.com

" අනේ මට සමාවෙන්න මලීශ්...මන් ඉස්සර ඔයාට මොනවා හැංගුවත් දැන් මන් ආයුශ් ට ආදරේ නෑ...මගෙ අම්මා පල්ලා.."

" ඒක මන් දන්නවා මැනික...මන් කියන්නේ එහ් ආදරේ අමතක කරා වගේ ඔය තරහත් අමතක කරන්න...මන් වෙනුවෙන් නෙමෙයි...නේහා වෙනුවෙන්..."

මලීශ් කෙල්ලගේ ඔලුව අතගාලා අහිංසක ඉල්ලීමක් කරද්දි කෙල්ල තමන් ගේ අත මලීශ් ගේ ඔලුවෙන් තියලා හිස සැලුවේ එහ් තරහත් හිතින් අයින් කරනවා පොරොන්දු වෙමින්...

ඊලගට ආයෙම කොල්ලගේ පපුවට තුරුල් උනේ අඩ අඩ ම...

" මන් ආදරෙයි මලීශ්...ගොඩක් ආදරෙයි.."

" මන් දන්නවා මැනික...කෝ...දැන් අඩන්න එපා...දැන් හැමදේම හරි..."

කොල්ලා කෙල්ලගේ ඇස් වල තිබුන කඳුලු පිහදලා කෙල්ලගේ නලලට කිස් එකක් දීලා කෙල්ලව පුටුවෙන් වාඩි කරේ හිනාවකුත් එක්ක...

" නේහා තාම නෑ... "

ඊට ටික වෙලාවකට පස්සේ මලීශ් කිවුවේ ගේ ඇතුල බලලා... එහ් එක්කමයි නේහා ගේ අම්මා ෆයිල් එකකුත් අතින් අරන් කෙල්ලගේත් අතින් අල්ලන් රූම් එකෙ ඉදන් එලියට ආවේ..." මේ තියන්නේ රිපෝට් ටික පුතේ...දෙතුන් පාරක් ඇරුනම ආයේ ඩොක්ටර් ලගට ගියේ නෑ.... "

කෙල්ලගේ අම්මා කිවුවේ අතේ තිබුන ෆයිල් එක මලීශ් අතට දෙන ගමන්...

" ඒකට කමක් නෑ ...මේ ටිකත් වටිනවා ගොඩක්... "

මලීශ් නේහා ගේ අම්මා දිහා බලලා හිනාවෙලා කියන ගමන් ම ෆයිල් එක දිග ඇරියා..සරණි නේහා ගේ අම්මට හිනා වෙලා කෙල්ලගේ අතින් අල්ල ගත්තා...

මලීශ් ටික වෙලාවක් නේහා ගේ රිපෝට් දිහා බලන් ඉදලා ඊලගට කරේ කෙල්ල දිහා බලන් හිටපු එක..කොල්ලගේ මේ හැසිරීම තේරුම් ගන්න බැරි හින්දම සරණි ගේ හිතට නම් දැනුනේ බයක්...

" ඇයි මලීශ්...රිපෝට් වල මොකක් හරි ප්‍රශ්නයක් ද... "

කොල්ලා කරේ නෑ කියන්න ඔලුව හොල්ලපු එක..ඒත් සරණි ට නම් මලීශ් ගේ එහ් වචන ටිකෙන් සෑහීමකට පත් උනේ නෑ...

sinhalaebooks.com

" එහෙනම් ඇයි මලීශ් මේ... "

" යමු.... ලේට් උනා... අපි ගිහින් එන්නම් අම්මා... "

කොල්ලා නේහා ගේ අම්මට කියන ගමන් ම කෙල්ලගේ අතින් අල්ල ගත්තේ සරණි ඇහුව දේ නොදනුන ගානට... නේහා ගේ එක අතක් සරණි ත් අනිත් අත මලීශුත් අල්ලන් ඉන්නවා දකිද්දි නේහා ගේ අම්මට දැනුනේ අසීමිත සතුටක්...එහ් නේහා ට තමන් නැති දවසක ආයුශ් වගේම මේ දෙන්නත් ඉන්නවා නේද කියලා හිතෙද්දි...

" පරිස්සමින් පුතේ.. "

කෙල්ලගේ අම්මා අහිංසක විදිහට හිනා වෙලා තුන්දෙනා දිහා ම බලලා කියද්දි නේහා වගේම මලීශ් සරණි ත් නේහා ගේ අම්මට වැඳලා කාර් එකට නැංගේ ඉක්මනට හොස්පිටල් එකට යන්න හිතාගෙන...

කාර් එකේ යන අතරතුර කිසිම කතා බහක් නොවුන්නේ මලීශ් උන්නේ වෙනමම කල්පනාවක නිසා... සරණි හිටියේ නේහා ඉන්න තැන රිපෝට් වල තියන දේවල් අහන්න බැරි කමට කට වහගෙන..මලීශ් ම කතා කරයි කියලා බලාගෙන....මේ කිසි දෙයක් නොදන්න කෙල්ල උන්නේ හැමදමත් වගේ අහිංසක හිනාවකින්....

හොස්පිටල් එක ලගට ඇවිත් බහින්න හදද්දි කොල්ලා නේහා ලගට ගිහින් කෙල්ලගේ ඔලුව අත ගාලා කිවුව කතාවට නම් නේහා ගේ වගේ ම සරණි ගේ ඇස් වලත් කඳුලු පිරුනා...

" ඔයාගේ ඇස් දෙක සනීප කරන්න පුලුවන් නංගි..කලින් මට එහ් ගැන පුංචි සැකයක් තිබුනා... මොකද ඔයා දැන් අවුරුදු 15ක් ම ඔය විදිහට හිටපු නිසා...ඔයාට බොරු බලාපොරොත්තු දීලා අන්තිමට ඒවා කඩලා බිඳලා දාන්න වෙයි කියලා මත් ගොඩක් බයෙන් හිටියේ... ඒත් රිපෝට් දැක්කට පස්සේ මගෙ හිතේ තිබ්බ පුංචි සැකෙත් නැති වෙලා ගියා... එහ් කාලෙම හරියට treatment කරානම් මීට වඩා ලේසි විදිහකට මීට වඩා ඉක්මනට සනීප කරගන්න තිබ්බා නංගි....දැන් එහ් ගැන කතා කරලා වැඩක් නෑ...ඒත් එක දෙයක්... ඔයා මේ හොස්පිටල් එකෙන් එලියට එන්නේ මේ ලෝකේ දකින්න පුලුවන් කෙනෙක් විදිහට... ඒක මේ අයියගේ පොරොන්දුවක්...."

මලීශ් කෙල්ලගේ ඔලුවෙන් එක අතක් තියලා කියද්දි කෙල්ල හිනාවත් එක්කම අඩන්න ගත්තා...මලීශ් කරේ කෙල්ලගේ සතුට දිහා ආසාවෙන් බලන් උන්නු එක....

මලීශ් ඩොක්ටර් කෙනෙක් හින්දම හොස්පිටල් එක ඇතුලේ හැම දෙයක් ම නේහා වෙනුවෙන් ම සූදනම් කරල තිබුනේ....

අද ඉඳන් ඇස් දෙක සනීප වෙනකම්ම හොස්පිටල් එකේ ඉන්න වෙන බවක් නම් කෙල්ලවත් සරණි වත් දැනන් උන්නේ නෑ...එහ් හින්දම ඇඳන් ඉන්න ඇඳුම් ඇරෙන්න කිසි දෙයක් අනේ

sinhalaebooks.com

තිබුනේ නෑ... කෙල්ලව චෙක් කරන්න ගන්න ම මලීශ් ම සරණි එක්ක ගිහින් කෙල්ලට මේ ඉන්න දවස් ගානට ම ඇති වෙන්න ඇඳුම් අරන් දුන්නා..

හොස්පිටල් එකේ ගෙවුන හැම දවසක් ම ගෙවිලා ගියේ පුදුම ඉක්මනට... එක දවසක සරණි ත් තව දවසක ආයුශ් ගේ අම්මත් තවත් දවසක ආයුශ් ගේ තාත්තත් විදිහට කෙල්ල ලග හැමෝම නතර වෙලා හිටපු හින්ද ම කෙල්ල ට පුංචි තනියක්වත් දැනුනේ නෑ...

කෙල්ලගේ ඇස් පරීක්ෂා කරලා ඒවගේ රිපෝට් බලලා අන්තිමටයි තීරනය කරේ කෙල්ලගේ දැන් තියන ඇස් දෙක සනීප කරන්න බැරි උනත් කෙල්ලට ඇස් දෙකක් දැන්මොත් පෙනීම ගන්න පුලුවන් කියලා...

මලීශ් එහ් හැමදේම සූදනම් කරේ පුදුම ඉක්මනට..කෙල්ලගේ ඔපරේශන් එකටත් දින දීලා ඉවරයි... අනිද්ද වෙද්දි කෙල්ලව ඔපරේශන් එකට ගන්නවා කිවුවත් කෙල්ල වගේම ආයුශ් ගේ අම්මත් තාත්තාත් සරණි ත් උනේ හිතේ දෙගිඩියාවෙන්...එහ් මලීශ් වගේ ම නේහා ගේ ඔපරේශන් එක කරන්න ඉන්න ඩොක්ටර් කිවුව දේවල් නිසා...

ආයුශ් ගේ අම්මා කෙල්ල ලගට ආවේ කෙල්ලගේ හිතේ තියන බය ටිකක් හරි අඩු කරන්න හිතාගෙන... මොකද හොස්පිටල් එකේ හිටපු මේ සතියක කාලේ ඇතුලට ගෙවුන හැම තත්පරේම කෙල්ල සතුටින් හිනා වෙලා උන්නත් අද එහ් හීනේ හැබෑ වෙන්න තව තියෙන්නේ ටික කාලයක් උනත් කෙල්ල උන්නේ සෑහෙන්න බය වෙලා..

ආයුශ් ගේ අම්මා කෙල්ල ලගට ඇවිත් කෙල්ල එක්ක කතා කරන්න හිතාගෙන කෙල්ල ලගින් ම වාඩි උනත් ආයුශ් ගේ අම්මගේ ෆෝන් එක රින්ග් වෙන්න ගත්ත හින්ද ම ඇය ෆෝන් එක අතට ගත්තේ හිනාවකුත් එක්ක...එහ් ෆෝන් එකේ screen එකේ වැටිලා තිබුන නම දැකලා...කෝල් එක වෙන කාගෙන් වත් නෙමෙයි...හරියට ම සතියකට පස්සේ මේ ආයුශ් ගෙදරට ගත්ත පලවෙනි කෝල් එක....

ආයුශ් ගේ අම්මා නේහා දිහා බලලා හිනාවකුත් එක්ක කෝල් එක ආන්සර් කරේ මේ කිසි දෙයක් නොදන්න කෙල්ල ඔහේ කල්පනා කරද්දි...." හෙල්ලෝ පුතා.... "

ආයුශ් ගේ අම්මා ෆෝන් එක ආන්සර් කරන ගමන් ම එහෙම කියලා නේහා දිහා බලලා speaker එක ඔන් කරේ කෙල්ලටත් ආයුශ් ගේ කටහඩ අහන්න.... ඒත් කෙල්ල නම් හිතුවෙම නෑ ආයුශ් ගේ අම්මගේ ෆෝන් එකට දැන් කෝල් කරේ ආයුශ් කියලනම්...ඒකමයි ආයුශ් ගේ කටහඩ ඇහැද්දි ම ඔහේ කල්පනා කර කර හිටපු කෙල්ල ගැස්සිලා ගියේ....

" හෙල්ලෝ අම්මා...අම්මා කොහෙද ඉන්නේ..... "

කොල්ලා කතා කරේ ටිකක් කලබලෙන්...ඒත් කොල්ලා අහපු ප්‍රශ්නෙට නම් කට ලගට ආව උත්තරේ ආයුශ් ගේ අම්මා ගිල ගත්තේ මලීශ් කිවුව දේවල් එහ් සැනින්ම මතක් උන නිසා..නේහා ත් උන්නේ ඇහෙන හැම වචනයක් ම හිත පුදුම විදිහට කලබල කරගෙන අහගෙන...

sinhalaebooks.com

" පු..තා...මේ..මන්...ගෙදර පුතා ඉන්නේ....ඇයි...එක පාරම එහෙම ඇහුවේ... "

ආයුශ් ගේ අම්මගේ කටහඬ ටිකක් වෙවුලන්න ගත්තා..මොකද ඇය එක පාරම බලාපොරොත්තු උන දෙයක් නෙමෙයි ආයුශ් ඇහුවේ...ඒත් වාසනාවකට ආයුශ් ට අම්මගේ එහ් වචනවල වෙනසක් තේරුනේ නෑ....

" නෑ අම්මා...මන් නිකන් ඇහුවේ...කෝ නේහා... "

කොල්ලා එක පාරම නේහා ගේ නම කියද්දි කෙල්ලගෙ පපුව මොකක් ද වෙලා ගියා.... සතුටක් වගේම බයකුත් නොතිබුනම නෙමෙයි . ඒත් කෙල්ල එහ් දැනුන හැඟීම් වලට පුදුම විදිහට ආසා කරා....

" ඉන්නවා පුතේ...දුවට දෙන්න ද..."

" අම්මා ඉන්නේ නේහා ලග ද.... "

" ඔව් පුතේ...ඇයි... "

" කෙල්ල හොදට ඉන්නවද අම්මා... "

" මගෙන් අහන්නේ...මේ ඉන්නේ ඉතින්...දුවගෙන් ම අහන්නකෝ...මෙන්න දූ...ආයුශ් පුතා...ඔයා කතා කරලා ඉවර උනා ම මන් එන්නම් හොදද.... "

ආයුශ් ගේ අම්මා ෆෝන් එකේ speaker එක ඔෆ් කරලා කෙල්ලගේ කන ගාවින් ෆෝන් එක තියලා කෙල්ලගේ ඔලුවත් අත ගාගෙන ම කෙල්ල හිටපු රූම් එකෙන් එලියට ආවේ කෙල්ලට ආයුශ් එක්ක නිදහසේ කතා කරන්න ඉඩ දීලා...

කෙල්ල උන්නේ මොනවද කතා කරන්න ඕනි කියලවත් හිතා ගන්න බැරුව නිහඬව.... එහ් හින්ද ම ද මන් ද ආයුශ් දෙතුන් පාරක් ම හෙල්ලෝ කිවුවේ ලයින් එක කට් උනා කියලා හිතාගෙන... කොල්ලා ඊලග තත්පරේ ෆෝන් එකත් අරන් බැලුවා තාම ලයින් එකේද කියලා... මොකද කෙල්ල උන්නේ හෙල්ලෝ කියාගන්නවත් පුලුවන් තත්වෙක නෙමෙයි.... විනාඩියක් විතර ගියාමයි කෙල්ලගේ කටින් වචනයක් හරි පිට උනේ...

" ආ...යු...ශ්..."

" මොකද නේහා කතා කරන් නැත්තේ අහ්....මන් හිතුවා ලයින් එක කට් වෙලා කියලා...බය වෙන් නැතුව කතා කරනවා...මන් තමුසෙම ගිලින් නෑ.... "

sinhalaebooks.com

ආයුශ් කිවුවේ ටිකක් සැරෙන්...ඒත් කෙල්ලගේ මූනටනම් ආවේ හිනාවක්..සතියක් ම මේ බැනුම් අහන් නැතුව ඉදල ම කෙල්ලට තිකන් සාත්කාව වගේ තිබුනේ..ආයුශ් ගේ සුපුරුදු කටහඬ එක්ක ම කෙල්ලට තිකන් අලුත් පනක් ලැබුනා වගේ දැනුනේ...

" හරි ආයුශ්.... "

" හ්ම්... මොකද කරන්නේ...කැවද...."

" ඔ..ව්...ඔ...යා..."

" දැන් කන්න ඕනි...මෙහෙ වැඩ ගොඩයි...එහ් අස්සෙන් මට තමුසෙව මතක් වෙනවා...ඒකයි ගත්තේ...."

" ඇ..යි.... "

" නෑ..මන් ඊයේ තරක හීනෙකුත් දැක්කා.."

" එහ් මොකක් ද ආයුශ් .."

" ඒක වැඩක් නෑ...තමුසේ ගෙදරනේ ඉන්නේ.."

" ඔ....ව්..."

" අරුන් දෙන්නා ආයේ ආවද..."

" ක..වු..ද..."

" මලීශ්...සරණී..."

" න්..නෑ...ආ...යු..ශ්...ඇ...යි..."

ආයුශ් ට බොරු කියන වචනයක් වචනයක් ගානේ කෙල්ලගේ හිත පිච්චිලා යන තරම් වේදනාවක් දැනුනා...කෙල්ල උන්නේ ඇස් අගින් වැටෙන්න දගලන කදුලු පුදුම වෙහෙසක් දීලා හිර කරගෙන.

" මන් කිවුව දේවල් මතකයි නේද නේහා..."

මේ තරම් වෙලා ඕනවට එපාවට කතා කරපු කොල්ලා මේ වචන ටික කිවුවේ පුදුම තරම් හැඟීම් බරව .. එහ් හින්දමයි කෙල්ලගේ හිත මේ තරමට ම රිදුම් දෙන්න ගත්තෙත්...

" ඔ..ව්..ආ...යු...ශ්..."

sinhalaebooks.com

" හ්ම්...මන් තියනවා...පරිස්සමින් ඉන්න...බායි...."

ආයුශ් එහෙම කියලා කෙල්ල මොකුත් කියන්නත් කලින් ම කට් කරා...කෙල්ල තමන් ගේ රිදුම් දෙන පපුව එක අතකින් අල්ල ගත්තේ ඇස් වල හිර කරන් හිටපු කඳුලූ නිදහසේ ගලන් යන්න ඉඩ දීලා...කෙල්ලගෙ හිතට දැනුනේ පුදුම වරදකාරී හැඟීමක්.... ආයුශ් ට බොරු කරලා තමන් මේ කරගන්නේ ලොකු පවක් කියලා කෙල්ලගේ හිතට තදින් ම දැනෙන්න ගත්තේ මේ වෙලාවේ....තමන් මොන හේතුව නිසා ඇස් දෙක සනීප කරගන්න කැමති උනත් ආයුශ් ට කරන්නේ ලොකු වැරුද්දක් කියලා කෙල්ලගේ හිත කියන්න ගත්තේ කොච්චර උනත් හදගෙන් හිටපු හිත බිංදුවට ම වැටෙද්දි...

හැමදේම වෙන්නේ අපිට උරුම විදිහට කියනවා වගේ. .වෙන්න තියන දේවලුත් නවත්තන්න බෑ කියනවා වගේ..... කෙල්ලගේ හිත මේ තරමට ම වෙනස් වීගෙන යන මේ මොහොතේ, කෙල්ල ගත්ත තීරනේ ගැන දෙපාරක් හිතන මේ මොහොතේ කෙල්ල උන්නු රූම් එකට ආවේ සරණි....කෙල්ල හොදට ම දැක්කා නේහා අඩන විදිහ....

" නේහා...කෙල්ලේ...ඇයි මේ... "

තත්පර ගානෙන් නේහා හිටපු තැනට ගිය සරණි ඇහුවේ පුදුමයෙන්..කෙල්ලට කිසි දෙයක් හිතා ගන්න බැරි උනා.. ඊට පස්සෙයි කෙල්ල නේහා ගේ එක අතක තිබුන ෆෝන් එක දැක්කේ....

" කවුද කෙල්ලේ කෝල් කරේ. "

" ආ...යු...ශ්....අනේ මට එයාව රවට්ටන්න බෑ සරණි...එයාට උන පොරොන්දු ව කඩ කරන්න බෑ....එයා පව්...එයාට...එයාට ගොඩක් දුක හිතෙයි..මට ඇස් දෙක සනීප කරගන්න ඕනි නෑ...... "

" නේහා... සන්සුන් වෙයන් කෙල්ලේ....ආයෙත් පිස්සු නටන්න ද හදන්නේ...අමතක ද අපි මේ ඔක්කොම කරන්නෙත් ආයුශ් හින්ද කියලා....ආසා නැද්ද ආයුශ් ගේ වැඩ හැම එකක් ම ඔය අත් දෙකෙන් කරලා දෙන්න...ආයුශ් ගේ මූන බලාගන්න... "

" ආසයි...ඒත් ආයුශ් ව රවට්ටලා නෙමෙයි..."

" හරි කෙල්ලේ...ආයුශ් කැමති වෙනවනේ දවසක....අනික අම්මා...අම්මා පව් නේහා...එද රිපෝට් ටික දෙද්දි අම්මගේ ඇස් වල තිබ්බ කඳුලූ ඔයා දැක්කනම් ඔහොම කතා කරන් නෑ...පව් කෙල්ලේ....එහ් අහිංසක හීන කඩලා බිඳලා දාන්න එපා....ආයුශ් ගෙන් ප්‍රශ්නයක් වෙන් නෑ...වෙන්න දෙන්නෙත් නෑ...කඩා වැටෙන්න එපා කෙල්ලේ..... "

සරණි කෙල්ලගේ ඔලුව අත ගාලා ආදරෙන් කිවුව දේවල් වලට කෙල්ලගේ හිත ආයෙම පරණ තත්වෙට ගන්න පුලුවන් උනා...සරණි ගේ හිතට නම් එහ් ගැන දැනුනේ ලොකු

sinhalaebooks.com

සතුටක්...කෙල්ලට ඕනි උනේ ඇස් දෙක සනීප වෙලා මොන මොන දේවල් වලට මූන දෙන්න උනත් එහ් හැමදේට ම කලින් මේ අහිංසක කෙල්ලගේ ඇස් දෙක සනීප කරලා දෙන්න...එහ් පුදුම පිරිසිදු හැඟීමක්.පුංචිම කහටක් වත් සරණි ගේ හිතේ කොතනකවත් හිතුනේ නෑ...ආයුශ් ගැන කොහොම හිතන් හිටියත් සරණි ට නේහා ගැන තිබුන බැදීම විස්තර කරන්න වචන නෑ......

ඊට ටික වෙලාවකට පස්සේ ආයුශ් ගේ අම්මා නේහා හිටපු රූම් එකට ආවේ මලීශුත් එක්කමයි...

මලීශ් උනත් කරේ කෙල්ලගේ හිත හැදෙන විදිහට කතා කරපු එක..... එහ් හින්ද ම පුදුම ඉක්මනට කෙල්ල ආයෙම හිත හදා ගත්තා......

ගෙවුන දවස් එක හමාර ගෙවිලා ගියේ පුදුම තරම් ඉක්මනට....කෙල්ලගේ ඔපරේශන් එකට දීලා තිබුන වෙලාවත් ලන් උනේ හැමෝගෙම හිත් නොසන්සුන් කරලා...

ඔපරේශන් එකට විනාඩි ගානක් තියලා මලීශ් කෙල්ල ලගට ඇවිත් අහපු ප්‍රශ්නෙට කෙල්ල දුන්නේ පුදුම උත්තරයක්....

" නංගි...කාවද මුලින් ම බලන්න ආසා...ආයුශ් ව ද....අයුශ් ට දැන් ම මේවා කියන්න බෑනේ...අපි එයාගේ ෆොටෝ එකල් බලමු.... "

" නෑ අයියේ...මට ආයුශ් ව බලන්න ඕනි මගෙ ඇස් දෙකෙන් ම යි...ඊට කලින් එයාව ෆොටෝ එකකින් දැක්කොත් එහ් ආසාව ටිකක් හරි අඩුවෙයි...එයා ආවම එයාට වෙනසක් නොතේරෙන්න මන් එයාව මගෙ ඇස් දෙකෙන් ම බලා ගන්නවා...."

" අනේ නංගි....ඔයා....."

" මට ආසයි මුලින් ම අම්මව බලන්න....අයියට පුලුවන් ද අම්මට එන්න කියන්න..."

කෙල්ල කිවුවේ හැමදම වගේ අහිංසක විදිහට හිනා වෙලා...කෙල්ලගේ අම්මා කෙල්ල මේ හොස්පිටල් හිටපු දවස් ටිකේ උදෙ දවල් කෙල්ලව බලලා යන්න ආවත් අද මේ වෙද්දි එන්න බැරි උනේ ඈය හිටියේ ගොඩක් දුර නිසා...

" මන් අම්මව එක්ක එන්නම් නංගි... "

මලීශ් කෙල්ලගේ ඔලුව අත් ගාලා ආදරෙන් කියද්දි කෙල්ල ආයෙම අහිංසක විදිහට හිනා උනා...

ඊට ටික වෙලාවකට පස්සේ කෙල්ලව ඔපරේශන් එකට ගත්තම හැමෝම කරේ නේහා ගේ ඇස් දෙක ඉස්සර වගේ ම සනීප වෙන්න කියලා ප්‍රාථර්නා කරපු

sinhalaebooks.com

එක..... කෙල්ල නම් හිටියේ අවුරුදු ගානක් ම හිතේ කොනක හිර කරලා තිබුන එහ් හීනේ හැබෑ වෙන සතුට බොහොම සතුටින් විද ගනිමින්...කොටින් ම කිවුවොත් ඔපරේශන් එකට ගන්නත් කලින් ම කෙල්ල ඇස් දෙක සනීප උනා වගේ සතුටකින් උන්නේ.... එහ් තරම්ම සතුටක් කෙල්ලගේ හිතේ තිබුනා...
eye transplant surgery... Corneal transplant..

Operation එක කරද්දි ඇඟ හිරිවට්ටන්න බෙහෙත් විදිනවා...සිහි නැති කරන්නේ නෑ.....කෙල්ලට කිසි දෙයක් නොදැන හිටියත් එතන උන හැමදේම කෙල්ලට දැනුනා...

වෙන කෙනෙක් ගෙන් ගත්ත cornea එකක් කෙල්ලගේ ඇස් වලට මැච් වෙන විදිහට කපලා අරන් මහද්දි කොච්චර උනත් කෙල්ල උන්නේ හිත ගැස්සිලා...

surgery එක ඉවර වෙලා කෙල්ලගේ ඇස් බැන්ද...එහ් වෙලුම් පටි ගලවන්නේ හරියට ම දවසකට පස්සේ... සමහර අයට surgery එකෙන් පස්සෙත් ඇස් බොද වෙලා පේනවා...ඒත් තත්වේ හරියන්න සති 6ක් 12ක් වගේ යනවා කියලා මලීශ් කෙල්ලට opration එකට කලින් ම කියලා තිබුනේ කෙල්ල මේ දේවල් දැනගන්න ඕනි නිසා.. ඒත් සමහර අයට සතියකින් දෙකකින් සාමාන්‍ය තත්වෙට එනවා...මලීශ් ප්‍රාථ්නා කරේ ම කෙල්ලගේ ඇස් ආයුශ් එන්න කලින් සාමාන්‍ය තත්වෙට එන්න කියලා...

opration එක කරලා කෙල්ලව තවත් දවසක් යනකම්ම කෙල්ල උන්නේ එහ් විදිහට...පහුවද කෙල්ලගේ ඔපරේශන් එක කරපු ඩොක්ටර් කෙල්ලගේ බැදලා තියන වෙලුම් පටි ගලවන්න සූදනම් වෙද්දි ආයුශ් ගේ අම්මා තාත්තා වගේ ම සරණී ත් මලීශුත් එහ් ලගම හිටියා...කෙල්ලගේ අම්මා නම් උන්නේ ඇස් වල කදුලු පුරෝගෙන..කෙල්ලගේ කැමැත්ත මුලින් ම අම්මව දකින්න ඕනි කියන එක..ඉතින් එහ් හින්දම ඇය හිටියේ තේහා ගේ ඇස් දෙකෙන් තමන් ව බලන එහ් මොහොත වෙනකම් නොසිව සිල්ලෙන්...තේහාගේ වෙලුම් පටි එකින් එක ගැලවෙද්දි හැමෝම හිටියේ පුදුම තරම් නොසිවසිල්ලෙන්......

වෙලුම් පටි සම්පූණර්යෙන් ම ඉවත් කරලා කෙල්ලගේ පියාගෙන ඉන්න ඇස් දෙක දිහා බලලා ඩොක්ටර් කිවුවේ කෙල්ලට හෙමීට ඇස් දෙක අරින්න කියලා... එහ් උපදෙස් අනුව කෙල්ල හෙමින් ඇස් දෙක අරිද්දි opration එක සාථ්ක ද කියලා හරියට ම තාමත් නොදන්න මලීශ් වගේ ම කෙල්ලගේ ඔපරේශන් එක කරපු ඩොක්ටර් දෙන්න ම කෙල්ල දිහා බලන් උන්නේ විමසිල්ලෙන්...

කෙල්ල ඇස් දෙක අරිද්දි ම කෙල්ලට පෙනුනේ බොද උන දසුනක්...කෙල්ල යාන්තමටඇස් පිල්ලම් ගහද්දි ටිකෙන් ටික කෙල්ලගේ දසුන පැහැදිලි වෙන්න ගත්තා...ඩොක්ටර් කෙල්ලට කිවුව කෙල්ලගෙන් ඇහුව හැමදේට ම කෙල්ල සාථ්ක ව පිලිතුරු දුන්නා....කෙල්ලගේ ඇස් දෙක සුවයි කියලා ඉන් නිණර්ය උනා....

කෙල්ල ඇස් පිල්ලම් ගහගා වට පිටාව බලද්දි හැමෝගෙම මූනු වල තිබුන සතුට වචන කරගන්න බැහැ....

sinhalaebooks.com

මලීශ් කෙල්ලගේ අම්මට ඇස් වලින් කිවුවේ කෙල්ල ලගට යන්න කියලා...එහ් අනුව ඇය කෙල්ල ලගට ගියේ ඇස් වල කදුලු පුරෝගෙන.... නේහා හරියට ම අවුරුදු 15කට පස්සේ දැක්ක අම්මගේ රූපේ දිහා මොහොතක් බලන් උන්නේ ඇස් පිය නොහෙලා.. කෙල්ලගේ වචන තිබුනේ ගොලුවෙලා..

කෙල්ල අද ජීවී ඇස් වලින් තමන් දිහා බලම් ඉන්න විදිහ දකිද්දි කෙල්ලගේ අම්මගේ ඇස් වල කදුලු අලුත් වෙන්න වැඩි වෙලාවක් ගියේ නෑ...ඇයගේ ඇස් වලින් තිමක් නැතුවම කදුලු ගලන් යන්න ගත්තා....

ඒත් නේහා උන්නේ ඇස් වලින් පවා හිනාවෙමින්..අද නේහා ගේ ඇස් වලින් එකම එක කදුලක් වත් පිට උනේ නෑ...කෙල්ල උන්නේ හිතට දැනුන සතුටවත් දරාගන්න පුලුවන් තත්වෙක නෙමෙයි...කෙල්ල අම්මව බදාගත්තේ හිනා වෙවීම....ආයුශ් ගේ අම්මා තාත්තා වගේම නේහා මලීශුත් එහ් දසුන දිහා බලන් හිටියේ ඇස් වල කදුලු පුරෝගෙන....

නේහා අම්මගේ තුරුලෙන් ඈත් වෙලත් තමන් ට පේන මේ වටපිටාව දිහා ආයේ ආයේ ත් බලන්න ගත්තේ පුදුම ලෝබකමකින්...

ආයුශ් ගේ අම්මාත් කෙල්ල ලගට ඇවිත් කෙල්ලගේ අත ස්පශර් කරද්දි එහ් එක ස්පශර්යෙන් ම කෙල්ල දැනගත්ත එහ් ආයුශ් ගේ අම්මා කියන්න...

හැමෝම ඩොක්ටර් ට ස්තුති කරද්දි එහ් ස්තුතියෙන් බාගයක් ම ලැබුනේ මලීශ්...ඒත් කෙල්ලට මලීශ් ව බලන්න මතක් උනේ අන්තිමට...එහ් කෙල්ල උන්නේ දරාගන්න බැරි සතුටකින් නිසා..මේ වෙද්දි කෙල්ලට හැමදේම අමතක වෙලා තිබුන නිසා...

" ම...ලී....ශ්...අ...යි..යා... "

කෙල්ල මලීශ් ගේ නම කියලා වටපිට බලද්දි ඩොක්ටර් එක්ක මොකක්දෝ කතාවක හිටපු මලීශ් කෙල්ල දිහාට හැරුනේ හිනාවකුත් එක්ක....

"අන්තිමටනෙ අපිව මතක් වෙන්නේ.... "

මලීශ් එහෙම කියන ගමන් ම කෙල්ල ලගට ගිහින් කෙල්ලගේ ඔලුව අත ගෑවා.... කෙල්ල උන්නේ මලීශ් දිහා ම බලාගෙන...

" හැමෝම බැලුවා...ඔයාව බලන්න ආසා නැද්ද නංගි...."

මලීශ් එහෙම කියලා කෙල්ලගේ ඉස්සරහා ට mirror එකක් ගෙනාවේ කෙල්ල නිහඩවම කන්නාඩියෙන් පේන තමන් ගේ රුව දිහා බලන් ඉද්දි....

විශ්වාස කරන්න...කෙල්ලට කෙල්ලව ම අදහා ගන්න බැරි උනා.... අවුරුදු පහලවකට කලින් දැක්ක පුංචි නේහා ගේ වගේම අද ඉන්න නේහා ගේ තිබුනේ පුදුම වෙනසක්...එදට

sinhalaebooks.com

වඩා කෙල්ල අද පුදුම විදිහට ලස්සන වෙලා තිබුනා..කෙල්ලගේ ඇස් වල වෙනසක් කාටවත් නොපෙනෙන්න ම සැත්කම කෙරුනේ මලීශ් මැදිහත් වෙලා..කෙල්ලගේ දුබුරු පාට ඇස් එහ් නිසා ම අදත් එහ් විදිහට ම තියෙන්න ඒක ලොකු හේතුවක් උනා...

ඒත් කෙල්ලගේ ඇස් විසල් උනේ නම් එහ් නිසා නෙමෙයි...මලීශ් ගෙන් දැක්ක මොකක් දෝ සමානකමක් කෙල්ල කෙල්ලගෙනුත් දැක්ක නිසා....

" මොකද නංගී...."

" අයියා...අපි දෙන්නගෙම ඇස් එක වගේ..."

කෙල්ල කිවුවේ මලීශ් ගේ මූන දිහා බලාගෙන....ලාවට හිනා වෙලා...

" ඔන්න ඉතින්...පෙනුන ගමන් ම මෝඩ කතාවක් කිවුවා...එහෙම තමයි ලමයෝ..එහෙම තමයි ලමයෝ...ඔයා මගෙ නංගිනේ...අනික එක වගේ ඇස් තියන අය මේ ලොකේ කොච්චර නම් ඉන්නවද...හැබැයි ඔන්න ඇස් දෙක එක වගේ කියලා මෙච්චර කාලෙකට කාටවත් පෙනිලා නම් නෑ....අඩුම තරමේ ඔයාගේ අම්මටවත්...නේද අම්මා...... "

කොල්ලා කිවුවේ හිනා වෙවීම...නේහා ගේ අම්මා දිහා බලලා...ඇයත් මලීශ් වගේම නේහා දිහා බලලා හිනා උනා....කෙල්ලත් එහ් කිවුව දේවල් වලට හා කියලා ඔලුව හොල්ලලා කන්නාඩියෙන් පේන තමන් ගේ මූන දිහා ආයෙත් පාරක් බැලුවා...

කන්නාඩියෙන් පේන තමන් ගෙ රූපේ එක්ක ම කෙල්ලට මැවුනේ ආයුශ්..ආයුශ් ව මේ වෙලාවේ දකින්න තිබ්බා නම් කියලා කෙල්ලගේ හිතට මහා ලොකු ආසාවක් ආවා..ආයුශ් මොන වගේ ඇති ද කියලා කෙල්ල හිතින් එක එක රූප මවා ගත්තා....

හොස්පිටල් එකේ ටික දවසක් ඉදලා කෙල්ලව ගෙදර යැවුවේ ඩොක්ටර් කෙල්ල කරන්න ඕනි ඉන්න ඕනි විදිහ ගැන ගොඩක් උපදෙස් දීලා... ඒත් දවස් කීපයක් ගිහිල්ලත් කෙල්ලට දැනුනේ තාමත් හීනයක් වගේ...මුලින් ම ඇස් පෙනුන වෙලේ වගේමයි කෙල්ල තාමත් හැසිරෙන්නේ...කෙල්ල පටපිට බලද්දි පවා එහ් ඇස් දිලිසෙනවා...

කාර් එකේ එන අතරතුර කෙල්ල glass එකෙන් පිටත බලාගෙන ඇස් දෙකට පේන හැම දසුනක් ම බලන් හිටියේ පුදුම ලෝබකමකින්...

කවුරුත් කෙල්ලගේ මේ සතුටට බාද නොකෙරුවේ කෙල්ලට මේ සතුට නිදහසේ විදගන්න ඉඩ දීලා...
කාර් එක ගේට් එක ලගින් ඇතුලට දද්දි කෙල්ලගේ ඇස් යොමු වෙලා තිබුනේ කවදවත් නොදැකපු ඒත් හිතින් මවාගෙන හිටපු ආයුශ් ගේ ගේ දිහාට...මේ වෙනකම් කෙල්ල දැක්ක හැම දේකින් ම ලස්සන ම දේ උනේ මේ සුවිසල් නිවස... කෙල්ල වශී වෙලා වගේ ගාඩර්න් එක දිහත් නිවස දිහත් බලන් හිටියා..කෙල්ලට කාර් එකෙන් බහින්නත් අමතක උනෙ එහ් නිසා...

sinhalaebooks.com

" දූ...බහින්න... "

ආයුශ් ගේ තාත්තා කෙල්ල දිහා බලලා හිනාවකුත් එක්ක කියද්දි කෙල්ල අහිංසක විදිහට හිනා උනා...

" ගොඩක් ලස්සනයි තාත්තා..."

කෙල්ල කිවුවේ ආයුශ් ගේ තාත්තා දිහා බලලා...ආයුශ් ගේ තාත්තා කරේ කෙල්ලගේ ඔලුවත් අත ගාලා කෙල්ලගේ සතුට දිහා බලන් හිටපු එක...

ආයුශ් ගේ අම්මා වගේ ම තාත්තා ත් කෙල්ලව ගේ ඇතුලට එක්ක යද්දි කෙල්ල ගේ පුරාම තමන් ගේ ඇස් යොමු කරේ වශී වෙලා වගේ...පුංචි කාලේ හිටපු පරිසරෙත් එක්ක කෙල්ල මේ තරම් නවීන දේවල් දැකලා තිබුනේ නෑ... ඊටත් වඩා කෙල්ලට පුංචි කාලේ ඇස් පේද්දි පවා කෙල්ල උන්නේ සාමාන්‍ය ගෙදරකනෙහ්....

ඇස් නොපෙනුන කාලේ හිතින් මවා ගත්ත දේවල් හිතපු විදිහටත් වඩා ලස්සනයි කියලා දැනෙද්දි කෙල්ලට පුදුම ලෝබ හිතුනා..කෙල්ලව කෙල්ලගෙත් ආයුශ් ගෙත් රූම් එකට එක්ක යද්දි කෙල්ල පඩි පෙල නැංගේ ආයුශ් එක්ක ගෙවුන හැම මතකයක් ම එකින් එක මතක් වෙද්දි...සරණි වගේ ම මලීශ් උන්නේ නිහඩව ම මේ හැමදේම බලාගෙන...

කෙල්ල රූම් එකට අඩිය තියනවත් එක්ක ම කෙල්ලට ඇහුනේ පායා රූම් එකේ එල්ලපු windchimes වල හඩ.... කෙල්ල අහිංසක හිනාවකුත් එක්ක එහ් දිහා බැලුවේ ඇස් නොපෙනෙන කාලේ තමන් රූම් එකේ හැම තැනක් ම හොයා ගත්තේ මේ හඩින් නේද කියලා හිතෙද්දි...

ලා රෝස පාට් කටර්න් වලින් රූම් එකේ ජනෙල් 4ම සරසලා... මුලු බිත්තියම සුදු පාටයි... රූම් එකේ අයිනකට වෙන්න ඇද...එහා පැත්තේ බැල්කනි එක...රූම් එක පුදුම තරම් ලස්සනයි .. බිත්තියේ වෙඩින් එකේ දි ගත්ත නේහා ගේ ෆොටෝ එකකුත් ගහලා තිබුනා..කෙල්ල එහ් දිහා බලන් හිටියේ හිනා වෙවීම...

හැබැයි එහ් දේවල් නම් කලින් තිබුන දේවල් නෙමෙයි..මේ හැමදේම ආයුශ් ගේ අම්මාගේ වැඩ...රූම් එකේ විතරක් නෙමෙයි..මුලු ගේම තිබුන ආයුශ් ගේ ෆොටෝස් ආයුශ් ගේ අම්මා නේහා ට නොපෙනෙන්න අරන් තිබ්බේ ආයුශ් ව කෙලින් ම ඇස් දෙකෙන් ම දකින එක කෙල්ලගේ හිතේ තියන ලොකු ම ආසාවක් නිසා...එහ් සතුට ෆොටෝ එකකින් දැකලා අඩු කරන්න ආයුශ් ගේ අම්මට ඕනි කමක් තිබුනේ නෑ... ඉතින් රූම් එකේ බිත්තියේ ආයුශ් ගේ ෆොටෝස් තිබුන තැන් වලට ඇය කරේ නේහා ගේ ෆොටෝස් තිබ්බ එක...

" ඔන්න දූ.....ඔයා ආයුශ් ව ඇස් දෙකෙන් ම දකිනකම් මන් ෆොටෝස් ටික ඔක්කොම අයින් කරා.. "

sinhalaebooks.com

ආයුශ් ගේ අම්මා කිවුවේ කෙල්ල දිහා බලලා හිනා වෙවීම...කෙල්ලත් ඔලුව හොල්ලලා හා කිවුවේ ඒක කෙල්ලගෙත් ආසාව නිසා...

කෙල්ලව රූම් එකේ තියලා ආයුශ් ගේ අම්මා පහලට ගියේ මලීශ් ටයි සරණි ටයි තේ එකක් හදන්න...ආයුශ් ගේ තාත්තා ත් වොශ් එකක් දාගන්න රූම් එකට ගියා.... එතකොටයි මලීශ් කෙල්ල එක්ක කතාවට වැටුනේ....

" නංගි...මත් කිවුව දේවල් මතකයි නේද...ආයුශ් ආව ම ඉන්න ඕනි විදිහ... "

කෙල්ල කරේ අහිංසක විදිහට හිනා වෙලා ඔව් කියන්න ඔලුව හොල්ලපු එක...සරණි කෙල්ලව hug කරේ ක්ශනික ව කෙල්ල ගැන දැනුන සතුටට...

ඒත් ගියේ විනාඩි දෙක තුනක් විතරයි...තේ එකක් හදාගෙන එන්න කිවත් එකට ගියපු ආයුශ් ගේ අම්මා ආයෙම රූම් එකට දුවන් ආවේ ෆෝන් එකත් අරගෙන...

" දූ...පුතා කෝල් කරනවා..ඔයාට කතා කරන්න ඕනිලු... "

ආයුශ් ගේ අම්මා එහෙම කියන ගමන් කෙල්ල අතට ෆෝන් එක දුන්නා... කෙල්ල ෆෝන් එක කනේ තියා ගද්දි ම මලීශ් සරණි එක්ක බැල්කනි එකට ගියේ කෙල්ලට නිදහසේ කෝල් එක ආන්සර් කරන්න දීලා...

" හෙල්ලෝ.. "

" ආ...යු...ශ්.... "

" මත් තව දවස් 5කින් එනවා...ඒක කියන්න ගත්තේ.... "

ආයුශ් එහෙම කියන ගමන් ම කෙල්ල වචනයක් වත් කතා කරන්න කලින් කට් කරා...කෙල්ලගේ හිතට දැනුනේ සියුම් වේදනාවක්..ඒත් කෙල්ල දුක හංගගෙන හිනා උනා...

මලීශ් සරණි ගෙදරින් යද්දි ටිකක් හවස් උනා...

හැමෝම ගියාට පස්සෙයි කෙල්ල රූම් එක ඇතුලේ තනි උනේ...

කෙල්ල ඇගට දැනුන මහන්සියත් එක්ක වොශ් එකකුත් දාගෙන රූම් එකට ඇවිත් අල්මාරිය ඇරියේ ඇඳුමක් ගන්න...ඒත් ඇඳුම අඳිනකොට ම කෙල්ලගේ කකුල් දෙක ලගට වැටුනේ එදා ආයුශ් තමන් ට දාගන්න කිවුව කරාබු දෙක...කෙල්ල ඒක එහ් කරාබු දෙකමයි කියලා දැනගත්තේ ඒක ස්පශර් කරලා... එහ් දැනුන හුරුකමත් එක්ක...

sinhalaebooks.com

කෙල්ල කරාබු දෙක අතට අරන් එහ් දිහා ටික වෙලාවක් බලන් හිටියා... කරාබු දෙකේ තිබුනේ හාට් එකක්.. කෙල්ලට හිතුනෙ ම මේ වගේ එකක් ආයුශ් ලගට ආවේ කොහොම ද කියලා...

ඊලගට අල්මාරියේ ආයුශ් ගේ පැත්තට ඇස් යොමු උන කෙල්ලට හිතුනෙම ආයුශ් ගේ පැත්තේ තියෙන්නේ මොනා ද කියල බලන්න..ඒක කරාබු දෙක දකිනවත් එක්ක ම හිතට ආව හැගීමක්..

කෙල්ල ඉක්මනට ඇදුමකුත් දගෙන අල්මාරියේ අනිත් පැත්තේ මොනා ද තියෙන්නේ කියලා බලන්න පටන් ගත්තේ කරාබු දෙක පැත්තකින් තියලා...

ඒත් කෙල්ලට හම්බුන දේවල් නම්...කෙල්ලගේ ඇස් අදහ ගන්නවත් පුලුවන් දේවල් නම් නෙමෙයි....කොල්ලගේ ඇදුම් වලට මැදි කරලා තිබුන box එකක් කෙල්ලගේ ඇස් වලට යොමු උනේ අල්මාරියේ කොල්ලගේ පැත්තේ ඇදුම් වලට අමතරව තිබුන එක ම දේ එහ් box එක නිසා... කෙල්ල දෙපාරක් නොහිතම box එකත් අරන් ඇද උඩට ගියා... කෙල්ලට box එකේ ඇතුලේ තියන දේවල් බලනකම් ඉවසිල්ලක් තිබුනේ නෑ.... ඇද උඩින් වාඩි උන ගමන් ම කෙල්ල box එක ඇරියේ එහ් නොඉවසිල්ලත් එක්ක.... ඒත් box එක ඇතුලේ නම් තිබුනේ කෙල්ල හීනෙකින් වත් නොහිතපු දේවල්....

box එක අරිද්දි ම උඩ තිබුනේ ලේන්සුවක්...ලේන්සුවක් කිවුවට ලේන්සුවක් ද කියලවත් අදුනගන්න බැරි තරමට ම දූවිලි ගොඩක් තිබුනා... දූවිලි විතරක් නෙමෙයි....තැනින් තැන කළුපාට උන කුනු පැල්මකුත් තිබුනා...කෙල්ල ඒක පැත්තකින් තියලා ආයේම box එක ඇතුලට ඇස් යොමු කරා... ඊලගට තිබුනෙත් ලේන්සුවක්...හැබැයි කලින් වගේ කුනු දූවිලි නෑ...එහ් වෙනුවට ලේන්සුව පුරාම ලේ පැල්ලම් තිබුනා... ආයුශ් මොකටද මේ වගේ දේවල් තියන් ඉන්නේ කියලා කෙල්ලගේ හිතට ආවේ ලොකු ප්‍රශ්නයක්...කෙල්ල හිත අහපු හැම ප්‍රශ්නයක් ම පැත්තකින් තියලා ආයෙම box එක ඇතුල බලන්න ගත්තේ නොඉවසිල්ලෙන්... ඊලග තිබුනේ ලස්සන necklaces එකකුයි ring එකකුයි... necklace එකේ pendant එකේ " A " අකුර තිබුනා..ring එකෙත් එහෙම මයි... දෙකම සිල්වර් කලර්...ඊටත් වඩා මේ දෙක ම ladies ජුවලරි.....

මේවා කාගේ වෙන්න ඇති ද...ආයුශ් ට කොහෙන්ද...මේ තරමට ආයුශ් මේ දේවල් පරිස්සම් කරන්නේ ඇයි....හිතට දැනුන සියුම් වේදනාව එක්ක කෙල්ලගේ හිත ප්‍රශ්න කෝටියක් අහන්න ගත්තා...කෙල්ල necklace එකයි ring එකයි පැත්තකින් තියලා ආයෙත් box එක දිහා බලද්දියි කෙල්ල දැක්කේ box එකේ යටට ම වෙන්න තියන ෆොටෝ එක...ෆොටෝඑක දකිනවත් එක්ක ම කෙල්ලගේ මුලු ඇගම පන නැති වෙලා ගියා...ෆොටෝ එකේ ඉන්නේ කවුද කියලා නොදැන හිටියත් ෆොටෝ එකේ හිටියේ නම් ලස්සන cute girl කෙනෙක්...ෆොටෝ එකේ විදිහට නම් එහ් කෙල්ලගෙන් දිස් උනේ නේහා ට ත් වඩා අහිංසක පෙනුමක්...

කෙල්ල ෆොටෝ එක දිහා බලන් හිටියේ කදුලු පුරෝගෙන...

sinhalaebooks.com

" එතකොට මේ හැමදේම මේ කෙල්ලගෙ ද... එතකොට මේ කෙල්ල....ආයුශ්....ආයුශ් ගෙ ද....ඒග් කියන්නේ ආයුශ්....ආයුශ්.... "

කෙල්ලට තමන් ට ම කියා ගත්තත් අන්තිම වචන ටික කියාගන්න කලින් ම කෙල්ලට ඉකි ගගහා ඇඩුනා...

තමන් ට ආයුශ් ගැන තියන මේ හැඟීමට කියන නම කෙල්ල නොදැන හිටියත් කෙල්ල කවදාවත් හිතුවේ නෑ ආයුශ් ට වෙන කෙනෙක් ලන් වෙලා කියලා දැනගත්ත ම හිතට මේ තරම ට දුකක් වේදනාවක් දැනෙයි කියලා....

කෙල්ල ආයුශ් ට ආදරේ කරනවද... කෙල්ල ට කීපවතාවක් ම එහෙම හිතුනත් කෙල්ල එහ් හැඟීම යටපත් අරගත්තෙ තමන් ට තියෙන්නේ ආයුශ් ගැන ආයුශ් ලග ඉන්න ආසාවක් විතරයි කියලා කෙල්ල තමන් ට ම තරවටු කරගත්තා..එහ් ආදරයක් කියලා කෙල්ල කොයිම මොහොතකවත් පිලිගත්තේ නෑ... ඒත් මේ වෙලවේ මේ කෙල්ලගේ ෆොටෝ එක ආයුශ් ලග තියනවා දකිද්දි කෙල්ලට දැනුනේ දරාගන්න බැරි තරම් දුකක්... කෙල්ල අඩ අඩ ම box එකේ තිබුන දේවල් එහ් විදිහට ම අහුරලා වෙනසක් නොදැනෙන්න එහ් විදිහට ම තිබ්බා....

ඊලගට ආයෙම ඇදට ඇවිත් ඇස් දෙක රතු වෙනකම්ම හොදට ම ඇඩුවා.... අඩුම තරමේ කෙල්ලට රෑට කන්නවත් හිතුනේ නෑ...

දවස් ගෙව්ලා ගියේ කෙල්ල එහ් වේදනාව එක්ක ම කාලේ ගෙවද්දි...කෙල්ලට හරියට කෑමක් වත් කන්න හිත දුන්නේ නෑ....

දවස් 3ක් ගෙව්ලා ගියේ කියන්නත් බැරි තරම් ඉක්මනට.... හරියට ම ආයුශ් එන්න තව දවස් දෙකයි... කෙල්ල අදත් නැගිට්ටේ සැරින් සැරේ හිතට වද දෙන එහ් ෆොටෝ එක මතක් කරගෙන.... අතට අහුවුන ගවුමකුත් ඇදගෙන කෙල්ල අදත් ඇද උඩට වෙලා වෙනදා වගේම කල්පනා කර කර හිටියා...

වෙලාව හරියට ම හවස 3යි... ආයුශ් ගේ අම්මා රූම් එකට දුවගෙන ආවේ පුදුම කලබලෙන්....

" ඇයි අම්මා..."

" දූ...ආයුශ්...ආයුශ් එනවා..."

" මොකක් ද අම්මා..."

කෙල්ල ආයෙම ඇහුවේ එහ් ඇහුන වචන විශ්වාස කරන්න බැරි හින්දමයි...

sinhalaebooks.com

" පුතා එනවා දූ...එයා පහලා...තාත්තා එක්ක... ඔයා...ඔයා දන්නේ නැති නිසා මන් කියන්න ආවේ.... "

" ඒත් අම්මා එයා එනවා කිවුවේ..."

" හරි දූ..එයා එන්න ඇති ඔයාව ස්ප්‍රයිස් කරන්න... "

ආයුෂ් ගේ අම්මා කිවුවේ කෙල්ලගේ ඔලුවත් අත ගාලා...හිනා වෙවීම... කෙල්ලගේ මූනට හිනාවක් ආවේ දැනුන සතුට දරාගන්න ම බැරි තැන... හිතේ තිබුන හැම දුකක් ම එහ් වචන ටික ඇහෙනවත් එක්ක ම නැති වෙලා ගියා....

කෙල්ල තවත් මොනවදෝ කියන්න හදද්දි ම ඇහුනේ අඩි සද්දයක්.....

කෙල්ල උන්නේ කියන්න ගියපු වචන ටික ගිලගෙන...ආයුෂ් ගේ අම්මා කෙල්ලගේ කනට කරල කිවුව දේන් කෙල්ල සීතල වෙලා ගියා...

" ඔන්න එනවා දූ..ඔයා වෙනද වගේම ඉන්න....වෙනසක් පෙන්නත් නැතුව..."

ආයුෂ් ගේ අම්මා කෙල්ලගේ කනට කරලා රහසින් කියද්දි කෙල්ල හා කියන්න ඔලුව හෙල්ලුවත් හදවතින් කෙල්ල ගැහෙන්න ගත්තා... ආයුෂ් ගේ අම්මා කොල්ලා රූම් එකට එනවත් එක්ක ම කොලගෙන් විස්තරවත් අහන් නැතුව කොල්ලගේ නලල සිප අරන් රූම් එකෙන් එලියට ආවේ එක ඉලක්කයක් දිහා බලගෙන ඉස්සර වගේ ඉන්න හදන නේහා දිහා බලලා ලාවට හිනාවකුත් එක්ක.... ආයුෂ් ගේ අම්මගේ හිතේ මේ තියන සතුට ඇයටවත් විස්තර කරගන්න බැරි තරම්..ඇය උන්නේ මුලු ලෝකෙම ලැබුනා තරම් සතුටකින්...

ආයුෂ් ගේ අම්මා පහලට ගියා ම ආයුෂ් ගේ අඩි සද්දේ තව තවත් ලගින් ඇහෙද්දි කෙල්ල වෙනදට වඩා ගැහෙන්න ගත්තා...එහ් ආයුෂ් ට තමන් ගැන වෙනසක් දැනෙයිදෝ කියන බයෙන්...

" නේ...හා... "

ආයුෂ් කෙල්ලගේ නම කියද්දි කෙල්ල වෙනසක් නොදැනෙන්න කටහඬ ඇහුන පැත්තට හැරුනා...ඒත් කෙල්ලට ආයුෂ් ගේ මූන බලන්න නම් විදිහක් තිබුනේ නෑ.... කෙලින් ම මූන බැලුවොත් සැක හිතෙන බව කෙල්ල දැනත් උන්නා...එහ් හින්ද ම කෙල්ල ගේ ඇස් යොමු වෙලා තිබුනේ කොල්ලගේ කකුල් දෙක දිහාට... මොකද කෙල්ල උන්නෙත් ඇදේ වාඩි වෙලා...

" ආ...යු..ශ්.... "

කෙල්ල හිමින් මිමුනද්දි ආයුෂ් කෙල්ල ලගින් ම ඇදෙන් වාඩි උනා... කෙල්ලට බලන්න පුලුවන් එක ඉරියවුවක් දිහා විතරක් නිසා කෙල්ලගේ ඇස් මේ පාර යොමු උනේ ආයුෂ් ගේ දෙතොල් දිහාට....

sinhalaebooks.com

ලා රෝස පාට කෙල්ලෙක් ගේ වගේ ලස්සන ලිප්ස් දෙකක් තියන කොල්ලගේ මූන දකින්න කෙල්ලට එහ් මොහොතේ දැනුනේ පුදුම ආසාවක්...ඒත් කෙල්ල තමන් ම පාලනය කරගත්තා...

" මන් ආවා... "

ආයුශ් ගේ කටහඬ පුදුම විදිහට ආදරෙන් පිරිලා...කොහොම ද දෙයියනෙහ් මේ තත්වෙනුත් මූන දිහා නොබලා ඉන්නේ...කෙල්ල ඉවසුවේ පුදුම ඉවසිල්ලක්...

" මන් බය උනා...අරුන් දෙන්නා....මන් එපා කියපු දේම කරලා ඇති කියලා...ඒකයි මන් කිවුව දවසට කලින් ආවේ.... ඒත් උඹව මෙහෙම දකිද්දි...මට සතුටුයි ගොඩක්..."

කොල්ලා කිවුවේ සියුම් ව කෙල්ලගේ හිස අතගාන ගමන්... ඒත් කොල්ලගේ එහ් වචන කෙල්ලට ගෙනාවේ පපුව පසාරු කරගෙන යන තරම් වේදනාවක්...

" මහන්සියි...වොශ් එකක් දන් එන්නම්...තේ එකක් හදන් එනවද..."

ආයුශ් කවදවත් නැතුව කෙල්ල දිහා බලලා ආදරෙන් අහද්දි කෙල්ලගෙ පපුව පිච්චුනා... තාමත් ආයුශ් ගේ මූන නොදැක්ක කෙල්ල හා කියන්න ඔලුව හෙල්ලුවේ කලින් බලන් හිටපු ආයුශ් ගේ ලිප්ස් දිහා ම බලාගෙන....

කොල්ලා ආයෙම පාරක් කෙල්ලගේ ඔලුවත් අත ගාලා බෑග් එක එහෙමම දාලා වොශ් රූම් එකට යද්දි කෙල්ල ඇස් වල හිර කරන් හිටපු කදුලු නිදහසේ ගලන් යන්න දීලා පහලට ආවේ පුදුම වේදනාවකින්... එහ් ආයුශ් ව තමන් මොන තරම් රවට්ටන්න ද කියලා තමන් ගැන ම දැනුන පසුතැවීමත් එක්ක...

කෙල්ල තේ එකකුත් හදගෙන උඩට ආවේ සෑහෙන්න වෙලාවකට පස්සේ...කෙල්ල පහලට වෙලා සෑහෙන්න වෙලාවක් කල්පනා කරා.... ආයුශ් ට ඇත්ත කියලත් බෑ...ඒත් ආයුශ් ට බොරු කරන එක කෙල්ල හිතුව තරම් ලේසිත් නෑ..ඒකෙන් රිදෙන්නේ කෙල්ලගේ හිතමයි....තව ටික දවසක් බලලා ඕන දෙයක් කියලා ආයුශ් ට ඇත්ත කියන්න කියලමයි කෙල්ලගේ හිත කිවුවේ.... ඒත් ඒකෙන් ආයුශ් ව සදහට ම ආයෙත් දකින්නවත් නොලැබෙයි කියල හිතෙද්දි කෙල්ලගේ පපුව පිච්චිලා ගියා....

උඩට එනකම්ම කෙල්ල ආවේ හිතට වද දෙන මේ ප්‍රශ්න ඔලුවේ තියාගෙන...රූම් එක ලගට එනකම්ම කෙල්ල හිටියේ එහ් සිහියෙන්... ඒත් රූම් එකේ දොර ලගට එද්දි කෙල්ල ගේ ඇස් වශී වෙලා ගියේ කෙල්ලටත් නොදැනිම...කෙල්ල ඉක්මන් කරලා දොර පිටිපස්සට ආවේ ආයුශ් ට කෙල්ලව නොපෙනෙන විදිහට.....

කොල්ලා උන්නේ දුබුරු පාට ටවල් එකක් පිටින්... උඩු කය නිරාවරනය වෙලා තියෙද්දි කොල්ලගේ ලස්සන තවත් ලස්සනට පෙනුනා... කෙල්ලගේ ඇස් මුලින් ම නතර උනේ එහ්

sinhalaebooks.com

පපුව ලග... ඊලගට හෙමින් හෙමින් ඇස් උඩට ගද්දියි කෙල්ල කොල්ලගේ මූන පලවෙනි වතාවට දැක්කේ...

විශ්වාස කරන්න..කෙල්ලට කෙල්ලවම විශ්වාස කරන්න බැරි උනා... කෙල්ලගේ වගේ ම තිබුන එහ් දුඹුරු පාට ඇස්, තාමත් තෙත බේරෙන කොන්ඩේ, රෝස පාට ලිප්ස්... කොල්ලගෙත් ගෙනාවේ පුදුම handsome ලුක් එකක්... කන්නාඩිය දිහා බලාගෙන හිටපු කොල්ලගේ මූන දිහා තේහා විනාඩි ගානක් ම බලන් උන්නේ ඇස් පිය වත් ගහන් නැතුව...

තමන් ට අර තරම්ම වද දුන්න ආයුශ් ගැන කෙල්ල හිතින් මවන් හිටපු රූපෙට වඩා ආයුශ් මොන තරම් නම් වෙනස් ද් කියලා හිතෙද්දි කෙල්ලට කෙල්ලගෙ ම ඇස් අදහගන්න බැරි උනා...මොකද මොන තරම් නපුරු කම් කරත් ආයුශ් ට තිබුනේ පුදුම අහිංසක පෙනුමක්... ඇස් ඉවතට ගන්න පවා කෙල්ලට ලෝබ හිතුනා...මේ තරම් අහිංසක පෙනුමක් තියන කෙනෙක් ට අර වගේ නපුරු වෙන්න පුලුවන් ද දෙයියනෙහ්...කෙල්ල හිතුවේ එච්චරමයි....

කෙල්ල අමාරුවෙන් කෙල්ලව පාලනය කරගෙන ආයුශ් ට වෙනසක් නොතේරෙන විදිහට රූම් එක ඇතුලට එද්දි කන්නාඩියෙන් පේන රූම් එක ඇතුලට එන තේහා දිහා කොල්ලා බලන් හිටියේ හිනාවකුත් එක්ක...

බිත්තිය දිහා ම බලන් ආව කෙල්ල ඇස් කොනකින් එහ් හිනාව දකිද්දි කෙල්ලගේ මුලු ඇගම අමුතු හැඟීමකින් හිරි වැටුනා....

ආයුශ් ඔලුවේ තියන වතුර බිංදු අත් දෙකෙන් පිහින ගමන් ම තේහා ලගට ඇවිත් තේහා අතේ තිබුන තේ එක තමන් අතට ගත්තා... ඊලගට කෙල්ලගේ අතින් අල්ලලා කෙල්ලව ඇද උඩින් වාඩි කරලා රූම් එකේ දොර වහලා ආයෙම කෙල්ල ලගට ඇවිත් එහ් ලගින් ම වාඩි උනා...

ඊලගට කෙල්ල දිහා බලාගෙන ම කෙල්ල ගෙනත් දුන්න තේ එකෙන් උගුරක් බිවුවා...හැබැයි ඒත් එක්ක ම කොල්ලගේ මූවට ආවේ හිනාවක්... කොල්ලා එහ් හිනාවෙන් ම කෙල්ලගේ ඇස් දිහා බැලුවා...කෙල්ල ඉවත බලන් ඉන්නවා වගේ පෙන්නුවත් කෙල්ලට කොල්ලගේ එහ් බැල්මනම් හොදට ම පෙනුනා... ඒකමයි කෙල්ල ගැහෙන්න ගත්තේ...ආයුශ් ට සැක හිතිල ද කියලා...මොකද ආයුශ් මොකද මේ පේන්නෙවත් නැති ඇස් දෙකක් දිහා බලන් හිනා වෙන්නේ...නැත්නම් ආයුශ් වෙනදත් කොහොම ද...

කොහොම උනත් කෙල්ල උන්නේ බය වෙලා...හොදට ම බය වෙලා... ඒත් ආයුශ් ඊලගට කිවුව කතාවට නම් කෙල්ලගේ බය නැත්තට ම නැති වෙලා ඇස් වලට කදුලු ඉනුවා...

" තේ එක නිම්ලා... "

වෙනද වගේ මූනට ම දමලා ගහන වචන වගේ නෙමෙයි...එහ් වචන අහන් ඉන්නත් ආසයි...

" අනේ ආයුශ්...මන්...ඉන්න...ආයේ හදන් එන්නම්.."

sinhalaebooks.com

කෙල්ල එහෙම කියන ගමන් ම නැගිටින්න හැදුවත් ආයුශ් කෙල්ල ව නවත්ත ගත්තේ අතේ තිබුන තේ එක තත්පර ගානෙන් බොන ගමන්...

" දැන් හරි..ඔක්කොම බිවුවා..."

" අනේ ආයුශ්...ඔයා එහ් නිම්ච්ච තේ එක..."

" කමක් නෑ... එහෙමත් රසයි..."

ආයුශ් හිනා වෙවීම එහෙම කියද්දි කෙල්ලගේ ඇස් වලට ආයෙම කඳුලු ආවා... කොල්ලා ඒහ් කඳුලු තමන් ගේ දෑතින් ම පිහලා දාන්මේ සුසුමකුත් පිට කරලා... ඊලගට කෙල්ලගේ කම්මුලකින් අතක් තිබ්බේ එහ් ස්පශර්යෙන් කෙල්ලගේ මුලු ඇගම ආයෙම හිරි වැටිලා යද්දි...

" මට කතා කරන්න ඕනි... "

ආයුශ් කම්මුල පිරිමදින ගමන් ම කිවුවේ පුදුම තරම් ආදරේකින්...

" කි..ය..න්...න.... "

කෙල්ල වචන ටික එකතු කරගත්තෙත් බොහොම අමාරුවෙන්...

ආයුශ් කෙල්ලගේ උකුලේ ඔලුව තියාගත්තේ කෙල්ලගේ අවසරයක් වත් නැතුව... ඊලගට කෙල්ලගේ අත තමන් ගේ ඔලුවෙන් තිබ්බේ ඔලුව පිරිමදින්න කියලා ඉගි කරලා... කෙල්ල උන්නේ ආයුශ්ගේ මේ හැසිරීම අදහා ගන්නත් බැරුව...ඒත් කොල්ලා ඔලුවෙන් අත තිබ්බ පමාවටම කෙල්ල ආයුශ් ගේ ඔලුව පිරිමදින්න ගත්තා...

කොල්ලා විනාඩි කීපයක් ඇස් දෙක පියා ගත්තේ අවුරුදු ගානකට පස්සේ හිතට දැනුන එහ් සැනසිලි දයක සතුටත් එක්ක....

" නේ...හා... "

එහ් සතුට ටික වෙලාවක් එහ් විදිහට ම විදගෙන් කොල්ලා කිවුවේ ඇසෙන නැසෙන තරමට ම මුමුනලා........

" ආ...යු...ශ්..."

කෙල්ල කිවුවේ වචන පවා පැටලෙද්දි...

" අයියා කියන්න... ඔයාට මින් අයියනේ...මන් ඔයාට වඩා වැඩිමල්... "

sinhalaebooks.com

කොල්ලා එහෙම කියන ගමන් ම කෙල්ලගේ බඳ වටා අතක් ගවලා කෙල්ලගේ කුසට මූන තද කරගත්තා.කෙල්ල උන්නේ ගල් ගැහිලා...

" ආ..යු..ශ්...මො..ක...ද...මේ... "

" ඇයි එපා ද... "

" නෑ..."

කෙල්ල වචනෙකට දෙකකට වඩා කොල්ලා එක්ක කතාවට යන්න බය උනා...කෙල්ල උන්නේ කොයි වෙලාවේ ආයුශ් ට තරහා යයිද කියලා පුදුම බයකින්....

ඒත් කෙල්ලගේ එහ් චූටි වචනෙත් එක්ක ම කොල්ලා කෙල්ලගේ උකුලෙන් නැගිට්ටා...ඒලගට ඇද උඩ තිබුන බෑග් එක ඇරලා කරාබු දෙකක් අතට අරන් තේහා ගේ අවසරයක් නැතුවම කෙල්ල දත් හිටපු කරාබු දෙක ගලවලා කොල්ලා අතේ තිබුන කරාබු දෙක දැන්මා...

" ආ..යු..ශ්...ඇ..යි...මේ... "

කෙල්ල ඇහුවේ ආයුශ් මේ හැසිරීම පපුවට බර වැඩි නිසා...ඒත් කොල්ල දුන්න පිලිතුර නම්... කෙල්ල ව තොමරා මැරුවා...

" උබ මට දුන්න පොරොන්දු ව රැක්කා තේහා... මන් දන්නවා..මන් හොඳ එකෙක් නෙමෙයි... ඒත් මන් වෙනස් වෙනවා..උබගේ මේ අවංකකම හින්ද ම... ආයෙම වද දෙන් නෑ මැනික... හැම එකීම එක වගේ නෑ කියලා උබ මට මගෙ ඇස් මනාපිටම පෙන්නුවා...ආයෙම...ආයෙම කවදාවත් ම මන් උබට වද දෙන් නෑ...."

ආයුශ් පුදුම තරම් හැගිම් බරව කියද්දි කෙල්ල එහ් වචනයක් වචනයක් පාසා අහන් හිටියේ මලකදක් වගේ...එහ් වචනයක් වචනයක් පාසා කෙල්ලගේ පපුව පුදුම විදිහට පිච්චිලා ගියා...

" උබට කවදාවත් ඇස් දෙකක් ඕනි නෑ මැනික... මන් ඉන්නවනේ බලාගන්න... "

ආයුශ් ආයෙම වතාවක් කෙල්ලගේ කම්මුලක් සියුම් ව අත ගාලා කියද්දි කෙල්ල හිටියේ එහ් වචන දරා ගන්න පුලුවන් තත්වෙක නෙමෙයි.... අඩන්නවත් හිනා වෙන්නවත් කතා කරගන්නවත් වෙන කිසිම දෙයක් කරන්නවත් කෙල්ලට සිහියක් තිබුනේ නෑ....

" ඔහොම ඉන්න...මන් තේ එකක් හදන් එන්නම්... "

කෙල්ල මොකුත් කියන්නත් කලින් ම ආයුශ් නැගිටලා පහලට යන අඩි සද්දේ කෙල්ලට හොදට ම ඇහුනා.....කෙල්ල ඇවිදින මල කදක් වගේ ඇදෙන් නැගිට්ටේ පිස්සියක් වගේ...

sinhalaebooks.com

එදා ඇහෙද්දි ත් සතුටක් දැනුන windchimes වල හඩ පවා කෙල්ලට දැනුනේ පුදුම අසරන හැඟීමක්....

කෙල්ල කෙල්ලගේ ඉස්සරහා තිබුන කන්නාඩිය දිහාට හැරුනේ තමන් ගේ මූන මේ ඇස් දෙක පේන වාරයක් වාරයක් පාසා කරගත්ත පව ගැන දහස් වාරයක් දුක් වෙමින්... ඒත් එහ් හැමදේම කෙල්ලට මොහොතකට අමතක වෙලා ගියේ කන්නාඩියෙන් පේන ආයුශ් දාන් මොහොතකට කලින් දාන් ම කරාබු දෙක දකිද්දි...
ඔව්..කිසිම වෙනසක් නෑ...මේ එහ් කරාබු දෙකමයි...ආයුශ් box එකේ දාලා තිබුන එහ් කරාබු දෙකමයි...වෙනසකට තියෙන්නේ මේ කරාබු දෙක ඊට වඩා අලුත්..එහ් desing එක ඒකමයි...

ඒක දකිනවත් එක්ක ම ආයෙ ම කෙල්ලගේ හිතේ මැවුනේ මේ තරම් වෙලා අමතක වෙලා තිබුන එහ් ෆොටෝ එක.. ආයුශ් එහ් වගේ ම කරාබු දෙකක් ඇයි තමන්ටත් දාන්මේ කියලා දැනෙද්දි කෙල්ලගේ පපුව පිච්චිලා ගියා...

ඇස් වල කඳුලු ආයේමත්...පුංචි කාලේ ඉඳන් කඳුලු කියන දේ කෙල්ලට හුරුයි....හරියට ආත්මයට ම බැඳුන දෙයක් වගේ... ඒත් ආයුශ් ජීවිතේට ආවට පස්සේ මේ දැනෙන වේදනාව දරාගන්න තරම් හයියක් කෙල්ලට තිබුනේ නෑ...

ආයුශ් ගෙන් ෆොටෝ එකේ දැක්ක කෙල්ල කවුද අහන්නත් බෑ...ඇහුවොත් කරන හැම බොරුවක් ම අහු වෙනවා... එහෙම උනොත් ආයුශ් සදහට ම නැති වෙයි...

කෙල්ලට දැනුනේ පුදුම වේදනාවක්... ආයුශ් ලගට ම එනකම් කෙල්ලට දැනුනේ නෑ... ඒත් කෙල්ල කන්නාඩියෙන් ඉස්සරා හිටපු ඉරියවුව දකිද්දි නම් කොල්ලා ගැස්සුනා... මොකද කෙල්ල හිටියේ කන්නාඩියෙන් තමන් ගේ මූන දිහා ම බලාගෙන...

ඒත් වාසනාවකට කෙල්ලගේ ඇස් පිල්ලමක් වත් හෙල්ලුනේ නෑ...එහ් හින්ද ම කොල්ලගේ ගැස්සුන හිත ආයෙම සන්සුන් වෙලා ගියා....

කොල්ලා නේහා ලගට ගිහින් කෙල්ලගේ උරහිසෙන් අත තියද්දි කෙල්ල ගැස්සුනා...මොකද ආයුශ් ව එහ් වෙනකම්ම නේහා දැකලා තිබුනේ නෑ....

" කන්නාඩිය ඉස්සරහට ම වෙලා.....මොකද කරන්නේ...තව පොඩ්ඩෙන් මන් රැවටෙනවා...ඇස් පේනවා කියලා... "

ආයුශ් තේ එක කන්නාඩි මේසෙන් තියලා කෙල්ලගේ ගෙල සිප ගන්න ගමන් කියද්දි කෙල්ල උන්නේ ගල් ගැහිලා....

" මේක බොන්න...මන් තාම ටවල් එක පිටින්... "

sinhalaebooks.com

ආයුශ් කෙල්ලගේ කනට කරලා එහෙම කියලා තේ එකත් කෙල්ලගේ අතට ම දීලා ගියේ අල්මාරිය ලගට... ඊලගට අල්මාරියෙන් සුදු පාට ටී එකකුයි ඇශ් කලර් ශෝට් එකකුයි අරන් ටවල් එක එහෙම්ම ම ගැලෙව්වේ නේහා ට ඇස් පේන් නෑනේ කියලා හිතලා... ඒත් තාමත් කන්නාඩිය දිහා ම බලන් හිටපු කෙල්ල එක පාරම ඇස් ඉවතට ගත්තේ හිතට දැනුන ලැජ්ජාවට... ඊට ටික වෙලාවකට පස්සේ කෙල්ලගේ මූනට හිනාවක් ආවේ එග් උන සිදුවීම මතක් වෙලා....

හිතේ මොන මොන දේවල් තිබුනත් හිතින් මොන තරම් විදෙව්වත් ආයුශ් ගේ එක ආදරනීය වචනයක් ඉදිරියේ කෙල්ලට කෙල්ලවම අමතක වෙලා යනවා...දැන් කියලා වෙනසක් නෑ...උනේ එග් දේමයි...ඊලගට කෙල්ලටත් නොදැනිම හීන මවන්න ගන්නවා...එග් හීන කොහෙන් කොයි විදිහට නතර වෙයි ද කියලවත් හිතන්න බැරි තරමට කෙල්ලගේ හිත ලෝබ වෙලා...

ආයුශ් ඇදුම් අදිනකම් කෙල්ල වෙන දිහාවකට එක එල්ලෙම ඇස් යොමු කරන ගමන් ආයුශ් හැදුව තේ එකෙන් උගුරක් බිව්වා...ඒත් බිව්වට වඩා ඉක්මනට කෙල්ල එග් උගුර පිටතට දැන්මා... කෙල්ල හිතලා කරා නෙමෙයි...ඉබේම උනා...

එග් සද්දෙටයි ඇදුම් ඇද ඇද හිටපු කොල්ලා එග් දිහාට හැරුනේ...එග් වෙලාවෙනම් කෙල්ලට බය නොහිතුනම නෙමෙයි... ආයුශ් තමන් එග් කරපු දේට තමන් ට කෑ ගහයි කියලමයි කෙල්ල හිතුවේ.... ඒත් කොල්ලා කරේ කෙල්ල හිතුවෙවත් නැති දෙයක්...

" අනේ ඇයි මැනික...මොකද උනේ...රස නැද්ද... "

ආයුශ් මූනත් දෙක කරන් ඇහුව විදිහට කෙල්ලගේ පපුව හෝස් ගාලා ගියා..කෙල්ලට තමන් කරපු දේ ගැන ලොකු පසු තැවීමක් ඇති උනා..අමාරුවෙන් හරි බොන්න තිබුනේ කියලා කෙල්ලට හිතුනා...

" නෑ...ආයුශ් මේ... "

කෙල්ල මොනවදෝ කියන්න හදද්දි ම ආයුශ් කෙල්ල අතේ තිබුන තේ එක බලෙන් ම උදුරලා අරන් උගුරක් බිව්වා... ඒත් කෙල්ලටත් වඩා කලින් ම කොල්ලා ආයෙම එග් උගුර විසික් කරේ කැස්සකුත් එක්ක...

එග් වෙලාවෙනම් කෙල්ලට ආයුශ් ගැන පුදුම දුකක් දැනුනා...එත් ඊට විනාඩි කීපයකට පස්සේ ආයුශ් කිව්ව කතාවට නම් කෙල්ල උන්නේ ගල් ගැහිල..කියන්න ඕනි මොනාද කියලවත් කෙල්ලට හිතා ගන්න බැරි උනා...

" අනේ...ලුනු වැඩි වෙලා නේද... ඒත් මන් චූට්ටයි නෙග් දැන්මේ...කොහොමද එහෙම උනේ... "

sinhalaebooks.com

ආයුශ් තමන්ට ම කියා ගද්දි කෙල්ල මොහොතක් ගල් ගැහිලා බලන් හිටියත් ඊලග තත්පරේ මූනට ආව හිනාව නවත්ත ගන්න නම් කෙල්ලට බැරි උනා...

කෙල්ල තමන් ගේ මුව අතින් වහගෙන අමාරුවෙන් හිනාව නවත්තගෙන ආයුශ් එක්ක කතා කරේ පුදුම ඉවසීමකින්....

" ඔයා මීට කලින් තේ හදලා තියනවද..."

" නෑ මේ පලවෙනි පාර..."

ආයුශ් මූනත් ඇද කරන් තාමත් තේ එක දිහා ම බලාගෙන.... ආයුශ් එහ් ඉන්න විදිහ බලන් ඉන්න ලෝබ හිතුනත් කොල්ලට තමන් ගැන වෙනසක් තේරෙයි කියන බයට ම කෙල්ල ඇස් ඉවතට ගත්තේ ලිප්ස් දෙකත් හපාගෙන...

" ආ..යු...ශ්.."

" ඇයි... "

" තේ වලට ලුනු දන් නෑ... "

මේ වෙද්දි තේහා ට කොල්ලා ගැන තිබුන බය නැති වෙලා තිබුන හින්ද ම කෙල්ල කිවුවේ කිසිම පැකිලීමක් නැතුව...

ඒත් නොහිතපු විදිහට එහ් කතාවට ආයුශ් ට කේන්ති ගියා ..

" පිස්සු හැදිල ද..ඕන කැමකට ලුනු දනවා...දන්න දෙයක් කතා කරනවා... "

ආයුශ් කිවුවේ ටිකක් තරහින්... එහ් හින්ද ම තේහා ගේ වචන ආයෙ ම ගොලු උනා....

ඒත් එහ් තරහා තත්පර ගානක් විතරයි...කොල්ලා තේ එක පැත්තකින් තියලා කෙල්ල ලගට ඇවිත් කෙල්ලගේ කම්මුලකින් අතක් තිබ්බා...

" සො...රි... "

කොල්ලා කිවුවේ අසරණ විදිහට.... කෙල්ල ලාවට හිනා උන එක විතරයි කරේ...

" මට කියලා දෙනවද... "

" මොනවද... "

" තේ හදන්න... "

sinhalaebooks.com

" හා... "

" එතකොට මන් ආයෙම වරද්දන් නෑ... "

ආයුශ් පොඩි ලමයෙක් අම්මා කෙනෙක් ට කියනවා වගේ වචනත් එකින් එක එකතු කරලා කියන විදිහට කෙල්ල එක පාරම කොල්ලව කිස් කරන්න තරම් හැඟීමක් ආවා...කෙල්ල උන්නේ එහ් හැමදේම යටපත් අරගෙන ..

" මන් කියලා දෙන්නම්... "

නේහා ආයෙම කියද්දි කෙල්ල තවත් වචනයක් කතා කරන්න කලින් ම ආයුශ් කෙල්ලව හරහට වඩා ගත්තා...

" ආ..යු..ශ්...මො..ක...ද...මේ... "

" ට්‍රාන්ස්පෝට්..... "

බය වෙලා හිටපු කෙල්ල දිහා බලලා ආයුශ් සැහැල්ලුවෙන් කියලා කෙල්ලවත් වඩාගෙන පහලට එද්දි ආයුශ් ගේ අම්මයි තාත්තයි පහල.. කොල්ලගේ මූන ලැජ්ජාවට ම රතු උනා... ඒත් ආයුශ් ගේ අම්මගෙයි තාත්තාගෙයි මූනු වලනම් තිබුනේ හිනාවක්... නේහා මේ කිසි දෙයක් නොදැක්කේ කෙල්ල උන්නේ ආයුශ් ගේ පපුවට මූන තද කරගෙන නිසා...

කොල්ලා අම්මයි තාත්තායි ලග ගල් ගැහිලා බලන් ඉද්දි ආයුශ් ගේ තාත්තා යන්න කියලා අතින් ඉගි කරද්දි කොල්ලා කිවුව පමාවට ම කෙල්ලවත් අරන් කිචන් එකට ආවා... ඇවිත් කෙල්ලව කිචන් එකේ තිබුන ටයිල් එකක් උඩින් වාඩි කෙරෙවුවා...

" ආ...යු...ශ්...අනේ...මා...ව... "

" ෂ්...ෂ්..අම්මලට ඇහෙයි....."

කොල්ලා කෙල්ලගේ කනට කරලා කියද්දි කෙල්ල එක පාරම තිහඩ උනා...

" දැන් කියන්න...උනු වතුර තියනවා..තව තේ කොල...ලුනු...සීනී... දන්න ඕනි විදිහ කියන්න... "

නේහා හිනා වෙලා ඔලුව හෙල්ලුවේ හා කියන්න...

ඊලගට කෙල්ල කිවුව විදිහට ම ආයුශ් තේ එක හදන්න ගත්තා..කොල්ලට හිතුනෙ ම ලුනු ටිකක් දාන්න..ඒත් නේහා ගේ රෙසිපි එක වෙනස් නිසා කොල්ලා ඉවසන් උන්නා...

sinhalaebooks.com

අන්තිමට තේ එක හදලා ඉවර වෙලා කොල්ලා උගුරක් බීලා බලද්දී ම එහ් මූනේ තිබුනේ කවදාවත් නැති තරම් සතුටක්...

කෙල්ල මේ හැමදේම කොල්ලට නොතේරෙන විදිහට බලන් හිටියා...ආයුශ් ගේ මේ ක්ශනික වෙනස් වීම විශ්වාස කරන්න බැරි දෙයක් උනත් කෙල්ල මේ ගෙවෙන තත්පරේටත් ලෝබ උනා... එහෙම තත්වයක් තියෙද්දී කෙල්ලගේ හිත කොහොමටවත් ම කැමති උනේ නෑ ආයුශ් ට ඇත්ත කියලා මේ හැමදේම නැති කරගන්න....

ආයුශ් තේ එකෙන් බාගයක් බීලා කෙල්ල අතට දෙද්දී කෙල්ල එහ් තේ එක බිව්වේ පුදුම ලෝබකමකින්...

තේ එක බීලා ඉවර වෙලා කොල්ල ම කෝප්පෙත් හෝදලා කෙල්ලව ආයෙම වඩාගන්න හදද්දී ම කෙල්ල ඉස්සර උනා....

" අනේ එපා ආයුශ්... "

" ඇයි... "

" අම්මලා දැක්කොත්.... "

"ඉතින්... මගෙනෙ... "

කොල්ලා එහ් වචන ටික ගානක් නැතුව උනත් කෙල්ලට නම් එහ් වචන ටික හද පතුලට ම දැනුනා..කවදාවත් අමතක නොවෙන විදිහට...

ආයෙම එහ් වචන ටික අහන්න කෙල්ලගේ හිත ලෝබ උනා...

" මො..ක...ක්...ද...කි...වු...වේ... "

" මගෙනේ... "

මේ පාර ආයුශ් කිව්වේ කෙල්ලගේ කනට කරලා...පුදුම හැඟීම් බර ස්වරයකින්...

දුකට වගේ ම දරා ගන්න බැරි සතුටක් ලගදිත් කෙල්ලගේ ඇස් කදුලු වලින් තෙත් වෙනවා... කෙල්ල ගේ ඇස් වල කදුලු පිරෙන්න ගියේ තත්පර ගානක් විතරයි....

කෙල්ලගේ ඇස් වල කදුලු පිරෙද්දී නම් කොල්ලට තරහා ගියා...

" නේහා මොකද මේ... "

sinhalaebooks.com

" ඇයි ආයුශ්...ඔයා මෙහෙම..ඇයි වෙනදා වගේ බනින් නැත්තේ මට...මට ගහන් නැත්තේ...මට මේ වෙනස්කම් දරාගන්න බෑ.... "

කෙල්ල ඉකි ගහන ගමන් කියද්දී කොල්ලගේ මුවින් සුසුමක් පිට උනේ ඉබේම...

කොල්ලා කල්පනාවට වැටුනේ ඉබේමයි...

ටික වෙලාවක් ඇහුනේ නේහා ගේ ඉකි බිඳුම් විතරයි... ඊලග මොහොතේ ආයුශ් කෙල්ලගේ ඔලුවෙන් අත තිබ්බේ එක අතකින් කෙල්ලගේ කඳුලුත් පිහින ගමන්...

" අද රෑට කියන්නම්...හැමදේම...ප්‍රොමිස්..."

ආයුශ් වෙවුලන කටහඬින් කියද්දී නේහා ගේ පපුවත් වේගෙන් ගැහෙන්න ගත්තා... කෙල්ල ආයුශ් කිවුව දේට හා කියන්න ඔලුව හොල්ලද්දී කොල්ල ආයෙ ම කෙල්ලව දෝතට අරන් රූම් එකට ආවේ කිසි කතා බහක් නැතුව....ලොකු කල්පනාවකට වැටෙමින්...
කොල්ලා රූම් එකට ඇවිත් නිහඬවම කෙල්ලව ඇඳ උඩින් තියලා එහා පැත්තෙන් ඇඳේ කොට්ටයක් තියලා හාන්සි උනා... ඊලගට කොල්ලා ඇස් දෙක පියා ගත්තේ දිග කල්පනාවකට වැටෙමින්.... ඇඳේ කොනට හිටපු කෙල්ල ආයුශ් දිහා ආයුශ් නොතේරෙන විදිහට බලන් හිටියා... ආයුශ් ඉන්නේ හිතේ ලොකු ප්‍රශ්නෙකින් කියන දේ නම් කෙල්ල හොදට ම තේරුම් අරන් තිබුනේ..... ආයුශ් අද රෑට කියන්නම් කිවුව දේ ගැන හිතද්දීත් කෙල්ලගේ හිතට දැනුනේ මොකක්දෝ බයක්...ඒත් හිතට ඉවසිල්ලක් තිබුනේ නෑ එහ් දේ දැනගන්නමයි....

ඇඳේ ඇලවිලා හිටපු ආයුශ් ට ටික වෙලාවක් යද්දී දන්නෙම නැතුව නින්ද ගිහින් තිබුනා.... ඒක එක අතකට කෙල්ලගේ හිතට ලොකු සැනසීමක් උනා...මේ තරම් වෙලා හොරෙන් බලපු ආයුශ් ගේ මූන දිහා ඇති තරම් වෙලා බලන් ඉන්න ලැබුන එකට කෙල්ල දෙවියන්ට පින් දුන්නා... ආයුශ් නිදාගෙන හිටපු දිහා මොහොතක් බලන් උන්න කෙල්ල ඊලගට කරේ කොල්ලගේ ඔලුව කොල්ලට ඇහැරෙන් නැති වෙන්න අත ගාපු එක... නිදාගෙන ඉද්දී කොල්ලගෙන් ඇස් ඉවතට ගන්නත් ලෝබ හිතෙන පෙනුමක් තිබුනේ... කෙල්ල දෙපාරක් හිතන් නැතුවම ආයුශ් ගේ පපුවෙන් මූන තියා ගත්තේ ටික වෙලාවකින් ඇහැරිනවා කියලා හිතාගෙන උනත් කෙල්ලටත් එහ් පපුව උඩම නින්ද ගියා...

කොයි තරම් වෙලාවක් ගියා ද කියලා කෙල්ලට දැනීමක් තිබුනේ නෑ..කොහොමහරි ආයෙම කෙල්ල ඇහැරෙද්දී ආයුශ් කෙල්ල ලග හිටියේ නෑ... කෙල්ල ඇස් ඇරලා වටපිට බලද්දියි දැක්කේ ආයුශ් ඇඳේ අනිත් කෙලවර ඉන්නවා දැක්කෙ...ඒත් ආයුශ් එහ් හිටපු විදිහට නම් කෙල්ලගේ පපුව පිච්චිලා ගියා....

ආයුශ් හිටියේ අර box එකේ තිබුන කෙල්ල එදා දැක්ක ෆොටෝ එක දිහා බලාගෙන...ආයුශ් ගේ ඇස් වල කඳුලු පිරිලා තිබුනා... එහ් කඳුලු ෆොටෝ එකේ ඉන්න කෙල්ල වෙනුවෙන් නේද කියලා හිතෙද්දී කෙල්ලගේ හිත ඊෂ්‍යාර්වකටත් වඩා මහා ලොකු තනිකමකින් පිරිලා ගියා...හරියට තමන් ට ම අයිති වටිනම දෙයක් නැති උනාම දැනෙන හැගීමකින්...

sinhalaebooks.com

කෙල්ල ඇස් වලට උනපු කඳුලු ආයුෂ් ට නොපෙනෙන්න පිහද ගත්තත් ආයුෂ් ට කෙල්ල ඇදේ පෙරලෙන සද්දේ ඇහෙද්දි ම කොල්ලා box එක පැත්තකින් තියලා කෙල්ල ලගට ආවා....

කෙල්ල උන්නේ බොරුවට ඇස් දෙක පියාගෙන.. ඒත් හිතේ දුකනම් තාමත් එහෙ විදිහමයි... මොකක්දෝ හේතුවකට කෙල්ලට එහ් වෙලාවේ ආයුෂ් ගැන දැනුනේ තරහක්...

ආයුෂ් කෙල්ල ලගට ඇවිත් කෙල්ලගේ මූනට වැටිලා තිබුන කෙස් ටික අතින් මෑත් කරලා කම්මුලක් සීරුවට අත ගාද්දි ම කෙල්ල ඇස් දෙක ඇරියා...එහ් ආයුෂ් ගේ ස්පශර්යෙන් ඈත් වෙන්න තිබ්බ උවමනාවට...

" මත් නැගිට්ද්දි ඔයා හොදට දොයි මැනික...මගෙ පපුවටත් තුරුල් වෙලා....මට ඇහැරවන්න දුක හිතුනා...එහ් හින්ද මත්...."

ආයුෂ් කියන්න ගියපු වචන ටික ගිල ගත්තා... ඒත් නොහිතපු විදිහට තේහා ගේ කටින් වචන පිට වුනා...එහ් වචන වෙනද තරම අහිංසක නම් උනේ නෑ... එහ් වචන තරහින් පිරිලා තිබුනා..ඇත්තට ම එහ් තරහකුත් නෙමෙයි....හිතට දැනුන අසරනකම...ආයුෂ් තමන් ගේ හැගීම් එක්ක සෙල්ලම් කරනවද කියලා හිතෙද්දි හිතට දැනුන අසරනකම කෙල්ල පිට කරපු විදිහ...

" එහ් හින්ද....එහ් හින්ද මොකද කරේ..."

" මො...කු...ත්...නෑ...මැනික...මත්..ඔයාට ඇහැරෙන්නේ නැති වෙන්න නැගිට්ටා.... "

ආයුෂ් කියන්නේ ඇත්ත උනත් සම්පූණර් ඇත්ත නෙමෙයි කියලා දන්න හින්ද ම කෙල්ලගේ හිතේ තිබ්බ දුක තවත් වැඩි උනා... ඒත් කෙල්ල උන්නේ නිහඬව...

" 7 ත් වෙලා මැනික...කාලා ඉමු ද... කෝ ඉන්න.... "

ආයුෂ් එහෙම කියන ගමන් ම කෙල්ලව වඩාගන්න හැදුවත් තේහා කරේ කොල්ලගෙන් ඉවත් වෙන්න හදපු එක...එහ් වෙලාවේ කොල්ලට දැනුමේ වාවගන්න බැරි තරම් දුකක්...

" තේ...හා...මො...ක...ද..මේ... "

ආයුෂ් වචන පවා එකතු කරගත්තේ ඇස් වල කඳුලු පුරෝගෙන...ඒත් තේහා ට මේ දැන් නම් ඒහ් ගැන ගානක් තිබුනේ නෑ...මොකද කෙල්ල උන්නේ මීට විනාඩි ගානකට කලින් උන සිදුවීම හිතේ හිතාගෙන...

" මට බඩගිනි නෑ ආයුෂ්...ඔයා කන්න..."

sinhalaebooks.com

නේහා ගේ එහ් වචන වලට කොල්ලගෙන් පිලිතුරක් ලැබුනේ නෑ.... එහ් වෙනුවට කොල්ලගේ අඩි සද්දේ ඇතින් ඇහුනා...කෙල්ල හැරිලා බලද්දි දැක්කේ ආයුශ් පහලට යනවා... ආයුශ් කන්න යනවා ඇති කියලා හිතලා කෙල්ල සුසුමකුත් පිට කරලා ආයුශ් පැත්තකින් තිබ්බ box එක දිහා බැලුවා.. box එක උඩින්ම අර කෙල්ලගේ ෆොටෝ එක දකිද්දි කෙල්ලගේ පපුව පිච්චිලා ගියා.. කෑ ගහලා අඩන්න තරම් හිතුනත් කෙල්ල පුදුම ඉවසිල්ලක් ඉවසුවේ ...

ඒට ටික වෙලාවකට පස්සේ ආයෙම ආයුශ් ගේ අඩි සද්දේ ඇහෙද්දි කෙල්ල බැල්කනි එක දිහාට ඇස් යොමු කරේ ආයුශ් ට සැක නොහිතෙන්න....

කෑම දෙකක් වෙනුවට එක කෑම එකලුයි වතුර එකකුයි රූම් එකට අරන් ආව කොල්ලා ඇදේ හාන්සි වෙලා කල්පනා කර කර ඉන්න කෙල්ල දිහා බලලා ලාවට හිනා උනා...

" නේහා...කාලා ඉමු ද..ප්ලීස්...මට ගොඩක් බඩගිනියි...ඔයා කෑවේ නැත්තම් මන් කන්නේ නෑ..."

කොල්ලා ආදරේ දෝරේ ගලන වචන වලින් කෙල්ල දිහා බලලා කියද්දි කෙල්ල ඔලුවත් හොල්ලලා ඇදෙන් නැගිට්ටේ මේ පාර ආයුශ් ව රිද්දන්න හිත දුන් නැති නිසා.... ඒත් කොල්ලා කරේ කෙල්ලගේ අතින් ඇදලා ආයෙම වාඩි කරවපු එක....

" ඔහොම ඉන්න...අද රූම් එකේ ඉදන් කමු..."

ආයුශ් කියද්දි කෙල්ලට දැනුනේ පුදුමයක්..ආයුශ් ට සැක හිතෙයි කියල බැල්කනි එක දිහා බලන් හිටපු හින්දම කෙල්ල ආයුශ් කෑම රූම් එකට ගෙනපු වගක් දැක්කේ නෑ ......

ආයුශ් හිනා වෙවීම මේසේ උඩ තියපු කෑම එක අතට ගද්දියි කෙල්ල දැක්කේ... ඒත් එහ් ගැන අහන්න බැරි හින්ද ම කෙල්ල උන්නේ මොකුත් නොදන්න ගානට....

" මන් කවන්නම්..... "

ආයුශ් කිවුවේ කෙල්ලගේ මූන දිහා ම බලාගෙන පුදුම තරම් ආදරෙන්....ඒත් කෙල්ල එහ් වචන ටිකට ගැස්සුනා...

" නෑ...ආයුශ්...මට...."

" මන් ආසයි.... "

ආයුශ් එහ් කිවුව විදිහට ආයෙම එක වචනයක් වත් කියන්න කෙල්ලට හිත දුන්නේ නෑ...හිතේ මොන තරම් දේ තිබුනත් ආයුශ් ගේ මේ හැසිරීම ලග හැමදම කෙල්ල අසරනයි...

sinhalaebooks.com

කෙල්ල හා කිවුවෙත් නෑ...එපා කිවුවෙත් නෑ...කෙල්ල උන්නේ ආයුශ් ට ඉඩ දීලා නිහඬව... ආයුශ් හරි පරිස්සමට හරියට තාත්තා කෙනෙක් පුංචි දුවෙක්ට කෑම කවනවා වගේ කෙල්ල කවන්න ගත්තා....කෙල්ල ආසාවෙන් කන විදිහ දකිද්දි කොල්ලගේ හිත අතීතෙට ගියේ ඇස් වලට කඳුලු උනද්දි... නේහා ඉවන බලන් හිටියත් කෙල්ලට මේ හැමදේම හොදට පෙනුනා... ඒත් ආයුශ් ගෙන් අහන්න බැරි තරම් කෙල්ල අසරනයි...කොල්ලා ඉක්මනට කෙල්ලට කවලා බත් කටවල් දෙක තුනක් තමනුත් කාලා කෙල්ලට වතුරත් පොවලා අත හෝදන් ආයෙම රූම් එකට ආවේ කිචන් එකෙත් පිගානත් තියලා....

මේ වෙද්දි 8 ට කිට්ටු කරලා තුබුනා....ආයුශ් ගේ අම්මා තාත්තාත් තාම ඇහැරලා... ඒත් කොල්ලා රූම් එකේ ලයිට් එකත් ඕෆ් කරගෙන රූම් එක ඇතුලට ආවේ දොරත් වහගෙන...

ඊලගට ඇදට වෙලා හිටපු කෙල්ල ලගින් ම වාඩි උනා...

" නේ...හා... "

" ආ..යු...ශ්... "

" අර කියනවයි කිවුව කතාව...."

" ඔ...ව්... "

" ඒක කියන්න හදන්නේ... "

ආයුශ් සුසුමකුත් පිට කරලා කිවුව විදිහට කෙල්ලගේ හිතට ලොකු බයක් දැනුනා...ඒත් කෙල්ල උපරිම සන්සුන් කමකින් කතා කරේ...

" කියන්න ආයුශ්... "

නේහා වෙවුලන කටහඬින් කියද්දි කොල්ලා ආයෙම සුසුමක් පිට කරා...මුලු රූම් එකේම අන්දකාරය තිබුනත් රූම් එකට යාන්තම් වැටිලා තිබුන හද එලිය හිත්ද ලාවට රූම් එකේ එලියක් තිබුනා...ඒත් කිසි දෙයක් පැහැදිලිව පෙනුන් නෑ.....

ආයුශ් කෙල්ලට කොට්ටයක් තියලා ඇදේ හාන්සි කෙරෙවුවේ කෙල්ලගේ ඔලුවත් ආදරෙන් අත ගාලා....

" මන් කෙටියෙන් කියන්නම්... "

ආයුශ් සුසුමක් පිට කරලා කියද්දි නේහා කරේ නිහඬව උන්නු එක... තවත් තත්පර ගානක් ගෙවිලා ගියේ එහ් විදිහට...

sinhalaebooks.com

ආයුශ් කෙල්ලගේ අවසරයක් නැතුවම කෙල්ලගේ උකුලෙන් ඔලුව තියා ගත්තා... දෙන්නට ම දෙන්නගේ මූනු යාන්තමට පෙනුනත් පැහැදිලිව පෙනුන් නෑ...එහ් හින්ද ම කෙල්ලට ආයුශ් ගේ මූනේ හැගීම් තේරුම් ගන්න බැරි උනා...

" සුදු මැනික.... "

කවදාවත් එහ් වචනෙන් ආයුශ් කතා කරලා නැති හින්ද ම කෙල්ලගේ මුලු ඇගම එහ් වචනේ එක්ක හිරි වැටිලා ගියා...

" අහගෙන ද ඉන්නේ... "

කෙල්ලගෙන් ප්‍රතිචාරයක් නැති තැන කොල්ලා ආයෙම ඇහුවේ කලින් ට වඩා හඩ බාල කරලා...

" ඔ...ව්... "

" කෙටියෙන්...ගොඩාක් ක් සරලව මුලු කතාවම කියන්නම් මැනික.... ආදරේ කරා මන්...ගොඩක් කාලෙකට කලින්... මගෙ හිතට දැනුන පලවෙනි ආදරේ...මන් ගොඩක් බොලද උනා...අන්තිමට ආදරේ කරාටත් වැඩිය මන් රැවටුනා ....මන් පිස්සෙක් උනා.... "

ආයුශ් කිවුවේ ඇස් වල කදුලු පුරවගෙන...මේ තරම් කාලයක් කාටවත් ම නොකියම රහසක් නේහා ගේ ඉස්සරහා දිග හරිමින්.... කොල්ලගේ පපුවට දැනුනේ පුදුම වේදනාවක්... ඒත් ඊට නොදෙවෙනි වේදනාවකින් කෙල්ල උන්නේ...

" එයා කෝ දැන්... "

" ගියා...මාව දාලා... "

" කොහෙට ද... "

" දන් නෑ... "

ආයුශ් හැම වචනයක් ම කතා කරේ උගුරෙන්...එහ් වචන පිටතට ඇසෙන නැසෙන තරමට ම දුවර්ල වෙලා තිබුනා....

" ඊ....ට..පස්සේ...."

" ඊට පස්සේ මන් බේබද්දෙක් උනා...ගෑනු එක්ක නිද ගත්තා... පිස්සෙක් උනා... "

ආයුශ් මේ කියන දේවල් කෙල්ල දැනන් උන්නත් ආයුශ් ගේ කටින් ම කියද්දි කෙල්ලට දැනුනේ ලොකු වේදනාවක්...

sinhalaebooks.com

" ඊ...ට...ප...ස්...සේ... "

" මන් උඹව මැරි කරා... මගේ හිතේ තිබ්බ දූකට මන් අහිංසක උඹගෙන් පලි ගත්තා.... "

ආයුශ් එහ් වචන ටික කිවුවේ ඉකි ගහමින්....

" ඊ...ට...ප...ස්...සේ.... "

ආයේ ආයෙම එක ම වචන ටික ඇරෙන්න කෙල්ලට වෙන වචන ටිකත් තිබුනේ නෑ...කෙල්ල ඇහුවේ එක ම දේ.....

" ඊට පස්සේ කවදවත් වෙනස් වෙන් නෑ කියලා ගලක් කරන් හිටපු මගෙ හිත උඹේ ඔය අහිංසක කම ලග ආයෙ ම මාව පිස්සෙක් කරා... කොච්චර නොහිතා ඉන්න හැදුවත් මට උඹ ගැන එහ් හැගීම් ගැන නොහිතා ඉන්න බැරි උනා... "

" ආ...යු...ශ්....එහ් කියන්නේ ඔයා මට ආ...ද....රේ ක...රා...ද..."

" නෑ...එතකොට මන් දැනන් හිටියේ නෑ එහ් හැගීම මොකක් ද කියන්න....හැබැයි උඹව නැති වෙනවට මගෙ හිත ගොඩක් බය උනා මැතික.... "

" ඊ...ට...ප...ස්...සේ... "

" ඊට පස්සේ මට රට යන්න උනා... ඒත් මට හිතුනෙ ම මන් ගියා ම උඹ මට දුන්න පොරොන්දු ව කඩලා දයි කියලා....මන් ආයෙත් එද්දි උඹ එහ් විදිහට ම ඉද්දි...අන්න එහ් වෙලාවේ...මන් ....මන් මගෙ හිතට ම පොරොන්දු උනා ආයෙම කවදවත් සීරීමක් වත් වෙන්න දෙන් නෑ කියලා...පන වගේ බලාගන්නවා කියලා... හැම එකීම එක වගේ නෑ කියලා උඹ මට ඔප්පු කරා .. "

ආයුශ් අන්තිම වචන ටික කිවුවේ තේහා ගේ උකුලෙන් නැගිටලා කෙල්ලගේ හුස්මත් දැනෙන තරමට ම කෙල්ලට ලන් වෙලා... එහ් මූන දිහා ම බලාගෙන...

ඒත් තේහා නම් හිටියේ මුලු ඇගම සීතල වෙලා... ආයුශ් ගේ එහ් වචන ආයේ ආයේත් කෙල්ලගේ සවන් වල දෝන්කාර දෙන්න ගත්තා....

ඊට පස්සේ ගෙවුනේ දැඩි නිහඩ තාවක්...ආයුශ් කරේ කලුවරේ ම කෙල්ලගේ කම්මුල් සියුම් ව අත ගාපු එක....

" ම...න්...එ...හ්...පො...රො..න්..දු...ව...ක...ඩ...ක...රා...න...ම්.... "

ගොඩක් වෙලාවකට පස්සේ කෙල්ල ඇහුවේ උගුරෙන් වචන ගලපමින්....

sinhalaebooks.com

කෙල්ල එග් අහපු ප්‍රශ්නෙට ආයුශ් කරෙ කෙල්ලට තවත් ලන් උන එක... ඊලගට කෙල්ලගේ දෙතොල් එක අතකින් ස්පශර් කරන ගමන් කිවුව කතාවට කෙල්ල දැනුනේ සියදිවි නසාගන්න තරම් හැගීමක්... එග් තරම ට ම ලොකු දුකක් කෙල්ලගේ හිතට දැනුනා....

" එහෙම උනානම්....මන්....මැරෙනවා......උබට ඇති තරම් ගහලා උබ ඉස්සරහම මන් මැරෙනවා....වචනෙට කිවුවට මට බෑ උබව මරන්න....හැබැයි මට මැරෙන්න පුලුවන්....එතකොට උබ ජීවිත කාලෙම විදවයි.. "

ආයුශ් හැමදම කියන විදිහට අදත් තමන් ව මරනවා කිවුවනම් කෙල්ලට මේ තරම් වේදනාවක් නොදැනෙන්න තිබුනා...ඒත් ආයුශ් මේ කිවුව කතාවනම්....කෙල්ලගේ හිතට මේ තරමට නම් කවදවත් ම වේදනාවක් දැනිලා නෑ..... කෙල්ල උන්නේ මල කදක් වගේ...එග් මුවින් පිට වුනේ සිහින් ඉකියක් විතරමයි.....

එතනින් එහාට ආයෙම කිසිම කතාවක් උනේ නෑ... විනාඩි ගානක් යනකම්ම...නේහා ගේ සිහින් ඉකිය ඇරුන ම අහුනේ ආයුශ් ගේ සුසුම් හඩ විතරමයි... නේහා ට අඩන්න එපා කියලා නොකිවුවත් කොල්ලා එග් ඉකි බිදුම් වැඩි වෙන හැම තත්පරේකම කෙල්ලගේ ගෙල සිප ගත්තේ පුදුම ආදරේකින්...

නේහා ට ආයෙම වචනයක් පිට කරගන්න ලැබුනේ සෑහෙන වෙලාවකට පස්සේ...එග් ආයුශ් ගේ මේ වචන එක්ක තමන්ගැන ම දැනුන වේදනාවත් එක්ක ම ආයුශ් ගේ ආදරේ ගැනත් දැනගන්න හිතට දැනුන උවමනාවකට....

ඒත් ආයුශ් ඒකට දෙන පිලිතුර මේ තරම්ම වේදනාකාරී වෙයි කියලා කෙල්ල හිතුවෙම නෑ....
" එ...යා...ව කො...හො...ම...ද...හ...ම්..බු..නේ..."

නේහා ගේ ගෙලෙන් දෙතොල් තද කරන් හිටපු ආයුශ් ගේ මුවින් නේහා ගේ මේ වචන එක්ක පිටවුනේ දිග සුසුමක්...

" ඒක දිග කතාවක්...මන්....මන්....පස්සේ දවසක කියන්නම්...."

ආයුශ් කිවුවේ කටහඩ පවා වෙවුලද්දි.....

ආයුශ් ගේ මේ හැම හැසිරීමකින් ම නේහා ගේ හිත පුදුම විදිහට රිදුනා... කෙල්ලට දැනුනේ හරියට තමන්ගේ හුස්ම හිරවෙලා වගේ....

" තා...ම....ත්........එ...යා...ට....ආ.. ද...රෙ...යි...ද.... "

කෙල්ල එග් ප්‍රශ්නේ ඇහුවා නෙමෙයි...කෙල්ලගේ මුවින් පිට වුනා....

sinhalaebooks.com

ආයුශ් සුසුමක් හෙලන ගමන් ම කෙල්ලගේ පපුවට මූන තද කරගත්තේ ඉකි ගගහා... ඒත් එහ් ඉකිය ආයුශ්ට වඩා වේදනාවක් ගෙනාවේ නේහා ට...

" ම...ච්... "

කෙල්ලට එහ් වචන ටික ඇහුනේ හීනෙන් වගේ.... එහ් දැනුන වේදනාව කියන්න නම් කෙල්ලට වචන තිබුනේ නෑ....

මුලු සිරුර ම අප්‍රාණික වෙලා යනවා වගේ දැනෙද්දි කෙල්ල හුස්ම ගත්තේ පවා අපහසුවෙන්... දැන් කෙල්ලට හැමදේම තේරෙනවා..ආයුශ් එහ් තියන් හිටපු ෆොටෝ එකත් එහ් කෙල්ලගේ බව දැන් හොදට ම පැහැදිලි.....මීට වඩා එහ් හිතේ තව රිදෙන්න තැනක් ඉතුරු වෙලා නෑ... අඩන්නවත් හිනා වෙන්නවත් කෙල්ලට සිහියක් තිබුනේ නෑ.... ඒත් ආයුශ්ගේ ඊලග වචන ටික කෙල්ලගේ හිතට ගෙනාවේ යම් තරමක සහනයක්...

" එ...හ්...ත...ර..ම..ට...මත් වෛරත් කරනවා.... "

කලින් ඇහුන ඉකි බිදුම් හඩ වෙනුවට මේ පාර ඇහුනේ තරහත් එක්ක ආව කටහඩක්....

" ඇයි... "

නේහා ඇහුවේ හීනෙන් වගේ...හරිනම් මේ වෙද්දි කෙල්ලගේ ඇස් වලට කදුලු උනලා තියෙන්න ඕනි...ඒත් කෙල්ල උන්නේ අසිහියෙන්... එක කදුලක් වත් එහ් ඇස් වල තිබුනේ නෑ....

දුක දරා ගන්න බැරි තරමට ම වැඩි උනාම මිනිස්සුන්ට අඩන්නවත් සිහියක් නැති වෙනවා...හරියට ම නේහා ටත් උනේ එහ් දේ මයි....

" මත් පස්සේ කියන්නම්.... "

ආයුශ් කරේ නේහා ගේ එහ් ප්‍රශ්නේ මග හැරපු එක....

" එයා ඔයාගේ ආදරේ නම්...මත් ඔයාගේ කවුද ආයුශ්.... "

ඉවසලා ඉවසලා බැරිම තැන නේහා ගෙ මුවින් පිට උනේ එහ් වචන ටික විතරයි...ඒත් කෙල්ල ට ආයුශ් ගෙන් ලැබුනේ කිසිසේත්ම බලාපොරොත්තු නොවුන පිලිතුරක්...

" එහ් මගෙ ආදරේ....උබ මගෙ හුස්ම ටික.. මත් එහ් ආදරේ නැතුව ජීවත් උනා නේහා...අදටත් ජීවත් වෙනවා...හැබැයි මගෙ හුස්ම ටික නැතුව මට එක තත්පරයක් වත් ජීවත් වෙන්න බෑ....එදට මත් මැරිලා යයි...."

sinhalaebooks.com

ආයුෂ් ගේ වචන පිටතට නෑසෙන තරමට ම දුවර්ල වෙලා තිබුනත් එග් වචන කෙල්ලගේ හදවතේ ගැබුරුම තැන සටහන් වෙලා ඉවරයි.....

" ආ...යු...ශ් ..... "

කෙල්ල ආයුශ් ගේ නම කිවුවේ එහ් වචන විශ්වාස කරන්න බැරි තැන... කොල්ලා කරේ කෙල්ලගේ උනුහුමට තවත් ලන් උන එක විතරමයි....

ආයුශ් ව තමන් ලගින් ඈත් කරන්න කෙල්ලටත් හිත දුන්නේ නෑ.... නේහා ත් ආයුශ් ලග එක තත්පරයක් හරි ගෙවන්න පුදුම විදිහට ආසා කරා...

ඒත් හිතට වද දෙන්න ප්‍රශ්න ආයුශ් ගෙන් අහනකම් කෙල්ලගේ හිතටනම් සැනසීමක් තිබුනේ නෑ...

" එයා ආයෙත් ආවොත්... "

නේහා ඇහුවේ තමන් ගේ වචන වලින් තමන්ව ම රිද්ද ගනිමින්...

" එතකොට මේ බඩේ මගෙ පැටියෙක් ඉදියි... "

ආයුශ් කිවුවේ නේහා ගේ ගවුම උඩින් නේහා ගේ බඩ ලගින් අත තියලා..කොච්චිර උනත් ආයුශ් ගේ එහ් කතාවට නම් නේහා ගේ ඇස්වලට කදුලු ඉනුවා...ඕනවටත් වඩා කෙල්ල හැගීම් බර උනා....

" එතකොට... "

" එතකොට මත් කොහොමද යන්නේ... "

" අනේ ආයුශ්.... "

කෙල්ල ඉකි බිදුම් අතරින් ම තමන් ගේ පපුවට මූන තියන් හිටපු ආයුශ් ගේ ඔලුව අත ගෑවා... ආයුශ් කරේ හෙමීට ඔලුව උස්සලා නේහා ගේ කම්මුල් සිප ගත්ත එක....

" ඊට කලින් ආවොත්... "

නේහා කිවුවේ ආයුශ් ලග කවදාවත් නැති විදිහට හුරතලෙන්... කොල්ලා නේහා දෙතොල් වලට බර උනේ හිනාවකුත් එක්ක....

" එහෙනම්...දැන් ම එයාව ගේමු... "

sinhalaebooks.com

කෙල්ලගේ මූන ලැජ්ජාවෙන් රතු වෙද්දි ආයුශ් කරේ නේහා ගේ දෙතොල් සිප ගත්ත එක... එහ් පහසින් මිදෙන්න කෙල්ලටත් උවමනාවක් තිබුනේ නෑ..නේහා කරේ ආයුශ් ගේ ඔලුව අත ගාලා කොල්ලට තවත් අනුබල දුන්න එක....

විනාඩි ගානක සිප ගැනීමකින් අනතුරුව කොල්ලා දෙතොල් ඉවත් කරේ නේහා ගේ නලලත් සිප ගන්න ගමන්... ඒත් කෙල්ල උන්නේ එහ් ස්පශර්ය ආයෙමත් විදින්න ලෝබ කමින්... ඒක කොල්ලට නම් අගේට තේරුනා...

" දැන් ඇති මැතික....නැත්නම් මන් ගොඩක් රිද්දයි.... "

" කමක් නෑ... "

" පිස්සු කෙල්ල... දැන් නිද ගමු... කෝ එන්න..."

ආයුශ් කිවුවේ කෙල්ලව පපුවට තුරුල් කරගෙන...නේහා නීතියෙන් තමන් ගේ බිරිඳ උනත් ආයුශ් තමන් ගේ අයිතිය වත් ලබා ගත්තේ නෑ...ඔහු කරේ නේහා ගේ දෙතොල් සිප ගත්ත එක විතරමයි.... අසිහියෙන් නෙමෙයි...සිහියෙන් ම ගතිකාවන්ගේ පහස ලබපු ආයුශ් නේහා ඉස්සරහා මේ විදිහට හැසිරෙන එකම මදිද ආයුශ් ගේ ආදරේ ඔප්පු වෙන්න... කෙල්ලගේ හිතට දැනුනේ පුදුම තරම් සතුටක්... එහ් තරම් සැහැල්ලු සතුටක් කෙල්ල මීට කලින් විදලා තිබුනෙම නෑ....

ආයුශ් ගේ පරන ආදරේ නේහා ගේ හීන බලාපොරොත්තු නැති කරලා දයි කියලා කෙල්ලට බයක් නොදැනුන ම නෙමෙයි...ඒත් කෙල්ල උන්නේ මේ සතුට හිතේ හැටියට විදිමින්...

" සුදු මැතික.. "

" ආ..යු...ශ්.... "

" අපි අලුතෙන් ජීවිතේ පටන් ගමු...මන් මගෙ කෙල්ලව පරිස්සමට බලා ගන්නවා...මන් අරුන් දෙන්නට පෙන්නනවා මගෙ කෙල්ලට මාත් එක්ක සතුටින් ඉන්න ඇස් දෙකක් ඕනි නෑ කියල...උන් හැදුවේ මගෙ කෙල්ලව මගෙන් ඈත් කරන්නනේ... "

ආයුශ් යම් තරමක කේන්තියෙන් මේ කියන්නේ මලීශ් සරණි ගැන කියල කෙල්ල දැනන් උන්නා... එහ් වගේ ම කෙල්ලගේ හිතට දැනුන සතුටත් එහ් වචන එක්ක නැති වෙලා ගියා..එහ් මොහොතෙයි කෙල්ල තීරනය කරේ කවදවත් ම ආයුශ් ට ඇත්ත දැනගන්න තියන් නෑ කියලා... මේ ආදරේ නැති කරගන්න එහ් තරමට ම කෙල්ලගේ හිත ලෝබ උනා....

" නේහා... "

" ආයුශ්... "

sinhalaebooks.com

" මොනවද කල්පනා කරන්නෙ.."

" මො...මො...කු...ත්...නෑ..."

" ම්ම්ම්ම්... දැන් නිදා ගන්න...අදින් පස්සේ මගෙ කෙල්ලගේ හැම වැඩක් ම වෙන්නේ මත් අතින්... හරි ද... ඔයාට තියෙන්නේ මැනික මත් ලගට වෙලා ඉන්න විතරයි...ඔෆිස් යද්දිත් මාත් එක්ක යත්...මට පුලුවන් මගෙ මැනිකව බලා ගන්න... "

ආයුශ් කෙල්ලව තවත් පපුවට තුරුල් කරන් කියද්දි කෙල්ල එහ් උනුහුම විද ගත්තේ හිතට දැනුන වේදනාවත් එක්ක...
ආයුශ් රට ගියපු වැඩෙත් හිතුවටත් වඩා සාර්ථක වෙලා තිබුනා... ආයුශ් ගේ කම්පැනි එකේ නැති උන සල්ලි වලින් බාගෙකටත් වඩා ආයුශ් ගේ project එකෙන් ආපහු ලැබිලා තිබුනා...

එහ් හින්ද ම ආයුශ් ගේ තාත්තා හිටියේ ආයුශ් ගැන පුදුම පැහැදීමකින්...ආයුශ් ගේ දක්ශතාව හින්දම අලුත් project කීපයක් ම කම්පැනි එකට ලැබිලා තිබුනා... ඒත් ඒවගේ මීටින් වලට ආයුශ් ව යවන්න ආයුශ් ගේ තාත්තාට හිත නොදුන්නේ ආයුශ් ට නේහා එක්ක නිදහසේ ඉන්න ඉඩ දෙන්න ඕනි කියලා ආයුශ් ගේ තාත්තා හිතපු නිසා....

එහ් හින්ද ම ඊලග මීටින් එකට ආයුශ් ගේ තාත්තම යන්න හිතුවා..තනියම නෙමෙයි....ආයුශ් ගේ අම්මා එක්ක ම...එතකොට ආයුශ් ට ටික දවසක් හරි නේහා එක්ක නිදහසේ මේ ගෙදර ඉන්න ලැබෙයි කියන එකත් ආයුශ් ගේ තාත්තාගේ එහ් තීරනේ යටි අරමුනක්...

ආයුශ් ට මේ ගැන කියන්න හිටියත් ආයුශ් ඩිනර් එකට පහලට ආවේ නැති හින්ද ම ආයුශ් ගේ තාත්තා හිතත් හිටියේ මේ බව කොල්ලට හෙට කියන්න කියලා...

පහුවද උදේ ඇහැරෙද්දි කෙල්ල උන්නේ ආයුශ් ගේ පපුවට ගුලි වෙලා...ආයුශ් ඇහැරෙද්දි තමන් ගේ පපුවේ ඉන්න නේහා ව දකිද්දි කොල්ලගේ හිතේ තිබුන හැගීම් තවත් වැඩි උනා....කොල්ලා නේහා ගේ ඔලුව අත ගෑවේ කෙල්ලට ඇහැරෙන් නැති වෙන්න....

නේහා එක්ක පටන් ගන්න යන මේ අලුත් ජීවිතේ ගැන ආයුශ් ගේ හිතේ හීන කෝටියක් මේ වෙද්දි ගොඩ නැගිලා තිබුනා...එහ් හීන වල ඉහලින් ම තිබුනේ ඇස් පේන් නැති නේහා ව මලක් වගේ පරිස්සම් කරන එක...බලා ගන්න එක...

කොල්ලා ජීවිතේ හිතා ගන්නවත් බැරි තරම් කැපකිරීම් කරපු කෙනෙක්... එහ් කැපකිරීම් වෙනුවෙන් කොල්ලට හැමදම ලැබුනේ රැවටීම් විතරයි...

sinhalaebooks.com

ඊට පස්සේ කොල්ලා හිතක් පපුවක් නැති තිරිසනෙක් උන එක ඇත්ත....දූශිත ජීවතයක් ගත කරපු බවත් ඇත්ත... ඒත් එහ් නැති වෙලා ගියපු ගතිගුන ආයෙම ඉස්මතු කරලා ගන්න පුලුවන් උනේ නේහා ට විතරමයි...

එහ් නේහා ගේ ආයුශ් දැක්ක අවංකකම ට... හැමදම කැපකිරීම් කරපු කොල්ල වෙනුවෙන් මේ තරම් ලොකු කැපකිරීමක් කෙරුව එකම කෙනා නේහා...කොල්ලා හිතුවේ එහෙම...එහ් කෙල්ලගේ ඇස් දෙකටත් වඩා කෙල්ලට ආයුශ් ව වටින හින්ද... එහ් පොරොන්දුව වටින හින්ද... එහ් හින්ද ම කොල්ලා නේහා වෙනුවෙන් නේහා ගේ ජීවිතේ වෙනුවෙන් අද ඉදන් හැම තත්පරේ ම කැප වෙන්න තමන් ට ම පොරොන්දු උනා...තාමත් තමන් ගේ පපුවට ගුලි වෙලා ඉන්න නේහා දිහා බලලා කොල්ලා හිතේ අලුතින් ගොඩ නැගෙන බලාපොරොත්තු හීන එකින් එක ඉශ්ට කරන්න මහා ගොඩක් හීන දැක්කා....
කෙල්ල ඇහැරෙනකම්ම කොල්ලා බලන් උන්නේ කෙල්ලගේ මූන දිහා...කෙල්ලව තනියම දලා ඇහැරෙන්න කොල්ලගේ හිත ඉඩ දුන්නේ නෑ... විනාඩි 30ක් 45ක් වගේ කොල්ලා එහ් විදිහට ම ඉන්න ඇති.... ඊට පස්සෙයි කෙල්ල ඇහැරුනේ...ඇස් අරිද්දි ම ආයුශ් ගේ ඇස් දෙක පේද්දි කෙල්ල බොහොම අමාරුවෙන් ඉවත බලා ගත්තේ ආයුශ් ට සැක හිතෙයි කියලා දැනුන බයට....ඒත් කොල්ලට නම් එහ් ගැන ගානක් තිබුනේ නෑ...

" නිද ගන්නවා කියලා ඔහොමත් නිද ගන්නවද.."

කොල්ලා ඇහුවේ හිනා වෙවීම කෙල්ලගේ ඔලුව අත ගාලා...

" අනේ සොරි ආයුශ්...මන්....ඉන්න...මන්..තේ එකක් හදන් එන්නම්..."

කෙල්ල එහෙම කියන ගමන් ම නැගිටින්න හදද්දි කොල්ල කරේ කෙල්ලව ඇදලා අරන් පපුවට තුරුල් කරගත්ත එක...

" ආ...යු...ශ්..."

" දැන් 8ටත් ලගයි නේහා...වොශ් එකක් දන් පහලට යමු...අම්මා බලන් ඇති..."

" අනේ එච්චර වෙලා ගිහින් ද..."

" හ්ම්...ඔයා වොශ් දනවද නැත්නම් මන්..."

ආයුශ් කියන්න ගිය වචන ටික ගිල ගත්තේ හිනාවකුත් එක්ක...

" නෑ..මට...පුලුවන් ආයූ...."

නේහා කිවුවේ එහ් වචන ටික එක්ක ම කොල්ලගේ මූනේ මැවුන හිනාව නැති වෙලා යද්දි...

" හරි යන්න... "

sinhalaebooks.com

කොල්ලා එහ් වචන ටික විතරක් කියලා ඇදෙන් නැගිට්ටේ කෙල්ලව පපුවෙන් ඈත් කරලා...ආයුශ් ගේ මූන දිහා ඇස් කොනින් බලන් හිටපු නේහා ට කොල්ලගේ මේ වෙනස හොදට ම පෙනුනා... ඒහ් එක්කමයි කෙල්ලට මතක් උනේ එක දවසකුත් ආයුශ් ට ආයු කියල කොල්ලගේ හැසිරීම...

" ඇයි ආයුශ්...එයත් ඔයාට කිවුවේ ආයු කියල ද..."

නේහා ඇහුවේ ආයුශ් කිසි සේත්ම බලාපොරොත්තු නොවුන දෙයක්... කොල්ලා එක පාරම ගැස්සුනේ එහ් හින්ද...

" හ්ම්.... "

කොල්ලා කිවුවේ එච්චරයි...

" මන් එහෙනම් ආයේ නොකියා ඉන්නම්..."

නේහා අහිංසක විදිහට හිනා වෙලා කියද්දි අයුශ් ගේ හිත පිච්චිලා ගියා...

" එපා මැනික...එහෙම කියන්න...ආයේ මන් මොකුත් කියන් නෑ...."

ආයුශ් නේහා ලගට ඇවිත් කිවුවේ කෙල්ලගේ ඔලුවත් අත ගාලා...

කෙල්ල වොශ් රූම් එකට ගිය අතරතුර කොල්ලා කරේ බෙඩ් එක අස් කරපු එක... ඊලගට කෙල්ල එලියට ආවම කොල්ලා වොශ් රූම් එකට ගියා... කොල්ලා ආයෙම එලියට එද්දි නේහා උන්නේ ලෑස්තිත් වෙලා..කොන්ඩේ පීරන ගමන්...

ආයුශ් ඇදුමකුත් ඇදගෙන කෙල්ල එක්ක ම පහලට යද්දි ආයුශ් ගේ අම්මා වගේ ම තාත්තා ත් පහල කෑම මේසෙට වෙලා බලන් ඉන්නවා....

කෙල්ලට අදත් කෑම කැවුවේ ආයුශ්..කෑම කාලා ඉවර වෙද්දි ම ආයුශ් ගේ තාත්තා කතාව පටන් ගත්තේ ආයුශ් ගේ අම්මා දිහත් බලලා...කොල්ලා නම් උන්නේ නේහාගේ කට කොනක ගෑවිලා තිබුන කෑම අතින් පිහින ගමන්....

" පුතා...මට පුතාට දෙයක් කියන්න තියනවා.... "

" කියන්න තාත්තා... "

" එද ඔයා මීටින් එකට ගියාට පස්සේ තව මීටින් දෙක තුනක් ම තියනවා අලුතෙන් ඕගනයිස් උන... "

sinhalaebooks.com

ආයුෂ් ගේ තාත්තා කියද්දි නේහා ගේ වගේ ම අයුෂ් ගේ මූනුත් අඳුරු වෙලා ගියා...එහ් ආයුෂ් ට ආයෙ ම රට යන්න වෙයි කියලා දෙන්න ම හිතපු නිසා...

" කවද්ද තාත්තා.... "

" අනිද්ද ත් එකක් තියනවා පුතා... "

" එහ් කියන්නේ තාත්තා..මන් යන්න ඕනි ද.."

" නෑ පුතා...මන් බැලුවේ අම්මා එක්ක ම ගිහින් එන්න... පුතා දූ එක්ක ගෙදර ඉන්න..එහ් දවස් ටික ඔෆිස් යන්න ඕනි ත් නෑ...මන් වැඩ ටික කාට හරි බාර දීලා යන්නම්... "

නේහා ට එහ් වචන ටික ඇහුනේ හීනෙන් වගේ... එහ් වචන ටිකත් එක්ක ම කෙල්ලගේ අඳුරු වෙලා තියන මූනට හිනාවක් ආවේ තත්පර ගානෙන්....

ආයුෂ් ගේ තාත්තා එහ් දිහා බලන් හිටියේ පුදුම තරම් සතුටකින්...

" ඒත් තාත්තා...."

" මමයි අම්මයි හෙට යනවා පුතා..පුතාට ඒයේ කියන්න හිටියේ..අපි ගියාම පුතාට පුලුවන්නේ දූ ව බලා ගන්න... "

ආයුෂ් ගේ තාත්තා නේහා දිහා බලලා හිනා වෙලා කියද්දි ආයුෂ් ගේ මූනටත් හිනාවක් ආවේ ඉබේමයි...

එද දවසම ගෙවිලා ගියේ එහ් ගමන් වෙනුවෙන්..ආයුෂ් ගේ පවුලේ අයට නම් රට යනවා කියන දේ නිකන් සාමාන්‍ය දෙයක්...මොකද ආයුෂ් ආයුෂ් ගේ අම්මා තාත්තා නංගි මේ හැමෝම වැකේශන් වලට කරේ තමන් ආසා රට වලට ගිහින් ආව එක..මොකද සල්ලි වලින් කිසිම අඩුවක් කවදවත් ම තිබිලා නැති නිසා....

පහුවද ආයුෂ් එයාපෝර්ට් එකට ගියේ අම්මයි තාත්තා වයි එක්කගෙන... නේහා නම් කරේ ආයුෂ් ගේ අම්මා එක්ක මොන මොනවදෝ කියවපු එක...සැරින් සැරේ ඇහුන හිනා හඬවල් එක්ක ඉස්සරහා ආසනේ හිටපු ආයුෂ් වගේ ම ආයුෂ් ගේ තාත්තා ත් හැරිලා බලද්දි ආයෙ ම හිනාව නවත්ත ගන්නවා...

මේ වෙද්දි නේහා යි ආයුෂ් ගේ අම්මයි අතර තිබුනේ අම්මයි දූවගෙයි බැඳීමටත් වඩා සමීප බැඳීමක්..එහ් ගැන හිතද්දි පවා ආයුෂ් ට දැනුනෙ සතුටක්...

sinhalaebooks.com

අම්මයි තාත්තා වයි එයාපෝර්ට් එකට දාලා ආයුශ් නේහා එක්ක ගෙදර යන්න ආවත් මගදි කොල්ලගේ අදහස වෙනස් උනේ එක පාර ම... කොල්ලා කාර් එක මලීශ් ගේ ගෙවල් පැත්තට හැරෙව්වේ හිතට ආව ක්ශනික අදහස නිසා....

කෙල්ල නම් දැක්කා..මේ යන පාර වෙනස් කියලා...ඒත් අහන්න බැරි කමට කෙල්ල උන්නේ නිහඬව....
ටික දුරක් ගිහින් ආයුශ් වාහන අඩු ටිකක් පාලු තැනක කාර් එක නැවැත්තුවේ නේහා දිහ ත් බලන ගමන්...

" සුදු මැනික... "

" ආ...යු.... "

කෙල්ල දැන් කතා කරන්නෙ ම එහ් නමින්...කෙල්ල එහ් නමට මේ වෙද්දි පුදුම තරම් ආසයි... ආයුශ් උනත් කෙල්ල ආයු කියලා කතා කරද්දි හිත ඇතුලේ තියන අදුරු මතක වෙනුවට නේහා එක්ක මතක එකතු වෙනවට කැමැත්තෙන් හිටියේ.....එහ් හින්ද ම කොල්ලත් එහ් නම නේහා ගේ කටින් අහන්න ආසා උනා... මේ වෙද්දි ආයුශ් ට එහ් නම හුරු පුරුදු නමක් උනේ එහ් විදිහට....

" අපි කොහෙද යන්නේ කියලා දන්නව ද ම්ම්ම්ම්.... "

ආයුශ් කෙල්ලගේ ඔලුව සීරුවට අත ගාලා ඇහුවා...කෙල්ල කරේ නෑ කියන්න ඔලුව හොල්ලපු එක...

" මලීශ් ගේ ගෙදර... "

" ඇ...යි....එ...හේ....හ...දි...ස්...සි...යේ.... "

නේහා ගේ හිතේ තිබ්බ නිදහස එහ් වචන ටිකෙන් නැති වෙලා ගියේ ආයුශ් ට මොනා හරි දැනගන්න ලැබෙයි කියන බයට.... ආයුශ් තමන් මේ කරන්නේ බොරුවක් කියලා දැන ගත්තොත්...එතනින් එහාට හිතන්න පවා කෙල්ල බය උනා...මේ වෙද්දි කෙල්ලට ඇස් දෙකක් එපා කියලා දැනුනත් කරගන්න දේවල් හින්ද කෙල්ල උන්නේ කරගන්න දෙයක් නැතුව අසරණ වෙලා...එහ් ඇස් වලින් රූපයක් දකින වාරයක් පාසා ම කෙල්ලගේ පපුව පිච්චෙනවා... එහෙම කෙල්ලට ආයුශ් ඇත්ත දැනගත්තොත් දරාගන්න බැරුව ම මැරිලා යයි..මොකද දැන් කෙල්ලගේ මුලු ජීවිතේ ම ආයුශ්...

" නෑ..මට ඌට පෙන්නන්න ඕනි... "

" මො..ක..ක්...ද.. "

" ඔයාව සතුටින් තියන්න ඇස් දෙකක් ඕනි නෑ කියලා... "

sinhalaebooks.com

ආයුෂ් කිවුවේ පුදුම තරම් තරහකින්..

" අ...නේ...ආ...යු...අ...පි...වෙ...න...දවසක... යමු ද...අනික මලීශ් අයියට බනින්න එපා ආයු...එයා...එයා ඔයාගේ සහෝදරයා නෙහ්...අනික...එයා මටත් ගොඩක් ආදරෙයි..... "

කෙල්ල අමාරුවෙන් වචන එකතු කරලා කියද්දි ආයුෂ් මොහොතක් කෙල්ල දිහා බලන් ඉදලා ආයෙ ම කාර් එක ස්ටාට් කරේ කලින් ට වඩා වේගෙන්...

" ආ...යු...ඇ...යි...මේ... "

කෙල්ල ඇහුවේ වෙවුලමින්...ඒත් කොල්ලා කරේ කාර් එකේ වේගේ වැඩි කරලා කාර් එක ආපහු හරව ගත්ත එක...

" අ...පි...අ...පි..කො...හෙ..ද...මේ...ය...න්..නේ..... "

නේහා අහපු දේට ආයුෂ් ගෙන් උත්තරයක් නම් ලැබුනේ නෑ...කොල්ලා කරේ එහ් ස්පීඩ් එකෙන් ම කාර් එක ඩ්‍රයිව් කරපු එක... කෙල්ලගේ හිතට බයක් නොදැනුන ම නෙමෙයි...ඒත් එහ් බය අඩු වෙල ගියේ මේ ගෙදර ට යන පාර කියලා කෙල්ල අදුන ගත්ත නිසා... ඒත් ආයුෂ් ට මේ තරමට ම තරහා යන්න හේතුව නම් මොකක් ද කියලා කෙල්ල දැනන් උන්නේ නෑ... කෙල්ල උන්නේ අහන්නත් බැරි කමට කට පියාගෙන..මොකද ආයෙ ම මොනා හරි ඇහුවොත් කොල්ලට තවත් තරහා යයි කියලා කෙල්ල හොදට ම දැනන් හිටියා...

කාර් එක ගේට් එකෙන් ගේ ඇතුලට අරන් කොල්ලා කාර් එක එහෙම්ම ම නවත්තලා නේහා වත් කාර් එකෙන් බස්සලා කෙල්ලගේ අතින් අල්ලගෙන ම උඩ රූම් එකට ආවේ කිසිම කතා බහක් නැතුව...ඒත් කොල්ලා ඉන්නේ තාමත් තරහින් කියලා කෙල්ලට දැනුනේ කොල්ලා ඇවිදින වේගේ වගේ ම කොල්ලා හයියෙන් හුස්ම ගන්න නිසා..ඊටත් වඩා කොල්ලගේ ඇස් දෙක ම රතු වෙලා තිබුනේ...කෙල්ලගේ අතින් අල්ලගෙන හිටපු තැන පවා රතු වෙලා රිදුම් දෙන්න ගත්තා...

කොල්ලා රූම් එක ඇතුලට ගියපු ගමන් ම රූම් එකේ දොර වැහුවේ පුදුම සද්දෙකින්....එහ් සද්දෙට කෙල්ල ගැස්සිලා ගියා... ඊලගට කෙල්ලව එහෙම්ම ම ඇදට තල්ලු කරේ හිත ඇතුලේ ඉන්න යක්ශයා ආයෙ ම අවදි වෙද්දි...

ඊලගට කොල්ලා එහෙම්ම ම ආවේ කෙල්ලගේ ඇග උඩට... නිකන් ම නෙමෙයි...කෙල්ලට රිදෙන තරමටම එහ් ඇගේ බර කෙල්ලගේ ඇග මතට දලා...

කොල්ලා හයියෙන් හුස්ම ගන්න ගමන් ම එක අතක් කෙල්ලගේ ඔලුවෙන් තියලා මූනට එබුනේ කිසි දෙයක් හිතා ගන්න බැරුව කෙල්ල දියෙන් ගොඩ දපු මාලුවෙක් වගේ ගැහෙද්දි...

sinhalaebooks.com

" අ..නේ..ආ..යු..මො..ක...ද...මේ "

" ම...ට...ව...ඩා...මලීශ් ව ද ලොකු..අර සරණී ව ද ලොකු... "

ආයුශ් ඇහුවේ කෙල්ලගේ ඔලුවේ තියන් හිටපු අතින් කෙල්ලගෙ කෙස් වැටිය කෙල්ලට රිදෙන තරමට ම මිරිකලා...

" ම..ත්...එ...හෙ...ම...කි.....වු..වේ...නෑ...නේ ආ...යු...ශ් .. "

කෙල්ල උන්නේ අඩන්න ඔන්න මෙන්න තියලා...ඒත් කොල්ලා නම් හිටියේ එන්න එන්න ම තරහා වැඩි වෙමින්....

" එහෙනම් කිවුවේ..උන්ට බනින්න එපා කියලා... "

" මන් එහෙම කිවුවේ එහ් ඔයාගේ සහෝදරයා හින්ද...මන් හින්ද ඔයා රන්ඩු කරගන්නවට කැමති නැති හින්ද...නැත්නම් මට ඔය කාවවත් ලොකු නෑ ආයුශ්..මට ඔයා...ඔයා මට මගෙ ජීවිතේ.... "

කෙල්ල අමාරුවෙන් වචන එකතු කරගෙන ඉකි ගගහා කියද්දියි කොල්ලාට යාන්තමට හරි සිහියක් වගේ... එහ් සැනින් ම කොල්ලා හිර කරන් හිටපු කෙස් ටික ලිහිල් කරේ සුසුමකුත් පිට කරලා...

ඒත් කෙල්ලගේ ඉකිය නම් නැවතුනේ නෑ....කොල්ලා තාමත් ගැහි ගැහී අඩන කෙල්ල දිහා ටික වෙලාවක් බලන් ඉදලා ආයෙම කෙල්ලගේ මූනට එබුනේ තමන් හැසිරුන විදිහ ගැන පුදුම විදිහට පසුතැවෙද්දි....

" සො...රි...නේ...හා...සො...රි.... මට අමතක වෙනවා මයෙ අම්මා...උබ...මන් වෙනුවෙන් කරන්න පුලුවන් උපරිම කැපකිරීමත් කරලා ඉවරයි කියලා.... උබ එහෙම කරලා තියෙද්දි ත් මන්...මන්..මෝඩයෙක් වගේ උබට
රිද්දුවා...ම..ට...ස...මා...වෙ..න්...න....රත්තරන්...මන්...මන්....මහා පව්
කරයෙක්...මට...මට...බයයි...උබවත් මට නැති වෙයි කියලා....... "

ආයුශ් පිටතට නැසෙන තරමට ම වචන පටලවමින් කියලා නේහා ගේ මූන නොනවත්වාම සිප ගත්තේ අඩ අඩ ම...

" අඩන්න එපා...මන් තරහා නෑ... "

නේහා කදුලු අතරින් ම හිනා වෙලා කිවුවත් කොල්ලා කරේ කෙල්ලව බදගෙන අඩපු එක...

sinhalaebooks.com

" උබ හිතනවා ඇති මන් මහා තිරිසනෙක් කියලා..ඇස් දෙකවත් සනීප කරගන්න නොදෙන...නෑ රත්තරං මන්..මන් එච්චර තිරිසනෙක් නෙමෙයි....මට...මට බෑ ආයෙම එහ් දුක විදින්න...ඒකයි මන් උබ සනීප වෙනවට අකමැති..නැතුව මන්...මන්...තිරිසනෙක් නෙමෙයි සුදු මැනික...මන්..මන්...කැමති නෑ උබ කාටවත් ම ඕනවට වඩා ලන් වෙනවට..මලීශ් ට සරණී ට උනත්...මට බයයි සුදු මැනික.... "

ආයුශ් කිවුවේ නේහා ගේ ඇගට තවත් ගුලි වෙලා... කෙල්ල උන්නේ ආයුශ් බය මොකට ද කියලා කිසිම දැනීමක් නැතුව උනත් කොල්ල කියන දේ මොකක් වෙන්න ඇති ද කියලා හිතන ගමන්..

" හෙට යමු...මාත් එක්ක ගමනක්...උදෙන් ම යමු සුදු මැනික...මට උබට කියන්න කතාවක් තියනවා...එතකොට උබ තේරුම් ගනියි හැමදේම...මන්...මන් ඇයි මෙහෙම හැසිරෙන්නේ කියලා... "

ආයුශ් එහෙම කියන ගමන් ම ඇදෙන් නැගිට්ටේ ඇස් වල කදුලු අත්ලෙන් පිහදන ගමන්...ඒත් නේහා තත්පරයක් වත් පමා නොවී ආයුශ් ගේ පපුවටවිතුරුල් උනේ මොහොතකටවත් කොල්ලට තනිකමක් දැනෙන්න නොදී...

" ආයෙත් කවදාවත් ම මන් දුක් විදින්න දෙන් නෑ...හෙට අපි කොහේ ගියත් ඔයා මගෙ...මගෙම විතරයි.... "

නේහා එහ් වචන කිවුවා නෙමෙයි...කෙල්ලගේ කටින් පිට උනා... ඒත් කෙල්ල එක දෙයක් අද හොදට ම දැනගත්තා...මලීශ් ගැන අද අර විදිහට කතා කරා කියලා ආයුශ් ට අද මේ තරම් කේන්ති ගියා නම් ඇත්ත දැනගත්තොත් එදට... එදට හිතා ගන්නවත් බැරි තරමට දෙයක් වෙයි කියලා... එහ් හින්ද ම කෙල්ල දෙවියන්ගෙන් ඉල්ලුවේ මේ රහස හැමදම රහසක් විදිහට ම තියාගන්න උදව් කරන්න කියලා.... ආයුශ් ව කවදාවත් ම උදුර ගන්න එපා කියලා...

ඒත් හෙට යන ගමන...එහ් තරම්ම වේදනාකාරී දෙයක් වෙයි කියලා කෙල්ල කීයටවත් ම හිතුවේ නෑ...
පහුවද උදේ කෙල්ල වෙනදට කලින් ම ලෑස්ති වෙලා නිදගෙන ඉන්න ආයුශ්ට තේ එකකුත් හදගෙන ඇවිල්ලයි කොල්ලට කතා කරේ... කොල්ලා වොශ් එකක් දගෙන එනකම් කෙල්ලට ලෑස්ති වෙන්න කියලා ආයුශ් වොශ් රූම් එකට ගියා... නේහා විශේෂ හේතුවක් නැති උනත් හිතට ආවා ක්ශනික ආසාව හින්ද ම සාරි එකක් ඇන්දා... මොකද කෙල්ල දැනන් හිටියෙත් නැතේ අද යන ගමන මොනවගේ එකක් වෙයි ද කියන්න... ආයුශ් වොශ් එකක් දන් රූම් එකට එද්දි ඉස්සරලාම දැක්කේ බැල්කනි එක දිහා බලන් ඉන්න කෙල්ලව... නේහා හිටපු අහිංසක පෙනුමට කොල්ලට කෙල්ලට කිස් එකක් නොදී ඉන්න බැරි උනා.... එහ් හින්ද ම කොල්ලා නේහා ගේ කම්මුලක් සිප ගත්තේ හිනා වෙවීම... ඊලගට මේසේ උඩ තිබුන තිමුන තේ එකත් බීලා උගුරට දෙකට....

sinhalaebooks.com

" මට විනාඩි 5ක් දෙන්න...මත් ඉක්මනට ලෑස්ති වෙන්නම් නේහා... "

කොල්ලා නේහා දිහා බලලා කියද්දි කෙල්ල හා කියන්න ඔලුව හෙල්ලුවා...

කොල්ලා අකමැත්තෙන් උනත් අද ඇන්දේ කොල්ලා කාලෙකට කලින් ආසම උන ඇඳුමක්...එග් ඇඳුම අද මේ මොහොතේ දැක්කත් කොල්ලා අතීතෙට ඇදිලා යන්නේ කොල්ලටත් නොදැනිම.... කොල්ලා එග් ඇඳුම පවා තියලා තිබ්බේ අල්මාරියේ ඇතුලට වෙන්න.. කාටවත් ම නොපෙනෙන විදිහට...

අද එග් ඇඳුම අරන් කොල්ලා මුලින් ම කරේ සුසුමක් පිට කරපු එක..ඊලගට ඇඳුම ඇදගෙන කෙල්ල ඉස්සරහට ආවේ කලින් මූනේ තිබුනහිනාව නැත්තට ම නැති වෙලා යද්දි...

ඉවත බලන් හිටියත් ආයුශ් ගේ මේ හැම ඉරියව්වක් දිහා ම හොරැහින් බලන් හිටපු නේහා ගේ හිතට ගෙනාවේ පුදුම වේදනාවක්...අහන්න බැරි කමට කෙල්ල කට පියන් උන්නත් ආයුශ්ට වඩා වේදනාවක් කෙල්ලගේ හිතේ තිබ්බා....

" යමු ද... "

ආයුශ් කෙල්ල දිහා බලන් කියද්දි කෙල්ල හැමදම වගේ කරේ ඔලුව හොල්ලපු එක...ආයුශ් කෙල්ලගේ අතින් ම අල්ලන් ඇවිත් කෙල්ලව කාර් එකේ වාඩි කරලා දොරත් ලොග් කරලා ආපහු කාර් එකට ආවේ යන්න කලින් නේහා ට කියන්න ඕනි කියලා ඊයේ මුලු රෑම කල්පනා කරපු දේ කියන්න හිතාගෙන...

" නේ...හා... "

" ආ...යූ... "

" මට යන්න කලින් කියන්න දෙයක් තියනවා.... "

" මොකක්ද.."

" හැබැයි මේක අහලා ඔයා කලබල වෙන් නෑ කියලා ප්‍රොමිස් උනොත් විතරයි කියන්නේ... "

" නෑ...ආ..යූ....මත් කලබල වෙන් නෑ.... කියන්නකෝ...ප්‍රො...මි...ස්..."

කෙල්ල නොසන්සුන් වෙලා තිබුන හිත සන්සුන් කරගන්න උත්සාහ කරමින් කිවුවත් කෙල්ල හිටියේ හොදට ම කලබල වෙලා...

" මේකයි නේහා... ම...න්....අ...පි...මේ...ය...න්...න...හදන්නේ මගෙ අතීතෙට... මගෙ ආදරේ හම්බුන තැනට...ටික කාලෙකට උනත්...මත් ජීවිතේ විදපු තැනට... "

sinhalaebooks.com

ආයුශ් සුසුමකුත් පිට කරලා පුදුම තරම් වේදනාවකින් කියද්දි කෙල්ලගේ හිතට එහ් තරම්ම වේදනාවක් දැනුනත් කෙල්ල මේ දේ බලාපොරොත්තු උනා..එහ් හින්ද ම කෙල්ලගේ මූවේ හිනාවක් මැවුනේ ආයුශ් බලන් ඉද්දි මයි...

" යමු ආයූ..ඔයා එක්ක ඕන තැනකට....අද ඔයාගේ හිතේ හිතන මේ තරම්ම කාලයක් කාටවත් ම නොකියා හිතේ හිර කරන් හිටපු හැමදේම මට කියන්න... "

නේහා අහිංසක හිනාවක් එක්ක කියද්දි කොල්ලගේ පපුව පිච්චිලා ගියේ මේ ආදරේ මීට කලින් හම්බුනා නම් දුක කියන දේ අදුරන්නෙවත් නැතුව තියෙන්න තිබුනා නේද කියලා හිත හඩා වැටෙද්දි....

අද හිතින් දුක් විදින හිතේ තියන හැමදේම නේහා ට කියනවා කියලා කොල්ලා හිතාගෙන කාර් එක ස්ටාට් කරේ කිසිම දෙයක් හන්ගන් නෑ කියලා තමන්ට ම පොරොන්දු වෙමින්... ආයුශ් කාර් එක අරන් ආවේ එදා ආයුශ් ගේ අත කැපුන දවසේ නේහා මුලින් ම ආයුශ් ට #ආයූ කිවුව වෙලේ කොල්ලා නේහා ට ත් බැනලා ආව තැනට... කාලෙකට කලින් ආයුශ් ගොඩක් ම ආදරේ කරපු වැව ලග පාක් එකට... එදා වගේ ම අද ත් එහ් පරිසරය එහ් විදිහට ම නිස්කලංකයි.....එදා වගේ ම පාර අයිනේ එදා වේල හොයා ගන්න වෙහෙසෙන අසරණ අය දෙතුන් දෙනෙක් ම හිටියා...තමන් ගේ ජීවිතේ මුලුමනින් ම වෙනස් කරපු ඇය ඇරෙන්න එහ් පරිසරය තාමත් එහ් වගේමයි..... කොල්ලා නිකමට අත් ඔරලෝසුව දිහා බලද්දි වෙලාව සටහන් වෙලා තිබුනේ උදේ 11 යි කියලා...රිදිලි බිදිල ඉහිරිලා තියන හිතට වෙලාව පවා එදා වගේ ම වෙද්දි දැනුන දුක වචන වලට පෙරලන්න බැරි තරම්...

කොල්ලා උන්නේ ඇස් වලින් ගලන් යන කදුලු අතරේ ගල් ගැහිලා....

ආයුශ් ට එහා පැත්තේ ආසනේ හොටපු නේහා මේ හැමදේම බලාගෙන....කිසි දෙයක් නොදන්නවා උනත් කෙල්ලට ආයුශ් ගැන දැනුනේ කියා ගන්න බැරි තරම් මහා දුකක්....ඒත් ඇයි මේ ඇස් වල කදුලු කියලා අහන්නවත් බැරි තරමට කෙල්ල උන්නේ අසරණ වෙලා...

ටික වෙලාවක් එහ් විදිහට ඉදලා ආයුශ් නේහා දිහාට හැරුනේ ඇස්වල කදුලු අත් දෙකෙන් ම පිහිදගෙන.....

" නේහා...මන් දන්නවා...ඔයාට මේ කිසි දෙයක් පේන්නේ නෑ කියලා..."

ආයුශ් සුසුමකුත් පිට කරලා කියද්දි කෙල්ලගේ පපුව පිච්චිලා ගියා..ආයුශ් ට වෙනසක් නොපෙනෙන්න කෙල්ල ලාවට හිනා උනේ පුදුම වෙහෙසක් දීලා....

" පෙනුන් නැති උනාට කමක් නෑ... මන් කියන්නම්.....ඔයාට පුලුවන්නේ හිතින් මවාගන්න... "

ආයුශ් ආයෙම පාරක් කියද්දි කෙල්ල හා කියන්න ඔලුව වැනුවා...

sinhalaebooks.com

" තේහා...මේක චූටී පාක් එකක්...පාර අයිනක තියන චූටී පාක් එකක්...මේ පාරේ වැඩිය වාහන යන්නේ නෑ.... ගොඩක් ම ඉන්නේ කපල්...."

" අපි මේ ඉන්නේ...එහ් පාර අයිනට වෙලා කාර් එක නවත්තලා...දැනෙනවද සීතලක්...එහ් ඇයි දන්නවද.... එහා පැත්තේ වැව... පාරත් වැවත් අතර චූටි ඉඩක් තියනවා...එහ් පාක් එකට යන පාර..."

" එහ් පාර අයිනේ.....ලොකු ගස් දෙක තුනක් තියනවා...ඒවාගේ යට ඉන්නවා ගොඩක් අසරන හිගා කාලා එදා වේල හොයා ගන්න අය... ටවුන් එකේ ඉන්න තහනම් කරලා හින්ද එයාලා ඉන්නේ මෙතන... එතකොට එයාලාට කීයක් හරි හම්බෙනවා නම් එහ් හම්බෙන්නේ අර කපල් වලින් නැත්නම් මේ පාක් එක බලන්න එන අයගෙන්...තේරුනා ද... "

ආයුශ් තේහා දිහා බලලා අහද්දි කෙල්ල ඔලුව හෙල්ලුවේ ඔව් කියන්න...හිතින් මවා ගන්නවා වෙනුවට කෙල්ල එහ් හැමදේම ඇස් දෙකෙන් ම දැක්කා...

" වැව ලගට බෙන්ච් දෙක තුනක් තියනවා... ඒත් කපල් යන්නේ එහ් තියන පාරෙන් උඩට ගිහින් පාක් එකට... කොහොම හරි මේ අයව පහු කරන් උඩ පාල් යන්නේ..."

කෙල්ල ආයෙම ඔලුව හෙල්ලුවා...

" දැන් මන් කතාව පටන් ගන්නම්..."

මේ තරම් වෙලා මේ තැනත් මෙතන ඉන්න අයවත් මෙතන වෙන්නේ මොකක් ද කියලත් ඇස් පේන් නෑ කියලා හිතන් ඉන්න තේහා ට හරිම පැහැදිලි ව තේරුම් කරපු කොල්ලා අන්තිමට කිවුවේ සුසුමකුත් පිට කරන ගමන්...කෙල්ලත් උන්නේ පිටතට ඇහෙන තරම ට ම පපුව ගැහි ගැහී...

" එතකොට මට වැකේශන් මැතික...මන්....මන් වැකේශන් එකට හැමදම ලංකාවට එනවා... එදත් මන් ආවේ හැමතැන ම ඇවිදින්න.......මලීශ් හිටියේ කැම්පස් එකේ...සරණී ත් ඉගන ගන්න තැන...ලංකාවට ආව ගමන් පොඩි කාලේ ඉදන් එකට හිටපු යාලුවෝ දෙන්නා ලග නැති උනා ම මට පාලු හිතුනා... මලීශ් ට කෝල් කරාම කිවුවා ඌටන්ලෙච්චස් කියලා... සරණී ට කෝල් කරාට සරණී ෆෝන් එකවත් ආන්සර් කරේ නෑ.... ඉතින් මන් තනියම ම මේ දැන් ඇදන් ඉන්න ශටර් එකයි දෙනිමයි ඇදගෙන කාර් එකට නැංගේ මැප් එකත් ඔන් කරගෙන... හිතෙන හිතෙන හැම තැනට ම ඇවිදින්න යන්න හිතාගෙන.... "

" මන්...මේ...දැන් ඉන්න තැනට ආවේ අහම්බෙන්.... මන් හරියට ම මෙන්න මේ තැන කාර් එක නවත්තල ලස්සන ට තිබුන හින්ද ටිකක් කාර් එකෙන් බැස්සා...දන්නවද...බහිනකොට ම මන් දැකපු දේ....මන් දැක්කේ පිලුනු උනු බත් එකක් කකා ඉන්න ගෑනු කෙනෙක්..එහ් ගෑනු කෙනෙක් කියලා මන් දැනගත්තේ කොන්ඩේ කඩා දලා හිටපු හින්ද...නැත්නම් මූනවත් පෙනුනේ නෑ...බත් එක දිහාට ම නැමිලා හිටියේ....බත් එකේ ගද පවා මන් හිටපු තැනට

sinhalaebooks.com

දැනුනා නේහා...ඉස්සර මට පුංචි දේටත් හරියට දුක හිතෙනවා...ඒක දැක්ක ම මගෙ පපුව පිච්චිලා ගියා නේහා... මන් තත්පර ගානට එහ් ගෑනු කෙනා ඉන්න තැනට ගියා...මගෙ අඩි සද්දෙට එහ් ගෑනු කෙනා ඔලුව උස්සලා බැලුවා.... "

" මූනවත් අඳුර ගන්න බෑ මැනික..මුලු මූනෙම දැලි වගේ කලුපාට කුනු..ඇඳන් හිටිය ඇඳුමත් හොඳට ම පරන වෙලා...කලුම කලු පාට ට එහ් ඇඳුමේ හැම තැනමත් කුනු... ඒත් එහ් වෙලාවේ මට මොනවත් ම හිතුනේ නෑ...මේත් අපි වගේ ම මනුස්සයෙක් නෙහ් කියලා විතරයි මට හිතුනේ.... "

" මන් ලගට ගිහින් කතා කරන්න හදද්දි එහ් ගෑනු කෙනා මන් දිහා බැලුවේ ඇස් දෙකත් කරකවලා.... එහ් වෙලාවේ නම් එහ් බැල්ම දකිද්දි මොනා උනත් මට බය හිතුනා.... "

ඒත් මන් වචන පටල පටල හරි එහ් ගෑනු කෙනාට කතා කරත්...

" ඔය බත් එක පිලුනු වෙලා නේද...මන් ඔයාට බත් එකක් ගන්න සල්ලි දෙන්න ද නැත්නම් මන් බත් එකක් ගෙනත් දෙන්නම්...ඕක කන්න එපා...ඕක නරක් වෙලා... "

මන් කිවුව දේට එහ් ගෑනු කෙනා මොකුත් ම කිවුවේ නෑ...හැබැයි මන් දිහා බලාගෙන හිටපු ඉරියවුව වෙනස් කරා...ඇස් පුංචි කරලා හිනා වෙන ගමන් කකා හිටපු බත් එකත් පැත්තකට විසික් කරලා එතනින් නැගිට්ටා...මන් එක පාරම බය උනා නේහා....එතකොට ම අර ගහක් යට වාඩි වෙලා හිටපු හිගන්නෙක් මට කතා කරා...

" ඔය ගෑනිට පිස්සු මහත්තයා...මහත්තයට කරදරයක් කරයි.."

" එහ් කටහඬින් මාව ගැස්සුනා... ඇත්තට ම එහ් වෙලාවේ මට ගොඩක් බය හිතුනා නේහා.....ඒත් මන් එතනින් යන්න හැරෙද්දි ම දැක්ක දේ නිසා මන් පස්සට ගන්න කකුල එහෙම්ම ම නැවතුනා....."

" ඇස් දෙකත් පුංචි කරන් හිනා වෙවී බලන් ඉඳලා තියෙන්නේ මන් දිහා නෙමෙයි...මගෙ ශටර් එකේ එල්ලලා තිබුන sunglasse එක දිහා කියලා එහ් වෙලාවෙයි මට තේරුනේ... අනේ මන් ද...මට මොනා උනා ද කියල...මට එහ් වෙලාවේ පුදුම අනුකම්පාවක් දැනුනේ....මන් එහ් කුනු පිරිලා කලු පාට උන මූන දිහත් පීරන් නැතුව ම අමුතුම පාටල් වෙලා තිබුන කොන්ඩේ දිහත් බලන් හිටියේ එහ් අනුකම්පාවත් එක්ක..."

" එහ් ගෑනු කෙනා ඉඳුල් පිරිලා තියන අත් දෙකෙන් ම ශටර් එකත් ඇදලා ශටර් එකේ තිබුන sunglasse දෙක ගත්තා...ඉඳුල් වලිනුයි අතේ තිබ්බ කුනු වලිනුයි මගෙ ශටර් එක හොඳට ම කිලිටි උනා නේහා... ඒත් මට ගානක් තිබ්බේ නෑ...ඇත්තට ම මට ගොඩක් අනුකම්පා හිතුනා.... එහ් ගෑනු කෙනා sunglasse දෙක අරන් එහෙට මෙහෙට කරලා අමුතු විදිහ බලලා ටික වෙලාවකින් මොකක් ද මතක් උනා වගේ මන් දිහා බැලුවා... මන් මොකුත්ප් නොකියා කට පියාගෙන ම හිටියා... ටික වෙලාවකින් එයා ලග තිබ්බ බෑග් එකක් ඇරලා මට කලුම කලු පාට උන කුනු රෙදි කෑල්ලක් දුන්නා...මන් හිතන්නේ ඒක

sinhalaebooks.com

ලේන්සුවක්... මන් ඇස් දෙකත් ලොකු කරන් එහ් දිහා ම බලන් ඉද්දි එහ් ගෑනු කෙනා මට තේරෙන් නැති මොන මොනවදෝ කියවන්න ගත්තා...ටික වෙලාවක් යද්දි මට තේරුනා එහ් ගෑනු කෙනා කියන්නේ මට එහ් රෙදි කෑල්ල ගන්න කියලා....අර sunglasse එක වෙනුවට මට මේ ලේන්සුව දෙනවා ඇත්තේ කියලා මට හිතුනා..... මන් ලේන්සුව ගන්න අත දිග් කරද්දි හිනා වෙවීම මගෙ අතින් ඒක තිබ්බා..හිනා උන විදිහට වෙන කෙනෙක් නම් බය වෙනවා..ඒත් මට අනුකම්පා හිතුනා....අතේ තිබ්බ ඉදුල් මගෙ අතෙක් ගෑවුනා...මන් එහ් ලේන්සුව එහ් ගෑනු කෙනාට ම පේන්න නමලා මගෙ සාක්කුවේ දාගත්තා.... එතකොට තවත් හයියෙන් හිනා උනා... "

" මන් කෑම එකක් ගෙනත් දෙන්නම් කියලා යන්න හැරෙද්දි එහ් ගෑනු කෙනා දුවගෙන දුවගෙන මගෙ කාර් එක ඉස්සරහට ඇවිත් කාර් එක දිහා පොඩි ළමයෙක් වගේ බලන් හිටියා...ටික වෙලාවකින් කාර් එක බදාගෙන ඒක එක දේවල් කෝටියක් කරන්න ගත්තා... මන් අයින් වෙන්න කිවුවත් එතනම හිටියා...මට දැන් යන්න විදිහකුත් නෑ...තල්ලු කරලා දාලා මට යන්න තිබුනා...ඒත් අසරණ වෙලා ඉන්න මනුස්සයෙක් ට එහෙම කරන්න මගෙ හිත දුන්නේ නෑ නේහා... මන් කාර් එකේ දොර අරිද්දි එහ් ගෑනු කෙනා අඩන්න ගත්තා...දැන් කරන්න දෙයක් නෑ..මට මෙහෙම යන්නත් බෑ...ඔය වෙලාවේ තමයි මට මගෙ යාලුවෙක් ව මතක් උනේ...අපේ university එකේම...එයත් වැකේශන් වලට ලංකාවට ඇවිත් තිබුනේ...එයාගේ තාත්තා ඩොක්ටර් කෙනෙක්...මන් ටග් ගාලා යාලුවට කෝල් කරාම එයා මට තාත්තා ගේ නම්බර් එක දුන්නා....මන් අන්කල් ට කතා කරලා විස්තරේ කිවුවම එහ් අන්කල් තමයි මට කරන්න ඕනි දේ කිවුවේ......"

" එහ් අන්කල් කිවුවා මට එහ් ගෑනු කෙනාව මෙන්ටල් හොස්පිටල් එකට එක්ක යන්න කියලා... එතන එයා දන්න ඩොක්ටර් කෙනෙක් ඉන්නවා කිවුවා...එයා එහ් ඩොක්ටර් ට කෝල් එකක් දෙන්නම් කිවුවා... අන්තිමට කිවුවා පුතා පරිස්සමට කියලා.... මන් හා කියලා ෆෝන් එකත් කට් කරලා කැතක් බලන් නැතුව එහ් ගෑනු කෙනාව කාර් එකට නැග්ගුවා නේහා...ඒත් එක විදිහකට ඉන්නේ නෑ....දෙතුන් පාරක් ම හැප්පෙන්න ගියා...පස්සේ මන් ශීට් බෙල්ට් එක දාල sunglasse එක අතට දුන්නා.... ඊට පස්සේ නම් දඟලුවේ නෑ... මෙන්ටල් හොස්පිටල් එක ලගට යනකම්ම... "

මන් එහ් ගෑනු කෙනාව බස්සන්න කලින් ආයෙ ම අර අන්කල් ට කෝල් කරා...එතකොට එහ් අන්කල් කිවුවා පුතා ඇතුලට යන්න..මන් ඩොක්ටර් ට කිවුවා කියලා...

" ඒත් එහ් ගෑනු කෙනාව බස්ස ගන්න එකනම් හිතුව තරම් ලේසි උනේ නෑ...බහින්න බෑ කියලා හොස්පිටල් එක දෙවනක් වෙන්න කෑ ගහන්න ගත්තා... එහ් හින්ද මට හොස්පිටල් එකේ වැඩ කරන අයගෙනුත් උදව් ගන්න උනා.... "

ආයුශ් එහෙම කියලා කතාව නැවැත්තුවේ සුසුමකුත් එක්ක....මේ තරම් වෙලා ආයුශ් කිවුව දේවල් ඇහිපිය නොහෙලා අහන් හිටපු නේහා ගේ හද ගැස්මත් ගැහෙන්න ගත්තේ ආයුශ් මේ කියන දේවල් හිනා ගන්න බැරුව....

" ඊට පස්සේ..."

sinhalaebooks.com

ආයුශ් ගේ තිහඩ තාවත් එක්ක මේ තරම් වෙලා තිහඩව හිටපු නේහා ඇහුවේ වචන පවා පිටතට නැසෙන තරම් දුවර්ල වෙල යද්දි...

කොල්ලා ආයෙම සුසුමක් පිට කරලා නේහා දිහා බැලුවේ නතර කරපු කතාව ආයෙම පටන් ගනිමින්....

" ඊට පස්සේ....... "" ඊට පස්සේ එතන වැඩ කරන අයගෙන් උදව්වෙන් මන් එහ් ගෑනු කෙනාව හොස්පිටල් එක ඇතුලට එක්ක ගියා...තිකන් ම තෙමෙයි...අත් දෙක බැදලා...නැත්තම් දගලපු දගලිල්ලට කාටවත් එහ් ගෑනු කෙනාව මෙල්ල කරන්න බෑ...එතන වැඩ කරපු එක මනුස්සයෙක් මට ගොඩක් උදව් කරා...මුතිදස කියලා...එහ් ගෑනු කෙනාව අන්කල් කිවුව ඩොක්ටර් ලගට එක්ක යන්න මට උදව් කරෙත් මුතිදස..."

" හොස්පිටල් එක ඇතුලේ එහෙම තියන්න බෑනේ...එහ් ගෑනු කෙනා හිටියේ හොදට ම කුනු පිටින් නෙහ්...පස්සෙ එයාව පිරිසිදු කරන්න යැවුවා....එහ් යවද්දි ත් මුලු හොස්පිටල් එකම දෙක වෙන්න කෑ ගහනවා...කොහොමහරි අන්තිමට එහ් ගෑනු කෙනාව නාවලා ඇතුලට එක්ක එනකතුත් මන් එතන... ජේශන්ස්ලා හැමෝට ම අන්දන ඇදුමක් එයාටත් අන්දල තිබුනා... මන් මූන හරියට දැක්කේ නෑ... මොකද මන් හිටියේ ටිකක් එලියට වෙන්න...ඊත් මන් දැක්කා...පීරන් නැතුව කුනුත් එක්ක ගැට ගොඩ ගැහිලා තිබුන කොන්ඩේ ගොතලා තියනව...හම වත් හරියට ජේන් නැති වෙන්න ම කුනු තිබ්බ අත පය පිරිසිදු වෙලා කරලා..එහ් ගෑනු කෙනාගේ අත පය වල කොච්චර කුනු තිබිල ද කියනවා නම් නේහා එහ් ගෑනු කෙනාට තියෙන්නේ සුදු හමක් කියලා කාටවත් අදුන ගන්නත් බැරි තරම්...මූන නොදැක්කත් එහ් ගෑනු කෙනාගේ අත පය මන් හොදට දැක්කා..සුදු පාට ට තියෙද්දි මට ම පුදුම හිතුනා... "

" ඩොක්ටර් ලගට ඇවිල්ලත් එක විදිහකට හිටියේ නෑ....nurse ලට පවා ගහනවා...මට ත් ඇතුලට යන්න බැරි කමට මන් උන් තැනට ම වෙලා බලන් හිටියා... ඔය අතරෙයි එහ් ගෑනු කෙනා nurse ලා අල්ලන් හිටපු අත ගස ඇරලා දුවන්න හැදුවේ...ඊත් මාව දැක්ක ගමන් ඉබේම නැවතුනා...ඇත්තට ම මගෙ හිතත් එහ් වෙලාවේ එහ් ගෑනු කෙනාව දකිද්දි නැවතුනා වගේ නේහා....මන් ගෑනු කෙනා ගෑනු කෙනා කිවුවට එහ් කෙල්ලෙක්...පෙනුමෙන් මන් හිතන් නෑ 20ක් වත් වයස ඇති කියලා..මන් හොස්පිටල් එකට ගෙනපු කෙනාම ද කියලා මට ම සැක හිතෙන තරම් අහිංසක ලස්සනක් එහ් කෙල්ලට තිබුනේ...මන් එහ් දිහා බලන් හිටියේ මගෙ ඇස් මට ම අදහ ගන්න බැරි හින්ද... මෙච්චර වෙලා කෑ ගගහා අඩ අඩ හිටපු කෙල්ල මාව දැක්ක ගමන් අර මුල්ම සැරේ sunglasse දෙක දැක්ක වෙලේ වගේ ඇස්දෙකත් බෝල කරන් මන් දිහා බැලුවා... එහ් මූනේ...එහ් බැල්මේ තිබුනේ අහක බලන්න ලෝබ හිතෙන පෙනුමක්...මන් එහ් දිහා ම බලන් හිටියේ ගල් ගැහිලා...එතකොට ම nurse ලා එහ් කෙල්ල ලගට එද්දි තත්පර ගානෙන් ආයෙම අඩන්න වගේ මූන හදගෙන මන් දිහා බැලුවා...බලලා එක පාරම මාව බදගෙන nurse ලා දිහාට ඇගිල්ල දිග් කරලා මොන මොනවදෝ කුටු කුටු ගාන්න ගත්තා...මට එහ් කෙල්ල කිවුව දේවල් නොතේරුනත් එහ් වෙද්දි මගෙ පපුව ගැහෙනවා නේහා..කවදවත් නැති තරම් කලබලයි...මගෙ පපුව ට තුරුල් උන පලවෙනි කෙල්ල...අනික එහ් අහිංසකම....මාව පිස්සු වැට්ටුවා...මන් එහ් කෙල්ලගේ

sinhalaebooks.com

ඔලුවෙන් අත තියලා ඔලුව අත ගෑවේ අනුකම්පාවට වඩා මොකක්දෝ නොතේරෙන හැඟීමක් මගෙ හිතට එහ් වෙද්දි දැනුන හින්ද... "

" කෙල්ල මන් ලග කීකරුයි කියලා දැනුනට පස්සේ ඩොක්ටර් මට කෙල්ලත් එක්ක ම ඩොක්ටර් ලගට එන්න කියලා අතින් සන් කරා..මන් කෙල්ලව ඩොක්ටර් ලගට එක්ක ගියාමත් කෙල්ල කරේ මාව බදාගෙන හිටපු එක... කොහොමහරි ඩොක්ටර් ට කෙල්ලව බලන්න පුල්ලුවන් විදිහට මන් කෙල්ලව ශේප් කරා...ඩොක්ටර් කෙල්ලව බලලා ඉවර වෙලා රූම් එකකට දැන්මට පස්සේ මන් ගෙදර එන්න හදද්දි එහ් කෙල්ල ආයෙමත් හොස්පිටල් එක දෙවනක් වෙන්න අඩන්න ගත්තා... මට එහ් තත්වෙන් එහ් කෙල්ලව දාලා එන්න හිත දුන් නෑ නේහා...මන් එහ් කෙල්ල ලගට ගිහින් කෙල්ලගේ කදුලුත් පිහලා නින්ද යනකම් ලගට වෙලා හිටියා..නින්ද ගියා ට පස්සෙයි මන් ගෙදර එන්න පිටත් උනේ.
.එහ් එන්න හදද්දි ඩොක්ටර් මගෙන් ඉල්ලීමක් කරා...එහ් පුලුවන් නම් මේ nurse ලට හුරු වෙනකම් මට ටික දවසක් ඇවිත් යන්න කියලා.... "

" ඩොක්ටර් කිවුවත් නැතත් මේ වෙද්දි මන් ආයෙමත් එන්න තීරනය කරලා ඉවරයි...මන් ඩොක්ටර් ට හා කියලා ගෙදර ආවා...එහ් ඇවිදිනුත් මට මතක් උනේ එහ් කෙල්ල මයි...මන් දන් නෑ..මට මොනා උනා ද කියලා...මන් බලන් උන්නේ හෙට වෙනකම්... පහුවදා උදේම මන් කන්නෙත් නැතුව හොස්පිටල් එකට ගියා...එහ් යද්දි.....එහ් කෙල්ලගේ ඇස් හොදට ම රතු වෙලා...එතන හිටපු අය කිවුවේ ඇහැරුන වෙලාවේ ඉදන් මාව හොය හොය ඇඩුවා කියලා...ඒවා අහද්දි මගෙ ඇස් වලට කදුලු පිරුනා..මන් ගිහින් කතා කරද්දි මන් දිහා ඇස් පුංචි කරන් ටික වෙලාවක් බලන් ඉදලා එක පාර ම මාව බදා ගත්තා...මාව ගැහෙනවා...මට එහ් දේවල් පුරුදු නැති හින්ද...මන් කෙල්ලව හෙමින් ඈත් කරලා රතු වෙලා තිබුන ඇස් දිහා බලන් ඉද්දි කෙල්ල ආයෙ ම මන් දිහා ඇස් බෝල කරන් බලන්න ගත්තා...එහ් බැල්මට මට පිස්සුහැදෙයි කියලා හිතුනා..එහ් තරමට අහිංසකයි...හුරතල්... "

" මන් ආවම තමයි ආයෙත් ඩොක්ටර් කෙල්ලව බලන්න ආවේ..ඊයේ රෑ කෙල්ල ලගට කාටවත් ම එන්න දීලා නෑ... පස්සේ ඩොක්ටර් බෙහෙත් දුන්න ම කවලා බෙහෙත් ටික පෙවුවෙත් මන්.... "

" ඔය විදිහට දවස් ගෙවුනා...දවසින් දවස මන් එහ් කෙල්ලට පුදුම විදිහට ලන් උනා...එහ් කෙල්ලටත් මන් නැතුව ඉන්න බැරි උනා...කෙල්ල කෑවේ බෙහෙත්බිවුවේ කොටින් ම කිවුවොත් සන්වරව හිටියේ මන් ජේන මානෙක හිටියොත් විතරයි...නිදා ගත්තෙත් මගෙ උරහිසේ... "

" මන් ගෙදර එන වෙලාවට මුනිදාස ට කෙල්ලව බලාගන්න දීලා එන්නේ...මන් දග කරන්න බෑ කිවුව ම කෙල්ල හිනා වෙනවා...මුල් කාලේ වගේ නෙමෙයි..එහ් වෙද්දි කෙල්ලට ටිකෙන් ටික මන් කියන දේවල් තේරෙනවා..ඩොක්ටර් ත් කිවුවා දැන් කෙල්ලගේ තත්වේ එන්න එන්න ම හොද අතට හැරීගෙන එන්නේ කියලා...එක අතකින් මන් සතුටු උනා.
අනිත් අතින් මට දුකයි.... සනීප උනා ම මාව අමතක වෙයි ද කියලා... "

" ඒටත් වඩා ඩොක්ටර් කිවුව කතාවක් හිත්ද...මගෙ හිත පුදුම විදිහට කලබල වෙලා තිබුනේ... ඩොක්ටර් කිවුවා සනීප උනොත් කෙල්ල අතීතේ අමතක වෙන්න පුලුවන් කියලා...නැත්තම් මාව මතක නැති වෙන්න පුලුවන් කිවුවා...අතීතේ විතරක් මතක තිබිලා.... "

" මන් හැම වෙලාවෙම දෙවියන්ගෙන් ඉල්ලුවේ මාව අමතක වෙන්න එපා කියලා..එහ් වගේ ම අතීතේ මතක් උනොත් එහ් අතීතේ නිසා මට කවදවත් මේ කෙල්ලව නැති වෙන්න එපා කියලා... "

" මේ එද්දි වැකේශන් එකත් ඉවර වීගෙන ආවේ...ඒත් මට මේ කෙල්ලව තනියෙන් දාලා යන්න හිත දුන් නෑ...අන්තිමේ මන් තීරනේ කරා degree එක අත අරින්න..මන් ආයෙ ම university එකට ගියේ නෑ.... "

" ඔය අතරේ කෙල්ල ටික ටික කතා කරන්න ගත්තා...අන්තිමට මන් කෙල්ලට #සාරා කියලා නමකුත් දැන්මා...මොකද කෙල්ලගේ කලින් නම දන්නේ නැති හින්ද...කෙල්ලට සාරා කිවුව ගමන් දැන් දන්නවා එහ් කතා කරන්නේ කෙල්ලට කියලා... එහ් දවස් ටිකේ...මන් හිටියේ පුදුම සතුටකින් නේහා...පුදුම සතුටකින්..මන් ජීවිතේ විදින්න පටන් ගත්තේ එහ් කෙල්ල මගෙ ලෝකෙට ආවට පස්සේ..ඔව් මන් ආදරේ කරා...මහා ගොඩක් ආදරේ කරා.... "

" කෙල්ලත් දැන් සාමාන්‍ය අතට හැරීගෙන එනව...දවසක් මන් යද්දි ඩොක්ටර් කිවුවේ මන් බයෙන් වගේ ම ගොඩක් ම සතුටු වෙන්න බලාගෙන හිටපු ආරංචියක්....එහ් සාරා ට දැන් හොදට ම සනීපයි කියලා...ඒත් අතීතේ මතක තිබුන් නෑ..ඒත් ගොඩක් ම සතුටු හිතෙන ආරංචිය ඩොක්ටර් කිවුවා කෙල්ලට ආයෙ ම අතීතේ මතක් උනත් වතර්මානේ අමතක වෙන්න තියන ඉඩ බොහොම සීමිතයි කියලා... ඩොක්ටර් කෙල්ලට මන් ගැන හැමදේම කියලා තිබුනා... මන් කෙල්ලව බලාගත්ත හැටි.කෙල්ල කෑ ගහපු ඒවා...එහ් හැමදේම...මන් යද්දි කෙල්ල මන් එනකම් පුදුම අසාවෙන් බලන් ඉන්නවා...මාව දැකපු ගමන් එහ් ඇස් දිලිසුනා...මාව බදගත්තේ අඩ අඩ ම....මන් අඩන්න එපා කිවුවත් හොදට ම ඇඩුවා....අන්තිමට කිවුව වචන ටිකට නම් අදටත් මතක් වෙද්දි මගෙ පපුව පිච්චෙනවා නේහා.. දන්නවද අන්තිමට කිවුව වචන ටික..."

" ඔයාට ගොඩක් පින්...දැන් මට සනීප හින්ද මාව දාලා යනවද..එහෙම උනොත්...මට...මට පිස්සු හැදෙයි.... " කිවුවා....මන් ආයෙ ම කෙල්ලව බදගෙන ගොඩක් ඇඩුවා...මට හොස්පිටල් එක කියන දේත් අමතක උනා... අන්තිමට අඩලා අඩලා හොස්පිටල් එකෙන් එලියට ඇවිත් කාර් එකට නගිද්දි යි මට මතක් උනේ කෙල්ලව එක්ක යන්න තැනක් නෑ නේද කියලා..ගෙදරට එක්ක එන්න බෑ...මොකද එහ් දවස් වල තාත්තා ට ඕන උනේ මාව බිස්නස් කාරයෙක් ගේ දුවෙක් ට බන්දන්න.... ගෙදර එක්ක ගියොත් පලවෙනි දවසෙම සාරා ට ජීවිතේ එපා වෙයි කියලා හිතුන හින්ද මන් ගෙයක් කුලියට ගත්තා....එන ගමන් කෙල්ලට ඇදුම් ගොඩක් අරන් දුන්නා.... මන් ගෙදර තත්වෙත් කෙල්ලට හෙමීට පැහැදිලි කරා... කෙල්ල මාව තේරුම් ගත්තා...ඒත් මන් කෙල්ලව එහ් ගෙදර වැඩි වෙලාවක් තනිය ම තිබ්බෙ නෑ...ගෙදර ඇවිත් යන්තම් තාත්තාට මූන පෙන්නලා මන් ආයෙ ම සාරා ලගට

sinhalaebooks.com

යනවා... එක රැයක් වත් මන් කෙල්ලව තනියෙන් තිබ්බේ නෑ...ඒත් මන් කවදාවත් කෙල්ලට කිස් එකක් ඇරෙන්න කිසි දෙයක් කරේ නෑ...ඒත් සාරා...කෙල්ල ටිකක් දඟයි...ලඟට ආවම එක එක දේවල් කරලා මාව අවුස්සනවා...එක දවසක් රෑක මන් හදවතින් වගේ ම සාරා ගතිනුත් මගෙම කර ගත්තා...ඒත් උදේ වෙද්දි ඇදේ කිසි දෙයක් තිබුනේ නෑ...මට ටිකක් දුක හිතුනා..ඒත් සාරා ගේ ඇඩිල්ල හින්ද මගෙ එහ් දුකත් නැති වෙලා ගියා..."

" අනේ අයියේ...මට මොනවත් මතක නෑ...ඒත් ඒක නෑ කියන්නේ මන් කලිනුත් මෙහෙම ඉදලා ඇති..අනේ අයියේ දැන් ඔයා මාව දාලා යනවද...අනේ මාව මැරෙයි එහෙම උනොත්..." කිය කිය කෙල්ල අඩන්න ගත්තා...ඒත් මට සාරා ගේ අතීතේ වැදගත් උනේ නෑ...මන් කෙල්ලව අඩන්න එපා කියලා හැමදම ලග ඉන්නවා කවදාවත් දාලා යන්නෙත් නෑ කියලා ඔලුවේ අත තියලා පොරොන්දු උනා...ඊට පස්සේ ගෙවුන හැම රැයක ම අපි එකතු උනා..මටත් වඩ උවමනාව තිබුනේ සාරා ට..මන් කිස් එකක් දීලා පැත්තකට වෙන්න හදද්දි මොනා හරි කරලා හැමදම මාව අවුස්සනවා..අන්තිමට එහ් දේත් වෙලා තමයි නවතින්නේ...."

" කෙල්ලට රසට උයන්න පුලුවන්...හැමදම කෙල්ල උදෙන් ම ඇහැරලා උයනවා... කවන්නෙත් එහ් අත් දෙකෙන් මයි...අපි පුදුම විදිහට ආදරේ කරා...සාරා කැමති උන් නෑ මන් සරණී ව ආශ්‍රය කරනවට...මන් යාලුවෝ ගැන කලින් ම කියල නෙහ් තිබුනේ...ඉතින් මන් සරණී ගෙදර ආවත් වැඩිය මූන දෙන්න ගියේ නෑ...ඔහොම දවස් ගෙවිලා ගියා... මන් හිටියේ පුදුම තරම් සතුටකින්..."

" දවසක් සාරා කිවුවා මන් ගෙදර එන වෙලාවට එයාට පාලුයි කියලා...එයාටත් කතා කරන්න ෆෝන් එකක් අරන් දෙන්න කියලා...මන් ෆෝන් එකකුත් අරන් දීලා fb account එකකුත් හදලා දුන්නා...පාලුයි නෙහ්...පව් මෙහ් කෙල්ල කියලා...."

" ටික දවසක් ඔය විදිහට ගෙවුවා...පස්සේ ජස්සේ සාරා ෆෝන් එකේමයි...මාව ගෙදර එවන්නත් පුදුම ඕනකමක් තිබුනේ... මට දුක හිතුනා...ඒත් කොයිම වෙලාවකවත් මට සැක හිතිලා නෑ...මන් එහ් තරමට ම ආදරේ කරා .. දවසක් මට කිවුවා ගෙදර ම ඉන්න කම්ම්මැලියි කියලා... අර ඩොක්ටර් අන්කල් ඉන්නේ..එයාගේ cousin කෙනෙක් ගේ birthday එකක්..මන් ඉතින් කෙල්ලවත් එක්ක ගියා...එහෙදි එහ් birthday එක තිබ්බ කොල්ලා සාරා ට bum එක දීලා....ඒත් මන් එහ් ගැන වැඩිය හිතුවේ නෑ...මට මගෙ කෙල්ලව විශ්වාස හින්ද... ඒත් වැඩි දවසක් ගියේ නෑ...සාරා ට පුදුම විදිහට කේන්ති යනවා..මන් දෙයක් ඇහුවත් තරහා යනවා...ඒත් මන් ඉවසුවා......."

" ඒත් දවසක්..දවසක් මන් ගෙදර ගිහින් එද්දි......සාරා....සාරා......"

ආයුශ් කතාව නැවැත්තුවේ දෝතින් ම ඔලුව බදාගෙන...මේ තරම් වෙලා ඇස් දෙකේ කඳුලු පුරවන් කතාව අහන් හිටපු කෙල්ල ආයුශ් ගේ අතින් අත තිබ්බේ පපුව පිච්චිලා යන තරම් වේදනාවකින්...

" ඇයි ආයු...සාරා..එයා මොකද.... "

sinhalaebooks.com

නේහා ඇහුවේ ඇස් දෙකේ කඳුලු නිදහසේ ගලන් යන්න ඉඩ දීලා...ආයුශ් අත් දෙක ඔලුවෙන් අයින් කරලා ඔලුව උස්සලා නේහා දිහා බැලුවේ ඇස් දෙකේ කඳුලු පුරවගෙන...ඊලගට ආයුශ් කිවුව කතාවට නේහා ගේ වගේම ආයුශ් ගේ හිතත් හොඳට ම පෑරුනා......
 වෙනදා මන් එනකම් ඉස්සරහට වෙලා මග බලන් ඉන්න කෙල්ල එදා හිටියෙ නෑ නේහා... ඉස්සරහා දොර බාගෙට ඇරලා තිබුනා...මන් බය උනා...මගෙ කෙල්ලට කරදරයක් කියලා.... මන් දොරත් ඇරන් ඇතුලට යද්දි මට ඇහුනා සාරා හයියෙන් හිනා වෙනවා...තනියම නෙමෙයි...තවත් පිරිමි කටහඩක් ඇහුනා... සාරා යි මම යි ඉන්න රූම් එකෙන්... මන්...අඩියට දෙකට රූම් එක ලග ගිහින් දොර රෙද්ද ඇත් කරද්දි දැක්ක දේ දන්නවද...මගෙ සාරා....සාරා ඇගේ එක නූල් පොටක් වත් නැතුව එදා birthday පාටි එකේ අර කොල්ලා එක්ක......දැක්ක ගමන් මට...මට මගෙ ඇස් අදහා ගන්න බැරි උනා නේහා...මන් ටික වෙලාවක් මගෙ කෙල්ල දිහා ම බලන් හිටියා ගල් ගැහිලා..මට විශ්වාස කරන්න බැරි උනා..මන් එච් තරමට ම එච් කෙල්ලව විශ්වාස කරා.... මන් ගල් ගැහිල බලන් ඉද්දි සාරා ඇද උඩ තිබ්බ ඇඳුමත් දාගෙන මගෙ කකුල් දෙක ලග වැටුනා අඩාගෙන...මගෙන් සමාව ඉල්ලගෙන..."

" මට කිසි දෙයක් හිතා ගන්න බැරි උනා නේහා... මේ දේවල් හීනයක් ද කියලමයි මට හිතුනේ..මන් ඔලුවත් බදාගෙන එහෙම්ම ම බිත්තියට හේත්තු උනේ මට හිටගෙන ඉන්නවත් හයියක් නැති උන හින්දා...මට එච් වෙලාවේ අඩන්නවත් මතක් උන් නෑ නේහා... මන් ඔහේ බලාගත්තු අත බලාගෙන හිටියා... මට අරූ ට වචනයක් වත් කියන්න හිතුන් නෑ....මොකද සාරා ව මන් ගොඩක් විශ්වාස කරා...ඔය අතරේ ඌ හෙමීට එතනින් මාරු උනා...සාරා මාවත් බදාගෙන වැල්හින්නක් වගේ අඩනවා.... මන් එහෙම පැයක් විතර ඉන්නැති...ඊට පස්සේ තමයි මගෙ ඇස් වලට කඳුලු හරි ඉනුවේ නේහා... මන් එතකොටයි අඩන්න පටන් ගත්තේ...මන් ඇස් දෙකේ කඳුලු පුරවගෙන සාරා දිහා බැලුවා...සාරා තාම අඩනවා...."

" මන් ඉඳගෙන හිටපු තැනින් නැගිට්න්න හදද්දි සාරා ගේ ඇඩිල්ල ආයෙම වැඩි උනා...මගෙ කකුල් දෙකේ එල්ලිලා ආයෙම සමාව ඉල්ලනවා... මගෙ හිත බිඳිලා ඉවරයි නේහා... එච් විශ්වාසේ සාරා බිදල ම දැන්මා...ඒත් මන් සාරා ට එක වචනයක් වත් කිවුවේ නෑ... හැබැයි මන් සමාව දුන්නෙත් නෑ... මට එච් වෙලාවේ මැරෙන්න තරම් හිතුනා... මට සාරා ගෙ මූනවත් බලන්න හිත දුන් නෑ... ඒත් සාරා....සාරා කරේ බෙහෙත් තොබී හිටපු එක..එයාගෙත් ම පලි ගන්න හදපු එක... අන්තිමට මන්... අමාරුවෙන් උනත් වෙනදා වගේ ඉන්න උත්සාහ කරා..ඒත් දවස් දෙකයි නේහා...දවස් දෙකයි ගියේ... මන් ආයෙම ගෙදර ගිහින් එද්දි මේසේ උඩ ලිවුමක්.... "

" ආයූ...

මට තවත් හිත රවට්ට ගන්න බෑ...මන් වෙන කෙනෙක් ට ආදරෙ කරනවා..සතුටින් ඉන්න....මට ඔයාගේ කිසි දෙයක් එපා.මේ ෆෝන්...මේ ඇඳුම්...මට මේ කිසි දෙයක් එපා...ඔයා වගේ ම මට ඒවත් එපා..මන් එයා එක්ක අලුතින් ජීවිතේ පටන් ගන්නවා...මගෙ වීර් එක්ක.....

sinhalaebooks.com

-සාරා-

" මන් ලිවුම කියවලා ඉවර වෙද්දි මගෙ ඇගට පන නෑ...ඒත් ඒත් මේ වීර්...වීර් කියන්නේ අරූ නෙමෙයි නේහා..උගෙ නම වීර් නෙමෙයි... මන් එහා පැත්තේ තිබුන ෆෝන් එක ගත්තා....ෆෝන් එක බලද්දි දන්නවද මන් දැක්ක දේ...සාරා...සාරා බලන්න වත් බැරි විදිහේ මැසේජ් යවලා තිබුනා...එකෙක් ට නෙමෙයි..දෙතුන් දෙනෙක් ට ම... inbox එකේ උඩින් ම තිබ්බේ වීර් කියලා සේව් කරලා.... එතකොට ගිහින් තියෙන්නේ මූ එක්ක.... එහ් වෙලාවේ මගෙ හිතට ආවේ පුදුම තරහක් නේහා...මන් මුලු ගේ ම තිබුන බඩු පොලවේ ගැහුවා... මන් එහ් ගෙදර ආයෙම තත්පරයක් වත් හිටියේ නෑ... ඒත් මට ඒකිව මතක් උනා...හැම තත්පරේම...ඒකිව අමතක කරන්න කියලා මන් බේබද්දෙක් උනා නේහා...ගෑනු එක්ක නිද ගන්න පටන් ගත්තා...මන් අමු පිස්සෙක් උනා...එහ් විතරක් නෙමෙයි..මන් ඒකිට තාමත් ආදරෙයි ... "

ආයුශ් දෝතින් ම ඔලුව බදගෙන...අඩාගෙන... නේහා කරේ අඩන ආයුශ් දිහා ඇස් දෙකේ කඳුලු පුරවගෙන බලන් හිටපු එක...

" නේහා... උබ දන්නවද මැනික...මගෙ සාරා....පිස්සු හැදිලා හිටපු කාලේ හෙවුවෙම මන් විතරයි...මට විතරමයි ආදරෙත් කරේ.... සාරා සනීප උන් නැත්තම් අදටත් මන් ලග දෙයියනෙ...මන් ලග ම විතරයි....ඒකයි රත්තරං මන් උබට ඇස් දෙක සනීප කරගන්න දෙන් නැත්තේ...මට ආයෙත් රෑ වැටුන වලේ දවල් වැටෙන්න බෑ.... මට...මට උබවත් නැති කරගන්න ඕන නෑ.... "

ආයුශ් ආයෙම අඩන්න ගද්දි ආයුශ් ගේ කතාව මේ තරම් වෙලා අහගෙන හිටපු නේහා ත් ආයුශ් තරමට ම අඩන්න ගත්තේ ආයුශ් ඉස්සර හිටපු විදිහත් අද මේ ඉන්න විදිහටත් හේතුව හොදකාරවම දැනගත්ත නිසා..කාටවත් ම වෛර කරන්නැති නේහා ට සාරාගැන දැනුනේ පුදුම තරහක්...එහ් තරම ට ආයුශ් ගැන දුක හිතුනා... ඒත් එහ් හැම දුකට ම යටයි ආයුශ් තමන් බොරු කරනවා කියලා දැනෙද්දි දැනෙන දුක...මේ බොරුව එලි උන දවසට මොනවගෙන් මොනවා වෙයි ද කියලා කෙල්ල හිතුවේ කලින්ටත් වඩා හයියෙන් පිස්සියක් වගේ අඩ අඩ...කෙල්ලගේ එහ් ඇඩිල්ලට ආයුශ් ගේ ඇඩිල්ල ඉබේම නැවතිලා ගියා...

" සු..දු...මැ..නි..ක...."

ආයුශ් නේහා ගෙ මූන දෝතින් ම අරන් කියද්දි කෙල්ල කරෙ තවත් අඩපු එක....

" අඩන්න එපා රත්තරං ...අපි ගෙදර යමු.."

ආයුශ් කෙල්ලව තමන් ගේ පපුවට තුරුල් කරගෙන එහෙම කියලා කාර් එක ස්ටාට් කරේ අත් දෙක්න් කඳුලු පිහිදන ගමන්...ඊලගට කාර් එක ස්පීඩ් එක වැඩි කරලා ඉක්මන් කරලා ගෙදරට ආවේ සැරින් සැරේ නෙහා ගේ රතු උන ඇස් දිහා බලන ගමන්....

කාර් එක ගේට් එකෙන් ඇතුලට අරන් කොල්ලා නේහා ව තමන් ගේ දෝතට ම අරන් කෙල්ලව රූම් එකට එක්ක ගියේ එහ් යන අතර තුරත් නේහා ගේ නලල කීප සැරයක් ම සිප අරන්... ඊලගට කෙල්ලව ඇද උඩින් තියලා තමන් ගේ පපුවට තුරුල් කරගත්තා....

" මන් දන්නවා රත්තරං ...උඹ අඩන්නේ මන් වෙනුවෙන්...මන් විදපු දුකට.... උඹත් මනුස්සයෙක් මගෙ මැනික...මට ආදරේ කරන උඹ ඉස්සරා උබේ මූනට ම මන් අරකි ට ආදරෙයි කියද්දි උබේ පපුව පිච්චෙනවා කියලත් මන් දන්නවා... මට ගොඩක් පව් මැනික...මේ පව් මට කවදාවත් ම ගෙවා ගන්න බැරි වෙයි.. මන් ඊයේ මුලු රෑම හිතුවේ උඹ ගැන මැනික...එදා උඹ ඇහුවම ආයෙත් අරකි මන් ලගට ආවොත් මන් යනවද කියලා මන් කිවුවා එහෙම වෙන් නෑ..මේ බන්ඩියට පැටියෙක් ශේනවා කියලා...එතකොට යන්න් බෑ කියලා...නෑ රත්තරං නෑ.... මන්...මන් මේ දැන් උඹට පොරොන්දු වෙනවා...මන් කවදාවත් ම උඹව අත අරින් නෑ මැනික...ඔය බඩේ මගෙ පැටියෙක් හිටියත් නැතත්..උඹ....උඹ විතරයි දැන් මගෙ ජීවිතේ.. "

" අරකි මාව රවට්ටන්න උඹ මන් වෙනුවෙන් මුලු ජීවිතේම කැප කරා මැනික....උඹට මලීශ් එක්ක එකතු වෙලා ඔය ඇස් දෙක සනීප කරගන්න පුලුවන්කම තියෙද්දි ත් උඹ හිතුවේ මගෙ පොරොන්දු ව ගැන.....මන් උඹට වද දෙද්දි උඹ වචනයක් වත් නොකියා අඩපු එක විතරයි කරේ...අද මගෙ කතාව උඹට කියද්දි මටත් වඩාඇඩුවේ උඹ මැනික...මෙහෙම ආදරයක්...නෑ රත්තරන් ...මන් කවදාවත් මේ ආදරෙ නැති කරගන් නෑ.... මන් කවදාවත් උඹව තනි කරන් නෑ මැනික....මගෙ ඇස් දෙක වගේ උඹව බලාගන්නවා.... "

ආයුශ් කෙල්ල ගේ ඔලුවට අත තියලා දිවුරුම් දෙද්දි නේහා තවත් ඉකි ගගහා අඩන්න ගත්තා... ආයුශ් කෙල්ලව තවත් තමන් ගේ පපුව ට තුරුල් කරගත්තා...

" මට අද උඹව මගෙ ම කරගන්න ඕනි...මගෙ ම විතරක්... "

ආයුශ් කෙල්ලගේ කනට කරලා රහසින් කියද්දි අඩ අඩ හිටියත් කෙල්ලගේ මූන ලැජ්ජාවෙන් රතු උනා...

" දැන් ම නෙමෙයි සුදු මැනික.... රෑ වෙලා..."

ආයුශ් කෙල්ලගේ කම්මුලකට අතක් තියලා කියද්දි කෙල්ල ඔලුව හෙල්ලුවේ හා කියන්න...ආයුශ් ආයෙම කෙල්ලව තුරුල් කරගත්තේ පුදුම තරම් ආදරෙකින්...

අතීතේ අඳුරු මතක එහෙම් පිටින් ම අමතක වෙන්න නේහා ගේ මේ ආදරෙට පුලුවන් කියන දේ කොල්ලා හොඳකාරවම දැනන් උන්නා...නේහා ගේ කවදාවත් නොකඩපු පොරොන්දුව මතක් වෙන වාරයක් පාසා ආයුශ් ගේ හිතේ නේහා ගැන තිබුන ආදරය තවත් වැඩි උනා....
ආයුශ් හවස් වෙලා කෙල්ලවත් එක්කගෙන ගාඩර්න් එකේ තිබුන බුදු පිලිමේ ලගට ගියා...කෙල්ල එක්ක ම මල් පූජා කරේ කෝටියක් ප්‍රාථර්නා හිතේ තියාගෙන...

sinhalaebooks.com

දවල් කඩෙන් කෑම ගෙනාවත් හවස කොල්ලගේ අත් දෙකෙන් ම ඉවුවේ කොල්ලගේ හිතේ තිබ්බ ආසාවට....ඒත් නේහා එහ් ලගට ම වෙලා කවදාවත් උයලානැති කොල්ලට හැමදේම කියා දුන්නා... බත් එක රයිස් කුකර් එකේ ගහලත් පැය දෙකක් ගිහිනුත් කොල්ලට හදාගන්න පුලුවන් උනේ බීට් විතරයි....නේහා එහ් හැමදේම බලන් හිටියේ පුදුම තරම් ලෝබකමකින්...

තවත් මොන හරි හදන්න හැදුවත් ඒකටත් තව පැය දෙක තුනක් ම යනවා කියලා දන්න හින්ද ම කෙල්ල ආයුශ් ව නැවැත්තුවේ හිනා වෙවීම...එක ව්‍යාංජනයක් විතරක් නේහා ට කන්න දෙන්න හිත නොදුන්න හින්ද ම කොල්ලා උන්නේ මූනත් දෙක කරන්... ඒත් නේහා ගේ බල කිරීම හින්ද ම කොල්ලා ප්ලේට් එකකට බෙදාගෙන කෙල්ල එක්කම සාලෙට ආවා...ආයුශ් අතින් ම නේහා ට කවද්දී කෙල්ලට දැනුනේ ආයුශ් අතින් උයපු මේ ව්‍යාංජනය තරම් රස කෑමත් කවදාවත් කාලා නෑ වගේ හැඟීමක්...කෙල්ල කෑවේ පුදුම තරම් සතුටකින්...

වෙලාවකට ආයුශ් ට තිබුනේ හය හතර නොතේරෙන දරුවෙක් ට වත් නොතිබුන ආසාවල්... රූම් එකට ආව වෙලාවේ ඉදන් නේහා ගේ කොන්ඩේ එක එක විදිහට පීරන්න ගත්තා... කොල්ලට හරියට කොන්ඩ කටුවක්වත් ගහා ගන්න බෑ...ඒත් කතාව නම් එහ් ගැන degree එකක් ගහපු ගානට... කීප සැරයක් ම කොන්ඩේ පීරන්න ගිහින් කෙල්ලගේ කොන්ඩේ අවුල් කරා...කොන්ඩේ ගොතන්න දන්නෙත් නෑ...ඒත් ලොකුකමට නේහා ගෙන් අහන්නෙත් නෑ....කොල්ලා නේහා ට හොරෙන් u tube එකෙන් කොන්ඩේ ගොතන විදිහ search කරා...කෙල්ලට ජේන් නෑ කියල හිතන් අයුශ් කරපු මේ හැම වැඩක් ම නේහා බලන් හිටියේ බොහොම අමාරුවෙන් හිනාව පාලනය කරගෙන......ඒකේ තිබුන විදිහට කරන්න හැදුවත් කොල්ලා කරේ කොන්ඩේ අබරපු එක විතරයි....අල්ලන් ඉන්න කෙස් ටික අත ඇරපු ගමන් ම කොන්ඩේ ආයෙම ලෙහෙනවා...

දෙතුන් පාරක් එහෙම කරලා හරි යන් නැති තැන ආයුශ් ඔලුවේ අත තියා ගත්තේ මූනත් දෙක කරන්... නේහා කොල්ලා ලගට ඇවිත් කොල්ලගේ කෙස් අතින් අවුස්සලා පපුවට තුරුල් උනේ හිනා වෙවීම...

" දන්නෙත් නෑ...අහන්නෙත් නෑ..."

නේහා හිනා වෙවීම කියද්දී ආයුශ් ගේ මූනට හිනාවක් ආවේ ඉබේමයි..

" දන්නවා කියලනේ කොන්ඩේ ගත්තේ...අහන්නේ කොහොමද ..."

ආයුශ් කිවුවේ ලාවට හිනා වෙලා....නේහා කරේ ආයෙම ආයුශ් ගේ පපුවට තුරුල් උන එක...

" සුදු මැනික... මන් දවල් කිවුව දේ මතකද...."

sinhalaebooks.com

ආයුෂ් තේහා ගේ ඔලුව සීරුවට අත ගාල අහද්දි කොල්ලා මේ අහන්නේ මොකක් ගැනද කියලා දන්න හින්ද ම කෙල්ලගේ මූන ලැජ්ජාවෙන් රතු උනා...

" හ්ම්ම්...ඔව්...."

" සුදූ මැනික...."

" ආ...යු... "

" ඔයාගේ අර නයිට් dress එක...."

" ඔ...ව්... "

" ඒක අඳිමු ද..මන් ආසයි ඒකට...ඔයා ඒක ගෙනාවේ අල්මාරියේ ම තියා ගන්න ද... "

" අනේ ආයු...ම...ට...ලැජ්ජයි...."

" අද මගෙ ම වෙන්නනෙ සුදූ මැනික...."

තේහා මූනත් රතු කරන් හා කියන්න ඔලුව හෙල්ලුවා... ආයුෂ් කෙල්ලට නයිට් dress එක දුන්න ම කෙල්ල කරේ එකත් අරන් වොශ් රූම් එකට ගියපු එක... ආයුෂ් ගේ මූනට හිනාවක් ආවේ කොල්ලගේ යටි හිත තේහා ගේ මේ ලැජ්ජාවට පවා පුදුම විදිහට ආදරේ කරපු නිසා....මොකද කවදාවත් සාරා ට මේ දේවල් ආගන්තුක උනේ නෑ...ආයුෂ් ටත් වඩා සාරා යි ආයුෂ් ව එහ් දේවල් වලට පොලබවගත්තේ...ඒත් තේහා....තේහා ගේ මේ ආගන්තුක බව මේ ලැජ්ජාව තේහා කවදාවත් ම තමන් ව අත අරින් නෑ කියන්න කොල්ලගේ හිතට තදින් ම දැනුනා....

තේහා වොශ් රූම් එකෙන් විනාඩි 10කට ආසන්න කාලයක් හිටියා... එහ් ගොඩක් ම කෙල්ලගේ හිතේ තිබ්බ ලැජ්ජාව නිසා... කෙල්ල එලියට එද්දි ම ආයුෂ් ගේ ඇස් දිලිසුනෙ කවදාවත් ම තේහා ව මේ විදිහට දැකලා නැති නිසා.... ඒත්....එහ් රාගය ම විතරක් නෙමෙයි...එහ් ඇස් වල මහා ගොඩක් ආදරේ පිරිලා තිබුනා...

සාරා ලගදිවත් පිස්සෙක් වගෙ නාස්ති උන කාලෙදි ඇසුරු කරපු ගනිකාවෝ ලගදිවත් නොදැනුන අමුතු හැඟීමකින් කොල්ලගේ මුලු හිතම පිරිලා තිබුනා... එහ් තරම් ආදරයක් සෙනෙහසක් කොල්ලට කවදාවත් ම දැනිලා තිබුනේ නෑ....

කොල්ලා තේහා ගේ අතින් ඇදලා තමන් ලගට ගන්න හැදුවත් කොල්ලගේ සමබරතාව නැති වෙලා තේහා එක්ක ම ඇදට වැටුනේ කොල්ලා හිතුවෙවත් නැති මොහොතක....
තේහා උන්නේ ආයුෂ් ගේ ඇග උඩ..හිත ගැස්සුන පාරට තේහා ඇස් දෙක තද කරලා පියා ගත්තා....කෙල්ලගේ නයිට් dress එකත් දනිස්සෙන් ගොඩක් උඩට එනකම්ම ඉස්සිලා තිබුනේ..ඒත් ආයුෂ් බලන් හිටියේ ඇස් දෙක තද කරලා පියන් ඉන්න තේහා ගේ මූන

sinhalaebooks.com

දිහා...ඒලගට කෙල්ලගේ මූනට වැටිලා තිබුන කෙස් ටික කනෙන් පිටිපස්සට දාන්මේ පුදුම තරම් සියුම් ව කෙල්ලව ස්පශර් කරලා... ඒත් එහ් හැම ස්පශර්යකින් ම කෙල්ලව ගැහෙන්න ගත්තේ මේ වගේ හැඟීමකට මූන දෙන පලවෙනි පාර හින්ද කියලා කොල්ලා හොදට ම දැනන් උන්නා..නේහා ගේ මේ හැම හැසිරීමකින් ම කොල්ලගේ හිතේ නේහා ගැන තිබුන ආදරේ තවත් වැඩි උනා...

ආයුශ් කෙල්ල එහෙම්ම ම ඉද්දි ඇදේ අනිත් පැත්තට හැරුනේ කෙල්ලව ආයුශ් ගේ ඇගට යට වෙන විදිහට... ඒත් කෙල්ල තාමත් උන්නේ ඇස් දෙක තද කරලා පියාගෙන...කලින්ටත් වඩා කෙල්ලව ගැහෙනවා... ආයුශ් කෙල්ලගේ තලලෙන් දෙතොල් තියලා එහෙම්ම ම කෙල්ලගේ පපුවෙන් මූන තියාගත්තේ සැනසුම් සුසුමකුත් එක්ක...විනාඩි කීපයක් එහ් විදිහට ගෙවිලා ගියේ දැඩි නිහඩතාවක් එක්ක... මේ නිහඩතාවත් එක්ක මේ වෙද්දි ටිකෙන් ටික නේහා ගේ ගැස්සිලා තිබුන හිතෙන් සංසුන් උනා...කෙල්ල තමන් ගේ පපුවට මූන තියන් ඉන්න කොල්ලගේ ඔලුවෙන් අතක් තිබ්බේ හිතාවලුත් එක්ක...

" ආ...යු...ශ්... "

" ම්ම්ම්ම්ම්ම්... "

" ඇයි ඔහොම ඉන්නේ.... "

" ඔයා බය වෙලානේ සුදු මැනික...මාලුවෙක් වතුරෙන් අරන් ගොඩින් තිබ්බා වගේ ගැහෙනවා... ඉතින් මන් කොහොම ද...ම්ම්ම්ම්.... "

ආයුශ් කෙල්ලගේ පපුවට තවත් මූන තද කරන් කියද්දි නේහා කරේ කොල්ලගේ ඔලුව අත ගාපු එක...

" එතකොට..අද...මොකුත්...කරන්...නැද්ද...මාව ඔයාගේ කරගන් නැද්ද..."

නේහා ඇහුවේ වචන පටලවමින්....ඒත් නේහා ගේ එහ් වචන ටිකට නම් ආයුශ් ඔලුව උස්සලා නේහා දිහා බැලුවා...කෙල්ල ඉක්මනට ඇස් දෙක එක ඉලක්කයක් වෙත රදවගත්තේ ආයුශ් ට සැක හිතෙයි කියන බයට...

" කරනවා...ඔය බය ටිකක් අඩු උනා ම..."

ආයුශ් කෙල්ලගේ කනට කරලා රහසින් කියද්දි කෙල්ල ලැජ්ජාවට ම රතු උනා...

" එහෙනම් අද දවසම ඉන්න වෙයි ආයු...මගෙ බය නැති වෙනකම්.... "

කෙල්ල කිවුවා නෙමෙයි කෙල්ලගේ කටින් එහ් වචන ටික පිට උනා....

" එහෙමත් එකක් ද...."

sinhalaebooks.com

ආයුශ් නේහා ගේ හුස්මත් දැනෙන තරමට කෙල්ලගේ මූනට ඉබිලා අහද්දි කෙල්ල ඔලුව හෙල්ලුවේ ඔව් කියන්න.....

" උබ කට වරද්ද ගත්තා සුදු මැනික...දැන් ඉතින් උබ ඉවරයි.... "

ආයුශ් ලාවට හිනා වෙලා කිවුවේ නේහා ගේ දෙතොල් තමන්ගේ එක අතකින් ස්පශර් කරලා කියද්දි කෙල්ල ආයෙම රතු උනා.... එහ් එක්ක ම ආයුශ් කෙල්ලගේ දෙතොල් තමන් ගේ දෙතොල් වලින් අල්ල ගත්තේ කෙල්ල ආයෙම ඇස් තද කරලා පියා ගද්දි....

මුලින් හෙමින් කෙල්ලව සිප ගත්තත් ටිකෙන් ටික එහ් ස්පශර්ය රළු උනේ සිප ගැනීම් පවා ටිකෙන් ටික වේගවත් වෙද්දි.... මුලින් බයෙන් ගැහි ගැහී හිටපු කෙල්ලත් ටිකෙන් ටික ආයුශ් ගේ ස්පශර්යට ම නතු උනේ ආයුශ් ට අනුබල දෙමින්...

ආයුශ් ගේ ස්පශර්ය කෙල්ලගේ මුලු සිරුර පුරා ම දැවටුනේ දෙන්නගෙම හැගීම් අවදි කරලා... නේහා ගේ ඇදුම් ආයුශ් ගේ අතින් එකින් එක ඉවත් වෙලා ගියේ තත්පර ගානකින්...

හෝරා කීපයක් ම ගෙවිලා ගියේ ආයුශ් වගේ ම නේහා ත් වෙනම ම ලෝකෙක තනි කරමින්... ගෙවුන හැම තත්පරයක ම රාගය වගේ ම ආදරයත් මදි නොකියන්න ම තිබුනා.... කෙටි වගේ ම දීගර් සුසුම් අතරින් නේහා හිතින් වගේ ම ගතිනුත් තමන් ගේ ආත්මය ම ආයුශ් ට පූජා කරේ පුදුම තරම් ආදරයක් එහ් හිතේ ඉතිරෙද්දි....

හැම කෙල්ලෙක් ට රැක ගන්න දෙයක් තියනවා...එහ් දේ තමයි කෙල්ලෙක් ගේ වටිනාකම රැදිලා තියෙන්නේ...ඇත්තට ම අවංකව පිරිසිදු ව හිටපු කෙනෙක් හරි ම දවසේ එහ් දේ තමන් ගේ ස්වාමියා ට දුන්න ම දැනෙන සතුට වචන වලින් කියන්න බෑ....එහ් දේ එහ් විදිහට ම නේහා ට ත් දැනුනා....

කෙල්ල ආයුශ් ගේ පපුවට තුරුල් උනේ එහ් දැනුන සතුටත් එක්ක මයි...ආයුශ් තමන් ගේ පපුවට තුරුල් වෙලා ඉන්න නේහා ව තවත් තුරුල් කරගත්තේ පුදුම තරම් ආදරේකින්...ආයුශ් ගේ පපුවේ හද ගැස්මත් දැනෙන තරමට ම කොල්ලගේ පපුවට ගුලි වෙලා උන්න කෙල්ල ඇහැරුනේ ඊයේ රෑ උන හැම සිදුවීමක් ම එකින් එක මතක් වෙලා කවදවත් නොවින්ද සතුටකින් මුලු හිතම පිරිලා යද්දි...ආයුශ් ඇහැරෙන් නැති වෙන්න කෙල්ල නැගිටලා ආයුශ්ගේ ඔලුව කොට්ටෙකින් තියලා ශීට් එකත් පොරවලා ඉවර වෙද්දි යි කෙල්ල බෙඩ් ශීට් එක දිහා බැලුවේ...බෙඩ් ශීට් එකේ හරි මැදට වෙන්න තිබුන නේහා ගේ පිරිසිදු බවේ සලකුන දකිද්දි කෙල්ලගේ මූනට හිනාවක් ආවේ හැම පිරිසිදු පතිනියක් ම එදට එහ් මොහොතේ විදින සතුට එහ් විදිහට ම කෙල්ලගේ හිතට දැනෙද්දි....

ඊයේ රෑ නිද ගද්දි දෙකත් පහු වෙලා තිබුන හින්ද ම කෙල්ල ඔරලෝසුව දිහාබැලුවේ හොදට ම දවල් වෙලා ඇති කියලා හිතට දැනුන සැකෙත් එක්ක... ඔරලෝසුවේ වෙලාව 11 යි කියලා සටහන් වෙලා තියෙද්දි කෙල්ල වටපිට බැලුවේ ඇස් අදහ ගන්නබැරි නිසා..එහ් තරම්

sinhalaebooks.com

දවල් වෙලා ඇති කියලා කෙල්ල කීයටවත් හිතුවේ නෑ…ඒත් රූම් එකට වැටිලා තිබුන ඉර එළියත් එක්ක වෙලාව හරි ඇති කියලා හිතුන හින්ද ම කෙල්ල ඉක්මනට වොශ් රූම් එකට ගියේ ආයුශ් ඇහැරින්න කලින් උයන්න ඕනි නිසා…

වොශ් එකකුත් දගෙන් කිචන් එකට ගිහින් පරිප්පුයි සෝයා එකකුයි හැදුවේ ඊට වඩා වැඩි යමක් උයන්න වෙලාවක් නැති හින්ද… බත් එක රයිස් කුකර් එකෙ ගැහුවේ ගෑස් ලිපේ උයන්න ගියොත් තවත් පැය ගානක් යන හින්ද…

කෙල්ල කිචන් එකේ මේ වැඩ කරන අතරෙයි කොල්ලට ඇහැරුනේ… ඇහැරෙද්දි ම කෙල්ල ලග නැති උනා ම කෙල්ල කිචන් එකේ කියලා කොල්ලගේ හිත කිවුවා…එහ් වෙලාවේ කොල්ලට තමන් ගැන ම දැනුනේ ලොකු පසු තැවීමක්…මොකද කෙල්ලට කිසි දෙයක් කරන්න නොදී කෙල්ලව බලා ගන්නවා කියලා තමන් ට ම දුන්න පොරොන්දු ව තමන් ගේ මේ වැඩ හින්ද ම මග හැරෙනවා නේද කියලා හිතද්දී…..

කොල්ලා ශීට් එක අයින් කරද්දි බෙඩ් ශීට් එකේ තිබුන රතු සලකුන දකිද්දි හිතට දැනුන සතුට වචන කරන්න බෑ…මොකද මොන තරම් දූශිත ජීවිතයක් ගත කරත් කොල්ලා කවදවත් ම මේ සතුට විදලා තිබුනේ නෑ…මොකද සාරා ලග එහ් දේ තිබුනේ නෑ…ගනිකාවෝ ලග නම් එහ් සතුට කොහොමටවත් ලැබෙන දෙයක් නෙමෙයි…මොකද කොල්ලා එහෙම හැසිරුනෙත් තමන් ගැනම තිබ්බ තරහට…එහ් ඇරත් ගනිකාවෝ ලග එහෙම දෙයක් තියෙන්න විදිහක් නෑ….

එහ් සතුට දරා ගන්න ම බැරිතැන කොල්ලගේ ඇස් වලට කදුලු ඉනුවා…ඒත් එහ් එක්ක ම ලොකු පසුතැවීමකුත් හිතේ නොතිබුනා ම නෙමෙයි… එහ් මේ නේහා මෙහෙම හිටපු පලවෙනි වතාව උනත් තමන් ගේ මේ පලවෙනි අත්දැකීම නෙමෙයි කියලා දැනෙද්දි….

හැබැයි කොල්ලට එක දේකට සතුටු හිතුනා…ජීවිතේ විදවලා විදවලා හරි අන්තිමට හරි ම කෙනා ලැබුනා නේද කියලා දැනෙද්දි….අතීතේ උන දේවල් වෙනස් කරන්න බැරි හින්ද ම කොල්ලා හිතට දැනුන පසුතැවීම හිතින් අයින් කරගත්තේ ආයෙත් කවදවත් ම එහ් වැරදි තමන් අතින් වෙන්නේ නෑ නේද කියලා හිතලා….

වොශ් රූම් එකට ගිහින් වොශ් එකකුටිප් දගෙන එළියට ආව කොල්ලට වැරදීමකින් නේහා ගේ id එක හම්බුනේ එහ් වෙලාවේ… එහ් අල්මාරියේ නේහා ගේ පැත්තේ තිබුන නේහා ගේ purse එක වැරදිලා කොල්ලා අතින් බිම වැටුන වෙලාවේ…

වැරදීමකින් දක්කත් ඒකේ තිබුන ඩේට් එක දකිද්දි කොල්ලට පුදුමයක් වගේ ම දුකකුත් දැනුනා… එහ් වෙන දෙයක් නිසා නෙමෙයි…එහ් තිබුන ඩේට් එක අද නිසා…. නේහා ට මේ තරම් ආදරේ කරලත් කෙල්ලගේ birthday එක නොදැන හිටපු එකට කොල්ලට තමන් ගැන ම ආවේ තරහක්…නේහා ට විශ් කරන්න බැරි උන හින්ද් ම කොල්ලා හිතුවේ අද රෑට කෙල්ලව ස්ප්‍රයිස් කරන්න…. කෙල්ලට හිතා ගන්නවත් බැරි විදිහට කෙල්ලව ස්ප්‍රයිස් කරන්න…..

sinhalaebooks.com

කොල්ලා ඇඳුමකුත් දාගෙන පහලට ආවේ කිසි දෙයක් නොදන්න ගානට..

ඒත් මේ birthday ස්ප්‍රයිස් එක.... නේහා ගේ වගේ ම ආයුශ් ගේ ජීවිතත් මේ තරමට ම වෙනස් කරයි කියලා කොල්ලා හීනෙකින් වත් හිතුවේ නෑ....
කොල්ලා පහලට එන අඩි සද්දේ කෙල්ලට ඇහුන හින්දම කෙල්ල ආයුශ් ට වෙනසක් නොපෙනෙන විදිහට එක ඉලක්කයක් දිහා බලාගෙන කරගෙන ගියපු වැඩ ටික එහ් විදිහට ම කරා.....ආයුශ් කිචන් එකට ඇවිත් කෙල්ල කරන වැඩ දිහා ටික වෙලාවක් බලන් ඉදලා ඊලග තත්පරේ පිටිපස්සෙන් ම ඇවිත් කෙල්ලගේ උරහිසෙන් නිකට තියා ගත්තේ එක අතකින් කෙල්ලව බදාගෙන....

" ඇහැරුනා ද... "

නේහා අහිංසක හිනාවකුත් එක්ක අහද්දි ආයුශ් කරේ නිහඬව ම නේහා ගේ ගෙල සිපගත්ත එක....එතකොටයි කොල්ලා දැක්කේ කෙල්ලගේ බෙල්ලේ කීප තැනක් ම රතු වෙලා තියනවා..එහ් දේවල් තමන් අතින් ඊයේ රෑ උන දේවල් නේද කියලා හිතෙද්දි කොල්ලට ආයෙම තමන් ගැනම ලොකු පසු තැවීමක් දැනුනා... ආයුශ් කෙල්ලව තමන් ගේ පැත්තට හරවගෙන කෙල්ලගේ කම්මුලෙන් අතක් තිබ්බේ සුසුමකුත් පිට කරලා...එතකොටයි කොල්ලා දැක්කේ කෙල්ලගේ ලිප්ස් වලත් කීප තැනක් ම රතු වෙන්න ම තුවාල වෙලා...

" අනේ සුදු මැනික.... "

කොල්ලා නේහා ගේ ලිප්ස් වලින් අත තියලා කිවුවේ තමන් ගැන ම පසුතැවීමකින්.......

" අනේ ඇයි සුදු අයියේ.... "

එහ් නේහා ආයුශ් ට එහෙම කතා කරපු පලවෙනි වතාව...ඒකෙන් කොල්ලගේ පසු තැවීම තවත් වැඩි උනා....

" මන් ඊයේ ගොඩක් රිද්දලා සුදු මැනික...මන් හිතලා කරේ නෑ...මට...මට සමාවෙන්න මැනික.... "

" ඇ..යි..."

" මන් ආයෙ එහෙම ලන් වෙන් නෑ..."

" ඇ..යි..."

" මට රිද්දන්න ඕනේ නෑ මැනික.... "

" අනේ මට රිදුන් නෑ ආයූ...අනික මන් ආසයි...."

sinhalaebooks.com

" මොකට ද..."

" ඉක්මනට මේ බන්ඩියට ඔයාගේ මූන තියන පැටියෙක් එනවා නම්..."

නේහා කිවුවේ තමන් ගේ හිස් කුසින් අතක් තියලා..ආයුශ් කෙල්ලගේ නලල ට කිස් එකක් දීලා හිස් කුසින් තියන් හිටපු කෙල්ලගේ අත උඩින් තමන් ගේ අත තියලා නේහා ගේ මූන දිහා බැලුවේ පුදුම තරම් ආදරේකින්...

" ගේමු මැනික... ඉක්මනට ම... "

" ඒත්....ඒත් කොහොම ද..."

නේහා ඇහුවේ ආයුශ් කවදාවත් ම අහලා නැති අමුතුම වොයිස් එකකින්...ලිප්ස් දෙකත් හපාගෙන...

" කොහොමද...දැන් හැදිලා ගානකට..."

කොල්ලා කෙල්ලගේ කනකුත් මිරිකලා කියද්දි නේහා හිනා වෙවීම ආයුශ් ගේ පපුවට තුරුල් උනා... කොල්ලා උන්නේ නේහා ගේ ඔලුව අත ගාන ගමන්...

" සුදූ මැනික..."

" ඇයි මට කතා කරේ නැත්තේ...මන් උයනවනේ......"

ආයුශ් කිවුවේ පසුතැවිල්ලෙන්..නේහා කරේ ආයුශ් ගේ පපුවේ තිබුන රෝම කූපයක් ආයුශ් ට රිදෙන තරමට ම ඇද්ද එක...

" ආ..ව්..."

කොල්ලට කෑ ගැහුනේ ඉබේම...

" ආයේ හැමදාම උයන්නේ මන්...කෝ ඉන්න... බත් එක ඉදිල ද බලන්න.... "

නේහා එහෙම කියන ගමන් ම ආයුශ් ගේ තුරුලෙන් ඇත් වෙලා ආයුශ් ට සැක නොහිතෙන විදිහට රයිස් කුකර් එක ලගට ගිහින් ඕෆ් වෙලා ද බැලුවා.... ආයුශ් මේ හැමදේම බලන් හිටියේ පුදුම තරම් ආදරේකින්...

කෙල්ල එපා ම කියද්දි ආයුශ් එක ප්ලේට් එකකට බත් බෙදාගෙන ඊයේ වගේ ම නේහා ට තමන් ගේ අතින් ම කැවුවා......ඊට පස්සෙයි කොල්ලා රෑ වැඩේ ගැන හිතුවේ...ස්ප්‍රයිස් එක වෙනුවෙන් නේහා ට චූටි බොරුවක් කියන්න වෙන එක ගැන නම් කොල්ලා උන්නේ ටිකක් පසු තැවීමකින්..ඒත් චූටි බොරුවයි නෙහ් කියලා කොල්ලා ආයෙම හිත හද ගත්තා....

sinhalaebooks.com

" සුදු මැතික..."

" ම්ම්ම්ම්....."

"මට හදිස්සියේම ඔෆිස් එකට යන්න වෙලා...."

" අනේ ආයූ..."

" මන් ඉක්මනට ගිහින් එන්නම් මැතික...ඔයාවත් එක්ක යනවා මන්...ඒත් අද ඔෆිස් එකේම ඉන්න බැරි වෙයි...මගෙ මැතිකට මන් එනකම් පැයක් විතර තනියම ඉන්න පුලුවන් නේද...හැබැයි ඇඳ උඩට ම වෙලා...මන් කෝල් කරන්නම් සුදු මැතික... "

ආයුශ් කිවුවේ පුදුම තරම් ආදරේකින්...නේහා ආයුශ් ගේ අතකින් අල්ල ගත්තේ සුසුමකුත් පිට කරලා...

" පාලුයි...ඉක්මනට එන්න....මන් බලන් ඉන්නවා..."

" එනවා සුදු මැතික ප්‍රොමිස්..."

ආයුශ් එහෙම කියන ගමන් කෙල්ලගේ නලලට කිස් එකකුත් දීලා කිචන් එකට ගියේ ප්ලේට් එක හෝදන්න.....

හවස 4 වගේ වෙද්දි ආයුශ් ගෙදරින් පිටත් උනේ නේහා ට රූම් එකට ම වෙලා ඉන්න කියලා..එහ් වගේ ම කොල්ලා නේහා ගේ අතට දීලා ගියේ ලස්සන නිල් පාට සාරි එක..අහස් නිල් පාට සාරි එකක්..

" සුදු මැතික...මන් එද්දි මේක ඇදන් ඉන්න..."

ආයුශ් කෙල්ලගේ ඔලුවත් අත ගාලා කිවුවේ නේහා හා කියන්න ඔලුව හොල්ලද්දි.....කොල්ලා දැනට මත් තීරනය කරලා ඉවරයි...කෙල්ලට දෙන birthday gift එක මොකක් ද කියලා...

ආයුශ් ගෙදරින් ගියේ පුදුම තරම් සතුටකින්... ගෙදර යතුරත් අරන් ම ගියේ දොර අරින්න කෙල්ලට කතා කරොත් ස්ප්‍රයිස් එකක් නැති වෙන හින්ද...

කොල්ලා කෙලින් ම ගියේ පොඩි ලමයින් ගේ සෙල්ලම් බඩු වගේ ම පොඩි ලමයින් ගේ ඇදුම් තියන කඩේකට .. හිතේ හැටියට සෙල්ලම් බඩු මල්ලකුත් අරන් එක වගේ ම මහලා තියන අම්මෙකුගෙයි පුංචි දුවෙක් ගෙයි පුතෙක් ගෙයි ඇදුමක් ගත්තේ ඉක්මනට ම ලගට එන්නේ දුව ද පුතා ද කියලා නොදන්න නිසා...තමන් ටත් ඒකට ම මැච් වෙන ඇදුමකුත් අරන් කොල්ලා ශොප් එකෙන් පිටත් උනේ එහ් හැමදේම ලස්සනට පැක් කරගෙන ...

sinhalaebooks.com

නේහා ආසා කෑම ජාති මොනා ද කියලා ඇත්තට ම කොල්ලා දැනන් හිටියේ නෑ...එහ් හින්ද ම ආයෙ ම කොල්ලට තමන් ගැන තරහක් දැනුනා... කොල්ලා නේහා ආසා ඇති කියලා හිතුන කෑම ජාතියි ලොකු කේක් එකකුයි පුංචි සෙල්ලම් බෝල ටිකකුයි ගත්තේ හිතේ තිබ්බේ ප්ලෑන් එකට එහ් හැමදේම ත් ඕනි නිසා...

ඊලගට එහ් හැමදේමත් කාර් එකේ දගෙන ගෙදර ට හරියට ම 5.30 වෙද්දි..විනාඩි 30ක් ලේට්....

කොල්ලගේ හිතේ චූටි බයක් තිබුනා..කාර් එක එන සද්දේ නේහා ට ඇහුනොත් ස්ප්‍රයිස් එකට බාදවක් එයි කියලා...ඒත් ශොප් එකෙන් එලියට බහිද්දි ම ගොරව ගොරව වහින්න පටන් ගත්ත දරානිපාත වශර්ාව හින්ද ම කොල්ල ගේ හිතේ තිබ්බ එහ් චූටි බයත් නැති වෙලා ගියා...

අකුනු ගහනවා හොදට ම...එහ් තරම්ම වහිනවා..මේ වැස්සට කාර් එකක් නෙමෙයි train එකක් හෝන් කරන් ගියත් ඇහෙන් නෑ...සීයට සීයක් ශුවර්...

එහ් හින්ද ම කොල්ලා කිසිම බයක් නැතුව සද්දයක් නැති වෙන්න දොරත් ඇරලා ඇතුලට ආවා...

ඇවිත් මුලින් ම කරේ කේක් එක ටේබල් එකක් උඩින් තියපු එක...ඊට පස්සේ අර ඇදුම් තුනත් එහ් ලගින් ම තිබ්බා...ඊට පස්සෙයි සෙල්ලම් බඩු මල්ල තිබ්බේ..එතන තිබුනා පුතෙක් ට ම වෙන් උන නිල් පාට ඇදුම් බේසම් වගේ ම සෙල්ලම් කාර් ගොඩක්... එහ් වගේ ම දුවෙක් ට ම වෙන් උන රෝස පාට ඇදුම් බේසම් වගේ ම බෝනික්කෝ ගොඩක්... නේහා ට මේ දේවල් ස්පශර් කරලා අදුන ගන්න ලේසි වෙන්න කොල්ලා ගෙනාවේ ටිකක් පුංචි ඒත් ගොඩක් ලස්සන සෙල්ලම් බඩු...

හැමදේම පිලිවලකට හදලා කොල්ලා උඩ රූම් එක දිහා බැලුවේ අහිංසක හිනාවකුත් එක්ක...එහ් හිනාවේ අහිංසක බලාපොරොත්තු කොටියක් විතර දැලු දනවා...

රූම් එකේ දොරත් ඇරලයි තිබුනේ...එහ් වගේ ම ලයිට් එකත් දලා..

ආයුශ් හිතින් මවා ගත්තා නේහා දැන් රූම් එකේ ඉන්න විදිහ... ඊලගට දගෙන හිටපු සපත්තු දෙක ගැලව්වේ පඩිපෙලේ යද්දි කිසිම සද්දයක් නේහා ට ඇහෙන් නැති වෙන්න...කොල්ලා තිබ්බ අඩියක් ගානෙ කිසිම සද්දයක් ඇහෙන් නැති වෙන්න පරිස්සම් උනා...එහ් හැම පියවරකින් ම අඩියෙන් අඩිය නේහා ට ලන් වෙද්දි කොල්ලගේ හිතේ ආදරෙත් එහ් තරමට ම වැඩි උනා..කොල්ලා හිතන් හිටියේ මේ විදිහට ම කෙල්ලට නොදැනෙන්න රූම් එක ඇතුලට ගිහින් කෙල්ලගේ ඇස් දෙක වහන්න...ඒත් රූම් එකේ දොර ලගට කිට්ටු වෙද්දි කොල්ලගේ එහ් අදහස වෙනස් උනා...කොල්ලා සාක්කුවේ තිබුන ෆෝන් එක අරන් රූම් එකේ තිබ්බ land phone එකට කෝල් එකක් ගත්තේ එහ් ගමන් ම හොරෙන් ම රූම් එකේ දොරින් රූම් එකට එබිලා බලන ගමන්...

sinhalaebooks.com

එතකොටයි කොල්ලා දැක්කේ...කෙල්ල තමන් දුන්න නිල් පාට සාරි එක ඇඳගෙන ඉන්නවා... ෆෝන් එක තිබුනේ බෙඩ් එක ලග ටේබල් එකේ... ෆෝන් එකේ ආයුශ් තමන් ගේ නම්බර් එක සේව් කරලා තිබ්බේ එහ් කාලෙමයි..එහ් පායා ගේ බල කිරීමට....

නේහා උන්නේ කොල්ලා කිවුව විදිහට ම ඇදේ වාඩි වෙලා..කෝල් එක එනවත් එක්ක ම කෙල්ල ඇදෙන් නැගිටලා ටේබල් එක ලග තිබුන ෆෝන් එක ලගට යනවා කොල්ලා බලාගෙන.... ඒත් කොල්ලට වැඩි වෙනසක් පෙනුනේ නෑ...කොල්ලා උන්නේ පුදුම තරම් ආදරේකින් කෙල්ල දිහා ම බලාගෙන....

නේහා කෝල් එක ආන්සර් කරලා හෙල්ලෝ කිවුවත් ආයුශ් එක වචනයක් වත් කතා කරේ නෑ.... කෙල්ල දෙතුන් පාරක් ම හෙල්ලෝ කියද්දි ආයුශ් හිනා වෙවී එහ් දිහා බලන් හිටියා...ඊලග තත්පරේ කෝල් එක කට් කරේ රූම් එක ඇතුලට යනවයි කියලා හිතාගෙන...ඒත් අඩිය ඉස්ස්සරහට තිබ්බ පලවෙනි තත්පරේ ම අඩිය ආපහු පිටිපස්සට තිබ්බේ ඇහුන වචන ටික විශ්වාස කරන්න බැරි කමට...තමන් ගේ ඇස් විශ්වාස කරන්න බැරි කමට...

නේහා හිනා වෙවීම ෆෝන් එක කට් කරල බිත්තියේ එල්ලලා තිබුන බිත්ති ඔරලෝසුව දිහා බැලුවේ අහිංසක හිනාවකුත් එක්ක...නේහා හිටියේ ආයුශ් ට පිටුපාලා උනත් රූම් එක දිහා බලන් හිටපු ආයුශ් ට කෙල්ලගේ හැම ඇක්ශන් එකක් ම බොහොම පැහැදිලි ව පෙනුනා...

" 5.40යි... 5 ට එනවයි කිවුව කෙනා තාම නෑ.... "

නේහා ගේ එහ් වචන ටික කොල්ලට ඇහුනේ හීනෙන් වගේ...එහ් එක්ක ම කොල්ලා වෙලාව බැලුවේ තමන් දැක්ක දේ විශ්වාස නැති නිසා...

ඔව්...හරියට ම 5.40යි... කොල්ලා උන් තැන ම ගල් ගැහිලා කෙල්ල දිහා බලන් උන්නු එක ම විතරයි කරේ... කෙල්ල එහ් එක්ක ම ආවේ කන්නාඩිය ලගට...ඇවිත් කඩා දාලා තිබ්බ කොන්ඩේට චූටි කටුවක් ගහලා කන්නාඩි මේසේ උඩ තිබ්බ ලිප්ස්ටික් එක ගෑවේ පුදුම තරම් සංසුන් ව...කන්නාඩියට ලිප්ස් දෙක ගොඩක් ම ලන් කරලා.. ඊලගට ඇදන් හිටපු සාරිය ට කටුවක් ගැහුවේ කන්නාඩියට ඇලව හිටගෙන...කන්නාඩියෙන් පේන තමන් ගෙ උරහිස දිහා බලාගෙන.... ඊලගට අතින් සාරි එකේ පොට හැදුවේ අහිංසක විදිහට කන්නාඩියෙන් පේන තමන් ගේ මූනට ම හිනා වෙලා....

හුස්ම ගන්න පවා අමතක වෙද්දි මුලු ලෝකෙම එක ම තැනක නතර වෙලා වගේ දැනෙද්දි ආයුශ් ගේ පපුවේ ගැස්ම පවා දුවර්ල වෙලා යද්දි කොල්ලා මෙ හැමදේම දිහා බලන් උන්නේ ඇස් පිල්ලමක් වත් නොගහා...කොල්ලට තමන්ගෙ ම ඇස් විශ්වාස නැති තැන හිටියේ...වෙලාවකට කොල්ලට හිතුනේ මේ දකින්නේ හීනයක් මයි කියලා..

මොන තරම් කොල්ල දුවර්ල වෙලා ද හිටියේ කියනවා නම් කොල්ලගේ ඇග පන නැති උන පාරට අතේ තිබුන ෆෝන් එක බිම වැටුනා.එහ් සද්දෙටයි කන්නාඩිය ඉස්සරහා හිටපු නේහා එහ් දිහා බැලුවේ....

sinhalaebooks.com

දොර ලග හිටපු ආයුශ් ව දකිද්දි කෙල්ලට කිසි දෙයක් හිතා ගන්න බැරි උනා..කරන්නේ මොකක් ද කියන්නේ මොකක් ද කියලා හිතා ගන්න බැරි තැන කෙල්ල පුදුම විදිහට අසරණ උනා...එහ් තරමට ම හිත ගැස්සුනේ ආයුශ් බලන් උන්නේ ඉරියව්ව නිසා...

නේහා ගේ ඇස් කෙලින් ම යොමු උනේ ආයුශ් ගේ ඇස් දිහා ට...අයුශ් ගල් ගැහිලා බලන් උන්නේ එහ් ඇස් දිහා... නේහා ගේ ඇස් ආයුශ් ගේ ඇස් එකින් එක ගැටුන පලවෙනි වතාව... නේහා ගේ ඇස් වල තිබුනේ අසරණකමක්.... මොකද කෙල්ලට දැනිලා උන්නේ...ආයුශ් තමන් රූම් එකේ දි කරපු හැමදේම බලන් ඉන්න ඇති කියලා... දැන් හංගන්නවත් රැක ගන්නවත් කිසි දෙයක් නැති බව කෙල්ල දැනන් උන්නා...

ආයුශ් ගේ ඇස් වල තිබ්බේ අදහා ගන්න බැරි බැල්මක්..තරහක්වත් දුකක් වත් නෙමෙයි...තමන් ගේ ඇස් තමන් ට ම අදහ ගන්න බැරි හැගීමකුයි එහ් ඇස්වල තිබ්බේ...

නේහා උන් තැන ම ගල් ගැහිලා බලන් ඉද්දි ආයුශ් එහ් ඉරියව් වෙන් ම නේහා ගේ ඇස් වලම තමන් ගේ ඇස් රදවගෙන නේහා දිහා ට ආවේ තියන පුංචි අඩියත් මහා ලොකු දුරක් ගෙවුවා වගේ මහන්සියක් ආයුශ් ගේ ගතට වගේ ම හිතටත් දැනෙද්දි...කොල්ලා උන්නේ තාමත් පියවි ලෝකේ නෙමෙයි..තාමත් කොල්ලා උන්නේ තමන් ගේ ඇස් තමන් ට බොරු කරනවා කියන මතයෙන්...

ආයුශ් අඩියෙන් අඩිය නේහා ලගට ඇවිත් කෙල්ලත් ආයුශ් අතරත් හුස්මත් දැනෙන තරමට පරතරයක් තියලා නැවතුනේ නේහා ගේ ඇස් දෙක දිහා ම බලාගෙන...

කෙල්ල උන්නේ මේ හැමදේම මේ තරම් ඉක්මනට උන විදිහත් එක්ක අඩන්නවත් සිහියක් නැති තරමට දුවර්ල වෙලා..

ආයුශ් කෙල්ල ගේ ඇස් දිහා ටික වෙලාවක් ගල් ගැහිලා බලන් ඉදල ඊලගට ඇහුව දේට නම් කෙල්ලට ඉකි ගගහා ඇඩුනේ දැනුන අසරණකම ට වගේ ම ආයුශ් ව නැති වෙයි කියලා හිතට දැනුන බයට....

" කවද ඉදන් ද.... "

ආයුශ් ගේ වචන ටික පිට කරගත්තේ පුදුම අපහසුවකින්...කොල්ලගේ උගුරෙන් වචන පිට නොවෙන තරමට ම උගුර ලග මොකක් ද හිර වෙලා වගෙයි කොල්ලට දැනුනේ...ඒත් නේහා කරේ උත්තර දෙනවා වෙනුවට ආයුශ් ගේ ඇස් දෙක දිහා ම බලාගෙන ඉකි ගගහා අඩපු එක.... ඒත් ආයුශ් බලන් උන්නේ ඇස් පිල්ලමක් වත් නොගහා..කලින් ඉරියවුවෙන් මයි....

කෙල්ලගේ ඉකි බිදුම් අතරින් ම ආයුශ් ආයෙම හඩ අවදි කරේ ඇසෙන නෑසෙන තරමට ම ආයුශ් ගේ කටහඩ දුවර්ල වෙලා යද්දි...

" මන්...රට ගියා ට පස්සෙ ද... "

sinhalaebooks.com

ආයුශ් ඇහුවේ නේහා ගේ ඇස් දිහා ම බලාගෙන....කෙල්ල ඇඩුම් අතරින් ම ඔව් කියන්න ඔලුව හොල්ලද්දි කොල්ලගේ හුස්ම නැවතුනා වගේ දැනුන හැගීමත් එක්ක ම කොල්ලා නේහා දිහා බලාගෙන ම අඩියෙන් අඩිය පිටපස්සට ආවා...ඒලගට පඩිපෙල එකින් එක බහින්න ගත්තේ ඇවිදින මලකදක් වගේ...

නේහා උන්නේ ආයුශ් යන දිහා ඉකි ගගහා බලාගෙන...කෙල්ලට කරන්න ඕනි මොකක් ද කියලා හිතාගන්න බැරි උනා...

ඒත් ආයුශ් නැතුව එකම එක තත්පරයක් වත් ජීවත් වෙන්න බෑ නේද කියලා හිතට දැනුන මහා අසරණකමත් එක්ක ම කෙල්ල අඩියට දෙකට දුවලා මේ වෙද්දි සාලේ හිටගෙන ඉස්සරහා දොර ලගට යන්න හදන ආයුශ් ගේ එක කකුලක් බදා ගත්තෙ කොල්ලට තවත් අඩියක් වත් හොල්ලන්න බැරි වෙන්න...

" අනේ ආයුශ්...අනේ මට සමාවෙන්න..මන්...මන් ඔයාව රවට්ටන්න හිතුවේ නෑ රත්තරං...මන්.....අනේ මන් කියා ගන්න බැරුව හිටියේ මගෙ අයියේ...මන් හිතින් පිච්චි පිච්චි විදෙව්වා හැමදම... අනේ මාව දාලා යන්න එපා රත්තරන්...මට ගහන්න...නැත්නම් මාව මරන්න...ඒත් මාව දාලා යන්න එපා.
...අනේ මට ඔයා නැතුව ඉන්න බෑ දෙයියනෙ...මාව මෙතන ම මැරිලා යයි... "

කෙල්ල කිවුවේ තිමක් නැතුව ගලන් යන කදුලු බිංදු අතරේ පපුවට දැනුන දරා ගන්න බැරි වේදනාව එක්ක...

ආයුශ් ගේ මේ නිහඩතාව...කෙල්ලගෙ හිතේ දුක මේ තරමට ම වැඩි වෙන්න ලොකු ම හේතුවක් උනා... කොල්ලා ගැහුව නම් බැන්නම්...නැත්නම් තමන් කරපු වැරැද්දට ඕන ම දඩුවමක් දුන්නා නම් කෙල්ලගේ හිතට මේ තරම්ම දුකක් වේදනාවක් නොදැනෙන්න තිබුනා... ඒත් ආයුශ් ගේ මේ නිහඩතාව... ආයුශ් මේ ඇත්ත දැනගත්ත දට ආයුශ් ගෙ අතින් ම ගුටි කාලා මැරෙන එකත් සැපයි කියලා හිතන් උන්නු කෙල්ලට මේ නිහඩතාව ගෙනාවේ දරාගන්න බැරි මහා ලොකු වේදනාවක්...

6ට කිට්ටු කරලා තිබුනත් මහා රෑ වගේ මුලු පරිසරයෙම වැහි අදුරට කලුවර වෙලා.... තත්පරෙන් තට්ග්පරේ මුලු පරිසරය ම දෙදරලා යන තරම් හයියෙන් ගහන මේ අකුනු හඩ විදුලි එලිය වගේ ම මේ දරානිපාත වශර්ාවත් කෙල්ලගේ මේ අසරණ කම දුක වේදනාව කම්පාව තවත් වැඩි කරා...

කෙල්ල හිතට දැනුන එහ් අසරණ කම ට දරා ගන්න බැරි දුකට කරේ ආයුශ් ගේ කකුල තවත් හයියෙන් බදගෙන වැලහින්නක් වගේ අඩා වැලපුන එක...

ඒත් ආයුශ් ගෙන් කිසිම ප්‍රතිචාරයක් තිබුනේ නෑ...කොල්ලා උන්නේ එක ඉල්ලක්කයක් දිහා බලාගෙන ඇහි පිල්ලමක් වත් නොගහා...මේ උන කිසි දෙයක් තාමත් විශ්වාස කරන්න බැරුව...

sinhalaebooks.com

අඬලා අඬලා හෙම්බත් උන තැන කෙල්ල ආයුශ් ගේ කකුල ලිහිල් කරලා තමන් ගේ ග්‍රහනයෙන් අයින් කරලා නැගිටලා ආයුශ් ගේ මූන දිහා බැලුවේ අත් දෙක ම එකතු කරලා ආයුශ් ගෙන් සමාව ඉල්ලන්න වදින ගමන්... ඒත්...ඒත් ආයුශ් ගෙන් එක ම ප්‍රතිචාරයක් වත් තිබුනේ නෑ...කොල්ලා නැවතිලා තිබුන අඩිය ආයෙම ඉස්සරහින් තිබ්බේ කලින් යන්න හදපු තැනට ම යි...එහ් වෙන කොහෙට වත් නෙමෙයි...දොර ඉස්සරහට...

" අනේ ආයුශ්...යන්න එපා රත්තරං...කොහෙද මේ යන්න හදන්නේ..." .

නේහා ආයෙ ම ගිහින් ආයුශ් ගේ කකුලේ එල්ලිලා අඩන්න ගත්තේ කොල්ලට ආයෙ ම අඩියක් වත් තියා ගන්න බැරි වෙන්න.. ඒත් මේ පාර ආයුශ් තමන් ගේ කකුල ඉවත් කරන්න පුංචි ම පුංචි උත්සාහයක් දරද්දි මේ තරම් වෙලා ආයුශ් ගෙන් කිසි ම ඇක්ශන් එකක් නොතිබුන නිසා ම කෙල්ලගේ හිතට ඒකත් මහා ලොකු සහනයක් උනා.කෙල්ල එහ් තත්පරෙ ම නැගිටලා දෝතින් ම ආයුශ් ගේ මූනට අත තිබ්බේ අඩ අඩ මයි...

" ආ..යූ... "

කෙල්ල ආයුශ් ගේ මූන දිහා බලාගෙන තවත් මොනවදෝ කියන්න හැදුවත් ඊලගට උනේ කෙල්ල කිසි සේත් ම බලාපොරොත්තු නොවුන දෙයක්... ආයුශ් තමන් ගේ අත් දෙක ම එකතු කරලා නේහා දිහා ට හරවලා කිවුවේ නේහා ට ඉස්සරහින් අයින් වෙන්න කියලා... දෑත් දෙක ම එකතු කරලා නේහා ට වැදගෙන ආයුශ් එහ් ඉල්ලපු දෙයට නේහා ගේ හිතට දැනුනේ කවදවත් ම නොදැනුන දරා ගන්න බැරි තරමට වේදනාවක්...

කෙල්ල ඉකි ගගහා ආයුශ් ගේ ඉස්සරහින් අයින් වෙද්දි කොල්ලා මහා වැස්සෙම තෙමීගෙන කාර් එකට නැංගේ නේහා වැලහින්නක් වගේ ඉකි ගගහා ආයුශ් දිහා ම බලාගෙන ඉද්දි...ආයුශ් වාහනේ ස්ටාට් කරන් යන දිහා නේහා බලන් උන්නේ වැස්සේ තෙමි තෙමී...ආයුශ් ගේට් එකෙන් කාර් එක එලියට යද්දි ම කෙල්ලගේ ඇඩිල්ල වැඩි උනේ හිතට දැනුන මහා ලොකු තනිකමත් එක්ක...කෙල්ල එහ් දැනුන වේදනාවට ම වැස්සෙම මහා පොලවේ දිගා උනේ පපුව පැලිලා මැරිලා යනවා නම් කියලා තමන් ගේ හිතින් ම ඉල්ලන ගමන්...

කෙල්ල බිම දිගා උන පාරට මිදුලේ තිබුන මඩ වතුර වලින් කෙල්ලගේ මුලු ඇගම තෙමිලා ගියා...දරානිපාත වැස්සත් එක්ක ම අකුනු හඩවල් එක්ක කෙල්ල එහ් සද්දෙට දෙවනි නොවෙන තරම්ම කෑ ගගහා ඇඩුවත් කෙල්ල ගේට් එක දිහායින් ඇස් ඉවතට ගත්තේ නම් නෑ..මොන තරම් උනත් ආයුශ් ආයෙම එයි කියලා කෙල්ලගේ හිත කෙල්ලට කියන්න ගත්තා..මොන තරන් වෙලා බලන් හිටියත් ආයුශ් ආවේ නෑ... අන්තිමට දරාගන්න ම බැරි තැන කෙල්ල වැලහින්නක් වගේ අඩ අඩ ම විදුලි කොටමින් මහා හයියෙන් ගොරවන අහස දිහා බලලා අත් දෙක ම එකතු කරලා වැන්දේ දැනුන අසරණකමට...

" මගෙ තාත්තා වගේ මගෙ ආයුශ් ව මගෙන් ඈත් කරන්න එපා...මාව මැරිලා යයි දෙයියනේ.... "

sinhalaebooks.com

කෙල්ල එහෙම කියන ගමන් ම ආයේ ආයෙත් මහා හයියෙන් අඩන්න ගත්තා...කෙල්ල උන්නේ ඇගට පවා පත නැති වෙනකම් හොඳට ම අඩලා....හොඳට ම දුවර්ල වෙලා..මොන තරම් ඇඩුවත් දෙවියන්ගෙන් ඉල්ලුවත් නේහා ගේ දුක් ගැනවිල්ල අහන්න කවුරුත් ම හිටියේ නෑ.... ගත්වෙන හැම තත්පරෙ ම කෙල්ලගේ හිතේ දුක එන්න එන්න ම වැඩි වෙද්දි කෙල්ල අඩ අඩ ම වතුර පිරිලා තියන පොලවෙම ඇස් දෙක පියා ගත්තේ එහෙමම මැරිලා යන්න කියලා මුලු හිතින් ම ප්‍රාර්ථනා කරමින්...

ආයුශ් කාර් එක පාරට දාන්මේ යන තැනක් වත් කරන්න දෙයක් වත් හිතාගෙන නෙමෙයි...කොල්ලා උන්නේ සිහියකින් නෙමෙයි...කොල්ලා කාර් එක ඩ්‍රයිව් කරත් කොල්ලගේ හිත තිබුනේ වෙන තැනක..කොල්ලගේ කඳුලු වලට ම ඇස් බොඳ වෙලා..කොල්ලා උන්නේ පාරවත් පේන තත්වෙක නෙමෙයි...

කොල්ලගේ හිතේ නේහා ව මුලින් ම දැක්ක දවසේ ඉඳන් උන හැම සිදුවීමක් ම එකින් එක මැවෙන්න ගත්තා... එදා මලීශ් එක්ක කාර් එකේ යද්දි මුල්ම පාරට නේහා ව දැක්ක ම නේහා ට ඇස් පේන් නෑ කියලා නොදන තමන් බැනපු හැටි...ඇස් පේනවා කියලා දැනගත්ත වෙලාවේ බැනපු හැටි..නේහා ගෙ ගෙදර මුල්ම වතාවට ගියපු වෙලාවේ කරපු දේවල්...අන්තිමට කෙල්ලගේ අකමැත්තෙන් ම කෙල්ලව මැරි කරපු හැටි..හනිමූන් දවසේ රෑ කෙල්ලගේ ඇගට ඉවිපත්දම් ඉටි දාන්ම හැටි...එහ් හැම නපුරුකමක් ඉස්සරහම නේහා ගේ කඳුලු ඉස්සරහා තමන් අසීමිත සතුටක් විඳපු හැටි... දුක් දෙන්න දෙන්න කෙල්ලගේ මූනේ දැකපු එහ් අහිංසක හිනාව...එහ් හිනාවට තමන් ට තමන් ව ම අමතක වෙලා තමන් ටත් හොරෙන් නේහා ට තමන් ගේ හිත ආදරේ කරපු හැටි..නේහා ගේ ඇස් මලීශ් හොඳ කරන්න හදද්දි නේහා ව නැති වෙයි කියලා හිතට දැනුන බය එක්ක කොල්ලා නේහා ගෙන් ගත්ත පොරොන්දුව මලීශ් ට සරණී ට කිවුව දේවල්... රට යන්න කලින් දවසේ රෑ නේහා තමන් ගේ පපුවට තුරුල් වෙලා අඩපු හැටි... කවදාවත් අඩන් නෑ කියලා හිතන් හිටපු තමනුත් එහ් එක්ක ම අඩපු හැටි.....

රට ගිහිනුත් ගෙවෙන හැම තත්පරේ ම නේහා ගේ ඇස් සනීප කරයි ද කියලා කොල්ලා බයෙන් උන්න හැටි....එහ් බය හින්ද ම ලැබෙන හැම තත්පරේ ම ගෙදර ට කෝල් කරලා නේහා කොහෙද ඉන්නේ කියලා හොයලා බලපු හැටි... රට ගිහින් දවසක් කලින් එද්දි නේහා එහ් පොරොන්දුව කවදාවත් කඩ කරලා නෑ කියලා දැනගත්ත වෙලාවෙ හිතට දැනුන සතුට,ආදරේ....එහ් වෙලාවේ තමන් ගේ හිතේ නේහා ගැන තියන මේ හැඟීම,ආදරේ තවත් හංගන්න ඕන් නෑ කියලා නේහා ව පන වගේ බලාගන්නවා කියලා තමන් ගෙ ම හිතට උන එහ් පොරොන්දු ව...නේහා ට ආදරෙයි කිවුව හැටි... නේහා ගේ පපුවට තුරුල් වෙලා අඩපු හැටි...ඇස් පේනවා කියලා නොදන කෙල්ලගේ හැම වැඩක් ම තමන් ගේ අත් දෙකෙන් ම කරපු හැටි...එහ් දේවල් කරන්න බැරි උනා ම තමන් දුක් උන හැටි...නේහා ව තමන් ගෙ ම කරගත්ත එහ් මොහොත.... එහ් හැමදේ ම එක්ක නේහා එහ් කිසි දෙයක් නොපෙනෙන විදිහට එක ම ඉලක්කයක් දිහා බලාගෙන තමන් ව රවට්ටපු හැටි....

මේ හැමදේම එකින් එක කොල්ලගේ හිතේ මැවෙන්න ගත්තේ තමන් ආයෙම රැවටුනා නේද කියලා දරාගන්න බැරි ලොකු වේදනාවක් එක්ක... එහ් වේදනාව මොන තරම්ම ද

sinhalaebooks.com

කියනවනම් කොල්ලා මේ සිදුවීම් මතක් වෙලා අවසානෙදි හයියෙන් බ්‍රේක් ගහලා කාර් එක පාර මැදදි ම නැවැත්තුවේ එහ් වේගෙට ම කොල්ලගේ ඔලුව පවා කාර් එකේ වැදෙද්දි..

" උබත් මාව රැවැට්ටුවා සුදූ මැනික...මට...මට හිතා ගන්නවත් බැරි තරමට උබ මාව රැවැට්ටුවා සුදූ මැනික...මගෙ ඇසු ත් මට බොරු කරන තරමට උබ මාව රැවැට්ටුවා...මොන තරම් විශ්වාස කරා ද මත් උබව..මොන තරම් හීන දැක්ක ද මත් උබත් එක්ක... එහ් හැමදේම උබ... උබ එහ් හැමදේම විනාශ කරා මැනික...උබ හදගත්ත මගෙ හිත ආයෙ ම බිදලා දැන්මා.... "

ආයුශ් කාර් එකේ ම තමන් ගේ අත ගහා ගත්තේ මහා හයියෙන් අඩන ගමන්...කොල්ලගේ හිතේ දුකකටත් වඩා තිබුනේ තමන් ගැන ම තරහක්...දැන දැනමත් ආයෙම ආදරේ කරන්න ගියාට මේ දඩුවම තමන් විදින්න ම ඕනි කියල කොල්ලගේ හිත කියන්න ගත්තා....

කොල්ලා තවත් විනාඩි ගානක් කවදාවත් නැති තරම් හයියෙන් අඩලා ඊලග තත්පරේ ඔලුව ඉස්සුවේ එක පාර ම එදා නේහා ට කිවුව කතාව මතක් වෙලා....

එදා නේහා තමන් පොරොන්දුව කඩ කරානම් මොකද කරන්නේ ඇහුව වෙලේ නේහා ට දුන්න උත්තරේ ආයේ ආයෙ ම කොල්ලට ඇහෙන්න ගත්තා... කොල්ලා කාර් එක ස්ටාට් කර ගත්තේ හිතට දැනුන දුකට තරහා වගේ ම කලකිරීමත් මුසු වෙද්දි....

" උබට හැමදම විදවන්න වෙයි මැනික...උබ මේ කරපු දේට උබට මතක් වෙන වාරයක් ගානේ විදවන්න වෙයි....ඔව්...මේක තමයි මත් උබට දෙන දඩුවම...ආයේ මේ ආයුශ් කවදාවත් උබගේ ඇස් ඉස්සරහට එන්නේ නෑ..."

ආයුශ් එහෙම කියන ගමන් ම කාර් එක අතුරු පාරකින් මේන් රෝඩ් එකකට දැන්මේ කාර් එකේ ස්පීඩ් එක දාන්න පුලුවන් උපරිමේට ම දාලා.....වෙලාව රෑ 7 ට කිට්ටු කරලා තිබුනා..දරානිපාත වශර්‍ාවේ නම් කිසිම අඩුවක් තිබුනේ නෑ...විදුලි කෙටිලි ගෙරවිලි එන්න එන්න ම වැඩි උනා මිසක් අඩු උනේ නම් නෑ... මේන් රෝඩ් එක හින්ද ම පාරේ වාහන වල පුංචි අඩුවක් තිබ්බත් ලොකු වෙනසක් නම් පේන්න තිබුනේ නෑ...

ආයුශ් කාර් එක පුදුම තරම් ස්පීඩ් එකකින් ඉස්සරහට අරන් යද්දි දෙතුන් වතාවක් ම පාරේ ගියපු වාහන වල ගැටෙන්න ගිහින් අනූ නවයෙන් බේරුනේ...ආයුශ් කියන්නේ ඉක්මනට තරහා යන කෙනෙක් උනත් ඉස්සර ආයුශ් ට තිබුනේ බොහොම සංවේදී හදවතක්...ආයුශ් කැමති නෑ කාටවත් ම කරදරයක් වෙනවට...නේහා නිසා ම ආයුශ් ගේ යටපත් වෙල තිබුන ගතිගුන උඩට ඉස්මතු වෙද්දි නේහා ට දඩුවමක් දෙන්න ඕනි කියලා තමන් ගෙ හිත කිවුවත් ඒකෙන් කාටවත් ම කරදරයක් වෙනවට කොල්ලා කැමති උනේ නෑ..

එහ් හින්ද ම කොල්ලා පුදුම තරම් ඉවසීමකින් කාර් එක ඩ්‍රයිව් කරන් ගියේ වාහන අඩු පාරකට.... අහම්බයක් උනත්...ඔව් එහ් තැනමයි...කාලෙකට කලින් තමන් ගේ ජීවිතේ ම

sinhalaebooks.com

වෙනස් කරපු තැන...වැව ලග එහ් පාක් එක ලග පාර...කොල්ලගේ හිතේ දුක දෙගුන තෙගුන උනේ කාලෙකට කලින් තමන් රැවටුනාටත් වඩා අද රැවටුනා නේද කියලා හිතෙද්දී..

කොල්ලගේ ඇස් වල මැවුනේ තමන් මේ ලෝකේ දැක්ක අහිංසක ම හිනාව......එහ් සාරා ගේ වගේ නේහා ගේ අහිංසක මූනූ...ඊලග තත්පරේ සාරා තමන් ව රවට්ටපු හැටි ත් නේහා සාරා ට ත් වඩා වැරටීමක් කරලා තමන් ව රවට්ටපු හැටි ඇස් මතාපිටම මැවිලා පේද්දී කොල්ලා එහෙම්ම ම කාර් එක රිවස් කරේ දෝතින් ම ඔලුව බදගෙන....

" උබ විදවයි නේහා...උබ මේ කරපු දේට හැමදම විදවයි.. "

ආයුශ් එහෙම කියන ගමන් ම රිවස් කරපු කාර් එක ඉස්සරහට හැරෙවුවේ ඉස්සරහින් පෙනුන විශාල ගහා දිහාට...ඊලගට දෙපාරක් හිතන් නැතුවම කාර් එක පුදුම ස්පීඩ් එකකින් එහ් දිහාට ඩ්‍රයිව් කරේ ඇස් දෙක තද කරලා පියාගෙන... ආයුශ්ගේ මූනේ අවසාන වතාවට නේහා ලගදි මැවුන එහ් හිනාවත් එක්ක ම ඊලග තත්පරේ කාර් එක විශාල ගහ ත් එක්ක ගැටුනේ ලොකු සද්දෙකුත් එක්ක...

දරාතිපාත වශර්ාවත් රෑ වෙලත් තිබුන නිසා කවුරුත් ම පාරේ පේන්න හිටියේ නෑ... ආයුශ් ගේ කාර් එකේ ඉස්සරහා ගන්න දෙයක් නැති වෙන්නම කුඩු වෙලා තිබුනා...

කොල්ලා උන්නේ ලේ විලක් මැද...කොල්ලා හුස්ම ගන්නවද නැද්ද කියලවත් පිටතට පෙනුන් නෑ... එහ් ඇස් පියවෙලා....

කොල්ලා එතන විනාඩි 10කට ආසන්න කාලයක් ඉන්න ඇති...මේ ආයුශ් ගේ දෛවය ලියවිලා තියන විදිහ ම වෙන්න ඇති.... හරියට ම විනාඩි 10කට පස්සේ එතනින් ගියපු වීල් එකක් එතන නැවතුනේ විදුලි එලියට දැකපු ගහේ ගැටිලා තියන කාර් එක දැකලා....

පුංචි මිනිස්සු ලග සල්ලි නැති උනත් මහා ලොකුවට මනුස්සකම තියනවා..ආයුශ් ව එතන දලා යන්න එහ් හිතට ඉඩ දුන්නේ නෑ... වීල් එකේ හිටියේ ඩ්‍රයිව් කරපු මැදිවියේ පුරුශයෙක් පමණයි...ඔහු උන්නේ ගෙදර යන ගමන්...ඔහු දෙපාරක් නොහිතම කාර් එක ලගට දිවුවා...අතේ තිබුන ටෝච් එක ගහලා බලද්දී යි ඔහු දැක්කේ කාර් එක ඇතුලේ ඉන්න කෙනාව...

ආයුශ් උන්නේ මූනවත් පේන් නැති තරම ට ලේ වලින් මුලු මූනම වැහිලා.... හුස්ම ගන්නවද නැද්ද කියලවත් ඔහුට තේරුම් ගන්න බැරි උනා...අනික ආයුශ් උන්නේ කාර් එක ඇතුලේ හිර වෙලා..එලියට ගන්නත් පුදුම වෙහෙසක් ගන්න උනා...

වීල් එකේ අයිතිකාරයා කොල්ලව පුදුම වෙහෙසක් දීලා එලියට ගත්තත් ආයුශ් හුස්ම ගන්න වගක් නම් ඔහුට පේන්න තිබුනේ නෑ... ඔහු මුලින්ම කරේ කොල්ලව එලියට අරන් වීල් එකට දගත්ත එක...ඒහ් එක්කමයි ඔහු ආයුශ් ගේ ෆෝන් එක ගත්තේ... ඔහු ෆෝන් එකත් තමන් ලගට ම අරන් වීල් එකේ යන ගමන් ආයුශ්ගේ ෆෝන් එක බලන්න ගත්තේ කවුරු හෝ මේ ගැන දැනුවත් කරන්න...

sinhalaebooks.com

ඔහු එතකොටයි දැක්කේ ෆෝන් එකේ " අයියා " කියලා සේව් කරලා තිබුන නම්බර් එක...එහ් number එකෙත් මිස් කෝල් ගොඩකුත් තිබුන හින්ද ම වෙන නම්බර් ගැන හොයන් නැතුව ම ඔහු එහ් නම්බර් එක ඩයල් කරා... රින්ග් වෙනවත් එක්කම ෆෝන් එක ආන්සර් කරා.

" ආයුශ්...උබ කොහෙද බූරුවෝ ඉන්නේ....අර කෙල්ල පිස්සියෙක් වගේ අඩනවා...දැන්වත් ගෙදර වරෙන්..."

ඔව්..එහ් මලීශ් ගේ නම්බර් එක...එහ් කතා කරේ මලීශ්...

" හෙල්ලෝ...මහත්තයා... "

විල් එකේ පුරුශයා කතා කරේ වෙවුලන කටහඩින්...මොකද ඔහු මේ වෙද්දි ත් හිටියේ හොදට ම බය වෙලා... එහ් ආයුශ් ගේ කටහඩ නෙමෙයි කියන්න මලීශ් ට එහ් තත්පරේ ම වැටහුනා......ඒකමයි ඔහු කලබල උනේ...

" හෙල්ලෝ...මේ කවුද කතා කරන්නේ...කෝ ආයුශ්... "

" මහත්තයා...මේ ෆෝන් එකේ අයිති කාරයා ඇක්සිඩන්ඩ් වෙලා.. හුස්ම ගන්න පාටක් නම් නෑ...ඒත් මන් හොස්පිටල් එකට අරන් යන ගමන්...මේ මහත්තයා ගේ කාට හරි මේ ගැන කියන්න ඕන නිසා මන් ගත්තේ.... "

" මො...ක...ක්...ආ...යු...ශ්....හ..රි...හ...රි...මන් දැන්ම ම එනවා.....ආයුශ් ව...හරි...දැන්..දැන්...කොහෙද ඉන්නේ..."

" පාක් එක ලග පාරේ මහත්තයා... මන් මහත්තයව කොලබ හොස්පිටල් එකට අරන් යන්න ද... "

" හරි...හරි...එහ් හොස්පිටල් එකට අරන් යන්න..මන්...මන්...ඉක්මනට එනවා.... " .

මලීශ් ෆෝන් එක කට් කරේ ඇස් දෙකේ කදුලු පුරවගෙන...ඊලගට හොස්පිටල් එකේ දන්න හැම ඩොක්ටර් කෙනෙක්වම දැනුවත් කරේ මලීශ් එතනට එන්න පරක්කු උනත් ආයුශ් ව හොස්පිටල් එකට ගෙනපු ගමන් ඇතුලට ගන්න පුලුවන් වෙන නිසා...එහ් තත්පරෙ ම මලීශ් කාර් එකට නැංගේ හොස්පිටල් එකට යන්න...
" මලීශ්...කොහෙද යන්නේ...නේහා ව බලන්න යන් නැද්ද .... "

සරණී ඇහුවේ කාර් එකට නගින මලීශ් දිහා පුදුමයෙන් බලන ගමන්..මොකද මොහොතකට කලින් නේහා සරණී ට කෝල් කරලා උන හැමදේම කියද්දි සරණී කෙලින් ම ආවේ මලීශ් ගේ ගෙදර... එහ් මලීශ් එක්ක ම නේහා ව බලන්න යන්න...ඒත් කෝල් එකක් එනවත්

sinhalaebooks.com

එක්කම ගේ ඇතුලේ හිටපු මලීශ් එක පාරට එලියට ඇවිත් එහ් කෝල් එක කට් කරපු ගමන් ම කාර් එකට නගිද්දි කෙල්ලට කිසි දෙයක් හිතා ගන්න බැරි උනා ...

" සරණී...ලොකු ප්‍රශ්නයක් වෙලා...ඔයා...ඔයා දැන් කෙලින් ම නේහා ලගට යන්න..ගිහින් නේහා වත් එක්කගෙන කොලඹ හොස්පිටල් එකට එන්න..."

" ඇ..යි...ම...ලී.....ශ්.....මො..ක...ද...වෙ...ලා...ති...යෙ..න්....තේ.... "

" ආයුශ් ඇක්සිඩන්ඩ් වෙලා සරණී..."

" මොකක්... "

" ඔව්...ඔයා නේහා ට විස්තරේ කියන්න එපා...කෙල්ලව හොස්පිටල් එකට එක්ක එන්න...ඊට පස්සේ විස්තරේ කියමු..."

මලීශ් එහෙම කියන ගමන් ම කාර් එක ස්ටාට් කර ගත්තේ සරණී මලීශ් කිවුව දේවල් වලට හා කියලා ඔලුව හොල්ලලා තමන් ගේ කාර් එකට නගිද්දි....

මලීශ් ඩ්‍රයිව් කරා තරම්ම වේගෙන් සරණී ත් කාර් එක පාරට දැම්මේ මේ වෙද්දි නේහා මොනවා කරගෙන ඇති ද කියලා හිතට දැනුන බයත් එක්ක....

නේහා උන්නේ කලින් ඉරියව්වෙන්ම බිම වැතිරිලා... කෙල්ල ආයුශ් එනකම් බලන් ඉදලා බැරිම තැනයි වතුර පිටින් ම ගේ ඇතුලට ගිහින් මලීශ් ට කෝල් එකක් ගත්තේ..කෙල්ල හිතුවා මලීශ් වත් ආයුශ් ගියපු තැනක් දන්නවා ඇති කියලා...ඒත් ආයුශ් මලීශ් ගේ ගෙදර වත් ආයුශ් ගියපු වෙන තැනක්වත් මලීශ් දන් නෑ කියද්දි කෙල්ල අඩාගෙන ම ආයේ මිදුලට ගියේ කොයිම වෙලාවක හරි ආයුශ් එයි කියන බලාපොරොත්තුවෙන්...ඒත් දැන් හෝරා දෙකක් ගිහින්....කෙල්ලත් අඩලා අඩලම හොදට ම හෙම්බත් වෙලා...කෙල්ලගේ ඇගට හරියකට පනක් වත් නෑ...සීතලට කෙල්ලට හොදටම වෙවුලන්න අරන්...

ඒත් කෙල්ලගේ මේ හැම වේදනාවක් ම නැති වෙලා ගියේ ගේට් එකෙන් වැටුන කාර් එකේ ලයිට් එලියට....කෙල්ල එහ් ආයුශ් කියලමයි හිතුවේ...එහ් හින්දමයි කෙල්ල හීනාවකුත් එක්ක අමාරුවෙන් නැගිට්ටේ...ඒත් එහ් කාර් එක ආයුශ් ගේ නෙමෙයි...කාර් එකෙන් බැස්සේ ආයුශ් නෙමෙයි සරණී කියලා දකිද්දි කෙල්ලගේ හිතට දැනුන වේද්නාව වචන කරන්න බෑ..පපුව පැලෙන්න තරම් වේදනාවක් එක්ක කෙල්ල ආයෙම බිම වාඩි උනේ අඩු වෙලා තිබුන ඇඩිල්ල ආයෙම වැඩි වෙද්දි....

කෙල්ල අඩා වැලපෙන විදිහට සරණී එක පාරට ම ගැස්සිලා ගියා...කෙල්ල තත්පරේට දෙකට නේහා ලගට දුවන් ආවේ නේහා ගැන හිතට දැනුන බයට....

" නේහා....මොකද කෙල්ලේ මේ...නැගිටින්න දෙයියනේ... "

sinhalaebooks.com

සරණි කෙල්ලව නැගිට්ටවන්න උත්සාහ කරමින් කියද්දි නේහා කරේ තව තවත් හයියෙන් අඬපු එක...

" මගෙ ආයුශ් ආවේ නැද්ද...කෝ එයා.. "

නේහා ඇහුවේ පුදුම තරම් අසරණ බැල්මකින් සරණි දිහා බලන ගමන්..එහ් බැල්මට කෙල්ලගේ ඇස් වලටත් කඳුලු ආවේ ඉබේමයි...

" ආයුශ් ඉන්නවා කෙල්ලේ...මන් ආවේ ඔයාව එක්ක යන්න... "

සරණි කිවුවේ ලාවට හිනා වෙලා...එහ් වචන ටිකට නම් නේහා ට දැනුනේ තමන් ට අලුත් පනක් ලැබුනා වගේ...

" එයා....එයා මාව එක්කන් එන්න කිවුව ද... "

" ඔ..ව්..කෙ...ල්...ලේ... "

" එයාට මෙහෙ එන්න බෑ කිවුවද... "

ඊලගට නේහා ඇහුවේ හිතට දැනුන සතුට තමන් ගෙ වචන වලින් ම නැති කරගෙන...

" ලෑස්ති වෙන්නකෝ කෙල්ලේ...අපි ගිහින් කතා කරමු...කෝ දැන් නැගිටින්න.... "

සරණි සුසුමකුත් පිට කරලා කිවුව විදිහට නේහා ගේ හිතට අමුත්තක් දැනුනා...එහ් වගේම ලොකු බයක්...කෙල්ල මොහොතක් සරණි දිහා බලන් ඉඳලා ඊලග අපහු දේට සරණි ගේ හුස්මත් මොහොතකට නැවතිලා ගියා වගේ....

" මගෙ ආයුශ් හොඳින් නේද...එයාට...එයාට කරදරයක් නෑ නේද...... "

" නෑ....කෙ...ල්...ලේ.... "

සරණි අමාරුවෙන් මූනට හිනාවක් අරන් කියද්දි නේහා සුසුමක් පිට කරේ හිතට දැනුන මහා බරක් නිදහස් උනා වගේ...ඊලගට ඉක්මනට නැගිටලා ඇතුලට ගියේ හිතට දැනුන වේදනාව එහ්විදිහට ම තියෙද්දි.......

කෙල්ල උඩට යන්න හදද්දි යි දැක්කේ සාලේ තිබුන සෙල්ලම් බඩු..කේක් එක වගේ ම අර ඇඳුම් ටික... ආයුශ් නොකියම ගිහින් තියෙන්නේ මේ දේවල් ගන්න නේද කියලා දැනෙද්දි කෙල්ල ආයෙම හිතින් කඩන් වැටුනා. ....

" අනේ මගෙ ආයු...මේ තරම් මට ආදරේ කරපු ඔයාව ද දෙයියනේ මන් රැවැට්ටුවේ.... "

sinhalaebooks.com

කෙල්ල ආයෙම අඬන්න ගත්තේ තමන් ගේ පපුවට තමන් ගේ අත් දෙකෙන් ම ගහගන්න ගමන්... ආයුශ් ගෙදරින් ගිහින් මෙහෙම නම් ආයුශ් ඇක්සිඩන්ඩ් උනා කියලා දැනගත්තම නේහා මොන විදිහට හැසිරෙයි ද කියලා හිතද්දි පවා සරණි ගේ පපුව පිච්චිලා ගියා....

සරණි කෙල්ල ව බලෙන් ම රූම් එකට එක්ක ගිහින් ඇඳුමකුත් අන්දගෙන පහලට ආවේ නේහා ගේ හිත හැදෙන විදිහට තවත් මොකුත් ම කියන් නැතුව.මොකද කෙල්ල දැනන් උන්නා නේහා ට බලාපොරොත්තු දෙන්න දෙන්න ඇත්ත දැනගත්ත ම කෙල්ලට ඒක දරාගන්න බැරි වෙයි කියලා...

සරණි වචන දෙක තුනක් විතරක් කෙල්ල එක්ක කතා කරලා කෙල්ලව කාර් එකට නංග ගත්තේ එහ් නිසා...

මලීශ් යනකොටත් ආයුශ් ව ඇතුලට අරන් තිබුනේ...මලීශ් ආයුශ් ගේ ෆෝන් එකත් අරන් ආයුශ් ව ගෙනපු කෙනාට ස්තුතිත් කරලා හොස්පිටල් එක ඇතුලට ගියේ පුදුම කලබලේකින්...කොල්ලගේ හිත පුදුම විදිහට අවුල් වෙලා අසරණ වෙලා තිබුනේ..මොකදමේ බැඳීම යාලුකමක්,සහෝදරකමකට ත් එහා ගියා මහා ලොකු බැඳීමක්....

කොල්ලා ඇතුලට යද්දි ම කොල්ලා ඉස්සරහට ආවේ කොල්ලා එක්ක එකට වැඩ කරන ඩොක්ටර් කෙනෙක්...

" ම...ලී.....ශ්...පේෂන් ට ගොඩක් අමාරුයි මචන්...අයි..සී..යූ එකට දැන්මා..දැන් ඔපරේශන් එකක.. ගොඩක් ඩැමේජ් වෙලා මචන්... හාට් බීට් එකත් ස්ලෝව්...ජීවිතේ ගැන විශ්වාසයක් තියා ගන්න අමාරුයි මචන්...උබට අමුතුවෙන් පැහැදිලි කරන්න ඕන් නෑනේ මචන්..උබට තේරෙනවනේ...."

එහ් වචන ටික එක්ක මේ තරම් වෙලා කඳුලු හිර කරන් හිටපු මලීශ් ගේ ඇස් වලින් කඳුලු ගලන් යන්න ගත්තේ හිතට පුදුම තරම් වේදනාවක් දැනෙද්දි..මලීශ් එහෙම ම දෝතින් ම ඔලුව බද ගත්තේ මේ තරම් අසරනකමක් දුකක් ජීවොතේ කවදවත් ම විදලා නැති නිසා....

" අපි ට්‍රයි කරමු මචන්...රිලැක්ස් වෙයන්....වරෙන් ඇතුලට..රිපෝට් ටික බලලා හිටපන්..... "

මලීශ් ට එහ් වචන ටික ඇහුනේ හීනෙන් වගේ..කොල්ලා හොස්පිටල් එක ඇතුලට ආවේ ඇවිදින මලකඳක් වගේ....

රිපෝට් ටික අතට ගද්දි ම කොල්ලා අතින් ෆයිල් එක ම බිමට වැටුනේ රිපෝට් ටිකේ විදිහට ආයුශ් ගේ ජීවිතේ තියෙන්නේ මොන තරම් අවධානම් තත්වෙකද කියලා ඩොක්ටර් කෙනෙක් විදිහට කොල්ලා හොදට ම දැනන් උන්න නිසා...මලීශ් දෝතින් ම ඔලුව බදගෙන පිස්සෙක් වගේ කල්පනා කරන්න ගත්තේ මේ උන කිසිම දෙයක් තාමත් හිතා ගන්න බැරි නිසා..

sinhalaebooks.com

ආයුශ් වෙනුවෙන් හැමදේම වෙද්දි මලීශ් එහ් දිහා බලන් හිටියේ පන රහිත පුද්ගලයෙක් වගේ....ආයුශ් ට මේ කරන ඔපරේශන් එක මොන තරම් බරපතලද කියලා කොල්ලට අමුතුවෙන් කියන්න ඕන උනේ නෑ...මේ ඔපරේශන් එකෙන් පස්සේ ආයුශ් ට සිහිය ආවේ නැති උනොත් ආයෙත් කවදාවත් ම ආයුශ් ඇස් අරින් නෑ...මේ ලෝකේ අත ඇරලා සදහටම යන්න යනවා....ඒත් මේ ඔප්ශන් එක ඇරෙන්න වෙන කරන්නත් කිසිම දෙයක් නෑ... ඔපරේශන් එක නොකර හිටියා නම් ඒත් වෙන්නේ ආයුශ් මේ ලෝකේ අත ඇරලා යන එක....

ආයුශ් ගේ හාට් බීට් එකත් එන්න එන්න ම ස්ලෝව් වෙනවා... ඔපරේශන් එක ඉවර වෙද්දත් මලීශ් හිටියේ උන් ඉරියව්වෙන්ම ආයුශ් දිහාම බලාගෙන...ඒත් ආයුශ් ට සිහියනම් ඇවිත් තිබුනේ නෑ...කොල්ලා එන්න එන්න ම දුවර්ල වෙන ලකුනු මිසක් හොද තත්වයක් නම් දැකගන්න පුලුවන් උනේ නෑ...

මලීශ් මොන තරම් සිහි විකල් වෙලා හිටියද කිවුවොත් කොල්ලට ආයුශ් ගේ රූපේ ඇරෙන්න අවට වෙන කිසිම සද්දයක් වත් ඇහුන් නෑ....

" මලීශ්...රිලැක්ස් මචන්...අපිට තව 2 hours තියනවනේ...විල් සී මචන්..."

මලීශ් එක්කම එකට වැඩ කරන ආයුශ් ගේ ඔපරේශන් එක කරපු ඩොක්ටර් කෙනෙක් ඇවිත් මලීශ් ගේ පිටට තට්ටු කරලා කියද්දි මලීශ් කරේ ඇස් පිල්ලමක් වත් නොගහා කඳුලු හෙලපු එක...

පුංචි කාලේ ඉදන් ම ආයුශ් එක්ක තිබුන හැම මතකයක් ම කොල්ලට මතක් වෙන්න ගත්තේ එහ් වේදනාව දෙගුන තෙගුන කරලා....

සරණී ගේ කාර් එක තිබුනේ හොස්පිටල් එකට ගොඩක් ම ලන් කරලා...නේහා උන්නේ ආයුශ් ගැනම කල්පනා කර කර..කෙල්ලට මේ යන්නේ කොහෙද කියන්න සිහියක් තිබුනේ නෑ එහ් නිසාම....සරණී හොස්පිටල් එක ලගින් කාර් එක නවත්තලා තාමත් කල්පනා කර කර ඉන්න නේහා දිහා බැලුවේ මේ දේ කොහොම කියන්නද කියලා හිතා ගන්න බැරුව....

ambulance වල සද්දෙට නේහා වට පිට බලන්න ගත්තේ කල්පනා ලෝකෙන් ඉබේම මිදිලා...

මේ ඉන්නේ හොස්පිටල් එකක් ලග කියන දේ වැටහුන පලවෙනි තත්පරේ ම කෙල්ල පුදුම විදිහට කලබල උනා.. එහ් ආයුශ් ට කරදරයක් ද කියලා හිතට දැනුන හැඟීමත් එක්ක..

" ස..ර...ණී...අ..පි...අපි කොහෙද මෙහෙ..."

sinhalaebooks.com

නේහා ඇහුවේ වචන පවා පටලවමින්... සරණි ගේ හිතට දැනුනේ කියාගන්න බැරි ලොකු අසරනකමක්...

" කියන්න සරණි...මගෙ ආයුශ්...එයා හොදින් නේද... "

" ඔ...ව්...කෙ...ල්...ලේ...අ..පි...යමුකෝ ඇතුලට..ඇතුලට ගිහින් කතා කරමු... "

සරණි එහෙම කියලා කාර් එක පාක් කරේ ඊලගට නේහා පිස්සුවෙන් වගේ ඇහුව හැම ප්‍රශ්නයක් ම මග හැරලා.... කෙල්ල කාර් එක පාක් කරලා ඇස් වල කදුලු පුරවන් ඉන්න නේහා ගේ අතින් අල්ලගෙන හොස්පිටල් එක ඇතුලට ගියේ මලීශ් ව හොයාගෙන...

නේහා අවට ඉන්න මිනුස්සු ගැනවත් හිතන් නැතුව සරණි ගෙන් පිස්සුවෙන් වගේ ප්‍රශ්න ඇහුවත් සරණි කරේ නිහඩවම මලීශ් ව හොයපු එක.මොකද කෙල්ලට බැරි උනා නේහා ගේ මූන බලාගෙන මේ දේ කියන්න....

නේහා අඩ අඩ ම හොස්පිටල් එක ඇතුලෙන් හෙවුවේ ආයුශ් ගේ රූපේ... ඒත් කෙල්ලගේ වේදනාව එන්න එන්න ම වැඩි උන එක විතරමයි උනේ.... මලීශ් පේන්න නැති තැන සරණි කරේ මලීශ් ට කෝල් එකක් ගත්ත එක.. හරියට ම විනාඩි 5කින් මලීශ් නේහා වගේම සරණි හිටපු තැනට ආවේ පිස්සෙක් වගේ ඔලුව අවුල් කරගෙන...

" මගෙ ආයුශ් හොදින් නේද... "

නේහා ඇහුවේ මලීශ් ගේ හැසිරීම තේරුම් ගන්න බැරි නිසාම ඇස් වල කදුලු ආයෙම අලුත් වෙද්දි...මලීශ් හිටියෙත් ඔලුව හොදටම අවුල් කරගෙන... එහ් නිසා කොල්ලට මේ වෙලාවේ නේහා ට මේ දේ කොහොම කියන්න ඕනි ද කියන දේ ඔලුවට ආවේ නෑ...කොල්ලා ගත් කටට ම උන දේ කියලා දැන්මේ පුදුම තරම් වේදනාවකින්...

" ආයුශ් ඇක්සිඩන්ඩ් වෙලා නේහා...ආයුශ් ට ගොඩක් අමාරුයි..."

" මොකක් ද අයියේ...."

" ඔව් නංගි...ආයුශ් ට ගොඩක් අමාරුයි....එයාට ඔපරේශන් එකක් කරා...පැය දෙකක් ඇතුලට සිහිය නාවොත් ආ..යු...ශ්...සදහටම යන්න යයි...."

මලීශ් දෝතින් ම ඔලුව බදගෙන කියද්දි නේහා මොහොතක් මලීශ් දිහා බලන් හිටියේ ඇස් පිල්ලමක්වත් නොගහා...ඊලග තත්පරේ කෙල්ල හොස්පිටල් එකම දෙවනක් වෙන්න අඩන්න ගත්තේ මුලු සිරුරම පන නැති වෙලා යද්දි....

" මගෙ ආයු...මගෙ ආයු කෝ..."

sinhalaebooks.com

නේහා මලීශ් ගේ උරහිසක් හොල්ලලා අඩ අඩ අහද්දි මලීශ් කරේ කෙල්ලව ආයුශ් හිටපු රූම් එකට අරන් ගියපු එක..අසීයූ එකේ කොල්ලා ඉන්න විදිහ දැකපු ගමන් ම කෙල්ලට සිහිය නැති වෙලා ගියේ එහ් දුක දරාගන්න ම බැරි තැන...නේහා ට ටික වෙලාවකින් සිහිය ආවත් කෙල්ල ආයෙමත් අඩන්න ගත්තා..මලීශ් වගේ ම සරණී ත් හිටියේ ඒට නොදැවෙනි දුකකින්...

ආයුශ් ට තිබුනේ හරියට පැය දෙකයි...එහ් පැය දෙක ඇතුලට කොල්ලට සිහිය නාවොත් ආයෙත් කවදාවත් ම ආයුශ් ඇස් අරින්නේ නෑ...එහ් පැය දෙකෙනුත් මේ වෙද්දි පැය බාගයක් ගිහින් ඉවරයි.... ආයුශ් හිටියේ හොඳටම දුවර්ල වෙලා... කොල්ලගේ හුස්ම පවා වැටුනේ අපහසුවෙන්...

මලීශ් නේහා සරණී ලගම වාඩි වෙලා උන්නත් එහ් එක්කම මලීශ් ට කාගෙදෝ කටහඩක් ඇහුන නිසා කොල්ලා ඔලුව ඔස්සුවේ ඔලුව පුදුම විදිහට රිදුම් දෙද්දි....මලීශ් ඉස්සරහා හිටියේ වෙන කවුරුත් නෙමෙයි...ආයුශ් ගේ ඔපරේශන් එක කරපු මලීශ් එක්කම වැඩ කරන මලීශ් ගේ යාලුවෙක්...ඔහු මලීශ් ට පැත්තකට කතා කරේ නේහා වගේ ම සරණී මේ වෙද්දි හිටපු තත්වේ තේරුම් ගත්ත නිසා ම ඒක මෙතනදි කියන්න සුදුසු නෑ කියලා දැනුන නිසා..

" මචන් මලීශ්..."

" ඔව් මචන්... "

" ආයුශ් ට සිහිය ආවොත්..."

" ඌට සිහිය එනවා මචන්... ඌ කොහොමද අපිව දාලා තනියම යන්නේ..."

මලීශ් කිවුවේ දුකත් තරහත් මුසු උන ස්වරයකින්...

" නෑ මචන්..මන් කියන එක අහපන්......ආයුශ් ට සිහිය ආවත් ආයුශ් ට ගොඩක් ඩැමේජ් වෙලා මචන්...උඹට මන් අමුතුවෙන් explain කරන්න ඕන් නැතේ...අයුශ් ට මතකේ උනත් නැති වෙන්න බැරි කමක් නෑ මචන්...අනිත් එක...උඹ දැක්කද අර රිපෝට්...මචන් ආයුශ් ට ආයෙත් ඇවිද ගන්න බැරි වෙයි කවදාවත්..."

එහ් කතාවට මලීශ් ටික වෙලාවක් ගල් ගැහිලා බලන් හිටියේ හුස්ම ගන්න පවා අමතක වෙලා යද්දි... රිපෝට් ටික අතට ගත්තට රිපෝට් එකේ තිබ්බ හැම දෙයක් ම කියවගන්න කොල්ලා හිටියේ සිහියකින් නෙමෙයි..ඒත් මේ වචන ටික....කොල්ලව තවත් දුවර්ල කරා...

" මලීශ්..මචන්...මන්..මන් මෙහෙම කියන එක වැරදි ඇති...ඒත් මන් මට හිතෙන දේ කියන්නේ... "

" මොකක් ද... "

sinhalaebooks.com

" මචන්...උබට හිතෙන් නැද්ද ආයුශ් අතකේ නැතුව ඇවිද ගත්ත බැරුව එක් තැන් වෙලා දුක් විදිනවට වඩා ආයුශ් ට සිහිය නාවොත් හොදයි කියලා .... "

එහ් කතාව ට නම් මලීශ් ගේ හිතට ආවේ පුදුම තරහක්..මලීශ් එහෙම්මම ඔහුව බිත්තියට තද කරේ ඉන්නේ කොහෙද කියලා පවා අමතක වෙලා යද්දී...

" මොකක් ද බ@# උබ කිවුවේ....ආයුශ් ට සිහිය එන් නැති උනොත් හොදයි...උබ කොහොම ද එහෙම කියන්නේ...ඌට සිහිය ආවේ නැති උනොත් මන් උබවත් යවන්නේ එතනටමයි..ඔය කියන කතා වලට..."

මලීශ් ඔහුගේ බෙල්ල තද කරලා කියද්දී අවට හිටපු අය එතනට රැස් උනේ මකීශ් ගෙන් ඔහුව ගලව ගන්න... මලීශ් ගෙ අතින් බෙල්ල අත ඇරුන පලවෙනි තත්පරේ ම ඔහු කරේ මලීශ් ව බදා ගත්ත එක.මොකද මේ මොහොතේ මලීශ් ඉන්නේ තත්වේ ගැන ඔහු හොදින්ම දැනන් හිටියා...

" සොරි මචන්.... "

මලීශ් කිවුවේ ආයෙම පාරක් අඩාගෙන...

"රිලැක්ස් මලීශ්..."

ඔහු මලීශ් ගෙන් මිදිලා කිවුවේ මකීශ් පිටට තට්ටුවකුත් දන ගමන්...

එහ් එක්කම ඇහුන කටගඩ නිසා හැමෝගෙම හදවත් වලට ආවේ අලුත් බලාපොරොත්තුවක්...එහ් සතුට මොන තරම් ද කියලා වචනෙන් කියන්න බැරි තරම්...

" ඩොක්ටර්...පේශන්ට සිහිය එනවා... "

මලීශ් ට වගේ ම මලීශ් ගේ යාලුවට එහෙම කිවුව නසර් ආයෙම ආයුශ් හිටපු රූම් එකට දුවන් ගියා...නේහා වගේ ම සරණි ත් එහ් එක්කම දුවන් ගියේ එහ් තත්පරේ මයි..නේහා නම් උන්නේ අඩන ගමන් ම හිනා වෙවී...

ආයුශ් හිටියේ අමාරුවෙන් හුස්ම ගන්න ගමන්..ආයුශ් ගේ ඇස් හෙමීට ඇරෙද්දී හැමෝගෙම ඇස් වලින් කදුලු ගලන්න ගත්තා... ආයුශ් අපහසුවෙන් තත්පර දෙකක් විතර වටපිට බලලා ආයෙම ඇස් පියා ගත්තා .. එතකොට නම් නේහා ගේ හදවත වේගෙන් ගැහෙන්න ගත්තා...

" අනේ අයියේ...මගෙ ආ..යු...ශ්..."

" දැන් බය වෙන්න දෙයක් නෑ නංගී...සිහිය ආවනේ...ආයුශ් ඔහොම ටිකක් හිටපු දෙන්... ඔයා ටිකක් එලියට එන්නකෝ..මට ටිකක් කතා කරන්න ඕනි... "

sinhalaebooks.com

මලීශ් එහෙම කියලා එලියට යද්දි නේහා එහ් පස්සෙන් ම ගියේ මලීශ් කියන්න යන්නේ මොකක්ද කියලා හිතා ගන්න බැරුව හිත බයෙන් ගැහෙද්දි...

" ඇයි අයියේ..මොකුත් ප්‍රශ්නයක් ද..මගෙ ආයූ හොදින් නේද... "

නේහා ගේ එහ් ප්‍රශ්නෙට මලීශ් කරේ අමාරුවෙන් මූනට හිනාවක් මවා ගත්ත එක... මේ දේ නේහා ගේ හිතට දරාගන්න බැරි උනත් මේක නේහා දැනගන්න ම ඕනි දෙයක් නිසා මලීශ් නේහා ගේ ඇස් දෙක දිහා බැලුවේ අසරණ ව...

" ඇයි අයියේ... "

" ආයුශ් හොදින් ද කියලා අපිට හරියට ම කියන්න බෑ නංගි ... "

" ඇ...යි...අ..යි...යේ... "

" ආයූශ් ට ගොඩක් ඩැමේජ් වෙලා...සමහරවිට විට එයාට කලින් දේවල් මතක නැතුව ඇති... "

" අනේ අයියේ... "

" අනිත් එක නංගි......එයාට.. එයාට ආයෙත් ඇවිදින්න පුලුවන් වෙයි ද කියලත් සැකයි ..... "

" අනේ දෙයියනේ...මගෙ...මගෙ ආයූ.... "

" කලබල වෙන්න එපා නංගි ..මන් කිවුවේ රිපෝට් වල හැටියට වෙන්න පුලුවන් දේවල්...මේ දේවල් නොවෙන්නත් පුලුවන්..ආයුශ් ට තාම සිහිය ආවා විතරනේ...අනිත් එක...අනිත් එක නංගි ආයුශ් ට මෙහෙම සිහිය ආව එක ගැන අපි සතුටු වෙන්න ඕනි ඔක්කොටම කලින්... "

මලීශ් නේහා ගේ ඔලුව අත ගලා කියද්දි නේහා අඩ අඩ ම උනත් ඔලුව හෙල්ලුවේ ඔව් කියන්න...

හොස්පිටල් එකේම තවත් පැයක්...දෙකක්...ගෙවිලා යන්න ඇති....ආයුශ් ට සිහිය ඇවිත් තිබුනත් ආයූශ් හිටියේ කියන්න තරම් සුවයකින් නෙමෙයි...

මලීශ් ගේ බල කිරීමට ම සරණී නේහා වත් එක්කන් ගෙදර ගියත් නේහා ගේ නම් පොඩි කැමැත්තක්වත් තිබුනේ නෑ ආයුශ් ව හොස්පිටල් එකේ දාලා ගෙදර යන්න.... ඒත් ආයුශ් ට දැන් ඔය විදිහට ම ඉන්න දෙන්න ඕනි කියලා දන්න හින්ද ම මලීශ් නේහා ට එහ් දේවල් තේරුම් කරා...

sinhalaebooks.com

ඔය විදිහට දවස් දෙකක් ගෙවිලා ගියේ ආයුශ් ගේ තත්වෙත් යම් තරමකට සුව අතට හැරෙද්දි .... ආයුශ් ඇස් ඇරලා හිටියත් කොල්ලට අතීතේ අමතක ද කියලා හැමෝගෙම හිතේ සැකයක් තිබුනා...ඒත් එහ් ගැන පරීක්ෂා කරන්න තරම් ආයුශ් හිටියේ හොද තත්වෙක නෙමෙයි නිසා ම ඩොක්ටසර්' ලා හිටියේ එහ් දේ ටිකක් කල් යවමින්...

ගෙවුන දවස් දෙකේ ම නේහා ආයුශ් ගේ ලගට ගියත් එහ් හැම වෙලාවෙම ආයුශ් හිටියේ ඇස් දෙක පියාගෙන...කෙල්ල නොවැන්ද දෙවියෙක් නෑ... ආයුශ් ව සනීප කරලා දෙන්න කියලා...හොස්පිටල් එකේ නොහිටපු හැම වෙලාවෙම කෙල්ල හිටියේ පන්සලේ....

.සතියක් ගෙවිලා ගියේ ඔය විදිහට... ආයුශ් ව පරීක්ෂා කරන්න ආව ඩොක්ටර් ආයුශ් ට හිනා වෙලා ආයුශ් ලගින් ම වාඩි උනේ ආයුශ් ට පරන දේවල් මතක ද කියලා චෙක් කරන්න... මේ වෙද්දි ආයුශ් උනත් හිටියේ යම් තරමකට සුවයෙන් හින්ද ම මේ ඒකට හොදම වෙලාව...

" දැන් කොහොම ද... "

ඩොක්ටර් අහපු ප්‍රශ්නෙට ආයුශ් උත්තර දෙන්න බැරි උනත් කොල්ලා යාන්තමට හිනා උනා..ඒත් එක්ක ම එතනට ආවේ මලීශ්...මලීශ් එහ් ලගින් ම වාඩි වෙලා ආයුශ් ට හිනා උනත් ඊලගට උනේ කවුරුත් නොහිතපු දෙයක්...

ආයුශ් මලීශ් ව දැක්ක ගමන් ගොඩක් කලබල උනා...ආයුශ් වටේ හිටපු නසර්ලා ආයුශ් ව සන්සුන් කරන්න හැදුවත් වැඩක් උනේ නෑ... මැශින් පවා ගැලවෙන තරමට ආයුශ් දගලන්න ගත්තා...

" මලීශ්....උබ මෙතනින් පලයන්... "

ඩොක්ටර් මලීශ් එක්ක වැඩ කරන මලීශ් ගේ යාලුවෙක් හින්ද ම කොල්ලට එහෙම කියද්දි කොල්ල එලියට ගියේ කිසි දෙයක් හිතා ගන්න බැරුව .... කොල්ලා එලියට ගියාම ආයුශ් නිකන් ම සන්සුන් උනා...

ආයුශ් ගෙන් මේ වෙලාවේ ප්‍රශ්න කරන එක හරි නැති නිසා ම ඩොක්ටර් ආයුශ් ට හිනා වෙලා කිසි දෙයක් නොවුන ගානට ආයුශ් ගේ රිපෝට් බලන්න ගත්තා...
ඩොක්ටර් රිපෝට් චෙක් කරලා රූම් එකෙන් යන්න හදද්දි ම රූම් එකට ආවේ නේහා යි සරණි යි..ආයුශ් හිටියේ කල්පනාවක...ඒත් නේහා ආයුශ් ලගින් ම වාඩි වෙද්දි කල්පනා කර කර හිටපු කොල්ලගේ ඇස් එක පාරම රතු වෙන්න ගත්තා...මලීශ් දැක්කටත් වඩා තරහක් එහ් ඇස් වල තිබුනා...

කොල්ලා දගලපු පාරට කොල්ලගේ කලින් හයි කරපු මැශින් ආයෙම ගැලවෙන්න ගත්තා...නේහා උන්නේ ගල් ගැහිලා..ඇස් දෙකේම කදුලු පුරවන් ආයුශ් දිහා ම බලාගෙන...ඇහුන සද්දෙට ඩොක්ටර් පවා රූම් එකට දුවන් ආවේ අඩියට දෙකට.... ඒත්

sinhalaebooks.com

ඩොක්ටර් දක්ක ගමන් ආයුශ් ගේ කටින් පිටවුන වචන ටිකට හැමෝගෙම මූනු වල මොහොතකට තිබුනේ පුදුමයක්..එහ් ආයුශ් ට අතීතේ හැමදේම මතක ද කියලා හිතට දැනුන සැනසීම එක්ක...

" ඩොක්ටර්..ප්ලීස් මෙයාලට මෙතනින් යන්න කියන්න...මට...මට මේ කාගෙවත් මූනු බලන්න ඕන් නෑ....ප්ලීස්.... "

ආයුශ් කියන්වත් එක්ක ම ඩොක්ටර් නේහා ට වගේ ම සරණි ට එතනින් යන්න කියලා අතින් සන් කරලා ආයුශ් ලගින් වාඩි උනේ සුසුමකුත් පිට කරලා...

" මිස්ටර් ආයුශ්...මොකක් ද ප්‍රශ්නේ.... "

" මට මගෙ විශ්වාසේ කඩලා දපු උන්නේ මූනවත් බලන්න ඔන් නෑ ඩොක්ටර්...මන්...මන්...හැමදම වෛර කරනවා..."

" එහ් කියන්නේ මිස්ටර් ආයුශ් ට අතීතේ හැමදම මතකයි... "

" මොනවද ඩොක්ටර් කියන්නේ..."

" ඇක්සිඩන්ඩ් එක ගොඩක් බරපතල නිසා මිස්ටර් ආයුශ් ගේ ඔලුවට වගේම කකුල් වලටත් බොඩි එකේ සමහර කොටස් වලටත් ගොඩක් ඩැමේජ් වෙලා තියනවා..එහ් තරම් දරුණු පහරක් ඔලුවට වැදුනම මිස්ටර් ආයුශ් ගේ මතකේ නැති වෙන්න ඉඩ ගොඩක් වැඩියි...මේ මිස්ටර් ආයුශ් ගේ වාසනාව....මිස්ටර් ආයුශ් ට ඔපරේශන් එකෙන් සිහිය ආව වෙලාවේ ඉඳන් මේ වෙනකම්ම උන දේවල් ගොඩක් තිබුනේ නරක පැත්තට බරව...ඒත් එහ් හැමදේම හොඳින් උනේ මිස්ටර් ආයුශ් ගේ වාසනාවට...."

ඩොක්ටර් ආයුශ් දිහා බලලා කියද්දි කොල්ලා කරේ කට කොනකින් හිනා උන එක... ඊලගට ආයුශ් කිවුව වචන ටිකට ඩොක්ටර් වගේම ආයුශ් ගේ කතාව ආයුශ් ට නොපෙනෙන්න අහන් හිටපු නේහා ගේ අත් දෙක පවා මූවට ගියේ එහ් වචන අදහගන්න බැරි කමට....

" ඒක ඇක්සිඩන්ඩ් එකක් වෙන්නේ කොහොමද ඩොක්ටර්...ඒක මන් හිතලා කරගත්ත දෙයක්...අනික..මේක මගෙ වාසනාව වෙන්නේ කොහොමද..මැරෙන්න බලාගෙන හිටපු මාව බේරුනේ මගෙ අවාසනාවට.... "

" මිස්ටර් ආයුශ් මොනවද මේ කියවන්නේ..."

" ඔව් ඩොක්ටර්..මට දැන් ජීවත් වෙන්න කිසි ම ආසාවක් නෑ ...."

" මිස්ටර් ආයුශ් දන්නවද මිස්ටර් ආයුශ් මේ කියන දේවල් වල තියන බරපතලකම...ජීවිතයක් නැති කරගන්න එක කොච්චර පවක් ද කියලා දන්නවද..මිස්ටර්

sinhalaebooks.com

ආයුශ් දැකලා තියනවද..කැන්සර් හොස්පිටල් එකේ මැරෙන්න පන අදින ජීවිත තව එක දවසක් වැඩියෙන් ජීවත් වෙන්න දකින හීන... මිස්ටර් ආයුශ් ට මොනවද අඩු...ප්‍රශ්න වලින් පැනලා යන එක නෙමෙයි මිස්ටර් ආයුශ් ජීවිතේ කියන්නේ...ප්‍රශ්න වලට මූන දෙන එකයි ජීවිතේ කියන්නේ... මිස්ටර් ආයුශ් ට ලැබිලා තියන මේ ජීවිතේ නිකරුනේ නාස්ති කරගන්න එපා...ජීවිතයක වටිනාකම දන්නේ ජීවත් වෙන මිනිස්සු නෙමෙයි...ජීවත් වෙන්න තව එක දවසක් වැඩියෙන් ඉල්ලලා පන අදින මිනිස්සු... මෝඩ වෙන්න එපා...එච්චරයි මට කියන්න තියෙන්නේ ..... "

ඩොක්ටර් ගේ එහ් වචන ටික ආයුශ් නිහඬව ම අහන් හිටියේ වචනයක් වත් නොකියන්න හිතෙන තරමට ම ඩොක්ටර් ගේ එහ් වචන ඇත්ත නිසා...ඒත් ආයුශ් හිටියෙ තමන් ගැන ම උපන් තරහකින්...

" මිස්ටර් ආයුශ් ට අද හවස ගෙදර යන්න පුලුවන්...treatment වලට වෙලාවට හොස්පිටල් එකට එන්න...බෙහෙත් ටික හරියට බොන්න...ආයෙත් මෝඩ තීරණ ගන්න එපා.... "

ඩොක්ටර් ආයුශ් ගේ පිටට තට්ටු කරලා කියද්දි කොල්ලා උන්නේ කිසි ත් නොකියා නිහඬවමයි...ඒත් යන්න ගියපු ඩොක්ටර් ආයේම හැරිලා ආයුශ් ලගට ආවේ ආයුශ් දිහා ආයුශ් ට තේරුම් ගන්න බැරි ඉරියව්වකින් බලලා.....

" ඇයි ඩොක්ටර්..."

" මිස්ටර් ආයුශ්....මිස්ටර් ආයුශ් ට දැනෙනවද.."

ඩොක්ටර් ආයුශ් ගේ යටිපතුල ස්පශර් කරලා අහද්දි ආයුශ් බලන් හිටියේ ඇස් දෙකම ලොකු කරන්.... ඩොක්ටර් ආයෙම කොල්ලගේ කකුල් උඩට එනකම් ස්පශර් කරලා ආයෙත් ආයුශ් ගෙන් අහද්දි මේ පාරනම් කොල්ලගේ මූනට දඩිය පවා දලා තිබුනා....

" උත්තර දෙන්න මිස්ටර් ආයුශ්....දැනෙනවද...."

ඩොක්ටර් ආයෙම අහද්දි කොල්ලා කකුල් දෙක නමන්න හැදුවත් කොල්ලගේ කකුල් දෙකෙන් දැනුනේ පුදුම වේදනාවක්...එහ් වගේම දනිස්සේ පහල කිසිම ස්පශර්යක් කොල්ලට දැනුනේ නෑ...කොල්ලා ඩොක්ටර් දිහා බැලුවේ හිතට දැනුන බය වගේ ම පුදුමයත් එක්ක....

" ඩො...ක්...ට...ර්...ම...ගෙ...ම...ගෙ...ක...කු...ල්...දෙ...ක.....අනෙහ්...ඩොක්ටර්...."

ආයුශ් කිවුවේ වචන පවා පටලවමින්....අයුශ් දිහා හොරෙන් බලන් ඉන්න නේහා ගේ ඇස් වලින් කදුලු ගලන් යන්න පටන් අරන් ගොඩක් වෙලා...කෙල්ල උන්නේ තමන් කරපු පව් වලට හිතින් පුදුම විදිහට විදවමින්.....

" රිලැක්ස් මිස්ටර් ආයුශ්...will see... "

sinhalaebooks.com

" ඩොක්ටර්....මට...මට කවදාවත් ඇවිදින්න බැරි වෙයි ද... "

කොල්ලා ඇහුවේ ඇස් වල කඳුලු පුරවගෙන....

" කරන්න බැරි දේවල් නෑ මිස්ටර් ආයුශ්...හිතේ හයිය විතරයි ඕනි...අපි...අපි try කරමු..
"

ඩොක්ටර් ආයුශ් ගේ පිටට තට්ටු කරලා රූම් එකෙන් එලියට යද්දි ම නේහා ආයුශ් ලගට දුවන් ආවේ තවත් ආයුශ් ට හැංගිලා ආයුශ් දිහා බලන් ඉන්න බැරි කමට...

" මන් ඉන්නවා ආයූ....මොන දේ උනත් මන් ඔයා ලගින් ඉන්නවා...."

කෙල්ල අඩ අඩ ම ආයුශ් ගේ එක අතකින් අත තියලා කියද්දි කොල්ලා කරේ නේහා ගේ අත ගස ඇරලා ඇස් දෙකත් රතු කරන් කෙල්ලව පුච්චලා අලු කරන්න තරම් බැල්මකින් කෙල්ල දිහා බලපු එක....

" අ...නේ...ආ...යූ..."

" මට උබේ මූන දකින්නත් පිලිකුල්...."

ආයුශ් ගත් කටට ම එහෙම කියලා ඇස් වල කඳුලු පිහිද ගත්තේ හිතට දැනුන දුකට වඩා එහ් තරහා ප්‍රහල හින්ද.....

නේහා උන්නේ මල කදක් වගේ..ආයුශ් දිහා ම බලාගෙන....අඩන්නවත් හිනා වෙන්නවත් කෙල්ලට සිහියක් තිබුනේ නෑ....
ආයුශ් අද හවස් වෙද්දි ගෙදර යන්න ඕනි උනත් කොල්ලා කැමති උනේ ම නෑ තමන් කලින් හිටපු ගෙදරට යන්න....ඩොක්ටර් ගේ මැදිහත්වීමෙන් ආයුශ් ව කැමති කරගන්න පුලුවන් උනත් කොල්ලා ගියේ නම් යන්න ඕනකමට මිසක් කිසිම හිතේ කැමැත්තකින් නෙමෙයි.....

ආයුශ් ව හොස්පිටල් එකෙන් එක්ක යන්න නේහා ට උදව් කරේ මලීශ් වගේම සරණී... කොල්ලගේ බඩු ටිකත් ලෑස්ති කරලා කොල්ලව කාර් එකෙන් වාඩි කෙරෙව්වත් කොල්ලා කාගෙවත් දිහා එකදු බැල්මක් වත් බැලුවේ නෑ...

ගෙදර ලගට ම ඇවිල්ලත් කොල්ලා උන්නෙ පෙර ඉරියව්වෙන් මයි...පෙර තරහින් ම යි....

නේහා, සරණී ආයුශ් ගේ බඩු ගද්දි මලීශ් කරේ ආයුශ් ව වීල් චෙයාර් එකෙන් ගේ ඇතුලට එක්ක ආව එක.... උඩ තට්ටුවේ ආයුශ් කලින් හිටපු රූම් එකට ආයුශ් ව එක්ක යන්න කරදර නිසා නේහා කලින් ම ආයුශ් ට ඉන්න පහල රූම් එකක් අස් කරලා තිබුනේ....කොල්ලව එහ් රූම් එකට එක්ක ගිහින් බෙඩ් එක උඩින් තිබ්බත් කොල්ලා උන්නේ කාගෙවත් මූනක් වත් බලන්න බැරි තරමට කේන්තියකින්...

sinhalaebooks.com

" නංගි....එහෙනම් පරිස්සමින්...මොකක් හරි හදිස්සියක් උනොත් කෝල් එකක් දෙන්න...ආයුශ් ව හොස්පිටල් එක්ක යන්න තියන දවසට මන් ආයෙත් එන්නම්..."

මලීශ් නේහා ගේ ඔලුව අත ගාලා කියද්දි කෙල්ල හා කියන්න ඔලුව හෙල්லුවා....

" මලීශ් ....මන් නේහා ගේ උදව්වට මෙහෙ නවතින්න ද.... නේහා ට තනියම ඔක්කොම කරන්න බෑනේ...ආන්ටි ත් නෑනේ...ආන්ටිලා දන්නෙත් නෑනේ මේවා...."

සරණි මලීශ් දිහා බලන් කිවුවත් මලීශ් ගේ ඇස් තිබුනේ ආයුශ් ගේ මූන දිහා...

" එපා...මෙ දෙන්නා ටිකක් නිදහසේ හිටපුදෙන්...."

මලීශ් කිවුවේ සුසුමක් පිට කරමින්...

" එහෙනම් නේහා ගේ අම්මටවත් කියමු ද අයියා...එයත් දන් නෑනේ මේ කිසි දෙයක්..."

" ඕන නෑ කිවුවනේ දැන් එක පාරක්...මේ දෙන්නා නිදහසේ හිටපු දෙන්.."

මලීශ් මේ පාරනම් කිවුවේ ටිකක් තදින්....සරණි එහ් වචන එක්ක කට පියා ගත්තේ හා කියන්න ඔලුවත් හොල්ලලා...

" එහෙනම් නංගි..අපි ගිහින් එන්නම්...හදිස්සියක් උනොත් කෝල් කරන්න..."

මලීශ් ආයෙම පාරක් කියද්දි නේහා ලාවට හිනා උනා...

මලීශ් ගේ කාර් එක නොපෙනෙන්න ම ඈතට යද්දි ආයුශ් එක්ක ගේ ඇතුලේ තනිවුන නේහා ට දැනුනේ දරාගන්න බැරි තරම් ලොකු තනිකමක්...අසරනකමක්....

" මන් මගෙ ආයුව මගෙ ඇස් දෙක වගේ බලාගන්නවා.... "

කෙල්ලගේ හිත කිවුවේ මේ වචන ටික විතරමයි......
මලීශ්,සරණි ගියාට පස්සේ කෙල්ල ඇඳේ හාන්සි වෙලා උන්න ආයුශ් ලගට ආවත් කොල්ලා උන්නේ හිනා මතාම ඉවත බලාගෙන...එහ් ඇස් බලන්නත් බැරි තරමට තරහින්ම රතු වෙලා..කොල්ලා ඇදන් උන්නේ හොස්පිටල් එකේදි ඇදන් හිටපු ඇදුමමයි...කෙල්ල ආයුශ් ගේ ඔලුවෙන් අතක් තිබ්බේ ආයුශ් ගේ ඊලග හැසිරීම මොන වගේ වෙයිද කියලා හිතට දැනුන බයත් එක්ක...කෙල්ල ආයුශ් ගේ ඔලුවෙන් අත තියනවත් එක්කම කොල්ලා එහ් තත්පරේම නේහා දිහා බැලුවේ කෙල්ලව පුච්චලා අලු කරන්න තරම් බැල්මකින්....

නේහා ගේ ඇස් වල කඳුලු පිරුනේ ආයුශ් ගේ මේ හැසිරීම් දරාගන්නම බැරි තැන....

sinhalaebooks.com

" අනේ ආයූ.... "

නේහා ඇස් දෙකේම කඳුලු පුරවන් කිවුවත් ආයෙත් එකදු බැල්මකින්වත් ආයුශ් නේහා දිහා බැලුවේ නෑ...

" මගෙත් එක්ක තරහා උනාට කමක් නෑ ආයූ...ඔය ඇඳුම ගලවලා වෙන ඇඳුමක් අන්දවන්න විතරක් දෙන්න.... ඕක හොස්පිටල් එකේදි ඇඳන් හිටපු ඇඳුමම නෙහ්... "

කෙල්ල ආයුශ් දිහා බලාගෙන ඇස් දෙකේ කඳුලු පුරවගෙන කිවුවත් ආයුශ් හිටියේ කෙල්ල කිවුව කිසිම දෙයක් නෑසුන ගානට...එහ් හින්දම කෙල්ල ආයුශ් ඇඳන් හිටපු ශටර්' එක ආයුශ් ගේ අවසරයක් නැතුවම ගලවන්න හැදුවේ...ඒත් ඊළඟට උනේ කෙල්ල හීනෙකින්වත් නොහිතුව දෙයක්...ආයුශ් තමන් ට පුලුවන් උපරිම වෙහෙස දීලා කෙල්ලව තල්ලු කරලා දැන්මේ කිසිම හිතක් පපුවක් නැති ගානට..ආයුශ් තල්ලු කරපු පාරට කෙල්ල ටයිල් පොලව මත මුනින් අතට වැටුනේ කෙල්ලගේ ඔලුව තදින් ටයිල් පොලව මත වැදෙද්දි..කෙල්ලගේ මුවින් කෙඳිරියක් පිට උනේ දැනුන වේදනාව දරාගන්න ම බැරි තැන... මොන තරම් හයියෙන් කෙල්ලගේ ඔලුව වැදුනද කිවුවොත් එහ් පාරට කෙල්ලගේ ඔලුව ගෙඩිගැහුනා.... විනාඩි කීපයක් යනකම් කෙල්ලට නැගිට ගන්න පවා බැරි උනා... ඒත් ආයුශ් ගේ එක බැල්මක් වත් කෙල්ල දිහාට යොමු උනේ නෑ...කොල්ලා උන්නේ කිසිම හිතක් පපුවක් නැති ගානට...

කෙල්ල ඔලුවත් අල්ලගෙන නැගිටලා තමන් දිහා එකදු බැල්මක් වත් නොබලන ආයුශ් දිහා මොහොතක් බලන් ඉදලා රූම් එකෙන් එලියට ආවේ දරාගන්න බැරි ලොකු වේදනාවකුත් එක්ක... ඩොක්ටර් දුන්න බෙහෙත් ටික දෙන්න ආයුශ් ට කන්න දෙන්න ඕනි හින්දම හිසෙන් මොන තරම් වේදනාවක් දැනුනත් කෙල්ල එහ් හැම වේදනාවක් මැදින් ම උයන්න ගත්තා...නිකන් ම නෙමෙයි...ආයුශ් ආසා වෙයි කියලා හිතුන කෑමත් හිතින් හිතමින්...

හවස 6.30 විතර වෙද්දි කෙල්ල උයලා ඉවර වෙලා ප්ලේට් එකකට කෑමත් බෙදගෙන ආයුශ් හිටපු රූම් එකට ආවේ අතින් අතින් වතුර එකකුත් අරගෙන....

කෙල්ල රූම් එකට එද්දි ත් ආයුශ් උන්නේ යාන්තමට ඇස් දෙක පියාගෙන...කෙල්ල රූම් එකට එන සද්දෙත් එක්ක ම ආයුශ් ගෙ ඇස් හෙලවෙනවා කෙල්ල බලාගෙන....

කෙල්ල කිසිම දෙයක් නොවුන ගානට කෑම එකත් අරගෙන ගිහින් ඒක ඇඳ ලග තිබුන ටේබල් එක උඩින් තියලා ආයුශ් ට කතා කරේ අහිංසක හිනාවකුත් එක්ක...

" ආයූ...කාලා ඉමු ද..බෙහෙත් ටික බොන්න ඕනි නෙහ්..."

කෙල්ල දෙතුන් පාරක් ම එක ම දේ කිවුවත් කොල්ලා කෙල්ල ගේ කිසි දේකට උත්තරයක් දුන්නේ නෑ...ඇස් දෙකත් රතු කරන් එක ම ඉලක්කයක් දිහා බලන් උන්න එක විතරමයි කොල්ලා කරේ...

sinhalaebooks.com

ඕන දෙයක් වෙන්න කියලා හිතාගෙන කෙල්ල බත් එක අතට ගත්තේ හිතට දැනුන බය මොහොතකට අමතක කරලා...

" මන් කවන්න ද..බෙහෙත් බොන්න පරක්කු වෙනවනේ..."

නේහා එහෙම කියලා බත් කටක් අනලා ආයුශ් ගේ මුවට ලන් කරත් කොල්ලා කරේ එතනින් මුව ඉවත් කරපු එක...

" අනේ කන්නකෝ ආයූ..."

නේහා එහෙම කියන ගමන් ආයේ ආයේ ම කොල්ලගේ මුවට බත් කට ලන් කරන්න උත්සාහා කරා...තත්පර කීපයක් ගෙවෙන්න ඇති...කෙල්ල අතේ තිබුන බත් පිගාන මොහොතකින් විසි වෙලා ගියේ කෙල්ලට හිතන්නවත් තත්පරයක් වත් නොදී...ආයුශ් තමන් ගේ අතින් කෙල්ල අතේ තිබුන බත් එකට ගහලා ඉවත බලාගත්තේ තරහින් පිරුන මූන තවත් රතු කරන්...

නේහා ආසාවෙන් ඉවුව බත් එක එහ් විදිහට ආයුශ් අතින් ම විසි කරලා දද්දි කෙල්ල අඩ අඩ ම ආයුශ් දිහා බැලුවේ හිතට දැනුන දරාගන්න බැරි දුකත් වේදනාවත් එක්ක...

" අනේ ඇයි ආයූ මෙහෙම කරන්නේ....මාත් එක්ක තරහා උනාට කමක් නෑ...අනේ බෙහෙත් ටිකවත් බොන්න දෙයියනේ..."

කෙල්ල ඉකි ගගහා කිවුවත් කොල්ලා කරේ එහ් කිසි දෙයක් නෑසුන ගානට හිටපු එක...නේහා බිම වැටුන පියන් කෑලි කකුලේ ඇනෙද්දි ම රූම් එකෙන් එලියට ගියේ ඉකි ගගහා අඩාගෙන...තමන්ට ම ශාප කරගනිමින්...වීදුරු කටු වලට කෙල්ලගේ කකුල් දෙකම හොදට ම තුවාල වෙලා ලොකු වේදනාවක් එක්ක ලේ ගලන්න ගත්තත් කෙල්ල එහ් හැමදේම අමතක කරලා ඇවිදින්න ගත්තේ තමන් ට ම දඩුවම් දෙමින්... කරන්න ඕනි මොනවද කියලවත් අදහසක් නැතුව කෙල්ල ඔලුවත් දෝතින් ම බදගෙන සාලේ ඇවිදින්න ගත්තා.... ඔය වෙලාවෙයි ගෙදර ලෑන්ඩ් ෆෝන් එක රින්ග් වෙන්න ගත්තේ.... කෙල්ල ෆෝන් එක ආන්සර් කරෙත් දෙතුන් පාරක් ම රින්ග් උන කරදරේට...

" හෙල්ලෝ..."

" මේ මිස් නේහා ද.."

" ඔව්...කවුද මේ.."

" මන් ආයුශ් ගේ ට්‍රේට්මන්ට් කරපු ඩොක්ටර් නේහා..."

" ඩො...ක්...ට...ර්.... "

sinhalaebooks.com

" මලීශ් කිවුව නිසයි ගත්තේ නේහා....ආයුශ් දැන් කොහොමද...බෙහෙත් ටික බිවුවද..."

" අනේ ඩොක්ටර්... "

" ඇයි "

" ආයුශ් මන් කියන කිසි දෙයක් අහන් නෑ..."

" මන් දැනගත්තා...මලීශ් මට ගන්න කිවුවෙත් ඒකයි...නේහා පොඩ්ඩක් ආයුශ් ට ෆෝන් එක දෙන්න...මන් එයාට කතා කරන්නම්.... "

ඩොක්ටර් කියද්දි කෙල්ලගේ මැලවිලා තිබුන මූනට හිනාවක් ආවේ ඉබේම..කෙල්ල එහ් සැනින් ආයුශ් හිටපු රූම් එකට ආවේ තත්පර ගානෙන්...

කෙල්ල බිම වැටිලා තිබුන වීදුරු කටු ගැනවත් හිතන් නැතුව ආයෙම ආයුශ් ලගට ගියේ හිනාවකුත් එක්ක...කෙල්ලගේ තුවල වෙලා තිබුන කකුල ආයෙම පෑරෙද්දි කෙල්ලගේ මූවින් එක වචනයක් වත් පිට නොවුනේ ඊට වඩා දස දහස් ගුනයක් කෙල්ලගේ හිතේ වේදනාව වැඩි හින්දම වෙන්න ඇති... ඒත් ආයුශ් ගේ රතු උන ඇස් මොහොතක් කෙල්ලගේ කකුල් දෙක දිහාට යොමු වෙලා තිබුනා...ඒත් එහ් තත්පර ගානකට විතරයි... කොල්ලා ආයෙම ඇස් ඉවතට ගත්තේ හැගීමක් දැනීමක් නැති ගානට...

" ආයූ.ඩොක්ටර් කතා කරනවා... "

කෙල්ල කලින් තිබුන හිනාව තාමත් එහ් විදිහට තියෙද්දි ආයුශ් අතට ෆෝන් එක දුන්නා...කොල්ලා කෙල්ල දිහා එකදූ බැල්මක් වත් නොබලා ෆෝන් එක අතට ගත්තා...

" හෙල්ලෝ..."

" මිස්ටර් ආයුශ් මං..."

" කියන්න ඩොක්ටර්..."

" මිස්ටර් ආයුශ් මන් කිවුව විදිහට බෙහෙත් ටික බිවුව ද... "

කොල්ලා කරේ එහ් ප්‍රශ්නෙට නිහඩව හිටපු එක....

" මිස්ටර් ආයුශ් ට මන් කිවුව දේවල් මතක ද...මිස්ටර් ආයුශ් ට ආයෙ ම නැගිට්න්න ආසාවක් නැද්ද... හැමදම ඔහොම ඉන්න ද ඕන... "

ඩොක්ටර් එහ් අහපු ප්‍රශ්නෙට නම් කොල්ලා නිරුත්තර වෙලා ගියා...

sinhalaebooks.com

" ඩො...ක්...ට..ර්..."

" ප්‍රශ්න අමතක කරලා ඉස්සරලා සනීප වෙලා ඉන්න මිස්ටර් ආයුශ්... ඊට පස්සේ ඔය ප්‍රශ්න ඔක්කොම විසඳ ගන්න පුලුවන්... දැන් ඔක්කොමට ම කලින් කාලා බෙහෙත් බීලා ඉන්න....නොදරුවෙක් වගේ හැසිරෙන්න එපා.... මන් තියනවා..... "

ඩොක්ටර් ෆෝන් එක කට් කරලා දැන්මේ කොල්ලා තවත් මොකුත් ම කියන්න කලින්...ෆෝන් එක කට්කරපු පලවෙනි තත්පරේ ම කොල්ලා බැලුවේ නේහා දිහා...කෙල්ල කලින් වගේ ම තාමත් උන්නේ අර අහිංසක හිනාවත් එක්ක...ඒත් ආයුශ් කිවුව දේ ට නම් කෙල්ලගේ මූන මැලවිලා ගියේ මොහොතකට දැනුන සතුටත් නැත්තට ම නැති කරලා දලා....

" මන් සනීප උන ගමන් ඩිවෝස් වෙන්න බලන් හිටපන්.."

" ආ...යූ..."

" මට උබව අප්පිරියයි දැන්... "

ආයුශ් කිවුවේ ඇස් දෙකම රතු කරන්...කෙල්ල උන්නේ හිටගෙන ඉන්න පවා අපහසු තරමට ම දුවර්ල වෙලා...

" කෝ මගෙ බෙහෙත් ටික... "

ආයුශ් ඇහුවේ නේහා ගේ මූනවත් නොබලා...

" හිස් බඩට බෙහෙත් බොන්න බෑනේ...මන් බත් ටිකක් බෙදන් එන්නම් ආයූ...ඒක කාලා බෙහෙත් ටික බොමු..."

කෙල්ල කිවුවේ මොහොතකට හිතේ වේදනාව අමතක කරලා...බෙහෙත් කෝ අහද්දි පවා කෙල්ලගේ මූනට හිනාවක් ආවේ ආයුශ් ඩොක්ටර් කිවුව නිසා හරි මුරංඩුකම් අත ඇරපු එකට... කෙල්ල කිවුව දේට ආයුශ් ගෙන් ප්‍රතිචාරයක් නොලැබුන හින්දම කෙල්ල ෆෝන් එකත් පැත්තකින් තියලා ආයෙම බත් එකක් බෙදන් ආවා...ආයුශ් ලගින් කවන්න කියලා වාඩි වෙන්න හදද්දි කොල්ල කෙල්ල අතේ තිබුන බත් එක උදුරලා ගත්තේ කෙල්ලටත් රවාගෙන...

" මට තනියම කන්න පුලුවන්..."

ආයුශ් කියනවත් එක්ක ම කෙල්ල ඒකටත් කරේ අහිංසක විදිහට හිනා උන එක... ආයුශ් කිවුව දේට මොකුත් ම නොකිවුවේ කොල්ලට ආයෙත් තරහා යයි කියලා හිතුන නිසා... ආයුශ් බත් එක අතට ගත්තු ගමන් ම කාපු විදිහෙන් කෙල්ලට තේරුනා මොන තරම් නපුරුකම් කරන් කොල්ලා ඉදලා තියෙන්නේ හොදට ම බඩගින්නේ කියලා... බඩගින්න නිසා හරි ආයුශ් තමන් උයපු දෙයක් කන එකත් කෙල්ලගේ හිතට ගෙනාවේ අසීමිත සතුටක්....

sinhalaebooks.com

ආයුශ් කාලා ඉවර වෙද්දි කෙල්ල බෝල් එකකට වතුර එකක් ගෙනත් කොල්ල ලඟින් තිබ්බේ කොල්ලට අත හොදගන්න...ඊලගට පිගානත් පැත්තකින් තියලා කොල්ලට බෙහෙත් ටික දුන්නා... ඊට පස්සේ කොල්ලට නිදා ගන්න දීලා ටිකකට කලින් ආයුශ් විසික් කරපු බත් එකයි පිගන් කෑලි එකයි එකතු කරගෙන රූම් එකත් අතු ගාලා රූම් එකෙන් එලියට ගියේ විනාඩි ගානක් ඇතුලත...මොකද කෙල්ලට ඕනි උනේ කොල්ලට නිදහසේ නිදා ගන්න දෙන්න...

ආයුශ් ට යාන්තමට නින්ද යාගෙන එද්දි කෙල්ල පැදුරකුත් බිම එලලා ආයුශ් ගේ ඇඳ ගාවින් ම බිම නිදා ගත්තේ මහා රෑ ආයුශ් ට අමාරු වෙයි ද කියලා හිතට දැනුන බයත් එක්ක... අඩ නින්දේ හිටියත් ආයුශ් හිටියේ මේ හැමදේම බලාගෙන...ඒත් නේහා ගේ එහ් හැම ඉරියව්වක් ම කොල්ලට ගෙනාවේ පුදුම තරහක්...

ආයුශ් ට හොදට නින්ද ගියත් කෙල්ලගේ කකුලේ වීදුරු කටු ඇනුන පාරවල් හින්දා කෙල්ලට නම් මොහොතකටවත් නින්ද ගියේ නෑ...කෙල්ල උන්නේ පැදුරේ එහෙට මෙහෙට පෙරලෙමින්...

ආයුශ් ට සනීප උන ගමන් ම තමන් ට ආයුශ් ගෙන් ඩිවෝස් වෙන්න වෙනවා කියලා හිතට දරා ගන්න බැරි ලොකු වේදනාවක් දැනුනත් කෙල්ල මොහොතකටවත් ආයුශ් ට සනීප වෙන එක දවසක් වත් පරක්කු වෙනවට කැමති උනේ නෑ... කෙල්ල ට ඕනි උනේ ආයුශ් ඉක්මනට සනීප වෙනවා දකින්න...යටි හිතේ පුංචි ම පුංචි බලාපොරොත්තුවක් නොතිබුනම නෙමෙයි..ආයුශ් ආයෙත් වෙනස් වෙයි කියලා... ඒත් ඒක හීනයක් විතරක් ම බව කෙල්ල දැනන් උන්නා... එහ් හීනෙට උනත් කෙල්ල පුදුම විදිහට ආදරේ කරා...

කෙල්ලගේ හිතේ බලාපොරොත්තුවකට කියලා ඉතුරු වෙලා තිබ්බේ ආයුශ් ව ඉක්මනට සනීප කරගන්න එක විතරයි...එතනින් එහාට ජීවිතේ ගැන ආසාවක් කෙල්ලගේ හිතේ පුංචි කොනකවත් තිබුනේ නෑ....

#ජීවිතේ_ආදරේ_බැදීම් කියන්නේ මහා දුකක ආරම්භයක්...මේ ටිකනම් මේ වෙද්දි කෙල්ල හොදට ම තේරුම් අරන් තිබුනා...

හීන බලාපොරොත්තු එකින් එක බිදිලා යද්දි දැනෙන එහ් වේදනාව, ආදරේ වෙනුවෙන් ම කරපු එහ් කැපකිරීම් ජීවිතේ ම එපා කරවද්දි මොහොතින් මොහොත ගෙවෙන හැම තත්පරේ ම වේදනාව විතරක් ම ලැබෙද්දි කෙල්ලට ජීවිතේ ගැන දැනුනේ පුදුම කලකිරීමක්පහුවදා උදේ කෙල්ල ඇහැරුනේ මුලු රෑම අඩලා අඩලා හෙම්බත් වෙලා.... කෙල්ලට ඇස් ඇරගන්න බැරි තරමට ම ඇස් දෙක ඉදිමිලා තිබුනා... කෙල්ල අමාරුවෙන් ඇස් දෙක ඇරපු පලවෙනි තත්පරේම බැලුවේ ආයුශ් දිහා...ආයුශ් උන්නේ තදා නින්දේ...කෙල්ල ආයුශ් ටඇහැරෙන් නැති විදිහට රූම් එකෙන් එලියට ගිහින් උඩ තට්ටුවේ රූම් එකෙන් ම වොශ් එකක් දාගත්තේ කොල්ලා ඇහැරෙයි කියලා හිතලා...ඊලගට ඇදුමකුත් දාගෙන කෙල්ල කරේ උයන්න පටන් ගන්න එක...

sinhalaebooks.com

වෙලාව 6 ට කිට්ටු කරලා තිබුනා..පාන්දර නිසා ආයුශ් ව ඇහැරෙයි කියන ලෝබකමට කෙල්ල කිචන් එකේ බඩු පවා එහෙට මෙහෙට කරේ හරි පරිස්සමට..හරියට තිත්දක් නැති නිසාද මන් ද කෙල්ලගේ ඇගට හරි අපහසුවක් දැනුනා...මුලු ඇගම පන නෑ වගේ දැනුනා....කෙල්ලට හිටගෙන ඉන්න පවා අහපසුවක් දැනුන නිසා ම කෙල්ල කරේ පුලුවන් ඉක්මනට උයන්න හදපු එක... 7 විතර වෙද්දි උයලා ඉවර කරගන්න කෙල්ලට පුලුවන් උනා... කෙල්ල ආයුශ් ගේ කෑම එක ප්ලේට් එක ට බෙදලා ඒක වහලා ආයුශ් ගේ රූම් එකට ගියේ කොල්ලට ඇහැරවන්න හිතාගෙන... ඒත් කොල්ලා හිටියේ එග් වෙද්දිත් ඇහැරලා...කෙල්ල රූම් එකට යද්දි ම කොල්ලා තරහින් ඉවත බලාගත්ත එක විතරයි කරේ... එක වචනයක් වත් එග් මුවින් පිට උනේ නෑ...

ඒත් නේහා කිසිම වෙනසක් නැතුව ම කොල්ලා ලගට ගිහින් අහිංසක හිනාවකුත් එක්ක කොල්ලට කතා කරා...

" ආයූ ..ඔයා නැගිට්ට ද... වොශ් එකක් දගමු ද...කාලා බෙහෙත් ටික බොන්න ඕනිතේ.... "

කෙල්ල හිනා වෙලා කිවුවත් කොල්ලා කරේ ඇස් දෙකත් රතු කරන් ඉවත බලන් හිටපු එක.... කොල්ලා උන්නේ කිසි දෙයක් නැසුන ගානට... ඕන දෙයක් වෙන්න කියලා කෙල්ල ආයුශ් ගේ බාහුවකින් අල්ලලා කොල්ලව වීල් වෙයාර් එකෙන් තියන්න හදද්දි කොල්ලා නිහඩවම උන්නේ වෙන කරන්න දෙයක් නැති කමට... මොකද කොල්ලත් මේ වෙද්දි හිටියේ දවස් එක හමාරක් ම වොශ් එකක් වත් නැතුව හරි අපහසුවෙන්...

කෙල්ල ආයුශ් ව වීල් වෙයාර් එකෙන් තියලා වොශ් රූම් එක ලගට එක්ක ගිහින් කොල්ලව නැගිට්ටෙවුවේ හිත පුදුම විදිහට ගැස්සෙද්දි ..ඊලගට පුලුවන් විදිහට ආයුශ් ව තමන් ගේ ඇගට වාරු කරගෙන කෙල්ල ආයුශ් ව වොශ් රූම් එකේ කලින් දවසේ රෑ ගිහින් තිබ්බ පුටුවෙන් වාඩි කෙරෙවුවා.... ඊලගටයි කෙල්ල ආයුශ් ගේ ඇදුම් එකින් එක ගලවලා කොල්ලව වොශ් කරන්න ගත්තේ...ආයුශ් ගේ ඇස් තරහින් රතු වෙලා තිබ්බත් කරගන්න දෙයක් නැති කමට කොල්ලා උන්නේ ඉවත බලාගෙන වේගෙන් හුස්ම ගනිමින්..

කෙල්ල ආයුශ් ව හරි පරිස්සමට වොශ් කරලා ඊලගට කොල්ලට ඇදුම් අන්දවන්න ගත්තා... එග් අතරතුර කෙල්ල ආයුශ් ගේ ඔලුව ආයුශ් ට දැනෙන නොදැනෙන තරමට සියුම් ව අත ගෑවේ ආයුශ් ගේ නමින් හිතේ උතුරන සෙනෙහස දරාගන්න ම බැරි තැන...

ආයුශ් ව රූම් එකට අරන් ඇවිත් ආයුශ් ව ඇද උඩින් තියලා කොල්ලට කෑම එකත් ලගට ම ගිහින් දුන්නේ කවන්න ගියොත් බැනුම් අහන්න වෙයි කියන බයට....ආයුශ් කෑම එක අතට අරන් කන දිහා කෙල්ල ටික වෙලාවක් බලන් ඉදලා ආයෙම ඉවත බලාගත්තේ ආයුශ් ට තරහා ගිහින් බත් එක විසික් කරයි කියලා හිතට දැනුන සැකෙත් එක්ක...

ආයුශ් කාලා ඉවර උනා ම කෙල්ල බෙහෙත් ටික ගෙනත් දීලා කොල්ලා බෙහෙත් ටික බොන අතරතුර පිගානත් හෝදලා ආයෙම රූම් එකට ආවා...එතකොට කොල්ලා උන්නේ ජනෙලෙන් පේන ගාඩර්න් එක දිහා මොකක්දෝ ලොකු කල්පනාවකින් බලාගෙන...

sinhalaebooks.com

කොල්ලගේ හිතට එක පාරම ආවේ ඉස්සර හවසට ගාඩර්න් එකේ ඇවිදපු විදිහ..ආයේ කවදවත් ඇවිද ගන්නවත් පුලුවන් වෙයි ද කියලා කිසි ම විශ්වාසයක් නැතුව කොල්ලා ගෙවන මේ ජීවිතේ ගැන කොල්ලට දැනුනේ ලොකු කලකිරීමක්...

එහ් කලකිරීමටත් වඩා වැඩියි ආයුශ් දිහා බලන් උන්න නේහා ට දැනුන දුක...මේ හැමදේම තමන් නිසා නේද කියලා දැනෙද්දි කෙල්ලට තමන් ගැන ම දැනුනේ ලොකු තරහක්...අද ආයුශ් මේ ඉන්න හැටි තමන් ගේ මේ ඇස් දෙකෙන් ම දැකගන්න තරම් තමන් කොච්චර පව් කරල ද කියන දේ විතරමයි කෙල්ලට හිතුනේ....

උදේ ඇගෙන් දැනුන වෙහෙස වගේ ම ඇගට පන නැති ගතිය තාමත් එහ් විදිහට ම තිබුනත් කෙල්ලට එහ් ගැන වගක්වත් නොවුනේ ආයුශ් මේ ඉන්න විදිහ හැසිරෙන විදිහ එහ් හැමදේම තමන් නිසා නේද කියන වරදකාරි හැඟීමෙන් මුලු හිතම පිරිලා තිබුන නිසා... ඒත් එක පාරම කෙල්ලට බඩෙන් දැනුන වේදනාවත් එක්ක ම වොමිට් වෙන්න ආවයින් කෙල්ල එහෙම්ම ම වොශ් රූම් එකට දිවුවේ ගාඩර්න් එක දිහා බලන් උන්න කොල්ලගේ කල්පනාවත් ඉබේම නැති වෙලා යද්දි...

තවත් විනාඩි 10කට වගේ පස්සේ කෙල්ල ආයෙමත් රූම් එකට ආවේ පුදුම අමාරුවකින්...ආයුශ් ගේ ඇස් කෙලින් ම යොමු වෙලා තිබුනේ කෙල්ල දිහාවට......ඒත් කොල්ලා ඇයි මොකද උනේ කියලා අහන්නවත් කාරුනික උනේ නෑ... කොල්ලගේ තරහා එහ් විදිහමයි... නේහා ලාවට හිනාවකුත් එක්ක ආයුශ් දිහා බලලා ආයෙම රූම් එකෙන් එලියට ගියේ තමනුත් අසනීප උනොත් ආයුශ් ව හරියට බලාගන්න බැරි වෙයි කියලා හිතට දැනුන බය නිසා ම පැනඩෝල් එකක් හරි බොන්න ඕනි කියලා හිතලා....
දවස් ගෙවිලා ගියේ ඔය විදිහට... හැම දවසක ම නේහා ආයුශ් ව පුදුම විදිහට පරිස්සම් කරා... කොල්ලගේ හැම වැඩක් ම උනේ නේහා ගේ අතින්...ආයුශ් උනත් දැන් පුරුදු වෙලා.නේහා ට එහ් දේවල් කරන්න ඉඩ දීලා කොල්ලා නිහඬ උනේ තමන් ට කියලා කරන්න පුලුවන් දෙයක් නෑ කියලා දන්න නිසා.... මොකද කොල්ලට තාමත් කිසි වැඩක් තනියම කරගන්න බෑ ......

ආයුශ් ව හොස්පිටල් එක්ක යන දවසත් ලන් උනා...මලීශ් සරණි ගේ උදව්වෙන් කෙල්ල ආයුශ් ව හොස්පිටල් එකට එක්ක ගියා... ඩොක්ටර් ආයුශ් ව චෙක් කරලා ඊලගට ඉන්න ඕනි විදිහ කරන්න ඕනි දේවල් ගැන නේහා ව වගේ ම ආයුශ් වත් දැනුවත් කරා...

මේ වෙද්දි කොල්ලගේ සෞඛ්‍ය තත්වේ හිතා ගන්න බැරි තරම් යහපත් අතට හැරිලා තිබුනා... පුදුමේ කියන්නේ කලින් කිසිම හැඟීමක් දැනීමක් නොදැනුන ආයුශ් ගේ දෙපා වලට දැන් යම් තරමක දැනීමක් ලැබිලා තිබුනා.... දැන් කොල්ල දැනෙනවා....කකුලේ මොනා හරි ස්පශර් උනත් කොල්ලට ඒක දැන් දැනෙනවා...

ආයුශ් ට ආයෙත් නැගිට්ටන්න පුලුවන් වෙයි ද බැරි ද කියන එක තාමත් ස්තිර නොවුනත් ආයුශ් ගේ කකුල් වලට දැනීමක් ලැබුන එකත් ලොකු දෙයක් කියලා ඩොක්ටර් කියද්දි ආයුශ් ට වඩා සතුටු උනේ නේහා...සතුට වැඩි කමට ම කෙල්ලගේ ඇස් වලින් කදුලු නිමක් නැතුවම කඩා වැටෙන්න ගත්තා...

sinhalaebooks.com

හිතුවටත් වඩා හැමදේම හොඳ විදිහට වෙද්දි නේහා ගේ හිතට දැනුනේ පුදුම සැනසීමක්… ආයුශ් ව ක්ලිනික් එක්ක යන එක ඇරුන ම ආයුශ් ගේ අනිත් හැමදේම නේහා ගේ අතින් උනා... උදෙන් ම උයලා ආයුශ් ව ඇහැවලා කොල්ලව වොශ් කරලා කොල්ලට කවලා බෙහෙත් දෙන එක දැන් දෙන්නට ම සාමාන්‍ය දෙයක් වෙලා... ආයුශ් ගේ නපුරුකම් වල අඩුවක් නොවුනත් එක ම එක දෙයක් මේ වෙද්දි වෙනස් වෙලා තිබුනා... එහ් හිතේ මොන තරම් තරහක් තිබුනත් කොල්ලා නේහා ට දැන් තමන් ගේ හැමදේම කරන්න ඉඩ දෙනවා...එහ් කොල්ලට බැරි කමට ම නෙමෙයි...නේහා කොල්ලව අම්මා කෙනෙක් තරමට ම පරිස්සම් කරන කෙනා....කොල්ලගේ උඩු හිත කොහොම උනත් කොල්ලගේ යටි හිත නම් පුදුම විදිහට එහ් සෙනෙහසට ආසා කරා... ඒත් නේහා තමන් ට කරපු වංචාව මතක් වෙන වාරයක් වාරයක් ගානේ කොල්ලට තමන් ව ම පාලනය නැතුව යනවා...එහ් වෙලාවට කොල්ලා කරේ අතට අහු උන දෙයින් කෙල්ලට ගහපු එක... ඒත් නේහා හැමදේම නිහඬව දරාගෙන හිටියා...

සති දෙක තුනක් ක්ලිනික් ගියාට පස්සෙ ආයුශ් ට කිහිලි කරු වලින් යම් තරමකට ඇවිදින්න පුලුවන් උනා... ඒත් තනියම නම් නෙමෙයි.... නේහා ගේ උදව් නැතුව කොල්ලට කිසි දෙයක් හරි හැටි කරගන්න බැරි උනා... ඩොක්ටර් කිවුව විදිහට කිහිලි කරු නැතුව ඇවිදින්නත් කොල්ලා ටිකෙන් ටික පුරුදු උනේ නේහා ගේ ඇගට වාරු වෙලා... අඩියක් දෙකක් ඇවිද ගන්න ලැබෙද්දි කොල්ලගේ මූනේ තිබුනේ නේහා කවදාවත් ම දැකලා නැති තරම් සතුටක්... කෙල්ල එහ් සතුට දිහා අහිංසක හිනාවකුත් එක්ක බලන් උන්නේ ආයුශ් ටත් වඩා හිත යටින් පුදුම විදිහට සතුටු වෙමින්...

මේ කාලේ ඇතුලත සැරින් සැරේ කෙල්ලට කීප වතාවක් ම වොමිට් වෙන්න ගත්තත් කෙල්ල එහ් ගැන ගානක් වත් නොගත්තේ කෙල්ලට එහ් දේ දැන් සාමාන්‍ය දෙයක් වෙලා තිබුන නිසා .. ඇගටත් මොන තරම් අමාරුවක් දැනුනත් කෙල්ල උන්නේ ආයුශ් මත්තෙම වැටිලා...

ටිකෙන් ටික ආයුශ් ට තමන් ගේ වැඩ තනියෙන් කරගන්න පුලුවන් වෙද්දි කොල්ලා කරේ හැම තත්පරේ ම කෙල්ලගේ හිත රිද්දපු එක... ඒකෙන් කොල්ලගේ හිතට අසීමිත සතුටක් දැනුනා...

වෙලාව හවස 4 ට විතර ඇති... කෙල්ල උන්නේ සාලෙට වෙලා බර කල්පනාවක...ආයුශ් ගේ හඬින් කෙල්ල ගැස්සිලා ගියේ එහ් හින්ද මයි....මොකද ආයුශ් ඇක්සිඩන්ඩ් උනත් හරි එක ම එක දවසක් වත් කෙල්ලට කෙල්ලගේ නම කියලා කතා කරලා නෑ...අවශ්‍ය ම උනොත් වචන දෙක තුනක් කතා කරා ඇරෙන්න කොල්ලා උන්නේ තමන් ගේ පාඩුවේ ..ඒත් අද... අද ආයුශ් කවදාවත් නැතුව කෙල්ලට කතා කරද්දි සතුටකටත් වඩා කෙල්ලගේ හිතේ තිබුනේ බයක්...ආයුශ් මොකට ද එන්න හදන්නේ කියලා කෙල්ලගේ හිත පුදුම විදිහට බය උනා...

" අනේ දෙයියනේ...නරක දෙයක් නම් වෙන්න එපා... "

කෙල්ල ආයුශ් ගේ රූම් එකට යන්න කලින් තමන් ට ම කියා ගත්තේ දෙවියන් සිහි කරමින්...

sinhalaebooks.com

" තේ...හා... "

" ආ...යූ... "

" මට දැන් සනීපයි...මට මගෙ වැඩ තනියෙන් කරගන්න පුලුවන්... "

ආයුශ් කිවුවේ රතු උන ඇස් වලින් කෙල්ල දිහා බලලා...

" මන් දන්නවා ආයූ...මට ගොඩක් සතුටුයි....."

කෙල්ල ඇස් වලින් පවා හිනා වෙලා කිවුවත් ඊලගට ආයුශ් කිවුව දේට කෙල්ල ආයුශ් දිහා ගල් ගැහිලා බලන් උන්නේ එහ් වචන අදහා ගන්න බැරුව.....

" ඉතින් දැන් මට වැඩකාරියෙක් ඕන් නෑ...මෙතන මාස තුනක පඩි තියනවා...රුපියල් හතලිස්පන්දහක්... මෙතන ඩිවෝස් පේපසර් තියනවා...මේක කියවලා මේ පේපසර් වලට සයින් කරලා මේ සල්ලිත් අරන් මෙහෙන් පලයන්.මගෙ ඇස් දෙකටවත් පේන්න ආයේ එන්න එපා.....උබව මට පිලිකුල්... "

ආයුශ් හිතක් පපුවක් නැති ගානට එහෙම කියලා තමන් අතේ තිබුන පේපසර් ටික නේහා ගේ මූනට දමලා ගැහුවේ සල්ලිත් එහ් එක්කම කෙල්ලට කකුල් දෙක ලගට වැටෙන විදිහට... කෙල්ල උන්නේ අඩාගන්නවත් සිහියක් නැතුව...

" මොනවද උබ තවත් බලන් ඉන්නේ... මන් උබට අද දවස විතරක් කල් දෙනවා... පුලුවන් නම් අද හවසම පලයන්..නැත්නම් හෙට උදෙන් ම..මගෙ ඉස්සරහා ඇස් පේන් නෑ වගේ රගපාපු, පොරොන්දු කඩලා දූන්ම උබ වගේ කපටි ගෑනියෙක් මට තවත් එපා..... "

ආයුශ් මුලු රූම් එක ම දෙවනක් වෙන්න කියද්දි කෙල්ල ආයුශ් දිහා මොහොතක් කල් ගැහිලා බලන් ඉදලා ආයුශ් තමන් ගේ කකුල් දෙක ලගට දූන්ම සල්ලි ටිකත් ඩිවෝස් පේපසර් ටිකත් අරන් රූම් එකෙන් එලියට ගියේ වචනයක් වත් කතා නොකර... කෙල්ලගේ ඇස් වලින් එක කදුලක් වත් පිට නොවුනේ තාමත් කෙල්ලට ආයුශ් ගේ වචන විශ්වාස කරන්න බැරි නිසා...

" ආ..යූ....ම..න්....ම...න්...වැඩකාරියෙක් ද
..."

කෙල්ල තමන් ගෙන් ම ඇහුවේ ආයුශ් දූන්න සල්ලි ටික දෝතින් ම බදගෙන...එහ් දිහා ම ඇස් රදවගෙන.... ඒත් එක්ක ම කෙල්ලගේ ඇස් වලින් කදුලු ගලන් යන්න ගත්තේ පුදුම දුකක් එහ් කදුලු වල සැගවිලා තියෙද්දි... කෙල්ලට ඉකි ගැහුනේ මේ තරම් දවසක් ආයුශ් ව වෙනස් කරලා දෙන්න කියලා දෙවියන්ගෙන් ඉල්ලපු හැම ප්‍රාථර්නාවක් ම තමන් ගේ ඇස් මතාපිට ම බොදවෙලා යද්දි.....

sinhalaebooks.com

කෙල්ල ඉකි ගගහා සාලෙට එද්දි එද ආයුශ් ගෙනපු අර පුංචි ඇඳුම් සෙල්ලම් බඩු කෙල්ලගේ ඇහැ ගැටුනේ කෙල්ලවත් නොහිතපු විදිහට...

ඒකෙන් උනේ කෙල්ලගේ හිතේ තිබ්බ දුක කලකිරීම තවත් වැඩි උන එක..

" අනේ ආයු.....ඔයා...ඔයා මට කොච්චර ආදරේ කරා ද දෙයියනේ...මමයි ඔයාව රැවැට්ටුවේ...ඒත්....ඒත් මන් හිතුවේ නෑ රත්තරං මෙහෙම දෙයක් වෙයි කියලා...ඔයාට...ඔයාට තියෙන්නේ මන් පොරොන්දු ව කඩ කරාට මාත් එක්ක තරහක් ද සුදු අයියේ....අනේ...අනේ මට මේ ඇස් දෙක එපා රත්තරං ...උබ නැතුව මට...මට මේ ඇස් දෙකෙන් වැඩක් නෑ රත්තරං .... මන් උබව රැවැට්ටුවට උබට මේ තරම් දුකක් දුන්නට මන් අනිවාරෙන් ම දඩුවම් විදින්න ඕනි මගෙ සුදු අයියේ.... "

කෙල්ල තමන් ට ම කියාගෙන පිස්සුවෙන් වගේ පහල තිබුන රූම් එකකට දුවන් ගියේ හරියකට සිහියක් වත් නැතුව...ඒලගට අතට අහු උන කතුරක් අතට ගත්තේ පුදුම විදිහට එහ් ඇස් වලින් කදුලු ගලන් යද්දි....

කෙල්ලගේ මුවින් පිට උනේ එක ම එක වචන ටිකයි....

" උබ නැතුව මට මේ ඇස් දෙක එපා රත්තරං .... "

කෙල්ල එහෙම කියනවත් එක්ක ම තමන් ගේ අතේ තිබුන කතුර ඇස් දෙකට ලන් කරේ තමන් ට විදින්න පුලුවන් ලොකු ම දඩුවම මේක නිසා....
කෙල්ල උන්නේ සිහියකින් නම් නෙමෙයි...අවට වෙන කිසිම දෙයක් වත් කිසිම සද්දයක් වත් නෑසෙන තරමට ම කෙල්ල උන්නේ සිහි විකල් වෙලා... ඒත් එක පාරම ඇහුන හඩත් එක්ක කෙල්ල දොර දිහා බැලුවේ එහ් කටහඩ ආයුශ් ගේ කියලා හොදට ම දන්න නිසා...කොල්ලා උන්නේ කිහිලි කරු දෙකෙන් දොර ලග හිටගෙන... එහ් ඇස් තරහටද දුකට ද කියලා පැහැදිලිව හදුන ගන්න බැරි තරමට ම රතු වෙලා තිබුනා... ගත උන තත්පර කීපය ගෙවිලා ගියේ දැඩි නිහඩතාවකින්... ඒලග තත්පරේ ආයුශ් කිහිලි කරු දෙකෙන් ම කෙල්ල ලගට ඇවිත් කෙල්ල ලග හිට ගත්තා...ටික වෙලාවක් ගෙවිලා ගියේ ආයුශ් ගේ වගේ ම නේහා ගේ ඇසුත් එකින් එක ගැටෙමින්....ඒත් ගෙවිලා ගියේ තත්පර කීපයක් විතරයි.... ආයුශ් නේහා ගේ කම්මුලට පහරක් ගැහුවේ එහ් පහරේ සැරට ම කෙල්ලගේ අතේ තිබුන කතුර විතරක් නෙමෙයි...කෙල්ලවත් ඇදගෙන බිමට වැටෙන්න...

නේහා ගේ ඔලුව ටයිල් පොලව මත වැදුනත් කෙල්ල ඔලුවත් අල්ලගෙන එහ් තත්පරේ ම නැගිට්ටේ ඇස් වල කදුලු පුරෝගෙන...

" ආ...යු...ම...ං......."

කෙල්ල කියනවත් එක්ක ම ආයුශ් කෙල්ලගේ අනිත් කම්මුලටත් ගැහුවේ එහ් ඇස් තවත් රතු කරන්...කලින් තරම්ම කම්මුල් පහර සැර නොවුන හින්දම මේ වතාවේ කෙල්ල ට

sinhalaebooks.com

හිටගෙන ඉන්න පුලුවන් උනා... ඒත් කම්මුල් පහරේ සැරට ම කෙල්ලට මුලු ඇගම කැරකෙනවා වගෙයි දැනුනේ..

" ආයූ..ඇයි මේ... "

කෙල්ල ගැහුවේ එක අතකින් කම්මුලක් අල්ලගෙන...

ඒත් ආයුශ් ගෙන් ලැබුනේ කෙල්ල කිසිසේත් ම බලාපොරොත්තු නොවුන පිලිතුරක්....

" ෂ්...ෂ්... එක වචනයක් හරි කතා කරලා තිබ්බොත් උබව මරනවා..."

" අ...නේ...ආ...යූ..."

" මන් උබට එක පාරක් කිවුවා...මෙතනින් වාඩි වෙයන්... "

ආයුශ් කිවුවේ රූම් එකේ කෙලවරට වෙන්න තිබුන බෙඩ් එක පෙන්නලා....කෙල්ල බෙඩ් එක උඩින් වාඩි උනේ ආයුශ් මේ කරන්න හදන්නේ මොකක් ද කියලා හිතා ගන්න බැරුව පපුව කවදවත් නැති තරම ට වේගෙන් ගැහෙද්දි....කොල්ලත් කිහිලි කරු දෙක පැත්තකින් තියලා වාඩි වෙන්න හැදුවත් අත ලිස්සලා කොල්ලා නොවැටී බේරුනේ අනූ නවයෙන්... ඉදගෙන හිටපු කෙල්ලට ඉබේම නැගිට්ටුනේ එහ් දසුනින්.....

" ආයූ...ඉන්න මන් උදව් කරන්නම්... "

කෙල්ල කිවුවේ ආයුශ් ගේ අතකින් අල්ලලා... ඒත් කොල්ලා එහ් අත ගසඇරලා දත්මේ නේහා ව පුච්චලා අලු කරලා දන්න තරම් බැල්මකුත් එක්ක...

" මට උබගේ උදව් ඕන් නෑ... "

ආයුශ් එහෙම කියන ගමන් ම කිහිලි කරු දෙක ඇදේ පැත්තකින් බිමට වෙන්න තියලා ඇදේ වාඩි උනේ හිටගෙන ඉන්න කෙල්ලටත් වාඩි වෙන්න කියන බැල්මකුත් එක්ක....කෙල්ල එහ් තත්පරේ ම වාඩි උනේ ඇස් වල කදුලු ආයෙමත් අලුත් වෙද්දි... ඒත් ආයුශ් කරේ අඩන කෙල්ලව තවත් රිද්දපු එක... කොල්ලා කෙල්ලගේ කම්මුල් දෙක රිදෙන තරමට ම අල්ලලා එහ් රතු උන ඇස් වලින් කෙල්ලගේ ඇස් වලට එබුනේ කෙල්ලගේ පපුව පිටතට ඇහෙන තරම ට ම ගැහෙද්දි....

ඊලගට කොල්ලා මොකක් හරි දෙයක් කියලා තමන් ට බනියි කියලා හිතුවත් ඊලගට උනේ කෙල්ල හීනෙකින් වත් නොහිතපු දෙයක්...

ආයුශ් කෙල්ලව එහෙම්මම ඇදේ හාන්සි කරලා කෙල්ලගේ පපුවේ මූන තියා ගත්තේ මාස ගානක් ම හිතේ හිරකරගෙන දුක් විදපු දුක ඉකියකුත් එක්ක පිට කරමින්..

sinhalaebooks.com

" ආ...යූ... "

කෙල්ල ආයුශ් ගේ මූනට දෝතට ගත්ත හැදුවත් කොල්ලා කරේ ඉකිය තවත් වැඩි කරමින් කෙල්ලගේ පපුවට මූන තද කරගත්ත එක...

" ආ..යූ...ඇ...යි...මේ... "

කෙල්ල ඇස් වල කඳුලු පුරවන් ඇහුවත් කොල්ලගෙන් පිලිතුරක් නම් ලැබුන් නෑ...එහ් වෙනුවට කොල්ලා කරේ තව තවත් කෙල්ලගේ උනුහුම හොයපු එක...

" අනේ ඔහොම ඉන්න එපා ආයූ...මට බනින්න..මට ගහන්න....මන් ඔයාට උන පොරොන්දුව කැඩුවා...මට මේ ඇස් දෙක ඕන් නෑ රත්තරං... "

කෙල්ල කිවුවේ ඇස් දෙකේ කඳුලු පුරවගෙන කොල්ලගේ ඔලුවෙන් අතක් තියලා...මේ තරම් වෙලා කෙල්ලගේ උනුහුමට ගුලි වෙලා හිටපු කොල්ලා ඔලුව උස්සලා කෙල්ලගේ මූන දිහා බැලුවේ එහ් වෙලාවේ.... එහ් ඇස් වල තරහා වගේ ම දුකත් ඕනවටත් වඩා තිබුනා...කොල්ලා උන්නේ පිස්සෙක් වගේ ඇස් වලින් නිමක් නැතුව ම කඳුලු ගලන් යන්න ඉඩ දීලා ..

" උබ...උබ හැමදම කරේ මට රිද්දපු එක...මුලින් මට උන පොරොන්දුව කැඩුවා...ඊලගට මන් ලග ඇස් පේන් නෑ වගේ රගපෑවා...ඊලගට...ඊලගට උබ මගෙ පැටියට මාව වැරදි කාරයෙක් කරන්න හදන්නේ...උබ කැමති ද දවසක මගෙ පැටියා ගේ කටින් කියවෙනවට...අම්මගේ ඇස් දෙක නැති කරේ තාත්ති කියලා? කතා කරපන් නේහා...උබ ට ඕනි එහ් කිරි සප්පයා ලග මාව වැරදි කාරයෙක් කරන්න ද... "

ආයුශ් ඇහුවේ පිටතට ඇසෙන නෑසෙන තරමට ම වචන දුවර්ල වෙලා යද්දි..ඒත් කෙල්ල නම් උන්නේ එහ් වචන අදහ ගන්නත් බැරුව...

" ආ..යූ...මො...න..ව...ද....මේ...කියන්නේ...
මො...න...පැ..ටි...යෙ...ක්...ගැ...න..ද...මේ...කි....ය....න්...නේ.... "

" උබට නොතේරුනාට මට දැනෙනවා නේහා...මගෙ පැටියා උබගේ බඩට ඇවිත්.... "

ආයුශ් කිවුවේ කෙල්ලගේ කුසින් එක අතක් තියන ගමන්...

" අ..යි...යේ.... "

" උබ මන් මත්තෙම නැහෙද්දි උබට අපේ පැටියා අපි ලගට ඇවිත් කියලා වත් දැනුන් නෑ මැනික... "

sinhalaebooks.com

ආයුශ් කෙල්ලගේ මූන දෝතට ම අරන් කිවුවේ කෙල්ලගේ කදුලු පිරිලා තියන දුබුරු පාට ඇස් දිහා ම බලාගෙන...එහ් ඇස් වල තිබුනේ පුදුමාකාර සතුටක්...ආයුශ් ගේ ඇස් කියලත් වෙනසක් නෑ...එහ් ඇස් තේහා ට දෙවනි නොවෙන තරම ට ම සතුටින් පිරිලා....

කෙල්ල අඩ අඩ ම ආයුශ් බදගත්තේ ආයුශ් ගේ ඇස් වල තිබුන එහ් ආදරේ දරාගන්න ම බැරි තැන...

" අපේ පැටියා අපි ලගට ඇවිල්ලා නම්... එ..න..කො...ට....එ...න...කො...ට...අර ඩිවෝස් පේපසර්... "

" මට ඕනි උනේ උබව රිද්දන්න මැනික..ඇති වෙන්න ම රිද්දන්න.......මුලින් උබ මාව රවට්ටලා ඇස් දෙක සනීප කරගත්තා කියලා දැනගත්ත ම මන් ඇක්සිඩන්ඩ් කරගත්තේ ඇත්තට ම මට එහ් වෙලාවේ ජීවත් වෙන්න ආසාවක් තිබුන් නෑ...උබත් මාව රැවැට්ටුව ම... ඒත් දෙවියෝ මාව බේරන්න ඇත්තේ උබගේ හිතේ මන් නමින් තියන ආදරේ පෙන්නන්න වෙන්නැති මැනික... එදා ඉදන් අද වෙනකම්ම උබ මන් ලගින් හෙලවුන් නෑ...මාව...මාව අම්මා කෙනෙක් තරමට ම බලාගත්තා...මන් මේ දවස් ටිකේ දැනගත්තා උබ මට කොච්චර ආදරෙයි ද කියලා...ඒත් උබ මට බොරු කරා, මන් ඉස්සරහා ඇස් පේන් නෑ කියලා රග පෑවා කියලා මතක් වෙන හැම තත්පරේ ම මට උබ ගැන දැනුනේ පුදුම තරහක් සුදු මැනික.... මට මාව ම පාලනය කරගන්න බැරිඋනා...ඒකයි මන්...අතට අහු වෙන එකෙන් උබට ගැහුවේ...මේ ඩිවෝස් පේපසර් ....මේවත් උබව රිද්දන්න පුලුවන් උපරිමේට ම රිද්දන්න කරපු දේවල්...ඒත්...ඒත් මන් දැනන් හිටියේ නෑ සුදු මැනික.... උබ...උබ මේ තරම් දරුනු තීරනයක් ගනියි කියලා.... ඒත් මගෙ හිත කිවුවා... උබ... උබ මොකක් හරි දෙයක් කරගයි කියලා...ඒකයි මන් උබේ පස්සෙන් ආවේ...දෙයියනේ...මන්...මන්...තව විනාඩියක් පරක්කු උනා නම්...සුදු මැනික උබ..... "

කොල්ලට කියාගන්න පුලුවන් උනේ එහ් වචන ටික විතරමයි...කොල්ලා ආයෙමත් අඩන්න ගත්තේ දෝතින් ම ඔලුව බදගෙන...

" අනේ ආයු... "

" මට සමාවෙයන් සුදු මැනික ... මන්...මන් උබව අර කොහෙවත් යන ගෑනියෙක් ට සමාන කරලා කරගත්තේ ලොකු වැරැද්දක්...උබ සාරා නෙමෙයි මැනික...උබ ඒට වඩා සිය දහස් ගුනයක් වෙනස්...මට සමාවෙයන් සුදු මැනික... "

කොල්ලා කිවුවේ අත් දෙක ම එකතු කරලා කෙල්ලගේ මූන දිහා බලාගෙන....කෙල්ල කරේ ආයුශ් මූන දෝතට අරන් පිස්සුවෙන් වගේ සිප ගත්ත එක විතරමයි... ඒලගට කොල්ලගේ පපුවට තුරුල් උනේ අඩ අඩ ම...

" මට සමාවෙන්න ආයු...මන් පොරොන්දු කඩ කරේ ඔයාව දකින්න තියන ආසාවට..මන් අතින් ම ඔයාගේ වැඩ ටික කරලා දෙන්න තියන ආසාවට...මට සමාවෙන්න රත්තරං ...එහ් කොහොම මොන දේට උනත් පොරොන්දු කඩ කරලා මන් කරේ වැරැද්දක්... "

sinhalaebooks.com

" ෂ්.ෂ්...මත් දන්නවා.. දැන් ඇති සුදු මැතික... මත් උඹට ආදරෙයි ..ගොඩක් ආදරෙයි ..... "

කොල්ලා කෙල්ලව තමන් ගේ පපුවට තවත් තුරුල් කරගනිමින් කිවුවේ කෙල්ලත් එහ් උනුහුම තව තවත් නතු වෙද්දි...

" මාත් ආදරෙයි ආයූ... "

එහ් වචන ටික මුවින් පිට වෙන ගමන් ම මේ තරම් කාලයක් ජිවිතේ වැඩිපුරම කඳුලු වලින් ගෙවුන කෙල්ලගේ ජිවිතේ අන්තිම කදුල ආයුශ් ගේ පපුවට වැටුනේ කෙල්ලගේ හිතට මහා ලොකු සැනසිමක් දැනෙද්දි....

එතනින් එහා ගෙවුන හැම තත්පරයක් ම ගෙවුනේ කියාගන්න වචන නැති තරමට ම සතුටින්........ආයුශ් නේහා ගේ තුරුලෙන් මොහොතකටවත් මිදුනේ නෑ...නේහා ත් කොල්ලා ලගම දැවටුන එක විතරමයි කරේ....

ආයුශ් නියමිත වෙලාවට ක්ලිනික් වගේ ම ඩොක්ටර් කිවුව විදිහට ම treatment කරපු නිසා ම හිතුවටත් වඩා ඉක්මනට ආයුශ් ට කිහිලි කරු නැතුව ඇවිදින්න පුලුවන් උනා....ඒක කොල්ලගේ වගේ ම කෙල්ලගේ හිතටත් ලොකු සැනසීමක් උනා...

තාමත් ආයුශ් ඇක්සිඩන්ඩ් උනා කියලවත් නොදන්න ආයුශ් ගේ අම්මයි තාත්තා යි ලංකාවට ආවේ ඔය අතරේ...ඇක්සිඩන්ඩ් එක රහසක් විදිහට ම තියාගන්න කොල්ලා තීරනය කරේ අම්මට තාත්තා ට උනත් මොහොතකට වත් දුකක් දෙන්න ඕන් නෑ කියලා හිතපු නිසා...

ආයුශ් ගේ අම්මා ආව ගමන් ම නේහා ප්‍රෙග්නට් කියලා දැනගත්ත ම එහ් තරම් සතුටු උන වෙන කෙනෙක් නැති තරම්...නේහා ගේ අම්මත් කෙල්ල ආයුශ් ගේ ගෙදරට ම ගෙන්න ගත්තේ අම්මව තමන් ලගින් ම තියාගන්න ඕන උන නිසා...

මාස කීපයක් ගෙවිලා යද්දි කෙල්ලගේ කුස ඉදිරියට ඇවිත් තිබුනේ පුංචි පැටියා ආයුශ් නේහා ලගට එන්න ගොඩක් ලගයි කියලා හැමෝගෙම හිත් වලට සතුටක් ගෙනෙමින්...

කෙල්ල කොහොමත් ආසයි පන්සල් යන්න..පුංචි කාලේ ඉදන් ම... එක පාරට ම කෙල්ලට පන්සල් යන්න ඕන කියලා ආසාවක් ආව හින්ද ම ආයුශ් ට එහ් ගැන කිවුව පමාව විතරයි... කොල්ලා කෙල්ලවත් ලෑස්ති කරගෙන කාර් එකට නැංගේ කෙල්ලගේ හැම ආසාවක් ම ඉශ්ට කරන එක මේ වෙද්දි කොල්ලගේ එක ම හීනේ වෙලා තිබුන නිසා....

පන්සල ට යන පාර ලගින් කාර් එක නවත්තලා කොල්ලා කෙල්ලවත් එක්කන් පන්සලට ගියේ හිතේ බලාපොරොත්තු කෝටියක් පොදි බැදගෙන....

බුදුන් වැදලා කොල්ලා නේහා වත් එක්කගෙන බෝධිය ලගට ගියේ කෙල්ලගේ කුසේ ඉන්න දරු පැටියා වෙනුවෙන් පඩුරක් ගැට ගහන්න.... ඒත් නොහිතපු විදිහට කොල්ලගේ සවනට

sinhalaebooks.com

හුරු පුරුදු කටහඬක් ඇහුනා... ඔව්...එහ් වෙන කවුරුත් නෙමෙයි...කාලෙකදි තමන් පන වගේ ආදරේ කරපු #සාරා ගේ කටහඬ... ඒත් කෙල්ල හිටියේ නම් තනියම නෙමෙයි...ආයුශ් කලින් දැකලා නැති කොල්ලෙක් එක්ක...එහ් විතරක් නෙමෙයි... කෙල්ලත් නේහා වගේ ම ප්‍රෙග්නට් ......ආයුශ් මොහොතක් එහ් දිහා බලන් හිටියේ ගල් ගැහිලා...නේහා එහ් බවක් හොදට ම දැක්කා... එතකොට එහ් ඉන්නේ සාරා කියලත් කෙල්ල අදුන ගත්තේ එදා දැක්ක ෆොටෝස් මතක් වෙලා.... කෙල්ලගේ හිත රිදුන් නෑ කිවුවොත් බොරු... එහ් හිත හොදට ම රිදුනා...ආයුශ් ආයෙ ම අතීතේ මතක අතරෙද කියලා සැකේකුත් එහ් එක්ක ම කෙල්ලගේ හිතට ආවා...

" ඇයි ඔයා මට ඔහොම කරන්නේ...මේ බඩේ ඉන්න පැටියා ගැනවත් හිතන්න..."

සාරා කිවුව වචන ටික නේහා වගේ ම ආයුශ් අහන් උන්නේ උන් තැන ම ඉදන්..තාමත් ආයුශ් ව නොදැක්ක සාරා උන්නේ හොදට ම අඩ අඩ...

" බඩේ ඉන්න පැටියා...එහ් පැටියා කාගෙද...හරියට ම මගෙ ද කියලවත් උබට ශුවර් ද ....
"

සාරා එක්ක හිටපු තරුනයා සාරා ගේ කෙස් වැටියෙන් තද කරලා ඇහුවේ මේ ඉන්නේ පන්සලේ කියන දේත් අමතක කරලා . ....

" ඇයි දෙයියනේ ඔහොම කතා කරන්නේ... "

" මන් වෙන කොහොම ද කතා කරන්නේ...මගෙ ඇස් දෙක ට ම උබ වෙන මිනිහෙක් එක්ක ඉන්නවා දැක්ක ම... "

එහ් වචන ටිකත් එක්ක ම ආයුශ් වගේ ම නේහා ටත් මූනෙන් මූන බැලවුනේ මෙච්චර කල් ගිහිනුත් සාරා තව ම හැදිලා නෑ නේද කියන දේ හිතට දැනෙනවත් එක්ක ම...

" ඒත් අයියේ...මේ දරුවා...ඔයාගේ... මට විශ්වාසයි .. "

" ඒක දරුවා ලැබුන ම ටෙස්ට් එකක් කරලා හොයා ගන්න පුලුවන් සාරා...දැන් යමු.. "

සාරා එක්ක හිටපු තරුනයා එහෙම කියලා යන්න යද්දි සාරා ත් එහ් පිටුපසින් ම යන්න හැදුවත් එහ් වෙලාවයි කෙල්ල ආයුශ් ව දැක්කේ....ආයුශ් ව දැක්ක ගමන් එහ් ඇස් වල කදුලු පිරුනේ ඉබේම...කෙල්ල ඉස්සරහට ගත්ත පය පිටිපස්සෙන් තිබ්බේ ආයුශ් ලගට ගිහින් කොල්ලත් එක්ක එක වචනයක් කතා කරන්න හිතට දැනුන ආසාවට උනත් එතකොටයි කෙල්ලගේ ඇස් ගැටුනේ...ආයුශ් ලග ම හිටපු නේහා දිහා ට.. කෙල්ල ඇස් වලට ඉනුව කදුලු අත් දෙකෙන් ම පිහිදගෙන පය ඉක්මන් කරලා එතනින් පිට වුනේ කාලෙකට ඉස්සර තමන් ට පන වගේ ආදරේ කරපු තමන් ව එහ් ආදරේ නැති කරගත්ත එදා තමන් ගේ උන ආයුශ්, අද වෙන කෙනෙක් ගේ කියලා හිතට දැනුන දරාගන්න බැරි දුකකත් එක්ක....

sinhalaebooks.com

සාරා යන දිහා මොහොතක් බලන් හිටපු කොල්ලා සුසුමකුත් පිට කරලා නේහා දිහාට හැරුනේ අහිංසක හිනාවකුත් එක්ක... ඒත් කෙල්ල නම් උන්නේ කියාගන්න බැරි තරම් දුකකින්..ඒහ් ආයුශ් ආයෙ ම අතීතෙට ගියා ද කියලා සැකෙත් එක්ක... මොහොතකට හරි ආයුශ් ආයෙමත් සාරා ගේ මතකේ ට යද්දි කෙල්ලට දැනුනේ දරාගන්න බැරි ඊෂ්‍යාර්වක්...

" දුකයි ද... "

කෙල්ල ඇහුවේ හිතේ නොසන්සුන් කම හිනා මතා ම යටපත් කරගෙන...

" ඇයි... "

" සාරා දැන් වෙන කෙනෙක් ගේ...අනිකමැතික එයා ප්‍රෙග්නට් ...එයා ඔයාගේ කලින් gf නෙහ්...දුකයි ද.... "

" සුදූ මැතික..... උබ මට මුලු ලෝකෙම... මොහොතකට හරි උබ හිතුවනම් මන් අතීතෙට ගියා කියලා උබ කරේ ලොකු වැරැද්දක් .... මගෙ හිතේ ඉන්නේ උබ විතරයි...උබ විතරමයි .... මට සුසුමක් පිට උනේ සාරා තාමත් හැදිලා නෑ කියලා දැනෙද්දි...එයා ඔය විනාශ කරගන්නේ එයාගේ ජීවිතේම යි.... සුදූ මැතික....උබ තමයි මගෙ හැමදේම... අද හෙට ඊට පස්සේ ගෙවෙන හැම තත්පරේ ම...උබ විතරමයි මේ පපුවේ ඉන්නේ.... "

කොල්ලා කිවුවේ නේහා ගේ අත් දෙක ම තමන් ගේ දෝතට අරන්...කෙල්ලගේ ඇස් දිහා ම බලාගෙන.... නේහා ගේ ඇස් වලින් වැටෙන සතුටු කඳුලු දිහා දරාගන්න බැරි තරමට ම ආදරේකින් බලාගෙන...එහ් හිතේ නේහා ගේ නමිනුත් නේහා ගේ හිතේ ආයුශ් ගේ නමිනුත් ආදරේ දෝරේ ගලද්දි ... ... බලාපොරොත්තු හීන කෝටියක් එහ් හිත් වල අලුතින් ඉපදෙද්දි..

-------------- සමාප්තයි -----------------